324 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 324 - இல. 02
Volume 324 - No. 02

2026 ජනවාරි 07වන බදාදා
2026 சனவரி 07, புதன்கிழமை
Wednesday, 07th January, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 278]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 279]

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න [තීරු 282-291]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 291-304]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
- මඩකලපුව දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව මුහුණ දෙන ඉඩම් ගැටලු [තීරුව 304]
- වට්ටක්කච්චි කෘෂිකර්ම පාසල සහ ගොවිපළ නැවත ආරම්භ කිරීම [තීරුව 307]

කොරියාවේ රැකියා සඳහා වන ගිවිසුම් යාවත්කාලීන කිරීම:
- විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 308]

ලක්විජය බලාගාරය වෙත සපයන ලද ගල් අඟුරුවල ප්‍රමිතිය:
- බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 321]

වරප්‍රසාද:
- යාපනයේ DDC රැස්වීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් අපහාසාත්මක වචන භාවිත කිරීම [තීරුව 324]

පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:
- පළමුවන වර කියවන ලදී [තීරුව 327]

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත:
- දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 329–422]

අත්‍යවශ්‍ය මහජන සේවා පනත:
- යෝජනා සම්මතය [තීරුව 422]

කල් තැබීමේ ප්‍රශ්න [තීරු 423-434]


# பிரதான உள்ளடக்கம்


அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 278]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 279]

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் [ப: 282-291]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 291-304]

தனி அறிவித்தல் மூல வினா:
- மட்டக்களப்பு மாவட்ட முஸ்லிம் மக்கள் எதிர்கொள்ளும் காணிப் பிரச்சினைகள் [ப: 304]
- வட்டக்கச்சி விவசாயப் பாடசாலையையும் பண்ணையையும் மீள ஆரம்பித்தல் [ப: 307]

கொரியா வேலைவாய்ப்புக்கான ஒப்பந்தத்தைப் புதுப்பித்தல்:
- வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 308]

லக்விஜய மின் உற்பத்தி நிலையத்துக்கு வழங்கப்பட்ட நிலக்கரி சரக்குகளின் தரநிலை:
- வலுசக்தி அமைச்சரினது கூற்று [ப: 321]

சிறப்புரிமை:
- யாழ். மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் பாராளுமன்ற உறுப்பினர் ஒருவரின் இழிவான வார்த்தைப் பிரயோகம் [ப: 324]

பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்:
- முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 327]

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்:
- இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 329-422]

அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:
- தீர்மானம் [ப: 422]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 423-434]


# PRINCIPAL CONTENTS


PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 278]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 279]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 282-291]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 291-304]

QUESTION BY PRIVATE NOTICE:
- Land Issues Faced by the Muslim Community in Batticaloa District [Col. 304]
- Recommencement of Vaddakkachchi Agricultural School and Farm [Col. 307]

UPDATING AGREEMENTS ON JOB OPPORTUNITIES IN KOREA:
- Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 308]

STANDARD OF COAL SHIPMENT DELIVERED TO LAKVIJAYA POWER PLANT:
- Statement by Minister of Energy [Col. 321]

PRIVILEGE:
- Use of Offensive Language by Member of Parliament at DDC Meeting, Jaffna [Col. 324]

PARLIAMENTARY PENSIONS (REPEAL) BILL:
- Read the First Time [Col. 327]

COLOMBO PORT CITY ECONOMIC COMMISSION (AMENDMENT) BILL:
- Read a Second, and the Third time and passed [Cols. 329-422]

ESSENTIAL PUBLIC SERVICES ACT:
- Resolution [Col. 422]

ADJOURNMENT QUESTIONS [Cols. 423-434]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජනවාරි 07වන බදාදා***
*2026 சனவரி 07, புதன்கிழமை*
*Wednesday, 07th January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;
(ii) 2024 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ
(iii) 2024 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 24(4) වගන්තිය සහ 2025 අංක 3 දරන විසර්ජන පනතේ 5 වගන්තිය ප්‍රකාරව, 2025 ජූලි 01 දින සිට 2025 සැප්තැම්බර් 30 දක්වා "වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ සිදුකරන ලද ප්‍රතිපාදන මාරු කිරීම්" සම්බන්ධයෙන් වන තොරතුරු පිළිබඳ වාර්තාව.- [ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ
(ii) 2023 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the -

(i) Colombo Port City Economic Commission (Amendment) Bill; and
(ii) Regulations under Section 20 read with Sections 4 (1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 (Published in Gazette Extraordinary No. 2465/07 of December 01, 2025),

which were referred to the said Committee.

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 සහ 2024 වර්ෂ සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2024 වර්ෂය සඳහා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 සහ 2023 වර්ෂ සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(iv) 2023 සහ 2024 වර්ෂ සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 හා 2024 වර්ෂ සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(ii) 2023 හා 2024 වර්ෂ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iii) 2023 හා 2024 වර්ෂ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iv) 2023 හා 2024 වර්ෂ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2023 හා 2024 වර්ෂ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vi) 2023 හා 2024 වර්ෂ සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vii) 2023 හා 2024 වර්ෂ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(viii) 2023 හා 2024 වර්ෂ සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(ix) 2023 හා 2024 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(x) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, හිඟුරක්ගොඩ, හතමුණ, අංක 316 යන ලිපිනයෙහි පදිංචි ජී.එම්.එස්. නානායක්කාර මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, වේයන්ගොඩ, කුඹල්ඔළුව, අංක 357/ සී යන ලිපිනයෙහි පදිංචි එන්.කේ. ප්‍රසාදිනී ජීවන්ති කරුණාරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මාතලේ, නුගගොල්ල, 80 යාය, අංක 16/65 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී.ජී. නිසංසලා මධුමාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතලේ, මහවෙල, දොඹවෙල, තෝරගොල්ලවත්ත, අංක 37/1 යන ලිපිනයෙහි පදිංචි ජී.බී.ඊ.ජේ.එම්. කවින්ද්‍යා ලක්ෂාණි ජයසුන්දර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) අරණායක, පන්නල, හුණුකොටුවවත්ත යන ලිපිනයෙහි පදිංචි අයි.එස්.ඒ.එස්. පොතුහැර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) උකුවෙල, රයිතලාවෙල, වළකුඹුර වත්ත, අංක 38 යන ලිපිනයෙහි පදිංචි එස්.ඩී. සරත් නවරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(i) ජා-ඇල, කපුවත්ත, කොළඹ පාර, අංක 555 යන ලිපිනයෙහි පදිංචි ඊ.ඒ.ඩී. මාලනී විනිෆ්‍රීඩා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(ii) ජා-ඇල, පොතුකොටුව, බංඩිගොඩ, අංක 116/බී යන ලිපිනයෙහි පදිංචි එන්.ජී. නන්දන චන්ද්‍රකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(i) හිරිවඩුන්න, දුනුකේවල, අංක බී 81/1 යන ලිපිනයෙහි පදිංචි ජේ.ඩී. නන්දන කුසුමසිරි අරුණශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(ii) රඹුක්කන, ඉඹුල්ගස්දෙනිය, කුරුඳුවත්ත, අංක 44/6 යන ලිපිනයෙහි පදිංචි එස්.එම්.ජී.එම්. සේණානායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

පාර්ලිමේන්තුවේ හිටපු මහලේකම් අපේ හිතවත් නිහාල් සෙනෙවිරත්න මැතිතුමාගේ හදිසි වියෝව පිළිබඳව පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අපි සියලුදෙනාම අපේ බලවත් සාතිශය සංවේගය පළ කර සිටිනවා.

දෙවන සහකාර ලේකම්වරයා හැටියට පාර්ලිමේන්තු සේවාව පටන් ගත් එතුමා 1981දී මහ ලේකම් ධුරයට පත් වුණා. 1994 දක්වා එතුමා විශිෂ්ට සේවාවක් ඉටු කළා. විශ්‍රාම යැමෙන් පසුවත් පාර්ලිමේන්තු ක්‍රියාදාමය ශක්තිමත් කරන්නට, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නට නන් අයුරින් විශාල සේවාවක් ඉෂ්ට කරමින් යුග මෙහෙවරක් ඉෂ්ට කළ යුග පුරුෂයෙක් හැටියට අපට එතුමාව හඳුන්වන්න පුළුවන්. එම නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපි සියලුදෙනාම නිහාල් සෙනෙවිරත්න මැතිතුමා ඉෂ්ට සිද්ධ කළ සේවාව අගය කරමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ස්ථාවර නියෝග 28(ඊ) යටතේ, වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා කාරණය කියන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මට ඇති මරණ තර්ජන පිළිබඳව සහ මගේ ආරක්ෂාව සම්බන්ධව සඳහන් කරමින් වරප්‍රසාද කඩවීමේ ලිපියක් ඔබතුමාට මම යොමු කළා. එම ලිපිය ආරක්ෂක අංශවලට යොමු කරලා, ආරක්ෂක අංශ විසින් බුද්ධි තොරතුරු අනුව තහවුරු කරගෙන තිබෙනවා, මට තර්ජනයක් තිබෙනවා සහ මට ආරක්ෂාව ලබා දිය යුතුයි කියලා. ඒ සම්බන්ධව අද පොලිස්පතිතුමා මට ලිඛිතව දැනුම් දීමක් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඊට පසුව,- *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, එම ලිපියේ ඊට පහළින් නිර්දේශ කරලා තිබෙනවා, "කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව" කියලා. ගරු කථානායකතුමනි, මට තර්ජනයක් තිබෙනවා, ආරක්ෂාව දීම සුදුසුයි කියලා බුද්ධි අංශ තහවුරු කරගෙන නිර්දේශ කරලා තිබෙනවා නම්, පොලිස්පතිතුමාත් ඒක අනුමත කරලා තිබෙනවා නම්, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබෙන තෙක් අපේ ආරක්ෂාව අප විසින් සලසා ගත යුතුද? ඒ නිසා ඉක්මනින් මගේ මේ කටයුත්ත පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කර, මේකට උත්තරයක් ලබා දෙයි කියා බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා ඒ ගැන හොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත වර්ධනය සඳහා රජය විවිධ වැඩ පිළිවෙළවල් ක්‍රියාවට නැංවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසර පුරාවටම සංචාරකයන් විශාල ප්‍රමාණයක් මෙරටට පැමිණ තිබේ. ඒ ආශ්‍රිතව තමයි මම ඔබතුමියට ප්‍රශ්නය යොමු කරන්නේ.

01. 2025 වසරේ මෙරටට පැමිණි සංචාරකයන් ප්‍රමාණය කොපමණද? එම ප්‍රමාණය ඉතිහාසයේ මෙරටට පැමිණි ඉහළම අගය ද?

02. ඒ හරහා මෙරටට ලැබුණු ආදායම දළ වශයෙන් කොපමණද?

03. 2026 වසරේ සංචාරක පැමිණීම් ඉලක්කය කොපමණද?

04. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන පියවරයන් මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය ඒ තොරතුරු මා වෙත ලබා දෙන්න පොඩි කාලයක් ඉල්ලා තිබෙනවා. එම තොරතුරු ලැබුණු වහාම මම මේ ප්‍රශ්නයට සම්පූර්ණ උත්තරයක් සපයා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, පසුගිය සති කිහිපයක කාලය තුළ පළාත් පාලන ආයතනයන්හි රැස්වීම් පවත්වන අතරතුර රජයේ නිලධාරින්ගේ රාජකාරියට බාධා වන පරිදි හැසිරීම්, බැණ වැදීම්, තර්ජනය කිරීම් සහ පහරදීම් පිළිබඳව පුවත් දිගින් දිගටම මාධ්‍ය මඟින් වාර්තා කෙරිණි.

01. එවැනි සිදුවීම් පිළිබඳව වාර්තා වී තිබේද?
02. තිබේ නම් ඒ කිනම් ප්‍රදේශයන්හිද?
03. සිදුවීම් වාර්තා වී තිබේ නම් ඊට සම්බන්ධිත පුද්ගලයන් පිළිබඳව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
04. මින් ඉදිරියට එවැනි සිදුවීම් ඇති නොවීමට රජය විසින් ගනු ලබන පියවර මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. ඔව්, එසේ වාර්තා වී තිබේ.

02.

| | |
|---|---|
| දකුණු පළාත | - ගාල්ල මහ නගර සභාව |
| සබරගමු පළාත | - ගොඩකවෙල ප්‍රාදේශීය සභාව |
| උතුරු පළාත | - යාපනය මහ නගර සභාව |
| | -පේදුරුතුඩුව නගර සභාව |
| | -වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව |

03. සබරගමුව පළාත

සබරගමුව පළාතේ ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සිදුවීම සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් නිලධාරින් පත් කර විමර්ශන කටයුතු ආරම්භ කර ඇත.

දකුණු පළාත

දකුණු පළාතේ ගාල්ල මහ නගර සභාවේ සිදුවීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් වාර්තා කර ඇත.

ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙත දන්වා යවා ඇත.

තවද ගාල්ල මහ නගර සභාවේ සිද්ධිය සම්බන්ධයෙන් සාමාන්‍ය නීතිය යටතේ කටයුතු කිරීමට පොලිසිය වෙතද පැමිණිලි කර ඇත.

උතුරු පළාත

උතුරු පළාතේ පළාත් පාලන ආයතනවලින් වාර්තා වූ සිදුවීම් සම්බන්ධව විමර්ශන කටයුතු ආරම්භ කර ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව උතුරු පළාත් පාලන කොමසාරිස් විසින් වාර්තා කර ඇත.

04. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් පාලන විෂයය පූර්ණව විමධ්‍යගත වූ විෂයක් වන අතර, ඒ අනුව පළාත් පාලන ආයතනවල අධීක්ෂණ බලතල පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇත. වර්තමානයේදී පළාත් සභාව සක්‍රියව නොමැති බැවින්, එම අධීක්ෂණ බලතල ගරු ආණ්ඩුකාරවරුන්ට පැවරී ඇත.

ඒ අනුව මෙම වාර්තාගත සිද්ධිවලට අදාළව පවතින පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම ගරු ආණ්ඩුකාරවරුන් ඒ සම්බන්ධව තීරණ ගනු ඇත.

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මෙරට ජාතික ආර්ථිකයට එල්ල කළ බලපෑම සුළුපටු නොවේ. ඒ සම්බන්ධයෙන් විවිධ තක්සේරු ඉදිරිපත් කර ඇති පසුබිමක ආපදාව හේතුවෙන් බලපෑමට ලක්වූවන්ට හා කර්මාන්ත ඇතුළු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට යළි නැඟී සිටීමට අවශ්‍ය ශක්තිය කඩිනමින් යළි ලබා දිය යුතුව ඇත.

1. ඒ අනුව, විපතට පත්වූවන් සඳහා රජය ඉදිරිපත් කර ඇති වන්දි ක්‍රමවේදය කුමක්ද?
2. ආපදාවෙන් පීඩාවට පත් ව්‍යවසායකයන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙන් වාර්ෂිකව සියයට 3ක පොලී අනුපාතයක් යටතේ ලබා දෙන සහන ණය වැඩ පිළිවෙළ කවරේද?
3. ඊට අදාළව හානිය තක්සේරු කරන ක්‍රමවේදය කුමක්ද?
4. ණය ගෙවීමට ලබා දෙන සහන කාලය ප්‍රමාණවත්ද?
5. ණය සහන පමා කාලයට - debt moratorium - අයත්ව සිට ආපදාවෙන් යළි විපතට පත් ව්‍යවසායකයන් සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද?

   විශේෂයෙන්ම CRIB එක සම්බන්ධයෙනුයි මේ අහන්නේ.
6. විපතට පත් වූ අය අතර ණය තොරතුරු කාර්යාංශයේ ලේඛනගතව සිටින අයවලුන් සඳහා ණය සහන ලබා දීමේදී ඔවුන්හට සහනයක් හිමි වන්නේද?
7. විපතට පත් ජන ජීවිත හා ව්‍යවසායකයන් යළි නඟා සිටුවීම සඳහා රජය සතු වැඩ පිළිවෙළ කුමක්ද?
8. ඉදිරියේදී මෙවැනි ස්වාභාවික ව්‍යසනයකදී සිදු විය හැකි හානි අවම කිරීමට රජයට ඇති සැලසුම් කවරේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ තොරතුරු සපයන්න ජනාධිපති කාර්යාලය විසින් කාලයක් ඉල්ලා තිබෙනවා. තොරතුරු ලැබුණු වහාම මා ඒවා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මීළඟ ප්‍රශ්නය අසන්නේ, ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේදී ආපදාව සම්බන්ධයෙන් කථා කරපු තොරතුරු ආශ්‍රිතවයි මේ කාරණය කියන්නේ. පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුවේ එක් කොට්ඨාසයක ගෙවල් 24ක් තවම වතුරෙන් යට වෙලා තිබෙනවා. ඒවායෙන් ගෙවල් 13ක් නැවත ලබා දෙන්න සාකච්ඡා කරගෙන යනවා, ඒ ස්ථානය පදිංචියට සුදුසු නැති බව සහ ඒ ජනතාව වෙනත් ස්ථානයකට පදිංචියට යා යුතු බව කියමින්. හැබැයි, ගෙවල් 17ක් ඒ අයට අවශ්‍ය බව ඒ ගමේ සියලු දෙනා ප්‍රකාශ කරනවා.

මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තොරතුරු දීලා තිබෙන්නේ පුත්තලම දිස්ත්‍රික්කයේ සියලු සහන කටයුතු අවසානයි කියලායි. එහෙම අවසාන වෙලා නැහැ. මේ කියන ප්‍රදේශය තවම අඩි 10ක්, 15ක් විතර වතුරෙන් යට වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශය සම්බන්ධව පහු වෙලා තීන්දු තීරණ අරගෙන වැඩක් නැහැ. ඒ පැත්තේ සම්පූර්ණයෙන්ම විනාශකාරී තත්ත්වයක් තිබෙන්නේ. මේ වනකොට ඒ පැත්ත පදිංචියට සුදුසුත් නැහැ. ඒ ජනතාවට ඉඩම් ලබා දෙනවාද, ගෙවල් ලබා දෙනවාද කියන එක සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න.

ඒත් එක්කම තවත් පුංචි කාරණයක් ඉදිරිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම expressway එකේ මොකක්ද අලුත් ක්‍රමයක් හදලා තිබෙනවා. එම නිසා තමයි මට අද උදේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අදාළ කාරණාව ගැන විතරක් කියන්න. ඔය කාරණය ප්‍රශ්නයට අදාළ නැහැ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මේක වරප්‍රසාද කාරණයක්. මේකත් මේ ගමන්ම ඉදිරිපත් කරන්නම්. මොකද, ඔබතුමා මට ආයෙත් කාලයක් දෙන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]* මම අද ගෙදරින් එනකොට වෙන්නප්පුවෙන් ආවේ උදේ 7.00ට. උදේ 7.00ට ඇවිල්ලාත් පැය දෙකහමාරක් ගියා මෙතැනට එන්න. මොකක්ද, හේතුව? දැන් expressway එකේ මොකක්ද අලුත් ක්‍රමයක් - මොකක්ද කෙහෙල් මලක් - හදලා තිබෙනවා. ඒ මොකක්ද, දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* සම්පූර්ණයෙන්ම හිර වෙලා තිබෙනවා; එන්න බැහැ. ඔබතුමා expressway එකේ ගිහිල්ලා බලන්න. අද වුණත් ගිහිල්ලා බලන්න, කොයි ආකාරයෙන්ද expressway එකේ යන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කරන ඔය කාරණාව දැන් විවාදයට ලක් වුණු කාරණාවක් නොවෙයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ඒක බරපතළ ප්‍රශ්නයක්. Airport එකට යන අය සම්පූර්ණයෙන්ම අනාථ වෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඔබතුමා අවසර දෙනවා නම් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ගරු අගමැතිතුමියගෙන් අහපු ප්‍රශ්නයට අදාළව ගරු චන්දන අබයරත්න ඇමතිතුමාට යම් පිළිතුරක් දෙන්න පුළුවන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වශයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට අදාළ කාරණා පිළිබඳව අපි පසුගිය සතියේත් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේදී මේ තත්ත්වය පිළිබඳව වාර්තා වුණා. එතැනදී අපි තීරණය කළේ අවශ්‍ය සියලුදෙනාට ඒ පහසුකම

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

සලස්වන්නයි. සමහර තැන්වල ඉඩම් තිබෙනවා, ගෙවල් හදන්න බැරි. සමහර තැන්වල ඉඩමත් නැහැ, ගෙයත් නැහැ. ඒ නිසා එතුමා සඳහන් කරපු ප්‍රදේශයට අදාළව නිවාස ලැබිය යුතු සියලුදෙනාට සහ ඉඩම් ලබා දීමට අවශ්‍ය නම් ඒ සියලුදෙනාට ඒවා ලබා දීම සඳහා කටයුතු කරනවා. තොරතුරු ලබා ගැනීමේදී සමහර තැන්වල සුළු සුළු ගැටලු මතු වෙලා තිබුණා. ඒ තත්ත්වයත් නිරාකරණය කරගෙන අවශ්‍ය කටයුතු කිරීමට අපි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවේදී තීරණයක් ගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Hon. Speaker, my Question is as follows:

Will the Hon. Prime Minister state -

(a) whether the Government accepts that in accordance with internationally accepted child protection and data privacy standards, personal information of a child, other than basic identification and emergency contact information, ought to be treated as private and confidential;

(b) whether the present module for Grade Six English language was prepared by qualified experts in child psychology and educational pedagogy? If not, why; and

(c) whether there was an issue regarding the Grade Six English language module as a result not following the said policy? If so, why did that happen?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, the Answers is as follows:

(a) Yes. The Government of Sri Lanka affirms its commitment to internationally accepted child protection and data privacy standards. In the education sector, the Ministry of Education generally refrains from collecting students' personal data, limiting it to emergency contacts. For specific programmes benefiting students, only essential details such as parents' or guardians' names, students'/parents' bank details, National Identity Card numbers and mobile numbers are gathered, strictly confined to beneficiaries.

The Ministry prioritizes privacy handling of such data confidentially in alignment with local and international protocols, particularly the provisions of the Personal Data Protection Act, No. 9 of 2022. Any sharing of student information with third parties for the child's betterment requires explicit written parental consent, with all processes maintaining utmost confidentiality to safeguard vulnerable groups. This approach complies with the global benchmarks, demonstrating proactive adherence to ethical standards.

(b) Sir, those who have been involved in the Grade Six English language module have obtained their academic and professional qualifications such as Bachelor's Degree, Postgraduate Diploma in Education and Master's Degree related to their subject area. Educational psychology, second language teaching methodology, second language acquisition are a few of the components they have studied to obtain such qualifications. Further, when personnel are recruited to various positions of the different sections of the NIE, they are recruited based on the educational and professional qualifications, as stated in the approved Service Minutes or schemes of recruitment.

(c) Sir, the activity highlighted in the Grade Six English language module, in no way, directs students to provide their personal information to any party. The activity concerned is a reading activity, where the students are expected to read three simple paragraphs on three hypothetical characters, one boy and two girls who have been presented as from England, Japan and India respectively, and to provide certain specific information mentioned in the paragraphs in a given space. The reading activity thus presented addresses the reading subskill, "reading for specific information" in this context. Since the students are not given any instruction to share their personal information, there is no room for violation of the policy regarding the privacy of children.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, I have two Supplementary Questions.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Go ahead.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Thank you very much for the Answer given, Hon. Prime Minister.

Sir, my first Supplementary Question is this. Hon. Prime Minister, quite contrary to what you explained to this Parliament, I find in the Module that has been given that information such as the height and the weight of the students are specified. It is not only this particular page, Hon. Prime Minister, but the entire module contains a system by which the three students from three different countries interact. I am not talking about the controversial website; I will not touch on anything relating to that. I am talking about "ebuddy.com", which is no longer in operation.

It had already been sold and is not there; it is about 10 years old and is no longer in operation.

In the module, the students are called upon and encouraged to interact with each other, telling them to share their information including their height and weight. Under those circumstances, will the Hon. Prime Minister take steps to take out not only that particular page, but the entire content in which the children are encouraged to interact with the other children through the Internet platform known as "eBuddy", which is no longer in operation?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, let me repeat. In the lesson, the three paragraphs are given as hypothetical situations. However, given the context and the controversy over that lesson, our assessment is also that it is inappropriate. So, immediately after it came to our knowledge, that particular module was sealed and not delivered to the children. We have obtained approval from the Academic Advisory Board of the National Institute of Education to remove that lesson. That was the recommendation of the Ministry, which was submitted to the Academic Advisory Board of the NIE and was approved. So, that lesson will be removed.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

Sir, the second Supplementary Question will be asked by the Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මේ අක්‍රමිකතාව, මේ අඩුපාඩුව, ඒ කියන්නේ අසභ්‍ය වෙබ් අඩවියක් මොඩියුලයට ඇතුළත් වීම ඇත්ත වශයෙන්ම මහ හරවා ගන්නට තිබුණා, ධවල පත්‍රිකාවක් - White Paper එකක් - Green Paper එකක් හරහා විධිමත් සාකච්ඡාවක්, විධිමත් වැඩ පිළිවෙළක් හරහා කටයුතු කළා නම්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනකොට PowerPoint presentation එකකට සීමා වෙන්නේ නැතුව, පොදු සංවාදයක් තුළ වඩාත් ක්‍රමවත්ව කටයුතු කළා නම්, ඇත්ත වශයෙන්ම මෙවැනි අඩුපාඩු සිදු වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා.

මම මේ කාරණයත් ඔබතුමියගෙන් අහන්න කැමැතියි. එදා White Paper, Green Paper ගැන කියන කොට ඔබතුමියත් ප්‍රකාශ කළා, ඕනෑම පාටක කොළයක මේවා ලියලා දෙන්නම් කියලා. ඇත්ත වශයෙන්ම උගත් තැනැත්තියක් හැටියට ඔබතුමිය දන්නවා, Green Paper, White Paper - ධවල පත්‍රිකාව - කියන්නේ මොනවාද කියන එක. ඇත්තවශයෙන්ම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ නිශ්චිත සංවාදයක්, සාකච්ඡාවක් නොපැවැත්වීම බරපතළ අඩු පාඩුවක් හැටියට අපි දකිනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවෝත්පාදනය සඳහා, අලුත්වීම සඳහා, ලෝකයට ගැළපෙන ආකාරයට ප්‍රතිසංස්කරණය වීම අනිවාර්යයෙන්ම සිද්ධ වෙන්නට ඕනෑ කියලා අපි යෝජනා කරන්න කැමැතියි. හැබැයි, ඒක සිද්ධ වෙනකොට අනිවාර්යයෙන්ම ඉතිහාසය විෂයයත් අනිවාර්යය විෂයයක් වෙමින් අපේකම, රටේකම, ගමේකම, ඉපැරණි සංස්කෘතිය රැක ගනිමින් කටයුතු කළ යුතු වෙනවා. ඇත්තවශයෙන්ම මේ සිද්ධ වෙන වැරදි, අසභ්‍ය වෙබ් අඩවි සඳහන්වීම් මේ සියල්ල මඟහරවා ගනිමින් කටයුතු කරන්න පුළුවන්කම තිබුණා.

මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, ඒ වාගේම යෝජනාවකුත් කරනවා. බැරි ද ආපහු මේක ක්‍රමවත් ආකාරයට කරන්න? PowerPoint presentation එකකට සීමා නොවී ධවල පත්‍රිකාවක් නිර්මාණය කරලා මේ හැම අංශයක් පිළිබඳවම සත්‍ය වශයෙන්ම විශේෂඥයන්ගේ - දැන් ඔබතුමිය කියාගෙන ගියා නේ, විවිධ උදවියගේ කුසලතාව, නිපුණතාව, සුදුසුකම් සියල්ලක්ම. ඒ කොච්චර සුදුසුකම් තිබුණත් මේ අඩු පාඩුව සිද්ධ වුණා. ඒක සිද්ධ වුණේ නිවැරදි සංවාදයක්, නිවැරදි ක්‍රමයක් නොමැතිකම තුළ. එය නිවැරදි කර ගන්නට ඔබතුමිය සූදානම් ද කියලා මම මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සංකල්ප පත්‍රිකාව සාකච්ඡාවට ගත්තා.

ඒක සියලු මන්ත්‍රීවරුන්ට ලබා ගන්න අපි වෙබ් අඩවියට දාලා තිබෙනවා. ඒ පිළිබඳව පාර්ලිමේන්තුව තුළ අපි සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවට සම්බන්ධ වෙන්න කියලා ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා. මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඒ සාකච්ඡාවට සම්බන්ධ වුණා. තවත් ඒ ගැන සාකච්ඡා කරන්න අපි විවෘතයි. ඒ සංකල්ප පත්‍රිකාව පදනම් කරගෙන ඕනෑ අවස්ථාවක ඒක තව දියුණු කරන්න, සාකච්ඡා කරන්න අපි කිසිසේත්ම විරුද්ධ නැහැ. අපි ඒ සංවාදයට විවෘතයි.

ගරු කථානායකතුමනි, ඒ සංකල්ප පත්‍රිකාවේ මේ මොඩියුලයේ අන්තර්ගතය පිළිබඳ කරුණු නැහැ. සංකල්ප පත්‍රිකාවේ තිබෙන්නේ කරන්න යෝජිත ව්‍යුහාත්මක වෙනසේ ඒ framework එක පිළිබඳවයි. මේ සිද්ධිය වාර්තා වූ වහාම අපි ඒ පිළිබඳ විමර්ශනයක් කළා. මොකද, ජාතික අධ්‍යාපන ආයතනයේ මොඩියුල පිළියෙළ කිරීමේ යම් ක්‍රියාපටිපාටියක් - procedure එකක්- තිබෙනවා. ඒ procedure එක violate වුණේ කොහොමද, මේ වාගේ දෙයක් අන්තර්ගත වුණේ කොහොමද, ඒකට වග කිවයුත්තේ කවුද කියන එක පිළිබඳ කරුණු විමසීමේ විමර්ශනයක් අපි ආරම්භ කළා. ජාතික අධ්‍යාපන ආයතනයේ Governing Council එක තමයි ඒ ආයතනයේ විනය පිළිබඳව වග කියන්නේ. ඊයේ ඒ ආයතනය මඟින් හිටපු ලේකම්තුමකු වන රංජිත් ආරියරත්න මැතිතුමා පත් කළා, මූලික විමර්ශන පවත්වන්න. එතුමා රාජ්‍ය සේවයේ ඉඳලා විශ්‍රාම ගිය කෙනෙක්.

මේ procedures violate වෙලා, මේක කොහොමද සිද්ධ වුණේ කියන එක ඒ විමර්ශනයෙන් පුළුල්ව සොයා බලනවා. ගරු කථානායකතුමනි, මේ සිද්ධිය වාර්තා වූ වහාම මම කලින් සඳහන් කළ විධියට මේ පොත seal කළා; ඒ පොත ළමයින්ට බෙදලා නැහැ. ඒ පොතේ තිබුණු ප්‍රශ්නගත lesson එක අයින් කරන්නත් ඊයේ අපට ජාතික අධ්‍යාපන ආයතනයේ Academic Advisory Board එකේ අනුමැතිය ලැබුණා. ඒ අනුව ඒ lesson එක ඒ පොතෙන් අයින් කරනවා. මම ඉල්ලා සිටිනවා, අපි මේ සංවාදය කරනකොට අනවශ්‍ය විධියට ඒ web link එක ප්‍රවර්ධනය කරන විධියට කථා නොකර ඉඳිමු කියලා. මොකද, ඒ lesson එක ළමයින්ට යන එක අපි දැන් නවත්වලා තිබෙන්නේ. ඒ වෙච්ච වැරැද්ද අපි දැකපු නිසා ඒ පිළිබඳ විමර්ශනයක් කරමින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා අතර, ඒ පිළිබඳව අපි කථා කරමු, සංවාද කරමු.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ඒ ක්‍රියාවලිය ශක්තිමත් කරන්නේ කොහොමද කියන එකට යෝජනා තිබෙනවා නම් ඉදිරිපත් කරන්න, අපි ඉතාම සතුටින් ඒවා භාර ගන්නවා. ඒ වාගේම සංකල්ප පත්‍රිකාව පිළිබඳව තවත් සාකච්ඡා කරන්න අවශ්‍ය නම් ඒකටත් අපි විවෘතයි. ඒවා සාකච්ඡා කරන ගමන් මෙවැනි දේවල් තවත් ප්‍රවර්ධනය නොකරන විධියට අපි සාකච්ඡා කරමු කියලාත් මම යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තශාලා: විස්තර
### ஏக்கல தொழிற்பேட்டையிலுள்ள கைத்தொழிற்சாலைகள்: விபரம்
### FACTORIES IN EKALA INDUSTRIAL ZONE: DETAILS

1564/2025

**1. ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඒකල පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සතු කාර්මික ජනපදය තුළ ස්ථාපනය කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙන්, සක්‍රිය තත්ත්වයේ පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතුරින්, වසර 03කට වඩා කාලයක් ක්‍රියාකාරී තත්ත්වයේ නොමැතිව වසා දමා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් කර්මාන්තශාලා සම්බන්ධව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම කර්මාන්තශාලා නැවත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතට ගෙන, අලුතින් කර්මාන්ත ආරම්භ කිරීමට අපේක්ෂා කරන ආයෝජකයන් හට එම භූමිය ලබා දීමේ හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஏக்கலவில் அமைந்துள்ள இலங்கைக் கைத் தொழில் அபிவிருத்திச் சபைக்குரிய கைத் தொழில் பேட்டையில் தாபிக்கப்பட்டுள்ள கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றில் இயங்கும் நிலையில் காணப்படும் தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அத்தகைய தொழிற்சாலைகளில் 03 ஆண்டுகளுக்கும் மேலாக இயங்காத நிலையில் மூடப் பட்டுள்ள கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி (அ)(iii)இல் குறிப்பிடப்பட்ட கைத் தொழிற்சாலைகள் சம்பந்தமாக இலங்கைக் கைத் தொழில் அபிவிருத்திச் சபை மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி கைத்தொழிற்சாலைகளை மீண்டும் இலங்கைக் கைத்தொழில் அபிவிருத்திச் சபை யின் நிருவாகத்துக்குள் கொண்டுவந்து, புதிய கைத்தொழில்களை ஆரம்பிக்க எதிர்ப்பார்க்கும் முதலீட்டாளர்களுக்கு அந்நிலங்களைக் கைய ளிக்க முடியுமா என்பதையும்;

(iii) ஆமெனில், இவ்விடயம் தொடர்பில் மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House the number of factories -
  (i) set up within the Industrial Development Board's Industrial Zone in Ekala;
  (ii) currently in operation; and
  (iii) that have remained closed for more than three years without being in operation?

(b) Will he also inform this House -
  (i) the steps taken by the Industrial Development Board with regard to the factories mentioned in (a) (iii) above;
  (ii) whether there is a possibility of bringing those factories back under the Industrial Development Board and allocating those sites to investors who wish to start new industries; and
  (iii) if so, the measures taken in this regard?

(c) If not, why?

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඒකල පිහිටි කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් කාර්මික ජනපදයේ කර්මාන්තශාලා 57ක් තිබෙනවා.

(ii) ඒවායෙන් මේ වනකොට 56ක් සක්‍රියව ක්‍රියාත්මක වනවා. ඉන් 6ක් සම්පූර්ණ ඵලදායිතාවට ඇවිල්ලා නැහැ. අනෙක් 50ම පූර්ණ ඵලදායිතාවෙන් ක්‍රියාත්මක වනවා.

(iii) ඒ අතරින් කාලාන්තරයක් තිස්සේ ක්‍රියාකාරී නොවන ආයතනයක් තිබෙනවා. විශේෂයෙන්ම වසර එකහමාරක පමණ ඉඳලා U.S.S. Engineering (Pvt.) Limited කියන ආයතනය තමයි වසා දමා තිබෙන්නේ.

(ආ) (i) ඒ කර්මාන්තශාලාව පිළිබඳව මේ වනකොට ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඒ කර්මාන්තශාලාව නැවත ආරම්භ කරන්න කියලා අපි ඉල්ලීමක් කර තිබෙනවා.

එම කර්මාන්තශාලාව නැවත පටන් ගන්න කියලා දැනුවත් කරලා තිබෙනවා. නමුත්, ලබා දී තිබෙන කාල රාමුව ඇතුළත ඒ කටයුතු සිද්ධ වන්නේ නැති තත්ත්වයක් යටතේ අපි දැන් වාචිකව දැනුම් දීලා තිබෙනවා, ඉතාම කෙටි කාලයක් ඇතුළත නීතිමය ක්‍රියාමාර්ගයක් අරගෙන ඒ භූමි ප්‍රමාණය නැවත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතට පත් කරගෙන වෙනත් ආයතනයකට ලබා දෙන්න.

(ii) ඔව්.

(iii) එම භූමිය වෙනත් ආයතනයකට ලබා දීම සඳහා නිදහස් කර ගැනීමේ කටයුතු මේ වන විට සිද්ධ වනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

එතැන කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මෙච්චර කාලයකට එතැන ගිනි නිවීමේ ඒකකයක් හදලා නැහැ. හදිසියේවත් එතැන ගින්නක් ඇති වුණොත්, අපට කොළඹ, ගම්පහ, නැත්නම් මීගමුවේ ගිනි නිවීමේ ඒකකවලට කථා කරන්න වනවා. ඒ අය එතැනට එද්දි ගින්න වටේටම පැතිර තිබෙන්න පුළුවන්. මොකද, ඒක වටේට තිබෙන්නේ ජනාවාස. ඒ කාර්මික ජනපදය වටේට ගම්මාන දෙක තුනක් තිබෙනවා. එතකොට ඒ ගම්මානවලටත් ගින්න පැතිරෙන්න පුළුවන්. ඒ හින්දා මේ සම්බන්ධයෙන් මොකක් හෝ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේක අපේ රටේ තිබෙන බරපතළ ගැටලුවක්. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ කර්මාන්තපුර 34කුත්, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කර්මාන්තපුර 31කුත් තිබෙනවා. ඒ වාගේම BoI එක යටතේත් කර්මාන්තපුර තිබෙනවා. අපේ රටේ කර්මාන්තපුර නිර්මාණය කරද්දි ආරක්ෂාව, නැත්නම් ගිනි නිවීමේ කටයුත්ත සඳහා සැලැස්මක් ඇතුව නොවෙයි ඒවා නිර්මාණය කරලා තිබෙන්නේ. මේ අර්බුදය අපේ හැම කර්මාන්තපුරයකම තිබෙනවා. අපි ඒ අර්බුදය විසඳන්න උත්සාහ කරනවා. ගිය අවුරුද්දේ අපි hydrants ටිකක් හදන්න සූදානම් වුණා. ඒ කියන්නේ, ජලය කළමනාකරණය කරලා water hydrants ටිකක් හදාගන්න. ඒ සඳහා සැලසුමක් නිර්මාණය කරගෙන යනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනත් එක්ක කථා කරලා, ආසන්නවම තිබෙන පළාත් පාලන ආයතනයක් හරහා fire truck එකක් ස්ථානගත කිරීම තමයි මේ අවස්ථාවේ අපට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ඒක ලොකු කර්මාන්තශාලා තිබෙන ප්‍රදේශයක්. එහි පිවිසුම් මාර්ග කිහිපයක් තිබෙනවා. නමුත් ඒ පිවිසුම් මාර්ග ඉතා පටුයි. සමහර තැන්වලින් කන්ටේනර් දෙකකට මාරු වෙන්නත් බැහැ. අශෝකාරාම පාර කියලා එක පිවිසුම් මාර්ගයක් තිබෙනවා. ඒ පිවිසුම් මාර්ගය හොඳටම අබලන් වෙලා තිබෙන්නේ. එම මාර්ගයේ වාහනයකට යන්නවත් බැහැ. ඇත්තටම ඒ මාර්ගයේ අයිතිය තිබෙන්නේ පළාත් පාලන ආයතනයට.

මේ පළාත් පාලන ආයතනවලට මේ පාරවල් නඩත්තු කරන්න බැහැ. ඒ සඳහා විශාල මුදලක් වැය වනවා. ඒ වාගේම රජ මාවත කියලා පාරක් තිබෙනවා. මේ රජ මාවත කියන පාර ඉතාම පටුයි. මේ මාර්ගයේ යම් කිසි ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාවෙන් හදලා තිබෙනවා. ඉතුරු ටික හදාගැනීම සඳහා ඒ කාර්මික ජනපදය යටතේ මොකක් හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද? එහෙම නැත්නම් ඒ සඳහා මොකක් හරි වෙන ක්‍රමයක් හදලා තිබෙනවාද?

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මෙතැන ප්‍රධාන පිවිසුම් මාර්ගයේ ගැටලුවක් නැහැ. අතුරු පිවිසුම් මාර්ගවල තමයි මේ ගැටලු තිබෙන්නේ. කර්මාන්ත අමාත්‍යාංශයට හෝ කාර්මික සංවර්ධන මණ්ඩලයට ප්‍රතිපාදන එන්නේ නැහැ, පිවිසුම් මාර්ග සඳහා. අපට දිගටම ප්‍රතිපාදන ඇවිත් තිබෙන්නේ අභ්‍යන්තර කටයුතු වර්ධනය කිරීම සඳහායි. නමුත් අපි මේ ගැටලුව පිළිබඳව සලකා බලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සහ පළාත් සභාව එක්ක කථා කරලා කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. මේ කර්මාන්තපුරයේ පමණක් නොවෙයි, ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙන තවත් කර්මාන්තපුරවල බාහිරව තිබෙන ගැටලු දෙක - ප්‍රවේශ මාර්ග පිළිබඳ ගැටලුව සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කියන ගැටලුව- පිළිබඳව පොදු වැඩ පිළිවෙළක්, එහෙම නැත්නම් දිස්ත්‍රික් සංවර්ධන වැඩ පිළිවෙළක් හරහා විසඳන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයත්, කර්මාන්ත අමාත්‍යාංශයත් සෘජු මැදිහත්වීමක් කරනවා, මේ වසරේදී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1576/2025- (1), ගරු කිට්නන් සෙල්වරාජ් මහතා.

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සෝමාවතිය ජාතික උද්‍යානයේ මහ බැංකුව විසින් ඉදිකරන ලද නිවාඩු නිකේතන: විස්තර
சோமாவதிய தேசிய வனப் பூங்காவில் மத்திய வங்கியால் நிர்மாணிக்கப்பட்ட விடுமுறை பங்களாக்கள்: விபரம்
HOLIDAY BUNGALOWS BUILT BY CENTRAL BANK IN SOMAWATHIYA NATIONAL PARK: DETAILS

1631/2025

**3.** **ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සෝමාවතිය ජාතික උද්‍යානය මධ්‍යයේ මහ බැංකුව විසින් ඉදිකරන ලද හෝටල් සංකීර්ණ දෙකක් තිබෙන බව දන්නේද;
(ii) එසේ නම්, එහි භාරකාරත්වය දරන්නේ කවුරුන්ද;
(iii) මේ වන විට ඒවා ඉදිකිරීම සඳහා ආයෝජනය කර ඇති මුදල කොපමණද;
(iv) ඒවා මේ වන විට භාවිත කරන්නේද;
(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சோமாவதிய தேசிய வனப் பூங்காவுக்கு மத்தியில் மத்திய வங்கியால் நிர்மாணிக்கப்பட்ட இரண்டு ஹோட்டல் தொகுதிகள் காணப்படுகின் றமையை அறிவாரா என்பதையும்;
(ii) ஆமெனில், அது எவரின் பொறுப்பில் உள்ளது என்பதையும்;
(iii) அவற்றை நிர்மாணிப்பதற்கு இன்றளவில் முதலீடு செய்யப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;
(iv) அவை இன்றளவில் பயன்படுத்தப்படு கின்றனவா என்பதையும்;
(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -
(i) whether he is aware that there are two hotel complexes built by the Central Bank in the middle of the Somawathiya National Park;
(ii) if so, the authority currently in charge of the said hotels;
(iii) the total amount invested to date in the construction of the said hotels;
(iv) whether these hotels are currently being used; and

if not, the reasons for that?

(b) If not, why?

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට අදාළ පිළිතුර සභාගත කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. සෝමාවතිය පාලම ආසන්නයේ ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් නිවාඩු නිකේතන ගොඩනැගිලි දෙකක් ඇත.
(ii) ඉහත සඳහන් ගොඩනැගිලිවල භාරකාරත්වය දරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.
(iii) 2010දී ඉහත ඉදිකිරීම් දෙක සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වැය කළ මුළු වියදම රු.50,606,995ක් වේ.
(iv) ඔව්. ඉහත ගොඩනැගිලි දෙක ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවාඩු නිකේතන ලෙස මේ වන විටත් භාවිත වේ.
(v) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

## ජාතික ශිෂ්‍යභට බලකාය පිහිටුවීම: අරමුණු
தேசிய பயிலிளவல் படையணியின் ஸ்தாபிப்பு: நோக்கங்கள்
ESTABLISHMENT OF NATIONAL CADET CORPS: OBJECTIVES

1635/2025

**4.** **ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ශිෂ්‍යභට බලකාය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති පනත කවරේද;
(ii) එය පිහිටුවීමේ අරමුණු කවරේද;
(iii) ජාතික ශිෂ්‍යභට බලකායට අනුබද්ධව සේවය කරන ශිෂ්‍යභට නිලධාරීන් සංඛ්‍යාව සහ ඉන් සක්‍රිය සේවය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිදහස් කර ඇති නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) මේ වන විට ශිෂ්‍යභට ක්‍රියාකාරකම් සිදු කරන පාසල් සංඛ්‍යාව සහ ශිෂ්‍ය භට කණ්ඩ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(v) අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වර්තමාන අවශ්‍යතාවලට අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ ක්‍රියාකාරකම් නවීකරණය කර තිබේද;
(vi) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய பயிலிளவல் படையணி தொடர்பாக இலங்கையில் நிறுவப்பட்டுள்ள சட்டம் யாது என்பதையும்;

(ii) அது நிறுவப்பட்டதன் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) தேசிய பயிலிளவல் படையணியில் இணைக்கப் பட்டு சேவையாற்றுகின்ற பயிலிளவல் படையணி அலுவலர்களின் எண்ணிக்கையும் அவற்றில் முனைப்பான சேவைக்குக் கல்வி அமைச்சால் விடுவிக்கப்பட்டுள்ள அலுவலர் களின் எண்ணிக்கையும் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) இன்றளவில் பயிலிளவல் செயற்பாடுகளை மேற் கொள்கின்ற பாடசாலைகளின் எண்ணிக்கையும் பயிலிளவல் படையணிகளின் எண்ணிக்கையும் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) எதிர்பார்க்கப்பட்ட நோக்கங்களை நிறைவேற்று வதற்கு தற்போதைய தேவைகளுக்கமைய தேசிய பயிலிளவல் படையணியின் செயற்பாடுகள் நவீனமயப்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில், அது எவ்விதத்தில் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the Act under which the National Cadet Corps was established in Sri Lanka;

(ii) the objectives for the establishment of it;

(iii) separately, the number of cadet officers currently serving under the National Cadet Corps and the number of officers released by the Ministry of Education for active service;

(iv) separately, the number of schools carrying out cadet activities and the total number of cadet units to date;

(v) whether the activities of the National Cadet Corps are being modernized according to the current needs to achieve the desired objectives; and

(vi) if so, such manner?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1985 අංක 40 දරන මිනිස් බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනත.

(ii) මිනිස් බලය උපයෝගී කර ගැනීම පිණිස නිසි බලධරයකු පත් කිරීම සඳහා ද, ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතයට අනිවාර්යයෙන් සහ ස්වේච්ඡාවෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියම කිරීම සඳහා ද, මිනිස් බල සංචිත කාර්යභාර මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, ජාතික සන්නද්ධ මිනිස් බල සංචිතය, ජාතික ශිෂ්‍යභට බලකාය, ජාතික සහායක හමුදාව සහ අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් පරිපූරක හමුදාවන් ද බඳවා ගැනීම සහ පවත්වා ගෙන යෑම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

(iii) ජාතික ශිෂ්‍යභට බලකායට අනුබද්ධව සේවය කරන ශිෂ්‍යභට නිලධාරි සංඛ්‍යාව - 3,092යි.

සක්‍රිය සේවය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් නිදහස් කර ඇති නිලධාරි සංඛ්‍යාව - 148යි. (2025.12.05 දිනට)

(iv) ශිෂ්‍යභට ක්‍රියාකාරකම් සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව 2,256යි.

දැනට ක්‍රියාකාරී ශිෂ්‍යභට ඛණ්ඩ සංඛ්‍යාව 4,599යි.

(v) ජාතික ශිෂ්‍යභට බලකායේ ක්‍රියාකාරකම් නවීකරණය කිරීමට අපි සැලසුම් කර තිබෙනවා.

විශේෂයෙන්ම දැනටත් ඒවා නවීකරණය කිරීමට පටන්ගෙන තිබෙනවා.

(vi) 1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා සහ පරිපූරක හමුදා පනතට සංශෝධන සිදු කිරීම තුළින් උක්ත ක්‍රියාකාරකම් නවීකරණය කිරීමට අපේක්ෂිතයි.

නව පරම්පරාවට ගැළපෙන පරිදි පුහුණු කාලසටහන් වෙනස් කිරීම තුළින් වැඩි ශිෂ්‍ය භටයින් ප්‍රමාණයක් රන්ටැඹේ සහ මුලතිව් පුහුණු කඳවුරුවලට යොමු කිරීමටත්, ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වැඩි කාල සීමාවක් වෙන් කිරීමටත්, කඳවුරුවලදී ශිෂ්‍ය භටයෙකුට දරන්න වන වියදම් අඩු කිරීම සඳහා ඇගැයීම් ක්‍රමය වෙනස් කිරීමටත්, ඒ වාගේම ස්වකීය පාසලේම ගුරුවරුන්ට ශිෂ්‍යභට කණ්ඩායම්වල භාරකරුවන් ලෙස ඉඩ ප්‍රස්ථා සලසා දීමටත්, විශේෂයෙන්ම ශිෂ්‍යභට ජාතික ක්‍රීඩා තරගාවලිය නැවත ආරම්භ කිරීමටත්, - පසුගිය දෙසැම්බර් මාසයේ යාපනයේ තමයි එය පවත්වන්න තිබුණේ. අයහපත් කාලගුණික තත්ත්වය නිසා ඒක කල් දැමුවා - පවත්වාගෙන ආ විෂය නිර්දේශ සඳහා තාක්ෂණය අනුබද්ධ කිරීමටත් කටයුතු කරමින් යනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු කථානායකතුමනි, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වනවා, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම වෙනුවෙන්.

ගරු කථානායකතුමනි, ජාතික ශිෂ්‍යභට බලකාය කියන්නේ, අපේ රටේ අවුරුදු 144ක පමණ කීර්තිමත් ඉතිහාසයක් තිබෙන සංවිධානයක්. ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා පැවසූ ආකාරයට අපේ රටේ පාසල් ඇතුළේ ඉන්න ශිෂ්‍ය ප්‍රජාව අනාගත අභියෝගවලට මුහුණ දෙන්න පුළුවන් විධියේ වඩා පරිපූර්ණ, යෞවන මානව සම්පතක් විධියට ගොඩනඟා ගැනීමේ අරමුණින් තමයි මේ ශිෂ්‍යභට බලකාය ක්‍රියාත්මක වන්නේ.

[ගරු රුවන් විජේවීර මහතා]

ජාතික ශිෂ්‍යභට බලකායේ කොඳු නාරටිය විධියට කටයුතු කරන්නේ ඒ පාසල්වල ඉන්න ශිෂ්‍යභට නිලධාරින්. ශිෂ්‍යභට නිලධාරින් විධියට තේරී පත් වෙන්නේ ජාතික ශිෂ්‍යභට බලකායේ කෙඩෙට් නිලධාරියෙකු විධියට නිශ්චිත පුහුණුවක් ලබන පාසල්වල ඉන්න ගුරුවරුන්. ඒ නිලධාරින්ට අනෙක් විෂය බාහිර ක්‍රියාකාරකම් වාගේ නොවෙයි, මේ විෂය බාහිර ක්‍රියාකාරකම අවුරුද්ද පුරාවටම ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ගණ සරඹ, ශාරීරික අභ්‍යාස සහ දේශන ආශ්‍රිතව අවුරුද්ද පුරා විහිදී යන ක්‍රියාකාරකම් මාලාවක් තිබෙනවා. ඒ වාගේම එක්දින, දෙදින සහ සත්දින කඳවුරුවලටත් මේ නිලධාරින්ට සහභාගි වෙන්න සිදු වෙනවා. ඒ ශිෂ්‍යභට නිලධාරින් පාසල් ගුරුවරු විධියට ඒ හැම දෙයම කරන්නේ පාසල් විෂය නිර්දේශයත් ආවරණය කරන ගමන්. එතැනදී කිසිම වරප්‍රසාදයක් ඒ ගුරුවරුන්ට ලැබෙන්නේ නැහැ.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ශිෂ්‍යභට නිලධාරින්ට පාසල්වල ශිෂ්‍යභට කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා, ඒ පාසල්වල ශිෂ්‍යභට කණ්ඩයේ විනය සහ සියලු කාරණා අපේක්ෂිත අරමුණු දක්වා මුදුන්පත් කර ගැනීමට. වර්තමානය වනවිට පවතින සමාජ, ආර්ථික වටපිටාව ඇතුළේ ශිෂ්‍යභට නිලධාරින් වැඩි ප්‍රමාණයක් මේ ශිෂ්‍යභට ක්‍රියාකාරකම්වලින් ඇත්වීමක් සිදු වෙනවා. මේ ශිෂ්‍යභට නිලධාරින් තවදුරටත් ශිෂ්‍යභට බලකායට ආකර්ෂණය කර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග සහ වැඩ පිළිවෙළ කුමක්ද කියන එක ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය ඇසීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. ඔබතුමා ඇහුවේ වැදගත් ප්‍රශ්නයක්. ඒ විධියේ විශාල ප්‍රශ්නයක් තිබුණා. දැනට ආධුනික නිලධාරින් ලෙස පාඨමාලාවලට සහභාගි වන අයට නිල ඇඳුම් නොමිලයේ ලබා දෙන්නත්, දිරිගැන්වීමක් හැටියට අවශ්‍ය පුහුණු උපකරණ ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම සක්‍රිය සේවයේ නොවන නිලධාරින්ටත් අපි කඳවුරු දීමනාව හැටියට උපරිම වශයෙන් රුපියල් දාහක් ලබා දෙන්න අදහස් කරලා තිබෙනවා. ඒකත් අපි නිර්දේශ කරලා තිබෙනවා. ඒකත් යම්කිසි දිරිගැන්වීමක්. ඒ වාගේම දිරිගැන්වීමක් හැටියට විදේශ සංචාර සඳහාත් ඔවුන් යොමු කරන්න කටයුතු කරනවා. වැඩි පුහුණුවක් ලබා දීලා හොඳ දායකත්වයක් ලබා ගැනීම කියන කාරණයත් අපි සැලකිල්ලට භාජන කරලා තිබෙනවා. පුහුණු කඳවුරුවල යටිතල පහසුකම් තවත් වැඩිදියුණු කළාම ඔවුන්ගේ පුහුණුවීම්වලටත් විශාල දායකත්වයක් ලැබෙනවා. ඒ වාගේම වාර්ෂිකව නිල ඇඳුම් දීමත් අපි සැලකිල්ලට භාජන කරලා තිබෙනවා. ඒවාට ප්‍රතිපාදන වෙන් කිරීමටත් අපි කටයුතු කරලා තිබෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පාසල් ශිෂ්‍යභට කටයුතු කරන නිලධාරින් අතර, විශේෂයෙන්ම සක්‍රිය සේවය සඳහා නිශ්චිත වශයෙන් ජාතික ශිෂ්‍යභට බලකායට සහ ත්‍රිවිධ හමුදාවට අනුයුක්තව කටයුතු කරන නිලධාරින් සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. පාසල්වලින් ඉවත් වෙලා සක්‍රියව ඒ කටයුතු කරන නිලධාරින් කොටසක් ඉන්නවා.

පාසල්වල ගුරුවරු වශයෙන් කටයුතු කරලා සක්‍රිය සේවයට යෑමේ ක්‍රියාවලියක් තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තමයි එම නිදහස් කිරීම සිදු වෙන්නේ. නමුත්, වර්තමානය වනකොට සැලකිය යුතු ශිෂ්‍යභට නිලධාරින් ප්‍රමාණයක් සක්‍රිය සේවය සඳහා mobilize වෙන්න, සක්‍රිය සේවය සඳහා අන්තර්ග්‍රහණය වෙන්න ඉල්ලුම් කරලා තිබෙනවා වාගේම සුදුසුකම් ලබාගෙන ඉන්නවා. නමුත්, ඒ නිලධාරින් සැලකිය යුතු ප්‍රමාණයක් තවමත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිදහස් කර ගැනීමේ ගැටලුවක් මතු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. එම නිලධාරින් සක්‍රිය සේවයට නිදහස් කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග තිබෙනවාද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, පාසල්වලත් ගුරු හිඟයක් තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ වාගේම ශිෂ්‍යභට බලකායට ස්ථිරවම බඳවා ගන්න අවශ්‍යතාවකුත් තිබෙනවා. අපි ඒ ගැනත් සැලකිලිමත් වනවා. ඒ කාරණා දෙකටම සාධාරණයක් වෙන විධියට ගුරු සේවයට යම් පිරිසක් මුදා හැරීමටත්, ගුරු සේවයට අලුතින් එන නිලධාරින් ඒ සඳහා අනුයුක්ත කර ගැනීමේ වැඩ පිළිවෙළක් ගැනත් අපි සාකච්ඡා කරමින් සිටිනවා. කාටත් පොදුවේ සාධාරණයක් වෙන්න අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරුවරු එක්ක සාකච්ඡා කරලා, ප්‍රතිපත්ති සංශෝධනය කරගෙන ඉදිරියේදී ඒ අනුව ක්‍රියා කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම ජාතික ශිෂ්‍යභට බලකායට අදාළ පනත සංශෝධනය කරන්නත් අපි කටයුතු කරගෙන යනවා. ඒකෙනුත් මේ කටයුතුවලට ලොකු සාධාරණයක් ඉෂ්ට වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

## පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාර: PTA යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයන්
## உயிர்த்த ஞாயிறு பயங்கரவாதத் தாக்குதல்: PTAஇன் கீழ் கைது செய்யப்பட்டோர்
## EASTER SUNDAY TERRORIST ATTACKS: PERSONS ARRESTED UNDER PTA

1639/2025

**5. ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර සම්බන්ධයෙන්, 2019 අප්‍රේල් 21 සිට 2022 අප්‍රේල් 21 දක්වා කාලය තුළ, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද රැඳවුම් නියෝග යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන් සංඛ්‍යාවෙන් මේ දක්වා අධිකරණයක් ඉදිරියේ චෝදනා එල්ලවී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැඳවියන් අතරින් චෝදනා පත්‍රයක් පිරවීමකින් තොරව නිදහස් කර ඇති රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම නිදහස් කරන ලද රැඳවියන් අතරින් මාස තුනක් (03) දක්වා, වසරක් (01) දක්වා, වසර එකහමාරක් (1 ½) දක්වා සහ මාස දහඅටකට (18) වැඩි කාලයක් රඳවා තබා ගැනීමේ සහ/හෝ අධිකරණ නියෝග යටතේ සිටි පුද්ගලයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1979ஆம் ஆண்டின் 48ஆம் இலக்க, பயங்கரவாதத் தடுப்பு (தற்காலிக ஏற்பாடுகள்) சட்டத்தின்கீழ், சனாதிபதி பிறப்பித்த தடுப்பு உத்தரவுகளின் பிரகாரம் உயிர்த்த ஞாயிறு பயங்கரவாதத் தாக்குதல்களுடன் தொடர்புடைய, 2019 ஏப்பிரல் 21 முதல் 2022 ஏப்பிரல் 21 வரையான காலப்பகுதியில் கைதுசெய்யப்பட்டுத் தடுத்துவைக்கப்பட்டவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இக்குறித்த நபர்களில், இன்றுவரை நீதிமன்றத்தின்முன் குற்றவாளிகளாகக் காணப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) குற்றப்பத்திரிகை தாக்கல் செய்யப்படாமல் தடுத்துவைக்கப்பட்டு விடுவிக்கப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) அவ்வாறு தடுத்துவைக்கப்பட்டு விடுவிக்கப்பட்டுள்ளவர்களில் மூன்று (03) மாதங்கள் வரை, ஒரு (01) வருடம் வரை, ஒன்றரை (1½) வருடங்கள் வரை மற்றும் பதினெட்டு (18) மாதங்களுக்கும் மேலாகத் தடுப்பு மற்றும்/அல்லது நீதிமன்ற உத்தரவுகளின்கீழ் உள்ளவர்களின் எண்ணிக்கை எத்தனை என்பதை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House the number of -

(i) persons arrested and detained under detention orders issued by the President under the Prevention of Terrorism (Temporary Provisions) Act, No. 48 of 1979, during the period from 21st April, 2019 to 21st April, 2022 in connection with the Easter Sunday terrorist attacks;

(ii) persons who have been charged before a court of law to date, out of the said number of persons;

(iii) said detainees who have been released without the filling of a charge sheet; and

(iv) persons who were held under detention and/ or court orders for up to three (03) months, upto one (01) year, upto one-and-a-half (1 ½ ) years and for more than eighteen (18) months from among those who were released, separately?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

Hon. Speaker, although I wanted to seek seven more days to answer this Question, I am prepared to answer it now.

(අ) (i) රැඳවුම් නියෝග යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ඇති පුද්ගලයින් සංඛ්‍යාව 540කි.

(ii) • මේ දක්වා අධිකරණයක් ඉදිරියේ චෝදනා එල්ල වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව 88කි.

• නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කළ ගොනු සංඛ්‍යාව 34කි.

(iii) එම රැඳවියන් අතරින් චෝදනා පත්‍රයක් පිරවීමකින් තොරව නිදහස් කර ඇති රැඳවියන් සංඛ්‍යාව 418කි.

(iv) එම නිදහස් කරන ලද රැඳවියන් අතරින්,

• මාස තුනක කාලයක් රඳවා තබා ගත් පුද්ගලයන් සංඛ්‍යාව - 93

• වසරක කාලයක් රඳවා තබා ගත් පුද්ගලයන් සංඛ්‍යාව - 165

• වසර එකහමාරක කාලයක් රඳවා තබා ගත් පුද්ගලයන් සංඛ්‍යාව - 94

• මාස දහඅටකට වැඩි කාලයක් රඳවා තබා ගත් පුද්ගලයන් සංඛ්‍යාව - 66

(ආ) පැන නොනඟී.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුරු ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසු පාස්කු ප්‍රහාරයට අදාළව රැඳවුම් නියෝග ලබා දී තිබෙන්නේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට පමණක් වන අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලද, 2019 ඔබතුමා අණ දෙන නිලධාරි ලෙස සිටි වකවානුව තුළ ඔබතුමාගේ පාලනය යටතේ හිටපු හමුදා බුද්ධි නිලධාරීන් හතරදෙනෙකුගේ නම් ද සඳහන් කර තිබුණත්, අද දක්වා ඔවුන් සඳහා රැඳවුම් නියෝගයක් ලබා ගෙනත් නැහැ, ඔවුන් අත්අඩංගුවට අරගෙනත් නැහැ. ඒකට විශේෂ හේතුවක් තිබෙනවාද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම දැනටත් ඒ සම්බන්ධ පරීක්ෂණ කටයුතු කරගෙන යන නිසා ඒ ප්‍රශ්නයට ඉඳුරාම පිළිතුරක් ලබා දීමේ අපහසුතාවක් තිබෙනවා. අපි මේ ඉදිරිපත් කරපු කරුණු සියල්ලක්ම දැනට වසර ගණනකට කලින් - අපි බලයට පැමිණෙන්න කලින් - සිද්ධ වෙච්ච දේවල්. අපි බලයට පත් වුණාට පසු අත්අඩංගුවට අරගෙන තිබෙන ඒ පොලිස් නිලධාරීන් දෙදෙනාට සම්බන්ධ වැඩි විස්තර ප්‍රකාශ කිරීම සඳහා විෂයභාර අමාත්‍යතුමා වශයෙන් මහජන ආරක්ෂක ඇමතිතුමාට මම ආරාධනා කරනවා. ඔබතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුර වශයෙන් කියන්න තිබෙන්නේ එම කාරණය තමයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් අසනු ලබනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට සම්බන්ධ වැදගත්ම කෙනෙක් වන සහරාන්ගේ කණ්ඩායමේ හිටපු සාරා ජස්මින් ගැන ඔබතුමන්ලා දන්නවා. 2020 අවුරුද්දෙන් පසු ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා යටතේ පවත්වපු තුන්වැනි පරීක්ෂණයේදී ඒගොල්ලන් තහවුරු කරන්න උත්සාහ කළා, සාරා ජස්මින් මැරුණා කියලා. නමුත්, අපි සියලුදෙනාම පිළිගන්නවා, සාරා ජස්මින් මැරුණේ නැහැ පලා ගියා, එහෙම නැත්නම් ඇයට පලා යන්න යම් කණ්ඩායමක් උදවු කළාය කියන එක. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි. සාරා ජස්මින් මැරුණේ නැහැයි කියන එක ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් පිළිගන්නවා. විශේෂයෙන්ම DNA පරීක්ෂණවල අවුලක් තිබුණාය කියන එක අපි සියලුදෙනාම දන්නවා. යම් කණ්ඩායමක් උත්සාහ කළා, ඇය මැරුණාය කියන එක තහවුරු කරන්න. අපි දන්නවා, අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් විපක්ෂයේ ඉන්නකොට සාරා ජස්මින් ඉන්දියාවේ ඉන්නවාය කියන එක තහවුරු කරලාම කිව්ව බව. ඒවා අපි පිළිගන්නවා. ඇය ජීවතුන් අතර ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නැඟෙනහිර පළාතේ ආඥාපති වෙලා හිටපු කාලයේ තමයි මේ බෝම්බ ප්‍රහාර සිද්ධිය සිද්ධ වුණේත්, සාරා ජස්මින් පලා ගියේත්.

අපි දන්නවා, පාතාල ලෝකයේ හුඟක් උදවිය පිට රටවල ඉන්න බව. පිට රටවල ඉන්න ඒ පාතාලයේ උදවිය ගෙන්වා ගන්න ඔබතුමන්ලා උසාවියෙන් විවෘත වරෙන්තු ගන්නවා. දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක කාලයක් ගත වෙලා. ඇයි සාරා ජස්මින්ට එරෙහිව විවෘත වරෙන්තුවක් ගන්නේ නැත්තේ, එයා කොහේ හරි ඉන්නවා නම්?

ඔබතුමන්ලා දැන් ඉන්දියාව එක්කත් ළඟින් වැඩ කරන හින්දා, අඩුම ගාණේ ඉන්දියානු ආණ්ඩුව එක්ක ඒ ගැන සාකච්ඡා කළේ නැද්ද? ඉන්දියානු ආරක්ෂක ලේකම්තුමා මේ රටට ආවා, විදේශ ලේකම්තුමා මේ රටට ආවා, මෝදි අගමැතිතුමා අපේ ජනාධිපතිතුමා හම්බ වුණා. ඒ සාකච්ඡාවලදීවත්, සාරා ජස්මින් ඉන්දියාවේ ඉන්නවා නම් ඇය ගෙන්වා ගැනීම පිළිබඳ මූලික සාකච්ඡාවක් ගියාද, නැද්ද?

අනෙක් ප්‍රශ්නය මේකයි. ඇයි තවම විවෘත වරෙන්තුවක් ගන්නේ නැත්තේ, සාරා ජස්මින් සොයා ගන්න?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ඒකට පිළිතුර ලබා දීමට මම ආරාධනා කරනවා මහජන ආරක්ෂක ඇමතිතුමාට.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, පාස්කු ප්‍රහාරය පිළිබඳව විමර්ශන සිද්ධ වෙමින් පවතිනවා සහ සාරා ජස්මින් මිය ගියේ නැති බවට යම් යම් තොරතුරු මේ වෙනකොට අනාවරණය වෙලා තිබෙනවා විමර්ශන ආශ්‍රයෙන්. අපට කිසිදු තොරතුරක් වාර්තා වෙලා නැහැ ඉන්දියාවේ සාරා ජස්මින් ඉන්නවා කියලා. නමුත් දිගින් දිගටම විමර්ශන පැවැත්වෙනවා වාගේම, පාස්කු ප්‍රහාරයට සම්බන්ධ පෙර තොරතුරු අනුව අධිකරණ ක්‍රියාමාර්ගත් මේ වෙනකොට අරගෙන තිබෙනවා. පාස්කු ප්‍රහාරයට අදාළව කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වුයේද යන්න පිළිබඳ විමර්ශන තමයි නව රජය යටතේ ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඒක ගැඹුරු විමර්ශනයක්. ඒ විමර්ශනය සිද්ධ වෙමින් පවතිනවා. සමහර කාරණා විමර්ශනයට බාධාවක් නිසා මම පාර්ලිමේන්තුවේදී ඒ කාරණා හෙළි කරන්න අදහස් කරන්නේ නැහැ. විමර්ශන සිද්ධ වෙනවා. අවශ්‍ය නම් ඒ වරෙන්තුව ගන්න අනාගතයේදී කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මඩකලපුව දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව මුහුණ දෙන ඉඩම් ගැටලු
### மட்டக்களப்பு மாவட்ட முஸ்லிம் மக்கள் எதிர்கொள்ளும் காணிப் பிரச்சினைகள்
### LAND ISSUES FACED BY THE MUSLIM COMMUNITY IN BATTICALOA DISTRICT

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரின் கவனத்திற்குக் கொண்டுவருவதற்காக எனது கேள்வியைக் கேட்க விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் வாழுகின்ற முஸ்லிம் மக்கள் காணி மற்றும் அரச நிருவாக ரீதியாக நாள்தோறும் பல்வேறுபட்ட பிரச்சினைகளைச் சந்தித்து வருகின்றார்கள் என்பதையும், குறிப்பாக வாகரை வடக்கு பிரதேச செயலகத்துக்குட்பட்ட பிரிவில் வாழும் மக்கள் அதிகமான பிரச்சினைகளை எதிர்கொண்டு வருகின்றார்கள் என்பதையும் கடந்த காலங்களில் இந்த உயரிய சபையில் நான் பேசியிருந்ததை நினைவுகூர விரும்புகின்றேன்.

காரமுனை 211G என்பது வாகரை வடக்குப் பிரதேச செயலகத்துக்குட்பட்ட மாங்கேணி தெற்கு கிராம சேவையாளர் பிரிவில் காணப்படுகின்றதொரு கிராமமாகும். 1952ஆம் ஆண்டு முதல் முஸ்லிம்கள் அங்கு வசித்து வந்துள்ளார்கள் என்பதற்கான தெளிவான வரலாற்று ஆவணமும் உள்ளது. அந்தக் கிராமத்தில் கிட்டத்தட்ட 200 வருடங்கள் பழமையான ஒரு முஸ்லிம் அடக்கஸ்தலம் அமைந்துள்ளது. இருந்த போதிலும் உள்நாட்டில் ஏற்பட்ட மிகப் பயங்கரமான யுத்த சூழ்நிலை காரணமாக விடுதலைப் புலிகளால் அம்மக்கள் பலவந்தமாகப் பூர்வீக மண்ணிலிருந்து விரட்டியடிக்கப்பட்டு வெளியேற்றப்பட்டார்கள். அதனால், அவர்களிடமிருந்த ஆவணங்களும் தொலைந்துவிட்டன.

கௌரவ சபாநாயகர் அவர்களே, அங்கிருந்து வெளியேற்றப்பட்டபோது அவர்கள் தமது சொந்த வீடுகளையும் தாம் மேற்கொண்ட விவசாயம், கால்நடை

வளர்ப்பு, மேட்டுநிலப் பயிர்ச்செய்கை போன்ற வாழ்வாதாரங்களையும் முற்றிலும் இழந்தார்கள். அவர்களின் பொருளாதாரம் சூறையாடப்பட்டது. அத்துடன், தமது அன்புக்குரிய பல உயிர்களையும் இழந்த அவர்கள், பலவந்தமாக வேறு இடங்களில் வசிக்க வேண்டிய நிலைமையேற்பட்டது. இலங்கையினுடைய உள்நாட்டு யுத்தம் முடிவடைந்ததன் பின்னர், 2009ஆம் ஆண்டு அம்மக்கள் தமது பூர்வீக இடமான காரைமுனைக் கிராமத்தில் மீண்டும் குடியேறினார்கள்.

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர் அவர்களே, 1956ஆம் ஆண்டு விவசாய நிலங்களுக்கு வழங்கப்பட்ட ஒப்பந்தங்களுக்கு உறுதிகளை வழங்க நடவடிக்கை எடுப்பதாகக்கூறி, 1983ஆம் ஆண்டு வாகரைப் பிரதேச செயலகத்தினால் பொது மக்களிடமிருந்த ஒப்பந்தங்கள் மீளப் பெற்றுக் கொள்ளப்பட்டதுடன் அவற்றைப் பெற்றுக்கொண்டமைக்கான பற்றுச்சீட்டும் வழங்கப்பட்டிருக்கின்றது. சுமார் 75 ஏக்கர் விவசாயக் காணிகளுக்கு மாத்திரம் பழைமையான ஒப்பந்தம் காணப்படுகின்றது. இதுவரைக்கும் புதிதாக விவசாய நிலங்களுக்கு ஒப்பந்தங்கள் வழங்கப்படவில்லை. அண்ணளவாக 700 ஏக்கருக்கும் மேற்பட்ட அவ்வாறான விவசாயக் காணிகள் காணப்படுகின்றன. 2011, 2012, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் 100க்கும் மேற்பட்ட காரமுனை மக்கள் காணிக் கச்சேரிக்கு விண்ணப்பித்தும் இதுவரைக்கும் அவர்களுக்கான காணிக் கச்சேரி நடாத்தப்படவில்லை. வாகரைப் பிரதேச செயலகத்தினால் இதுவரைக்கும் நடாத்தப்பட்ட சுமார் 9 காணிக் கச்சேரிகள்மூலம் 3,450 பேருக்குக் காணி அனுமதிப் பத்திரம் வழங்கப்பட்டுள்ளது. அதில் ஓர் அனுமதிப்பத்திரம்கூட காரைமுனை முஸ்லிம்களுக்கு வழங்கப்படவில்லை. இத்தகவலானது, குறித்த பிரதேச செயலகத்திலிருந்து தகவல் அறியும் உரிமைச் சட்டத்தினூடாக கடந்த மாதம் பெற்றுக் கொள்ளப்பட்டது.

கௌரவ சபாநாயகர் அவர்களே, காணி அனுமதிப்பத்திரம் இன்மையினால் பிரதேச செயலகத்தில் தத்தமது நிருவாக ரீதியான தேவைகளை நிறைவு செய்வதற்கும் அரச உதவிகளைப் பெறுவதற்கும் பல்வேறுபட்ட அசௌகரியங்களைப் பரம்பரை பரம்பரையாக எதிர்கொண்டு வாழவேண்டிய துர்ப்பாக்கிய நிலைக்கு காரைமுனை மக்கள் தள்ளப்பட்டிருக்கின்றார்கள். ஒரு மின்சார இணைப்பைப் பெற்றுக்கொள்ள விண்ணப்பிப்பதற்காக, பல மாதங்களாக அலைந்து திரிந்தாலும் பிரதேச செயலகத்தின் கடிதத்தைப் பெற்றுக்கொள்ள முடியாமலிருக்கிறார்கள். யுத்த காலத்தில் மக்களால் வேளாண்மைக்கு - பயிர்ச்செய்கைக்கு - உட்படுத்தப்பட்ட காணியென்று வாகரை பிரதேச செயலாளர் பிரிவில் அடையாளப்படுத்திய சுமார் 2,000 ஏக்கர் காணியை விடுவிப்பதற்குத் தேவையான நடவடிக்கைகள் பற்றி பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்தில் தீர்மானம் எடுக்கப்பட்டதாக அறிய முடிகின்றது. ஆனால், யுத்தத்துக்கு முன்னர் பரம்பரை பரம்பரையாக - காலம் காலமாக - வசித்த மக்களுடைய அபிவிருத்தி செய்யப்பட்ட காணியை விடுவிப்பதற்குத் தேவையான எந்த நடவடிக்கைகளும் இதுவரை வாகரை பிரதேச செயலகத்தினால் மேற்கொள்ளப்படவில்லை. இவ்வாறு அபிவிருத்தி செய்யப்பட்ட காணியை விடுவிக்காததால் Department of Forest Conservationஇனால் பல்வேறுபட்ட பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள்.

மட்டக்களப்பு மாவட்ட முஸ்லிம்களின் காணிப் பிரச்சினைகள் தொடர்பாக ஒக்ரோபர் மாதம் 21ஆம் திகதி - கிட்டத்தட்ட 3 மாதங்களுக்கு முன்னர் - இந்த உயரிய சபையில் நான் கேள்வி எழுப்பியபோது, காணி ஆணையாளர் ஊடாக ஒரு விசேட குழுவை நியமித்து, அக்காணிப் பிரச்சினைகளுக்குத் தீர்வைப் பெற்றுத் தருவதாக கௌரவ காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர் அவர்கள் சபையில் குறிப்பிட்டதை நான் இச்சந்தர்ப்பத்தில் கூற விரும்புகின்றேன்.

ஆகவே, கௌரவ காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர் அவர்களே, காணி ஆணையாளர் நாயகத்தினூடாக மூன்று பேர் கொண்டதொரு குழுவை நியமித்து, இதனோடு மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற ஏனைய காணிகள் சம்பந்தமான பிரச்சினைகளையும் ஆராய்ந்து ஓர் அறிக்கையைச் சமர்ப்பிப்பதற்கு நீங்கள் உடனடியாக நடவடிக்கை எடுப்பீர்களா? எனக் கேட்க விரும்புகின்றேன். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශයට අදාළව ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරනු ලැබුවේ. ඒ වාගේම එතුමා දිගින් දිගටම මේ පිළිබඳව ප්‍රශ්න කරමින් සිටිනවා. අපි මේ වෙනකොට එතුමා ඒ ප්‍රදේශයට අදාළව කලින් ඉදිරිපත් කරපු ප්‍රශ්න පිළිබඳ වාර්තාවක් සකස් කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය විධියට ඉඩම් කොමසාරිස්තුමා එක්ක සාකච්ඡා කරමින් තිබෙනවා.

එතුමා අද ඉදිරිපත් කරපු ප්‍රශ්නයට අදාළවත් අපි අමාත්‍යාංශය විධියට ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගැනීමට සූදානම් කියන පිළිතුර තමයි ලබා දෙන්නේ. ඒකට අවශ්‍ය ඔබතුමාගේ පෞද්ගලික මැදිහත්වීම එක්ක අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන සුදුසු සැලැස්මක් සකස් කර ගනිමු කියන යෝජනාව කරනවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට committee එකක් පත් කරන්න පුළුවන්ද? ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා හරහා තුන්දෙනෙක් හෝ නම් කරලා committee එකක් පත් කරලා මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න. ඒක තමයි මම ඉල්ලන්නේ. ඔබතුමා එහෙම පත් කරනවා කියලා, ඔක්තෝබර් මාසයේ මේ පාර්ලිමේන්තුවේදී මට පොරොන්දුවක් දුන්නා. ඒ committee එක පත් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, අපි දැනට මේ පිළිබඳව අදාළ නිලධාරින් එක්ක සාකච්ඡා කරමින් සිටිනවා. අපි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ඉක්මනින් අවශ්‍ය මැදිහත්වීම් කරලා, ඒ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවාය කියන පණිවුඩය මේ අවස්ථාවේදී ලබා දෙන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

# II

## වට්ටක්කච්චි කෘෂිකර්ම පාසල සහ ගොවිපළ නැවත ආරම්භ කිරීම
## வட்டக்கச்சி விவசாயப் பாடசாலையையும் பண்ணையையும் மீள ஆரம்பித்தல்
## RECOMMENCEMENT OF VADDAKKACHCHI AGRICULTURE SCHOOL AND FARM

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டி. லால் காந்த அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

இலங்கையில் 1950களில் கண்டி மாவட்டத்தின் குண்டசாலை, யாழ்ப்பாண மாவட்டத்தின் திருநெல்வேலி, கிளிநொச்சி மாவட்டத்தின் வட்டக்கச்சி பகுதிகளில் அரசினர் விவசாயப் பண்ணையும் விவசாயப் பாடசாலையும் உருவாக்கப்பட்டன. இதன்மூலம் 6 மாதம், ஒரு வருடம் என விவசாயப் பயிற்சிபெறும் மாணவர்களை வைத்து அக்காலத்தில் இலங்கையின் பல பகுதிகளில் "படித்த வாலிபர் குடியேற்றத் திட்டம்" என்ற பெயரில் விவசாயக் குடியேற்றத் திட்டங்களும் மேற்கொள்ளப்பட்டன. அவ்வாறாக குண்டசாலை, திருநெல்வேலி விவசாயப் பாடசாலையும் பண்ணையும், 1980களில் உருவாக்கப்பட்ட வவுனியா, தாண்டிக்குளம் விவசாயப் பாடசாலையும் பண்ணையும் இயங்கி வருகின்றன. பயிற்சிகளுடனான விவசாய டிப்ளோமா சான்றிதழ்களும் வழங்கப்படுகின்றன. ஆனால், வட்டக்கச்சி விவசாயப் பாடசாலையும் பண்ணையும் தன் இயங்கு நிலையை இழந்துள்ளன.

1950களிலிருந்து கிட்டத்தட்ட 400 ஏக்கர் வரையான மேட்டுநிலம் மற்றும் வயல் நிலத்தைச் சொந்தமாகக்கொண்ட இப்பண்ணையில் 400க்கும் மேற்பட்ட பணியாளர்களும் நாளாந்தத் தொழிலாளர்களும் பணிபுரிந்துள்ளனர். பல புதிய விதை இனங்களும் கண்டுபிடிக்கப்பட்டதோடு, புதிய புத்தாக்க விவசாய முறைகளும் அறிமுகம் செய்யப்பட்டது. 1990களுக்குப் பின் இப்பண்ணை தன் இயங்குநிலையை இழந்துள்ளது. அத்துடன், புதிய விலங்கினங்கள், மாடு, ஆடு, பன்றி, கோழி என்பவற்றை அறிமுகம் செய்வதிலும் இப்பண்ணை இலங்கையில் பெயர்பெற்ற, செல்வாக்குள்ள பண்ணையாக அமைந்திருந்தது.

பலநூறு பேருக்கு வேலைவாய்ப்பு வழங்கி, நாட்டின் மொத்தத் தேசிய உற்பத்தியிலும் இப்பண்ணை செல்வாக்குச் செலுத்திவந்த நிலையில், தற்போது செயற்பாடுகளற்று இருப்பதையும் இப்பண்ணைக்குரிய நிலப்பரப்பில் பெரும் பகுதியை இராணுவத்தினரும் இராணுவத்தின் சிவில் பாதுகாப்புப் பிரிவு எனப்படும் CSDஉம் வலுக்கட்டாயமாக அபகரித்து வைத்துள்ளனர் என்பதையும் அமைச்சர் அறிவாரா?

1. இப்பண்ணைக்குரிய மொத்த நிலப்பரப்பு வயல் மற்றும் மேட்டுநிலம் என்ற அடிப்படையில் எத்தனை ஏக்கர்?
2. இதில் இராணுவம் மற்றும் CSD வைத்திருக்கும் காணிகளின் அளவு எத்தனை ஏக்கர்? இவை இராணுவத்தால் மீள உரிய திணைக்களத்திடம் எப்போது ஒப்படைக்கப்படும்?
3. இப்பண்ணை பழைய நிலைபோல பலருக்கும் வேலைவாய்ப்பு வழங்கி வருமானத்தை ஈட்டும் துறையாக மாற்றப்படுமா?
4. புதிய விதையினங்கள், விலங்கினங்கள், விவசாய முறைகளின் முன்னேற்றத்துக்கும் கண்டுபிடிப்புக்கும் அரசு ஆவன செய்யுமா?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා වැදගත් කරුණු ගණනාවක් මතු කළා. අපි මේ පිළිබඳ විස්තරාත්මක පිළිතුරක් ලබා ගනිමින් තිබෙනවා. ලැබුණු වහාම ඒ පිළිතුර ඔබතුමාට ලබා දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා කියන කාරණයත් මේ වෙලාවේ සඳහන් කරනවා.

ඒ අනුව පිළිතුර ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදනය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මහතා.

## කොරියාවේ රැකියා සඳහා වන ගිවිසුම් යාවත්කාලීන කිරීම: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கொரியா வேலைவாய்ப்புக்கான ஒப்பந்தத்தைப் புதுப்பித்தல்: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று
## UPDATING AGREEMENTS ON JOB OPPORTUNITIES IN KOREA: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.12.19වැනි දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ද්වීපාර්ශ්වික ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවට විදේශ රැකියා අවස්ථා ලබා දෙන රටවල් වන්නේ, ඊශ්‍රායල රාජ්‍යය සහ කොරියානු ජනරජයයි.

කොරියානු රජය විසින් 2025 වර්ෂය සඳහා ලබා දීමට නියමිත උපරිම නිෂ්පාදන අංශයේ රැකියා ප්‍රමාණය 6,800ක් වන අතර, සෙසු කාණ්ඩ සඳහා රැකියා අවස්ථා ප්‍රමාණයක් සඳහන් කර නොමැත.

කොරියානු රාජ්‍යයේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා අනුමත රැකියා කාණ්ඩ වනුයේ,

i. නිෂ්පාදන අංශය

ii. ධීවර අංශය

iii. ඉදිකිරීම් අංශය

iv. නැව් තැනීම් අංශය

v. සේවා අංශය

2. 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රැකියා සඳහා කාර්යාංශයේ ලියාපදිංචිව කොරියානු රැකියා සඳහා පිටත්වීම් ප්‍රමාණය පහත වගුවෙහි සඳහන් කර තිබෙනවා.

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025/12/31 දිනට |
|---|---|---|---|---|---|---|
| අවබෝධතා ගිවිසුම්වලට අනුව රජය මඟින් විදේශ ගත වූ සංඛ්‍යාව | 500 | 1,108 | 6,639 | 6,412 | 5,562 | 3,712 |
| ඒජන්සි ආයතනවලින් හා පෞද්ගලික මාර්ගයෙන් විදේශ ගත වූ ප්‍රමාණය | 1,291 | 1,428 | 9,399 | 9,745 | 7,121 | 6,490 |
| මුළු එකතුව | 1,791 | 2,536 | 16,038 | 16,157 | 12,683 | 10,202 |

කොවිඩ් - 19 වසංගතය නිම වීමෙන් පසු 2022දී ශ්‍රමිකයන් 6,639ක් විදේශගත කර ඇති අතර, ඉන් පසු සාපේක්ෂව අඩු වීමක් සිදු වී ඇත.

එසේ අඩු වීමට පහත සඳහන් හේතු බලපා ඇති බව කාර්යාංශයට නිරීක්ෂණය වී ඇත.

i. කොරියානු ජනරජයේ දේශපාලන, ආර්ථික හා ප්‍රතිපත්තිමය වෙනස් වීම්.

ii. කොරියානු ජනරජයේ දේශපාලනික හා ආර්ථික ස්ථාවරත්වයේ ඇති වූ වෙනස්කම්.

iii. දකුණු කොරියාව තුළ නීති විරෝධීව රැඳී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ගණන.

iv. ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නිරන්තර සේවා ස්ථාන මාරු කිරීම ආදිය නිසා එරට හාම්පුතුන් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් දක්වන සෘණාත්මක ආකල්ප.

3. 2004 වර්ෂයේ ශ්‍රී ලංකාව හා දකුණු කොරියානු රාජ්‍යය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව මෙම බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර සේවා ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටිය එකී ගිවිසුමේ මනාව සඳහන් කර ඇත.

ඒ අනුව යම් සේවා අපේක්ෂකයකු රැකියාවක් සඳහා තෝරා ගන්නා තුරු වෙබ් අඩවියේ රඳවා ගනු ලබන උපරිම කාලය වසර දෙකක් වේ. මෙය රැකියා ගිවිසුම් නිකුත් කිරීම ක්‍රියාත්මක වන අනෙකුත් රටවල් 16 සඳහා ද පොදු වේ. එමෙන්ම සුදුසුකම් ලැබීමෙන් අනතුරුව වෙබ් අඩවියේ තොරතුරු ඇතුළත් කිරීමෙන් දකුණු කොරියාවේ රැකියාවක් ලැබීමේ සුදුසුකම් ලැබීමක් විනා ස්ථිර වශයෙන් රැකියාවක් ලබා දීම සහතික කිරීමක් නොවේ.

ඒ අනුව මෙම අයගේ නම් වෙබ් අඩවියේ රඳවා ගනු ලබන කාලය වසර දෙකෙන් පසු දීර්ඝ කර ගැනීමට නොහැක. කෙසේ නමුත්, මේ පිළිබඳව අදාළ ආයතන සමඟ සාකච්ඡා සිදු කළ ද කොරියානු පාර්ශ්වයෙන් එකඟතාවක් ලබා ගැනීමට තවමත් නොහැකි වී ඇත.

කෙසේ වුවත්, මේ සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍ය කටයුතු රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් සිදු කිරීමට කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂතුමිය සමඟ සාකච්ඡා කීපයක් සිදු කරන ලදී. එහිදී 2025 වර්ෂයේ ශ්‍රී ලංකාවට ලැබී ඇති රැකියා ගිවිසුම් ප්‍රමාණය අඩු වීම සම්බන්ධයෙන් සහ සේවා අංශයේ රැකියා ගිවිසුම් ලැබීම ඉතා අඩු මට්ටමක පැවතීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදී. එහිදී අධ්‍යක්ෂතුමියගේ අවධානය සේවා අංශයේ රැකියා ලැබීම් වෙනුවෙන් යොමු කර ගැනීමට හැකි වූ අතර, සේවා අංශයෙන් කොරියානු වෙබ් අඩවියේ රැඳී සිටින සුදුසුකම් ලත් රැකියා අපේක්ෂකයන් නිෂ්පාදන ක්ෂේත්‍රයට ඇතුළත් කිරීම පිළිබඳව කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය සමඟ සාකච්ඡා කර ඔවුන්ට යම් සහනයක් සැලසීමට උත්සාහ කරන බවට එකඟතාව පළ කරන ලදී. එසේම මේ සම්බන්ධව රැකියාලාභීන් විසින් කරන ලද ඉල්ලීම්ද කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

එසේම නැව් තැනීමේ රැකියා ක්ෂේත්‍රය යටතේ 2025 වර්ෂයේ ලැබී ඇති රැකියා ගිවිසුම් සංඛ්‍යාව 32ක් වන අතර කොරියානු වෙබ් අඩවියේ රැඳී සිටින පිරිස 1,391කි. ඒ, ජනවාරි 1වැනි දා වනකොට. කොරියානු වෙබ් අඩවියේ රැඳී සිටින්නන් සඳහා නැව් තැනීමේ රැකියා ගිවිසුම් ලැබීමේ සම්භාවිතාව අඩු වී ඇති බැවින් ඔවුන් සුදුසු පරිදි නිෂ්පාදන ක්ෂේත්‍රය යටතේ ඇති වෙබ් අඩවියට ඇතුළත් කිරීමට තීරණය කර ඇති අතර එය ඉදිරි මස තුළ සිදු කරනු ඇත.

4. කොරියානු රැකියා සඳහා බඳවා ගැනීමට අදාළව මානව සම්පත් සංවර්ධන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියේ 2026.01.01 දිනට සිටින රැකියා අපේක්ෂකයන් ගණන පහත පරිදි වේ.

| | |
|---|---|
| නිෂ්පාදන | 5,820 |
| ඉදිකිරීම් | 50 |
| ධීවර | 343 |
| සේවා අංශ | 2,518 |
| නැව් තැනීම් | 1,391 |
| එකතුව | 10,122 |

මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදීම මෙරට කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කර ඇති අතර, ඉදිරියේදී තවදුරටත් සාකච්ඡා කිරීමට නියමිතය.

තවද, ශ්‍රී ලංකා රජයේ ඉහළ පෙළේ දූත මණ්ඩලයක් කොරියාවට ගොස් කොරියානු රාජ්‍යයේ ප්‍රධානීන් මෙන්ම කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ ප්‍රධානීන් සමඟ ද සාකච්ඡා කර ශ්‍රී ලංකාවට ලැබෙන රැකියා ප්‍රමාණය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වර්ෂයේ මුල් කාර්තුව තුළ සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරමින් පවතී.

ඉහත වැඩසටහන යටතේම කොරියාවේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකාවෙන් වැඩි වශයෙන් සේවකයන් ලබා ගන්නා කර්මාන්තශාලා ආවරණය වන පරිදි රැකියා ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් වසර පුරාවට සිදු කිරීමට අපේක්ෂා කරයි. එහිදී කර්මාන්තශාලා ප්‍රධානීන් කැඳවා ශ්‍රී ලංකා ශ්‍රමිකයන්ගේ දක්ෂතා හා නිපුණතා විදහා දැක්වෙන පරිදි වැඩසටහන් පැවැත්වීමටද අරමුණු කරගෙන ඇත.

[ගරු විජිත හේරත් මහතා]

මීට අමතරව, ශ්‍රී ලාංකික දූත කණ්ඩායම ශ්‍රී ලංකාවෙන් සේවකයන් වැඩි වශයෙන් ලබා ගන්නා කර්මාන්තශාලා ප්‍රධානීන් පෞද්ගලිකව මුණගැසී ශ්‍රී ලාංකිකයන් වැඩි පිරිසක් රැකියා සඳහා යොමු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටද අපේක්ෂා කර ඇත.

5. කොරියාවට අමතරව ඊශ්‍රායලය.

6. ඉතාලිය සමඟ මීට පෙර ගිවිසුමකට එළඹීලා තිබෙනවා.

ඉතාලි රාජ්‍යය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹීමට ශ්‍රී ලංකා රජය විසින් කටයුතු කරමින් පවතිනවා. එය තවදුරටත් අලුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඉතාලියේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මාර්ගයෙන් ඉතාලි පාර්ශ්වයෙන් ශ්‍රී ලාංකික සේවකයන් බඳවා ගැනීමට කැමැත්තෙන් සිටින සංවිධාන සම්බන්ධ කර ගැනීමට අවස්ථා ගණනාවකදී ශ්‍රී ලංකා රජය පියවර ගෙන තිබෙනවා. ඉදිරියටත් පියවර ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමාට බෙහෙවින්ම ස්තුතියි, පිළිතුර ලබා දුන්නාට.

අපි අනුමාන කරනවා, දැනට කොරියානු රැකියාවලට ලියාපදිංචි අය 10,000ක් විතර ඉන්නවා කියලා. ඒ 10,000ම කොරියානු භාෂා විභාගයට මුහුණ දීලා, සම්මුඛ පරීක්ෂණවලට ගිහිල්ලා, වෛද්‍ය පරීක්ෂණවලට ගිහිල්ලා තිබෙනවා. ඒ සඳහා යම් වියදමකුත් දරා තිබෙනවා. මේ අවුරුද්දේ මාර්තු මාසයේ ඒ අය ඉවත් වෙනවා. ඔබතුමා කියපු විධියට වසර 2ක කාලය තමයි සීමාව. ඇත්ත වශයෙන්ම මමත් මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා දකුණු කොරියානු තානාපති මියොන් ලී මැතිනිය සමඟත් සාකච්ඡා කළා. ඔබතුමා කියපු ආකාරයට ඇත්ත වශයෙන්ම මේක handle කරන්නේ, ක්‍රියාත්මක කරන්නේ, කොරියානු මානව සම්පත් සංවර්ධන අධිකාරියෙන්. ඔබතුමාගේ උත්තරයේදී කිව්වා, යම් අපේක්ෂකයෙකු වෙබ් අඩවියේ තියාගන්න පුළුවන් අවුරුදු දෙකක සීමාවකට කියලා. නමුත්, ඒ 10,000කට සිදු වන අසාධාරණය නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මියොන් ලී තානාපතිතුමියටත්, ඒ වාගේම කොරියානු මානව සම්පත් සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ටත්, කොරියානු රජයටත් කථා කරලා මේ කාල සීමාව දීර්ඝ කර ගන්න කටයුතු කරන්න කියලා. මොකද, ඒ අපේක්ෂකයන් ලක්ෂ ගණනක් වියදම් කරලා ලියාපදිංචිය, වෛද්‍ය පරීක්ෂණය, කොරියානු භාෂා විභාගය යන ඔක්කොටම මුහුණ දීලායි ඉන්නේ. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඒ රැකියා ප්‍රමාණය වැඩි වන තෙක් හෝ ඒ අය වෙබ් අඩවියේ තබා ගැනීමේ කාලය දීර්ඝ කර ගන්න ඔබතුමා කටයුතු කරන්න කියලා.

මම අහපු ප්‍රශ්නයේ තවත් කොටසක් තමයි, ඉතාලි රැකියා පිළිබඳ කාරණය. ඇත්ත වශයෙන්ම නිෂ්කාසන ලැබී තිබෙන, ඒ කියන්නේ සියලු දේට සුදුසුකම් ලබා තිබෙන -සුදුසුයි කියලා අවසාන තීන්දුවත් ලැබුණු- අය ගණනාවක් ඉන්නවා, ඉතාලියේ රැකියාවලට යන්න බැරිව.

ඉතින් දැන් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා මේ පැරණි ගිවිසුම, අලුත් ගිවිසුම කියන කාරණාව නිසා. මෙතැනදීත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නිෂ්කාශන අවසරය ලැබුණු ඒ කණ්ඩායම යැවීමට කටයුතු කරන්න කියලා. ඉතාලියේ ඉන්න ශ්‍රී ලංකා තානාපතිතුමාටත් මම දුරකථනයෙන් ආමන්ත්‍රණය කරලා ඉල්ලීමක් කළා, මේ බරපතළ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කියලා. කරුණාකරලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණයට මැදිහත් වෙලා මේකට අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා.

ඒ වාගේම අවසාන කාරණාව හැටියට මම ඔබතුමාට මේකත් කියන්න කැමැතියි. ඔබතුමන්ලා කොච්චර උත්සාහ දැරුවත්, අද මේ මොහොතේත්, කාලයක් පුරාවටත්, - මම කියන්නේ නැහැ, මේ කාලවකවානුවේ කියලා - වංචනික විදේශ රැකියා ආයතන මිනිසුන්ගෙන් කෝටි ප්‍රකෝටි ගණන් මුදල් හොරා කාලා තිබෙනවා. මහරගම රේන්බෝ ගාමන්ට් ටෙක්නොලජීස් පුද්ගලික සමාගම, බත්තරමුල්ලේ නිව් රේන්බෝ ගාමන්ට් ටෙක්නොලජීස් ආයතන ගැන ඔබතුමා දන්නවා ඇති. 640කට අධික පිරිසකගෙන් කෝටි 86ක් වංචා කරලා තිබෙනවා රුමේනියාවට යවනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කථාව කෙටි කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පෞද්ගලිකව මේ කරුණු කාරණා ගැන සොයා බලන්න කියලා. මොකද, විමර්ශන ක්‍රියාත්මක වෙන්නේ බොහොම මන්දගාමීව. ඒ වාගේම තවම චෝදනා ගොනු කරලාත් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඒ ආයතනයේ අයිතිකාරයා අත්අඩංගුවට අරගෙන තිබෙනවා. නමුත් හිමිකාරියකුත් ඉන්නවා. ඒගොල්ලන් අත්අඩංගුවට අරගෙන නීතිය ක්‍රියාත්මක කරලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම මම ඔබතුමාට වගකීමෙන් මේක කියන්න කැමැතියි. මේකට ඔබතුමාගේ සම්බන්ධයක් නැහැ. අපි හොයලා බැලුවා, කපිල කියන පුද්ගලයෙක් ස්ථාන මාරු කරලා තිබෙනවා, මේ කරුණට අදාළව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇත්ත වශයෙන්ම මේ කාරණාවට අදාළව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඒ නිලධාරියා සහ තවත් නිලධාරීන් කණ්ඩායමක් ඉන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකට ඔබතුමා පෞද්ගලිකව අවධානය යොමු කරලා විනිවිදභාවයෙන් යුක්ත වූ පරීක්ෂණයක් පවත්වලා රේන්බෝ ආයතනයේ මේ වංචාව ගැන සොයන්න කියලායි. මේ වංචාව නිසා 640කට වැඩි පිරිසක් අද,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව දෙන්න ගරු කථානායකතුමා. මේක මානුෂීය ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නයට විනාඩි 5ක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි. විනාඩි 5ක් මම ගත්තාට, මේ මිනිස්සුන්ගෙන් අරගෙන තිබෙනවා, මුළු ජීවිතයම. ඒගොල්ලන්ගේ ඉතිරි කිරීම්, ඒගොල්ලන්ගේ සල්ලි, ඒවා ඔක්කෝම හොරා කාලා තිබෙන්නේ. ඉතින් මම විනාඩි 5ක් ගත්තාට කමක් නැහැ නේ. ප්‍රශ්නයක් නැහැ නේ. මේක කෝටි 86ක වංචාවක්.

ගරු ඇමතිතුමනි, මම මේ ගැන ඔබතුමාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ විදේශ රැකියා ආයතනයේ බලපත්‍ර තහනම් කරලා තිබෙනවා. තහනම් කරන්න පෙරත් හොරකම් කළා. පසුවත් හොරකම් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කාරණා කෙරෙහි ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. එකක් තමයි, මේ රේන්බෝ ආයතනයේ ප්‍රශ්නය. අනික් එක, ඉතාලි රැකියා ප්‍රශ්නය. අනික් එක, කොරියානු රැකියා ප්‍රශ්නය.

ස්තුතියි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මතු කරපු විවිධ රැකියා ඒජන්සි විශාල ලෙස මුදල් අය කරමින් වංචාසහගතව කරන කටයුතු ගත්තොත්, පසුගිය කාලයේ එවැනි සිදුවීම් ගණනාවක් වාර්තා වෙලා තිබුණා. ඔබතුමා මතු කරපු රේන්බෝ ආයතනයේ වංචාව ගත්තොත්, ඒකත් අපේ කාලයේ නොවෙයි ඒ කාලයේ වෙච්ච එකක්; දේශපාලන රැකවරණය මැද සිද්ධ වෙච්ච එකක්. ඔය අහුවෙලා ඉන්න කට්ටිය නොවෙයි, ඇත්ත කට්ටිය. ඒගොල්ලෝ ඇවිල්ලා Board of Directors. ඇත්ත අය කවුද කියන කොට, ඔබතුමන්ලාගේ පැත්තෙන් අනෙක් පැත්තට පැනපු එක්කෙනෙකුත් සම්බන්ධයි. ඔහුගේ පෞද්ගලික ජීවිතය එක්කත් සම්බන්ධයි. *[බාධා කිරීමක්]* ඒ කාලයේ. ඒ කාලයේ ඔය පැත්තෙන් මේ පැත්තට පැනපු කෙනෙක්. ඒ කියන්නේ, ඒ කාලයේ විපක්ෂයෙන් ආණ්ඩුවට පැනපු කෙනෙක්. අපි ආවාට පස්සේ ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ තීන්දු සහ ක්‍රියාමාර්ග ගත්තා. උසාවියට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නඩුව උසාවියේ විභාග වෙමින් පවතිනවා. දැනට තිබෙන පනත ශක්තිමත් මදි, සමහර ක්‍රියාමාර්ග ගන්න. ඒ නිසා 1985දී සම්මත වෙච්ච ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත වෙනස් කරලා, අලුත් පනත් කෙටුම්පතක් ගෙන ඒමටත් අපි කටයුතු කරනවා. ඇත්තටම දැනට තිබෙන්නේ ඒගොල්ලන්ගේ තැන්පතු මුදල තබා ගැනීම විතරයි. ඒකෙන් ඒගොල්ලෝ ගැලවෙනවා. ඔබතුමා කියපු විධියටම කෝටි 80 ගණනක් තිබෙනවා එතැන. ඉතින් තුන්දෙනෙකුගේ සල්ලිවලින් ඒක පියවා ගන්න පුළුවන්. මොකද, තියන්න තිබෙන්නේ ලක්ෂ 30යි.

ඇත්තටම ගත්තොත්, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නවා. දැනටමත් බොහෝ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මේ වෙනකොට නිලධාරීන් 6දෙනෙකුගේ වැඩ තහනම් කර තිබෙනවා. ඒ වාගේම, කාර්යාංශයට සම්බන්ධ සමහර අංශවල වැඩ කරන සේවකයන් අතර මේ ජාවාරමට උදවු කරන අයත් ඉන්නවා; හඳුනා ගෙන තිබෙනවා. ඒ අය සම්බන්ධයෙන් පරීක්ෂණ කරනවා. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ අපි අලුතින් විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් පිහිටෙව්වා මේ පිළිබඳ පරීක්ෂණ කරන්න. ඉදිරියේදී අපි ඒ පිළිබඳව තවත් දැඩි ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා.

ඊළඟ එක, ඉතාලිය සම්බන්ධ ප්‍රශ්නය. ඉතාලියත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා තිබුණා. නමුත් ඉතාලියෙන් අපට රැකියා අවස්ථා ලැබී තිබුණේ නැහැ. ඒක තමයි ප්‍රශ්නය. පසුගිය කාලයේ ලංකාවත්, පාකිස්තානයත් blacklist කරලා තිබුණේ. ඒ නිසා ඒ අය අපට රැකියා දෙන තැනක හිටියේ නැහැ. රැකියා නොවෙයි, වීසා දුන්නේත් නැහැ. ඒ නිසා රැකියා අවස්ථා ලැබුණේ නැහැ. දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අපි මෑතකදී ඉතාලියේ ඉන්න ශ්‍රී ලාංකිකයන්ට රියැදුරු බලපත්‍රය ලබා ගැනීමේ අවබෝධතා ගිවිසුම අත්සන් කළා. තව මාසයකින් විතර ඒක ක්‍රියාත්මක වෙනවා. ඒ ගිවිසුම අත්සන් කර අවසන්. මෙහෙන් ඉතාලියට රැකියා සඳහා ශ්‍රමිකයන් යැවීමට අලුත් ගිවිසුම්වලට එළඹෙන්න අපි උත්සාහ කරනවා.

ඊළඟට, කොරියාව සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා කියපු දේ ගත්තොත්, කොරියාවට යන්න බලාපොරොත්තුවෙන් 10,122ක් website එකේ ලියාපදිංචි වෙලා ඉන්නවා. අත්සන් කර තිබෙන ගිවිසුමේ වගන්තිවලට අනුව අවුරුදු 2ක් යනකොට රැකියාවක් නොලැබුණොත් ඒ website එකෙන් ඒගොල්ලන්ගේ නම් ඉවත් වෙනවා. මේ 10,122දෙනාම අවුරුදු 2ක කාලයක් සම්පූර්ණ කරන්නේ නැහැ. ගොඩක් අය මේ මාර්තු වෙනකොට ඒ කාලය අවසන් කරනවා. අතරමැද ආපු අය තව ඉස්සරහට යනවා. කොහොමත් සැලකිය යුතු පිරිසක් ඉවත් වෙනවා. ඒ නිසා තමයි ඒ ගිවිසුමේ වගන්ති එහෙම තිබුණා වුණත්, අපි HRD එකෙන් ඉල්ලීමක් කර තිබෙන්නේ තව අවුරුද්දක්වත් මේ කාලය දිගු කරන්න කියලා.

පසුගිය අවුරුද්දේ කොරියාවේ රැකියා අවස්ථා නොලැබුණේ කොරියානු ආණ්ඩුවේ තිබුණු අස්ථාවරත්වයත් එක්ක. කොරියානු ආණ්ඩුව වැටුණා. ඊට පසුව භාරකාර ආණ්ඩුවක් පිහිටෙව්වා; ජනාධිපතිවරයාට ඉවත් වෙන්න වුණා. එවැනි දේශපාලන අස්ථාවරත්වයක් ඇති වුණා. ඒ අස්ථාවරත්වයත් එක්ක ආර්ථිකයේ කඩා වැටීමක් වුණා. කොරියාවේ ඇති වුණු ඒ ආර්ථික සහ දේශපාලන අස්ථාවරත්වයත් එක්ක අපේ රටට ලැබෙන රැකියා අවස්ථාවල යම් අඩුවීමක් වුණා. දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. දැන් නව ආණ්ඩුවක් පිහිටුවා තිබෙනවා, නව ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඒ නිසා මේ අවුරුද්ද තුළ කොරියාවෙන් අපේ රටට ලැබෙන රැකියා අවස්ථා වැඩි වෙයි කියන අපේක්ෂාව අපට තිබෙනවා. කොහොම වුණත්, ඔබතුමා කියපු දේ මම පිළිගන්නවා. විශාල බලාපොරොත්තු තබා ගෙන විභාගය සමත් වෙලා වෛද්‍ය පරීක්ෂණත් කරන්න ඕනෑ. ඇත්තටම ගත්තොත්, වෛද්‍ය පරීක්ෂණ 2ක් කරන්න වෙනවා. අවුරුදු 2කට දෙසැරයක් වෛද්‍ය පරීක්ෂණ කරන්න වෙනවා. රැකියාව ලැබුණොත්, යන්න ඔන්න මෙන්න තියලා 3වැනි වෛද්‍ය පරීක්ෂණයත් කරන්න ඕනෑ. ඒ අනුව වෛද්‍ය පරීක්ෂණ 3ක් කරන්න වෙනවා. මේවා තමයි ගිවිසුමේ තිබෙන වගන්ති. අපි නොවෙයි, ඒ ගිවිසුම් අත්සන් කළේ. මේවා මීට කලින් අත්සන් කරපු අවබෝධතා ගිවිසුම්. ඒ ගිවිසුමේ තිබෙන කරුණුවලට යටත්ව තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙන්නේ. කොහොම වුණත්, දැනට මේ website එකේ ඉඳලා ඉවත් වෙන අය ඉවත් නොකර තවදුරටත් රඳවා ගන්න අපි HRD එකත් එක්ක සාකච්ඡා

[ගරු විජිත හේරත් මහතා]

කළා. දැනටම ලිඛිතවත් දැනුම් දීලා තිබෙනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේ මාසයේ අග හෝ ලබන මාසයේ මුල කොරියාවට ගිහිල්ලා විශේෂයෙන්ම මේ ගැන කථා කරලා, මේ සඳහා යම් සහන කාලයක් දෙන්න කියලා ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, මේ website එකේ ඉන්නා අය තෝරා ගැනීමේදී ඒ තෝරා ගැනීම කරන්නේත් මෙහෙන් නොවෙයි, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් නොවෙයි. මේ website එකේ ඉන්න සමහර අයට ගැටලුවක් තිබෙනවා. ඒ කියන්නේ, කලින්ම register වෙලා සිටින අය සිටියදී, මෑතකදී register වුණු අය සමහර වෙලාවට job එකක් හම්බ වෙලා යනවා. ඒක මෙහේ සිටින නිලධාරින් කරන දෙයක් නොවෙයි. අහඹු ලෙස තමයි ඒ තෝරා ගැනීම වෙන්නේ. ඒ තෝරා ගැනීම කරන්නේ කොරියාවේ ඉන්න කර්මාන්තශාලා හිමියන් විසින්. ඒගොල්ලන් HRD එකට කිව්වාම, HRD එකෙන් තමයි ඒ තෝරා ගැනීම කරන්නේ. සමහර අවස්ථාවලදී මාස 2කට කලින් register වෙච්ච කෙනෙක් අහඹු ලෙස තේරෙන්න පුළුවන්. එහෙම වෙලා තිබෙනවා. නමුත් අවුරුදු 2කට කලින් ලියාපදිංචි වෙච්ච කෙනාට යන්න හම්බ වෙන්නේ නැහැ. හැබැයි, මාස 2ක් වාගේ කාලයක් තුළ ලියාපදිංචි වුණු කෙනාට රැකියාවක් ලැබෙනවා. මේකේත් යම් ගැටලුවක් තිබෙනවා. ඒකත් අපි බැලුවා. ගිවිසුමේ කොහේවත් නැහැ, ලියාපදිංචි වෙච්ච අනුපිළිවෙළට යවන්න කියලා. අහඹු ලෙස තෝරා ගැනීම තමයි තිබෙන්නේ. මේ සියල්ල කරන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් නොවෙයි, කොරියාවේ HRD ආයතනයෙන්. මේවා අපට පාලනය කරන්න බැරි තත්ත්වයක තිබෙන්නේ. ඒ නිසා තමයි මේ ගිවිසුමත් සංශෝධනය කරගන්න අපි බලාපොරොත්තු වෙන්නේ.

අවසානයේ මට කියන්න තිබෙන්නේ, රැකියා බලාපොරොත්තුවෙන් ඒ වෙබ් පිටුවේ ලියාපදිංචි වෙලා ඉන්න අයගේ කාලය දිගු කරගන්න කොරියානු රජයත් එක්ක සාකච්ඡා කරලා සහනයක් ගන්නට අපි උපරිම උත්සාහ කරනවා කියන එකයි.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(අ) යටතේ මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ.

අපට අද document එකක් ඉදිරිපත් කරලා තිබෙනවා මුදල් අමාත්‍යාංශයෙන්, "වීරමොං ක්‍රියා පටිපාටිය යටතේ කරන ලද ප්‍රතිපාදන" කියලා. ගරු කථානායකතුමනි, ඒක ඉදිරිපත් කරලා තිබෙන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 24(4) යටතේ. ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, "මෙම වගන්තියේ කිසිදු විධිවිධානයක් මුදල් අමාත්‍යවරයා විසින් ලිඛිතව දක්වන මතය අනුව අය වැය ආර්ථික හා මූල්‍ය තත්ත්ව වාර්තාව තුළ පහත සඳහන් හේතු මත... " යනුවෙන්. එහෙම තමයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, 92(2),-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
92(2)(අ). ගරු කථානායකතුමනි, දැන් මේ ඉදිරිපත් කරලා තිබෙන ඒවා ගත්තාම, බිලියන ගණනක විශාල ප්‍රමාණයක මුදල් මාරුවීමක් තිබෙනවා. මේක ඇත්තටම දෙසැම්බර් මාසයේ 31වැනි දාට පෙර ඉදිරිපත් කළ යුතුයි කියලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, 92(2) යටතේ රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්නේ, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කියන්නේ, නිවැරදි ක්‍රම අනුගමනය කරනු ලැබ තිබේද යන කාරණය ගැන. මොකද හේතුව, මේක අද අපට document එකක් විධියට ඉදිරිපත් වෙලා තිබෙනවා. මම කියන්නේ මේක නිවැරදි ක්‍රමය අනුව ඉදිරිපත් කරලා නැහැ කියලායි. ගරු කථානායකතුමනි, මේක දෙසැම්බර් මාසයේ 31වැනි දාට පෙර ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන්න තිබෙන රාජ්‍ය අය වැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව. හැබැයි දැන් මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ ජනවාරි මාසයේ, අද. ඇත්තටම මේක පසුගිය දෙසැම්බර් මාසයේ 31වැනි දාට පෙර ඉදිරිපත් කළ යුතු එකක්. මොකද, බිලියන ගණනක් මුදල් හැම අමාත්‍යාංශයකම එහා මෙහා මාරු වෙලා තිබෙනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ වාර්තාව ඉදිරිපත් කිරීම දෙසැම්බර් 31වැනි දාට පෙර කරන්න ඕනෑ එකක්, මූල්‍ය වාර්තාව අනුව. හැබැයි, ඒක සිද්ධ වෙලා නැහැ. ඒකයි මම මේ කියන්නේ. ජනවාරි මාසයේ නොවෙයි මේක ඉදිරිපත් කළ යුතු වන්නේ. ඒ කියන්නේ ගිය වර්ෂයට අදාළ වන ප්‍රතිපාදන මාරු කිරීම් අපේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 24 (4) වගන්තිය අනුව, ඒ නියමිත කාලයට ඉදිරිපත් කළ යුතුයි. ඕනෑ නම් මම ඒක කියවන්නම්. ඒ අනුව මේක ඉදිරිපත් කරන්න ඕනෑ ඒ වර්ෂයේ දෙසැම්බර් 31වැනි දාට පෙර. හැබැයි දැන් මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ පහු වෙලා. ඒ නිසායි මම මේක වැදගත් කාරණයක් විධියට මතු කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 92(2)(අ) යටතේ රීති ප්‍රශ්නය මතු කළේ, සභාව නිවැරදි ක්‍රමය අනුගමනය කරනවාද නැද්ද යන්න පිළිබඳවද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 22(2) ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
92(2).

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92(2)(අ) අනුව නිවැරදි ක්‍රමය අනුගමනය කරලා තිබෙනවාද කියන කාරණය මෙතැනදී වැදගත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන Parliamentary Business Committee එකේදීත් කථා කරලා -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 92(2)(අ) යටතේ මොකක්ද තිබෙන්නේ? මම එය කියවන්නම්:

> "ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රම අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකු විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි වන්නේ ය."

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, හරි. ඒක තමයි මම කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතකොට දැන් මොකක්ද ඔබතුමා අහන ප්‍රශ්නය?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම දැන් මෙච්චර වෙලා කිව්වා නේ. ආපසු අවස්ථාව දෙන්න, මම කියන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ, ආයෙත් කියන්න ඕනෑ නැහැ. ගරු කථානායකතුමනි, -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින් මට කියන්න දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අහගෙන හිටියා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින් අහගෙන හිටියා නම්, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතැන ලේකම් මණ්ඩලයක් ඉන්නවා. අවශ්‍ය නම් එතුමන්ලාට පුළුවන්, මන්ත්‍රීතුමා මතු කරන ප්‍රශ්නය හරිද කියලා හොයලා බලලා කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට උත්තර දෙන්න -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එහෙම වුණොත් පාර්ලිමේන්තුවේ table කරන හැම දෙයක්ම නිවැරදි ක්‍රමයට ඉදිරිපත් කළාද කියලා ස්ථාවර නියෝග අනුව අහන්න අපට පුළුවන්. ඒක මුවාවෙන් ඊට පස්සේ වෙනත් කථාවක් කියන්නත් පුළුවන්. ඒකයි මම කියන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ නිසා, අවශ්‍ය නම් ලේකම් මණ්ඩලයට පුළුවන් මන්ත්‍රීතුමා කියන එක ගැන හොයලා බලලා මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න. එහෙම නැතුව ස්ථාවර නියෝග 92 (2)(අ) පාවිච්චි කරන්න ගියොත්, මේ හැම document එකක් ගැනම එහෙම අහන්න පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක table කළාම පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලය-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට කියන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමා එක සැරයක් කිව්වා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මට ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ඉඩ දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තත්පරයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ඉඩ දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ -

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. රීති ප්‍රශ්නක් නැඟීම සම්බන්ධව එහි සඳහන්ව තිබෙනවා. එවැනි රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වුණත් විනාඩියකට වැඩියෙන් කථා කරන්න බැහැ. ඒ වුණාට සමහර අය විනාඩියකට වඩා වැඩියෙන් කාලය අරගෙන කථා කරනවා. ඒ නිසා ගරු කථානායකතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, -*[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කථානායක නෙවෙයි නේ. ඒ නිසා කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
එහෙනම් ඔබතුමාද කථානායක? එතකොට කථානායක ඔබතුමාද? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ නඟපු රීති ප්‍රශ්නය සම්බන්ධයෙන්ම ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට තත්පර කිහිපයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපේ රටේ පාර්ලිමේන්තුවේ document එකක් වැරදි විධියට සභාගත කරලා තිබෙනවා ද, නැද්ද කියලා අහන එක අපේ යුතුකමක්. ඒක වැරදි විධියට ආණ්ඩුවට කරන්න බැහැ. මම ඇහුවේ ඒ ප්‍රශ්නයයි. එච්චරයි. ඒකට උත්තරයක් දෙන්න.

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තමන්ගේ අයිතිවාසිකමක් අරගෙන නඟපු රීති ප්‍රශ්නය සම්බන්ධයෙන්, ඒ ඉදිරිපත් කරපු content එක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමකුත් ආවා. ඒ කෙසේ වුවත්, ඒකත් කරන්න වෙන්නේ විනාඩියක් ඇතුළතයි. විනාඩියක් ඇතුළත ඒක අවසන් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මම රීති ප්‍රශ්නයක් නඟනකොට ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් විරුද්ධ වෙනවා. ඒකට තිබෙන අයිතිවාසිකම මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක ඔබතුමා තීරණය කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
විනාඩියක කාලය දැන් අවසන් වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. එම නිසා ඊළඟ කාරණයට යන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මම මේ ඉදිරිපත් කරන්නේ කලින් කථා කරපු කාරණයට අදාළ දෙයක් නොවෙයි. මම කථා කරන්නේ ස්ථාවර නියෝග 118(3) ගැන. ගරු කථානායකතුමනි, එහි සඳහන්ව තිබෙනවා, Ethics and Privileges Committee එකට submission එකක් කරනකොට කළ යුතු ආකාරය. මම එහි English version එක කියවන්නම්. I quote:

> "Such a complaint that is submitted to the Committee should be forwarded to the Speaker with recommendations of the Committee, within two weeks from the date of receipt."

හැබැයි, සුදත්ත සම්බන්ධයෙන් මම අවුරුද්දකට කලින් Ethics and Privileges Committee එකට යොමු කරපු කාරණය සම්බන්ධයෙන් දැන් අවුරුද්දක් ගත වෙලාත් තවමත් එයාගෙන් statement එකක් අරගෙන නැහැ. එයාට පොලිස් ආරක්ෂාව දීලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවෙන් එයාට ලියුමක් දානවා. එයා ආපහු reply කරනවා, "මම මේ රටේ නැහැ" කියලා. ඔහු මේ රට පුරා දුවලා දුවලා වීඩියෝ දාලා අගමැතිතුමියට support කරනවා; අනුරට support කරනවා; ඔක්කෝටම support කරනවා. ඔහුට පොලිස් ආරක්ෂාවත් දීලා තිබෙනවා. හැබැයි, අවුරුද්දක් ගිහිල්ලාත් මේ පාර්ලිමේන්තුවට තවමත් බැරි වෙලා තිබෙනවා එයාගේ statements අරගන්න. මේක මාර විහිලුවක් නේ. මේකට උත්තරයක් දෙන්න. ගරු කථානායකතුමනි, මේකට උත්තරයක් දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් උත්තරයක් ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක පාර්ලිමේන්තුවේ මතු වෙච්ච ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මැතිතුමා.

## ලක්විජය බලාගාරය වෙත සපයන ලද ගල් අඟුරුවල ප්‍රමිතිය: බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## லக்விஜய மின் உற்பத்தி நிலையத்துக்கு வழங்கப்பட்ட நிலக்கரி சரக்குகளின் தரநிலை: வலுசக்தி அமைச்சரினது கூற்று
## STANDARD OF COAL SHIPMENT DELIVERED TO LAKVIJAYA POWER PLANT: STATEMENT BY MINISTER OF ENERGY

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, ලක්විජය බලාගාරය වෙත ගෙන්වන ලද ගල්අඟුරු නැව් තොගයක නිසි ගුණාත්මකභාවයක් නොමැති බවට ඇති වී තිබෙන ප්‍රචාරය සම්බන්ධයෙන් මම අදහසක් පළ කරන්න කැමැතියි. මෙම ගල්අඟුරු වාරයේදී ලක්විජය බලාගාරයට නව සැපයුම්කරු වන Trident Chemphar Limited ගෙන්වන ලද පළමු ගල්අඟුරු නැව පිළිබඳ විස්තරයයි.

ගල්අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ලංසු කැඳවීමේදී 5 හා 5.1 වගන්ති අනුව ඉදිරිපත් කර ඇති නිර්ණායක වන Gross Calorific Value - GCV - එක 5900-6150 Kcal/Kg ඇතුළු තවත් නිර්ණායක - moisture, ash, sulfur, volatile matter - සහිත ගල්අඟුරු සැපයීමට සැපයුම්කරුවන් කටයුතු කළ යුතු බව පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

මෙම සිදුවීමට අදාළ මෙට්‍රික්ටොන් 60,000ක පමණ ගල්අඟුරු තොගය දකුණු අප්‍රිකාවේ RBCT වරායෙන් පටවා ඇති අතර, පැටවුම් වරායේ තත්ත්ව සහතිකයේ පිරිවිතර අපේක්ෂිත පිරිවිතරවලට අනුකූලව ඉදිරිපත්ව ඇති බැවින් ගොඩබෑම් කටයුතු සිදු කර ඇත. මෙහිදී තත්ත්ව සහතික වාර්තා ගැළපේ නම් සියයට 80 ගෙවීම සඳහා Letter of Acceptance ලංකා ගල්අඟුරු සමාගම නිකුත් කරනු ලබයි. එහෙත් ලිපි ලේඛනවල තිබුණු අඩුපාඩු කිහිපයක් නිසා මේ වනතෙක්ම එම සියයට 80 ගෙවීම් කටයුතු අවසන් කර නොමැත.

අදාළ ගල්අඟුරු තොග සඳහා අවසන් ගෙවීම් කරනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද Cotecna Inspection India (Pvt.) Limited එකේ ගොඩබෑම් වරායේ තත්ත්ව සහතික වාර්තාව නිකුත් කිරීමෙන් පසුවය. ගොඩබෑම අවසන් වී දින 10ක් තුළ මෙම වාර්තාව ලැබීමට නියමිතය. එනම්, ජනවාරි 16ට පෙර එය ලංකාවට ලැබීමට නියමිතයි.

ගිවිසුමට අනුව පැටවුම් වරායේ තත්ත්ව සහතිකයට වඩා ගොඩබෑම් වරායේ තත්ත්ව සහතිකයේ ගුණාත්මකභාවය - මා කලින් සඳහන් කළ පිරිවිතර පරාසය තුළ - අඩුවුවහොත් ඒ සඳහා දඩ මුදලක් අය කර ගැනීමෙන් පසුව ගල්අඟුරු තොග සඳහා ගෙවීම් කරනු ලබයි.

මෙහිදී මා යම් පැහැදිලි කිරීමක් කළ යුතුයි. විශේෂයෙන්ම ගල්අඟුරුවල තිබෙන ප්‍රධාන සාධකයක්, පිරිවිතරවල තිබෙන ප්‍රධාන අයිතමයක් තමයි, Gross Calorific Value එක. Gross Calorific Value එක අඩු වැඩි වන විධියට තමයි ඒකෙන් නිෂ්පාදනය වන බලශක්තිය - energy value - තීරණය වන්නේ. බලශක්ති නිෂ්පාදනය අඩු වනකොට එය අඩු වනවා. බලශක්ති නිෂ්පාදනය වැඩි වනකොට එය වැඩි වනවා.

පැටවුම් වරායේ තත්ත්ව සහතිකයට වඩා ගොඩබෑම් වරායේ තත්ත්ව සහතිකය වෙනස් වනවා නම් ගිවිසුම අනුව කටයුතු කරනවා. යම් හෙයකින් ලක්විජය බලාගාරයේ අවශ්‍යතාවට අදාළ එක් එක් පිරිවිතරවල පරාසයේ - ගිවිසුමේ 5.2 වගන්තිය තුළ දක්වා ඇති - ප්‍රතික්ෂේපිත මට්ටමේ ගල්අඟුරු තොග සපයා තිබුණහොත් දඩමුදල් දෙගුණයකින් අය කිරීමට ගිවිසුමේ 5.6 වගන්තිය අනුව කටයුතු කරනු ඇත.

කෙසේ වෙතත්, තොග ගොඩබෑම් අවසන් කිරීමට ද ප්‍රථම ලක්විජය විදුලි බලාගාරයේ රසායනාගාරයේ කරන ලද නියැදි පරීක්ෂණයකින් Gross Calorific Value එක 5689, 5739, 5760 සහ 5830 ලෙස නිරීක්ෂණය කර ඇත. කාලපරාසයට අඩුවෙන් තමයි පෙන්නුම් කරලා තිබෙන්නේ.

නමුත්, මෙහි ප්‍රතිඵලය අපට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා ගැළපීමට නොහැක. මොකද, accredited laboratory එකකින් තමයි මෙම සහතිකය නිකුත් කරන්න ඕනෑ. අපේ ගල්අඟුරු බලාගාරය සතු රසායනාගාරය accreditation ලබාගෙන නැහැ, මෙම අයිතමය පරීක්ෂා කිරීම සඳහා. ඒ අනුව ගිවිසුමට අනුව නම් කර ඇති accredited laboratory එකක් මඟින් ලැබෙන තත්ත්ව වාර්තාව අනුව ගිවිසුමට අනුව කටයුතු කරන බවත් දැනුම් දීමට කැමැත්තෙමි.

[ගරු කුමාර ජයකොඩි මහතා]

ඇත්තටම පෙබරවාරි මාසයේ අග වනකල් පසුගිය වසර සඳහා ඇණවුම් කර ලැබුණු ගල්අඟුරු තිබෙනවා. එහෙම තිබියදී මොකක් හරි අවශ්‍යතාවකට අලුතින් ආපු තොගය නැවෙන් ගොඩ බාලා ඉවර වෙන්න ඉස්සෙල්ලා පරීක්ෂා කරන්න ගිහිල්ලා තිබෙනවා. මොකද, accreditation නැහැ. ඒ වාගේම බලශක්ති නිෂ්පාදනයටත් යොදාගෙන තිබෙනවා. ඒ ගැන අපි වෙනම පරීක්ෂණයක් කරනවා. මොකද, ඒවාට නිසි ක්‍රම තිබෙනවා. ඒ අවශ්‍ය විධියට තමයි ඒවා පාවිච්චි කරන්න ඕනෑ. පරණ තොග තිබියදී අලුත් තොග පාවිච්චි කරලා ඒක ප්‍රසිද්ධ කර තිබෙනවා, අනුමැතියක් නැතිව. ඒක සැපයුම්කරුවා පිළිගන්නේත් නැහැ. සැපයුම්කරු එක්ක තිබෙන ගිවිසුම අනුව අපට නියමිත ගල්අඟුරු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලැබුණාට පස්සේ ගිවිසුමට අනුව කටයුතු කරනවා කියලා මම මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්න, ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මා ඉදිරිපත් කරනවා, ගරු කථානායකතුමනි. No need to read it.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය ඔබතුමාට කියවන්න පුළුවන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම කිව්වා, ඉදිරිපත් කළා කියලා. එය ප්‍රමාණවත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, ඊට කලින් මට point of Order එකක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න. ඒ කාරණාව ගැන නොවෙයි වෙනත් එකක්. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2) (ආ) යටතේ රීති ප්‍රශ්නයක් තිබෙනවා.

Sir, Standing Order No. 118.(4) states, I quote:

> "The Committee shall also examine any matter referred to it in relation to a violation or non-adherence of the rules of the Code of Conduct of the Members of Parliament…."

ගරු කථානායකතුමනි, මෙහි පැහැදිලිවම තිබෙනවා, Member කෙනෙක් Code of Conduct එකේ තිබෙන කාරණාවක් breach කරනවා නම්, ඒකටත් අපට complain කරන්න පුළුවන් කියලා. ඒකේ පැහැදිලිවම තිබෙනවා, ඒකෙන් එක MP කෙනෙකු intimidate කරන්න හෝ assault කරන්න හෝ බැහැ කියලා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මේක රීති ප්‍රශ්නයක්. ඊයේ මම ඒක දෙනකොට ලේකම් මණ්ඩලය මට කිව්වා, DCC Meetingsවල කුණුහරුපෙන් බැණපු එකට අපි කටයුතු කරන්නේ නැහැ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව ලබා දීලා තිබෙන්නේ අදාළ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කරුණාකරලා කියවන්න කියන්න, Code of Conduct එක. හරි. මම කියවන්නම්, වරප්‍රසාද ප්‍රශ්නය.

## වරප්‍රසාද: යාපනයේ DDC රැස්වීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් අපහාසාත්මක වචන භාවිත කිරීම
## சிறப்புரிமை: யாழ். மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் பாராளுமன்ற உறுப்பினர் ஒருவரின் இழிவான வார்த்தைப் பிரயோகம்
## PRIVILEGE: USE OF OFFENSIVE LANGUAGE BY MEMBER OF PARLIAMENT AT DDC MEETING, JAFFNA

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கைத் திருநாட்டில் உயரிய சபையாகக் கருதப்படுகின்ற இந்தச் சபையின் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் தன் சக உறுப்பினர் ஒருவர் தொடர்பாக மிக மோசமாக மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் வார்த்தைப் பிரயோகங்களைச் செய்தது தொடர் பான முறைப்பாட்டை நான் இங்கு முன்வைக்கின்றேன்.

கடந்த டிசம்பர் மாதம் 26ஆம் திகதி யாழ். மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் கௌரவ அமைச்சரும் மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவருமான ராமலிங்கம் சந்திரசேகர் அவர்களின் தலைமையில் நடைபெற்றது. அந்தக் கூட்டத்தில் கௌரவ பாராளுமன்ற உறுப்பினர்களான சிவஞானம் சிறீதரன் அவர்களும் கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களும் கலந்துகொண்டிருந்தார்கள். அந்தக் கூட்டம் மிக இனிதாகவும் செவ்வனாகவும் கௌரவ அமைச்சர் அவர்களால் நடத்தப்பட்டுக் கொண்டிருந்த வேளையில், மாகாணத்துக்குரிய வைத்தியசாலைகளை மத்திக்குக் கொடுப்பது தொடர்பான விடயமொன்று கௌரவ அமைச்சர் அவர்களால் முன்மொழியப்பட்டது.

இவ்விடயம் தொடர்பில் கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்கள் உரையாற்றிக்கொண்டு இருந்த போது, அது தொடர்பான கருத்தொன்றை நான் சொல்ல முனைகையில், கௌரவ பாராளுமன்ற உறுப்பினரும் ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் உறுப்பினருமாகிய கஜேந்திரகுமார் அவர்கள் என்னை ஒருமையில் விளித்து மிகக் கேவலமாகவும் பொதுமக்களால் கேட்க முடியாததுமான வார்த்தைப் பிரயோகங்களை புற்றுநோயால் இறந்த எனது தாயுடன் தொடர்புபடுத்தி

ஆங்கிலத்திலும் தமிழிலும் மேற்கொண்டிருந்தார். அதில் மிக மோசமான வார்த்தைப் பிரயோகமாக, "புற்றுநோயால் இறந்த உமது தாயுடன் நீர் உடலுறவு கொள்ளும்" என்ற பொருள்பட ஆங்கிலத்தில் நேரடியாக என்னை இழிவாகப் பேசியது அமைந்திருந்தது. அது மட்டுமல்லாமல், புற்றுநோயால் இறந்த எனது தாயை வைத்தியசாலையில் மிகக் கேவலமாக நான் நடத்தியதாக மிக அடிமட்டத்தனமான குற்றச்சாட்டையும் நேரடியாக அந்தக் கூட்டத்தில் முன்வைத்தார். மேலும், என்னுடைய பெயரை விளித்து பாராளுமன்றத்தில் தன்னுடைய கதிரைக்கு அருகில் அமர்த்தி இருக்கிறார்கள் என்று கூறியதோடு, அது தொடர்பாக மிகக் கேவலமாகத் தமிழில் வார்த்தைப் பிரயோகங்களையும் மேற்கொண்டார். இந்த இழிவான வார்த்தைப் பிரயோகங்கள் சாதாரண அடித்தட்டு மக்களால்கூட ஒரு சபையில் பிரயோகிக்கப்பட முடியாதவை ஆகும். அது தவிரவும், பாராளுமன்றத்தில் ஒதுக்கப்பட்ட ஆசனங்கள் தொடர்பாக பாராளுமன்றத்தை அவமதித்தும் அவர் பேசியிருந்தார்.

இந்த உயரிய சபையில் எனது ஆசனத்துக்கு வலப் பக்கத்தில் அவருக்கான ஆசனத்தை தாங்கள் வழங்கி இருப்பது பாராளுமன்றம் தொடர்பில் மிகக் கேவலமான ஒரு கருத்தை பொதுமக்களுக்குத் தெரிவிக்கிறது. கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்றத்தில் ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவில் தொடர்ந்து பதவி வகிக்க மேற்படி நபருக்கு இருக்கும் தகுதிகள் தொடர்பில் மிக ஆழமான ஐயப்பாடுகள் எழுகின்றன. இந்த விடயம் தனியே பாராளுமன்ற உறுப்பினரின் சிறப்புரிமையை மட்டுமன்றி, தமிழ் மக்களின் ஒட்டுமொத்த மரியாதையையும் கலாசாரத் தையும் மிகக் கேவலமாக கேள்விக்குள்ளாக்கி இருக்கின்றது. என்னையும் எனது தாயையும் தொடர்புபடுத்தி மிகக் கேவலமான முறையில் வார்த்தைப் பிரயோகங்களை மேற் கொண்டமையானது, எனது பாராளுமன்ற சிறப் புரிமையை மிக ஆழமாகப் பாதித்திருக்கிறது. எனவே, இது தொடர்பில் ஆராய்ந்து உரிய நடவடிக்கை எடுப்பதற்காக, சிறப்புரிமை தொடர்பான என்னுடைய இந்த வினாவை ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தும்படி கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இன்றிலிருந்து எனது ஆசனத்துக்கு வலப்பக்கத்தில் இருக்கும் கௌரவ பாராளுமன்ற உறுப்பினர் கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களின் கதிரையை உடனடியாக வேறோர் இடத்துக்கு மாற்றுமாறு அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். இவர் தொடர்ந்து எனது ஆசனத்துக்கு வலப்பக்கத்திலுள்ள ஆசனத்தில் இருப்பதால் ஏற்படும் பிரச்சினைகள் தொடர்பாக என்னால் பொறுப்புக்கூற முடியாதிருக்கும் என்பதை நான் இந்த உயரிய சபைக்குத் தெரிவிக்க விரும்புகின்றேன்.

ஒழுக்கமற்ற, பண்பற்ற இந்த நபர் 20 வருடங்கள் இந்தப் பாராளுமன்றத்தில் இருந்திருக்கிறார். இந்த நபர் தொடர்ந்து ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அங்கத்தவராக இருக்க முடியாது என்பதை மிகவும் தாழ்மையுடன் தெரிவித்துக் கொள்கின்றேன். இந்த விடயம் தொடர்பான விசாரணை முடியும் வரை சம்பந்தப்பட்ட நபரை ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவிலிருந்து விலக்கி வைக்கும்படி அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். சம்பந்தப்பட்ட நபரைத் தாங்கள் இந்தக் குழுவிலிருந்து அகற்றுவதற்குத் தவறுவீர்களாக இருந்தால், இந்த நபரால் விசாரிக்கப்படும் ஒழுக்காற்று மற்றும் சிறப்புரிமை தொடர்பான விடயங்கள் பொதுமக்களால் கேள்விக்கு உட்படுத்தப்படும் என்பதை நான் இங்கு தெரிவித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු කථානායකතුමනි, මම මතු කළ සුදත්තගේ කථාවට පොඩ්ඩක් උත්තර දෙන්නකෝ. දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කළ වරප්‍රසාද ප්‍රශ්නය නැවත සභාගත කරනවා. මම එය සභාගත කළේ නැහැ. හැන්සාඩ් වාර්තාවට එය ඇතුළත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I raised a point of Order earlier, but no one is here to reply. මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරපු මුදලුත් මාරු කරලා තිබෙන්නේ. පසුගිය අවුරුද්දේ වැඩ කෙරිලා නැහැයි කියන කාරණය තමයි මේකෙන් ඔප්පු වෙන්නේ. ඒකයි මම ඔබතුමාගෙන් ඉල්ලුවේ කරුණාකරලා මේක මොකක්ද කියන එක කියන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, කිසිදු ආකාරයක එහෙම වැරැද්දක් කරලා හෝ ඉදිරිපත් කිරීමක් නොකර ඉඳලා *නැහැ. [බාධා කිරීමක්]* මෙතුමා කාරණය මතු කළේ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් නම්, මේ රුපියල් බිලියන 500 වෙන් කිරීමට අදාළ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 16වැනි වගන්තියට අදාළ සියලු වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. අවශ්‍ය නම් මම ඒ සියලු වාර්තා නැවත ඉදිරිපත් කරන්නම්. ඒ වාගේම, ප්‍රාග්ධන වියදම් මාරු කිරීම සම්බන්ධයෙන් කිව්වොත්, පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමේදී කිසිදු පරිපූරකයක් සඳහා අතිරේක වියදම් වැඩි කළේ නැහැ. ඒ කියන්නේ, වැය ශීර්ෂ ඇතුළේ තමයි මාරු කිරීම් කළේ. එම නිසා ඒවාට අදාළ දේවල් ඉදිරිපත් කරලා තිබෙනවා. යම් ලියවිල්ලක් ඉදිරිපත් කරලා නැහැ කියලා ඔබ නිශ්චිත වශයෙන් කියනවා නම් ඒ මොනවාද කියලා කියන්න. මගේ පිළිතුරු කථාව තුළදී මම ඒ සියලු විස්තර ලබා දෙන්නම්. බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමා සභානායකතුමා දිහා බලලා මට mike එක දෙන්නේ නැතුව ඉන්න එපා. මට විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩියක් නොවෙයි, මීට කලින්ුත් විනාඩි කිහිපයක් දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා කිව්ව කාරණය වැරැදියි. වෙනත් වගන්තියක් යටතේ තමයි එතුමා කථා කළේ. මම කථා කරන්නේ ස්ථාවර නියෝග 27 (4) යටතේ. මට මේ කාරණය කියන්න ඉඩදෙන්න. මේ සභාව නොමඟ යවන්න එපා. මේක නිසා සභාව සම්පූර්ණයෙන්ම නොමඟ යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
### பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்
### PARLIAMENTARY PENSIONS (REPEAL) BILL

"ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත ඉවත් කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 ජනවාරි 21වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.*

*2026 சனவரி 21, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Wednesday, 21st January, 2026*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒ වාගේම ඔබතුමාගෙන් අවසර ලබා ගත් පරිදි, පාර්ලිමේන්තු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දෙවන සහකාර මහ ලේකම්, සහකාර ලේකම්, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් වශයෙන් පුරා අවුරුදු 33ක් ව්‍යවස්ථාදායකය තුළ විශාල සේවාවක් ඉටු කර, 1994දී විශ්‍රාම දිවිය ආරම්භ කර, විශ්‍රාම දිවිය තුළ පුරා අවුරුදු 30කට වැඩි කාලයක් ගත කරපු හිටපු පාර්ලිමේන්තු මහ ලේකම් නිහාල් සෙනෙවිරත්න මහතාගේ වියෝව පිළිබඳව පාර්ලිමේන්තුවේ සාතිශය සංවේගය පළ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

එතුමා, නීතිඥයෙකු ලෙස විශාල කැපවීමකින් ව්‍යවස්ථාදායකයට සේවය කළ කෙනෙක්. අප 2000 වර්ෂයේ පාර්ලිමේන්තුවට එනකොට එතුමා විශ්‍රාම ගොස් සිටියත්, අපි අවස්ථා කිහිපයකදීම එතුමාව මුණගැසී සාකච්ඡා කර තිබෙනවා. එතුමාගේ අවසාන වසර කිහිපයේදී වාගේම අපි ආණ්ඩු පක්ෂයට ඇවිල්ලා මම සභානායකවරයා වශයෙන් කටයුතු කරන කොටත් එතුමාගෙන් අවශ්‍ය ඕනෑම උපදෙසක්, සහායක් ගන්න කියලා එතුමා අවස්ථා ගණනාවකදීම කියලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මහ ලේකම් කියන්නේ, අපේ රටේ තිබෙන ඉතාම වැදගත් තනතුරක්. ඒ තනතුර ශක්තිමත් කරමින්, ඒ තනතුරට අවශ්‍ය ආලෝකය එකතු කරපු මහ ලේකම්වරයෙක් ලෙස එතුමා කටයුතු කළා.

වෘත්තීය ජීවිතය තුළ එතුමා මේ රටට විශාල සේවයක් ලබා දුන්නාය කියලා මම හිතනවා. එතුමා අවුරුදු 91ක් ජීවත් වෙලා අපෙන් සමුගෙන තිබෙනවා. එතුමාගේ සේවය අගය කිරීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත
## கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்
## COLOMBO PORT CITY ECONOMIC COMMISSION (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Nishantha Jayaweera. You have 12 minutes.

[පූ.භා. 11.21]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, අද දින කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට බඳුන් කරනවා. මෙය සංශෝධන පනත් කෙටුම්පතක් විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්න හේතුවක් තිබෙනවා. විශේෂ කමිටුවක් විසින් 2021 අංක 11 දරන පනත පිළිබඳව විධිමත් අධ්‍යයනයක් කරලා නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. අන්න ඒ නිර්දේශ ද සැලකිල්ලට අරගෙන 2025 නොවැම්බර් 24වැනි දින කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරනවා, මෙන්න මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ආයෝජන කැඳවීමට තිබෙන බාධා සහ ලෝකයේ තිබෙන නවීන නීති රීති එක්ක අනුගත වෙන්න තිබෙන බාධා ඉවත් කරන්න මෙන්න මේ සංශෝධන ටික ඉදිරිපත් කරලා එතෙක් පැවැති පනත සංශෝධනය කරන්න. අපි මුලින්ම මේ පනත් කෙටුම්පත යටතේ ඉදිරිපත් වෙන කරුණු මොනවාද කියලා බලමු.

ප්‍රථමයෙන් tax incentives විධියට ඉදිරිපත් කරලා තිබෙනවා, බදු සංශෝධන වගයක්. ඒවා මොනවාද කියලා බැලුවොත්, මෙහිදී ප්‍රධාන වශයෙන් ව්‍යාපාර වර්ග කොටස් දෙකක් හඳුනා ගන්නවා. පළමුවැනි එක තමයි, Primary Business of Strategic Importance - PBSI - කියන එක. දෙවැනි වර්ගය තමයි, Secondary Business of Strategic Importance - SBSI - කියන එක. මෙන්න මේ ප්‍රධාන වර්ග දෙක යටතේ නිර්ණායක කිහිපයක් මත බදු සහන දෙන්න තීරණය කරනවා. එතකොට PBSI යටතේ හඳුනා ගන්න ආයෝජකයින් ප්‍රධාන වශයෙන් කොටස් හතරකට බෙදෙනවා. ඒ අනුව, ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආයෝජනයක් ගෙනෙන ආයෝජකයෙකුට වසර 10ක සමාගම් ආදායම් බදු නිදහසක් ලබා දෙනවා. ඒත් එක්කම project implementation period එක අවුරුදු 5ක් දක්වා දීර්ඝ කරලා ලබා දෙනවා. ඊට අමතරව ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ආයෝජනයක් සහ රැකියා අවස්ථා 300ක් උත්පාදනය කරලා දෙන ආයෝජකයෙකුට වසර 12ක සමාගම් ආදායම් බදු නිදහසකුත්, වසර 6ක project implementation period එකකුත් ලබා දෙනවා. ඊට අමතරව ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක -ඇමෙරිකානු ඩොලර් බිලියනයක- ආයෝජනයක් සහ රැකියා අවස්ථා 300ක් ඇතුව එන ආයෝජකයෙකුට අවුරුදු 15ක සමාගම් ආදායම් බදු නිදහසක් සහ වසර 8ක project implementation period එකක් ලබා දෙනවා. ඊට අමතර ඇමෙරිකානු ඩොලර් මිලියන 25ක ආයෝජනයක් සහ රැකියා අවස්ථා 100ක් ඇතුව එන ආයෝජකයෙකුට වසර 8ක සමාගම් ආදායම් බදු සහන කාලයකුත්, වසර 4ක project implementation period එකකුත් ලබා දෙනවා.

මෙහි තිබෙන විශේෂම කාරණය මේකයි. මෙන්න මේ ආකාරයෙන් එන ආයෝජකයෙකුට මීට අමතරව ඒ project implementation period එක ඇතුළේ සිදු කරනු ලබන සියලුම ආනයන වෙනුවෙන් ගෙවන්න වෙන Custom Import Duty, PAL සහ CESS කියන බදුවලින් නිදහස් කරනවා. හැබැයි, මේ ආයෝජකයින් VAT එකට liable වෙනවා. VAT එකට liable වුණාට ඒගොල්ලන්ට VAT එකක් ගෙවන්න වෙන්නේ නැහැ. මොකද, ඒගොල්ලන්ගේ output tax එක zero නිසා ඒ ආනයනයට අදාළව ගෙවන VAT එක ඒගොල්ලන්ට ආපසු ගෙවීමක් විධියට ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

ඊළඟට, Secondary Business of Strategic Importance කියන category එක යටතේ එන ආයෝජකයෙකුට වසර 4ක කාල සීමාවක් දක්වා සියයට 7.5ක අනුපාතයට බදු සහනයක් ලබා දෙනවා. ඒ යටතේ එන ආයෝජකයෙකුටත් Custom Import Duty එකට, PAL එකට සහ CESS එකට නිදහසක් ලැබෙනවා. මෙන්න මේ බදු සම්බන්ධයෙන් tax incentives ටික තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත යටතේ යෝජනා වෙන්නේ.

විශේෂයෙන්ම කියන්න තිබෙන දේ මේකයි. සාමාන්‍යයෙන් ආයෝජකයෙක් අපේ රටට එනකොට බදු සහන විතරක් නොවෙයි තීරණාත්මක නිර්ණායකය වන්නේ. ඊට අමතරව ඉතාම තීරණාත්මක වන තවත් ප්‍රධාන කරුණු 3ක් තිබෙනවා. ඉන් පළමු කරුණ තමයි, රටක පවතින ආර්ථික සහ දේශපාලන ස්ථාවරත්වය. මොකද, අපේ ජාතික ජන බලවේගය රජය බලයට පත්වීමත් එක්ක ඉතාම හොඳ ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරලා තිබෙනවා. ඒත් එක්කම දේශපාලන ස්ථාවරත්වයකුත් ඇති කරලා තිබෙනවා. අන්න ඒ යටතේදී විශේෂයෙන්ම මේ රජය විසින් පවත්වාගෙන යන මූල්‍ය විනය ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිගෙන තිබෙනවා. ඒ මූල්‍ය විනය සහ අල්ලස, දූෂණය අවම කිරීමත් එක්ක ණය ශ්‍රේණිගත කිරීම් යම් ඉහළ මට්ටමකට ගන්න හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම ආයෝජකයන්ට තිබෙන ප්‍රධාන බාධාවක් තමයි, ආයෝජනයක් ගෙනැල්ලා මේ රටේ ලියාපදිංචි

[ගරු නිශාන්ත ජයවීර මහතා]

වෙන්න විශාල කාලසීමාවක් ගත වෙන එක. අන්න ඒ කාලසීමා අවම කරන්න අවශ්‍ය තනි කවුළුවක් - Single Window එකක් - ඇති කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරන් තිබෙනවා. අන්න ඒවා තමයි තීරණාත්මක සාධක වෙන්නේ. එහෙම නම්, පළමුවැනි තීරණාත්මක සාධකය තමයි, ආර්ථික සහ දේශපාලන ස්ථාවරත්වය ඇති කිරීම.

දෙවැනි තීරණාත්මක සාධකය තමයි, යටිතල පහසුකම්. ඒ කියන්නේ රටේ යටිතල පහසුකම් වැඩි කරගන්න එක. ඒ යටිතල පහසුකම් වැඩි කරගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඔබතුමන්ලා 2026 වසරේ අය වැය කියෙව්වා නම් පෙනී යයි, රජය විසින් අපේ රටේ යටිතල පහසුකම් වැඩිදියුණු කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරන් තිබෙන බව.

තුන්වැනි එක තමයි, පුහුණු ශ්‍රමිකයන් සහ හොඳ ශ්‍රම බලකායක් ඉන්න එක. අපේ රටේ හොඳ මානව සම්පතක් තිබෙනවා. ඒ අනුව පුහුණු ශ්‍රමිකයන් අවශ්‍ය ප්‍රමාණයට වැඩි කරන්න මේ රජය විසින් අවශ්‍ය කටයුතු කරගෙන යනවා. එතකොට මම කියපු මෙන්න මේ නිර්ණායක තුනත් අර බදු සහනවලට අමතරව ආයෝජන කෙරෙහි බලපානවා.

බදු සහන ගැන කථා කරද්දි කියන්න ඕනෑ, දැනටමත් රටවල් 46ක් එක්ක ශ්‍රී ලංකාව ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට එළැඹිලා තිබෙන බව. ඒ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමකට - double taxation avoidance agreement එකකට - එළඹුණු රටක ආයෝජකයෙක් මේ රටට එනකොට ඒ ආයෝජකයා මේ රටේදී යම් බදු මුදලක් ගෙව්වත්, තමන්ගේ ලාභය තමන්ගේ රටට ප්‍රේෂණය - remit - කරන වෙලාවේදී මෙහේදි ගෙවන බදු මුදල බදු බරක් විධියට ඔහුට අඩු කරගන්න පුළුවන්. අන්න ඒක හින්දා මේ බදු සහන ඉතාම තීරණාත්මක සාධකයක් වෙන්නේ නැහැ. ආයෝජන කැන්දන්න ඒවායෙන් යම් ප්‍රමාණයක සහයෝගයක් ලැබෙනවා. නමුත් දැන් double taxation avoidance agreement එකක් තිබෙන රටක ආයෝජකයෙක් මෙහාට ඇවිල්ලා මෙහෙන් බදු අය කළත්, තමන්ගේ ලාභය ඒ රටට ප්‍රේෂණය කරද්දි ඒ ආයෝජකයාට ඒ අය කරන බදු ප්‍රමාණය බදු බරක් විධියට අඩු කරගන්න පුළුවන්. මෙන්න මේක තමයි අපේ නව සංශෝධන පනත් කෙටුම්පතෙන් බදු සහන විධියට ලබා දෙන්නේ.

ඊට අමතරව මේක යටතේ තවත් එකක් එනවා, APIT කියලා. ඒ කියන්නේ, Advanced Personal Income Tax කියන එක. දැනට ලියාපදිංචි වෙලා ඉන්න ආයෝජකයෙක් ඉන්නවා නම් ඒ ආයෝජකයාට මේ පනත සම්මත වෙලා මාසයක සිට පටන් ගෙන වසර 3ක කාලයක් යනකම් ඒ APIT එක ගෙවීම නිදහස් වෙනවා. නමුත් අලුතෙන් ආයෝජකයෙක් එනවා නම් ඒ ආයෝජකයා යටතේ සේවය කරන සේවකයන් APIT එකට යටත් වෙනවා.

ඊට අමතරව මේකෙන් තවත් විශේෂ දෙයක් හඳුනාගෙන තිබෙනවා. අනුකූලතාව සහ අධීක්ෂණය ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර අරන් තිබෙනවා. මේ යටතේදි එන ආයෝජකයෙක් ඒ ආයෝජනය පටන් ගත්ත අවස්ථාවේ ඉඳන්ම තමන්ගේ ආදායම් වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දෙන එක අනිවාර්ය කරලා තිබෙනවා. අන්න ඒ වාගේ අනුකූලතාව වර්ධනය කරන්න අවශ්‍ය නීතිමය සංශෝධන මේ පනත් කෙටුම්පතේ ඉදිරිපත් කර තිබෙනවා.

ඊටත් අමතරව තිබෙන තවත් විශේෂ දෙයක් තමයි, බදු සහනවලට දෙන අනුකූලතාව පරීක්ෂාවට ලක් කරන්න, අනුකූලතාව සහ විනිවිදභාවය තහවුරු කරන්න අවශ්‍ය විධිවිධාන මේකට ඇතුළත් කර තිබීම. එතකොට මුදල් අමාත්‍යාංශය විසින් කාර්තුමය පදනමින් ඇගැයීමක් සිදු කළ යුතු බවට අවශ්‍ය නීතිමය සංශෝධන මේකේ ඉදිරිපත් වෙනවා. ඊට අමතරව නියාමන පියවර අරන් තිබෙනවා. මෙතෙක් පැවති පනතේ තිබුණා, කවුරුහරි කෙනෙක් ඇවිල්ලා මේකට ලියාපදිංචි වුණොත්, ඒ ලියාපදිංචි වෙන කෙනා අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදීම මූලික වශයෙන් ඉඩම් පරිහරණ ගාස්තු සහ ඒ හා සම්බන්ධ වෙනත් අයකිරීම් ගෙවන්න ඕනෑ කියලා.

නමුත් මේ පනත් කෙටුම්පතින් ඒක සංශෝධනයට ලක් වෙනවා. අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන ආයෝජකයා ඒ අයදුම්පතට අදාළ මුදල, ඒ කියන්නේ අයදුම් කිරීමේ ගාස්තුව පමණයි මුල් අවස්ථාවේදී ගෙවන්න වෙන්නේ. අනෙක් ගාස්තු ගෙවන්න වෙන්නේ ඒ අයදුම්පත සලකා බැලීමට ලක් කරලා ඔහු ලියාපදිංචියට ලක් කළොත් විතරයි. ඒ සංශෝධනයත් මේකේ ඇතුළත් වෙනවා. ඊටත් අමතරව වාර්ෂිකව බදු ආදායම් අහිමි වීම ප්‍රකාශයට පත් කිරීම සහ ඇස්තමේන්තුගත කිරීමේ නීතිමය විධිවිධාන මේකේ තිබෙනවා.

ඒ වාගේම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී අනුකූලතාව නංවන්න අවශ්‍ය කටයුතු මේකට ඇතුළත් කරලා තිබෙනවා. මෙන්න මේ සියලු කටයුතු සැලකිල්ලට ලක් කිරීමේදී ආයෝජන වඩාත් හොඳින් ආකර්ෂණය කර ගන්න අවශ්‍ය විධිවිධාන මෙතැනට ඇතුළත් කරලා තිබෙනවා. ඊට අමතරව, අපේ මේ රජය විසින් පසුගිය වසරේදී පවත්වාගෙන ගිය ආර්ථික ජයග්‍රහණ මොනවාද කියලා අපි බලමු. 2025 අවුරුද්දේ අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.2ක ප්‍රමාණයකට ළඟා කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඒ සඳහා 122කට වැඩි ක්‍රියාකාරකම් සිදු කරලා තිබෙනවා. ඊට අමතරව Export Development Council of Ministers මඟින් ගත් ප්‍රතිපත්තිමය තීරණ අනුව TVRS - Tourist VAT Refund System - එකක් කටුනායක ගුවන් තොටුපොළේ ඇති කළා.

මැණික් කර්මාන්තය සම්බන්ධ යම් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඊට අමතරව වසර පහකට අපනයන විවිධාංගීකරණ මාර්ගෝපදේශයක්, ඒ කියන්නේ සැලැස්මක් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙන්න මේ කරුණු මඟින් අපනයන ආදායම වැඩි කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඊටත් අමතරව මේ සැලැස්ම ඇතුළේදී වසර පහක් ගතවෙන කොට අපේ අපනයන ආදායම බිලියන 36කට ගෙන යන්නේ කොහොමද කියලා අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපේ අපනයන ආදායම ඒ ආකාරයෙන් වැඩි කර ගන්න කොට විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඩොලර් බිලියන 7.8ක් දක්වා ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවා.

සංචාරක ආදායම ඩොලර් බිලියන තුනක් ලබා ගෙන තිබෙනවා. ඊටත් අමතරව ඍජු විදේශ ආයෝජන - foreign direct investment - ඩොලර් බිලියන එකකට වැඩි ප්‍රමාණයකට ළඟා කරගන්න හැකි වෙලා තිබෙනවා. මෙන්න මේ සියලු කරුණු ඇතුළේදී අපේ ජංගම ගිණුමේ ශේෂය ඩොලර් බිලියන 1.7ක ධන අගයකට පත් කර ගන්න රජය සමත් වෙලා තිබෙනවා. ඊටත් අමතරව අපි ඉතිහාසයේ පළමුවැනි වතාවට රජයක් විසින් අය වැයකින් ඉදිරිපත් කරපු ආදායම් ඇස්තමේන්තුව ඉක්මවා ගිය ආදායමක් උපයා ගන්න සමත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

මේකට ප්‍රධාන වශයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ සුරා බදු දෙපාර්තමේන්තුව දායක වෙනවා. ඒ දෙපාර්තමේන්තුවලට ලබා දීලා තිබුණු වාර්ෂික ආදායම් ඉලක්කයන්ට එහාට, සංශෝධිත ආදායම් ඉලක්කයන්ටත් එහාට ආදායම් ලබා ගන්න හැකි වෙලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගත්තොත්, ඒ ඉලක්කවලින් එහාට බිලියන 49ක ආදායමකුත්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ගත්තොත් බිලියන 288ක ආදායමකුත් -ඒ කියන්නේ, ලබා දීපු සංශෝධිත ඉලක්කයටත් එහාට ගිය බිලියන 288ක ඉලක්කයක්- සහ සුරාබදු දෙපාර්තමේන්තුව ගත්තත් ලබා දීපු ඉලක්කයට එහාට බිලියන පහක ඉලක්කයක් ළඟා කර ගන්න සමත් වෙලා තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුවල බදු පරිපාලනය ශක්තිමත් කිරීම, ජනතා විශ්වාසය තහවුරු වීම සහ ඒ නිලධාරින්ගේ කැප වීම අගය කරනවා. අපි අවශ්‍ය නීතිමය සංශෝධන වරින් වර ඉදිරිපත් කරලා, ඒ බදු ක්‍රමය සරල කරලා බදු ආදායම වැඩි කරගන්න අවශ්‍ය පියවර ගන්න කටයුතු කරන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Rauff Hakeem. You have 20 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[11.34 a.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairperson of Committees, the Hon. Bimal Rathnayake, the Leader of the House, brought to our notice the passing away of one of our former distinguished Secretaries-General, Mr. Nihal Seneviratne. I would like to add my tribute to him from the Opposition.

I was, particularly, fortunate to have been in the same position you are holding, Madam Chairperson - the position of Deputy Chairman of Committees - when I first entered Parliament way back in 1994. When I came to Parliament as a fresher and was expected to preside over the House, Mr. Nihal Seneviratne's presence, as the then Secretary-General of Parliament, was a great strength to me. Everybody knows that in the long line of several Secretaries-General, Mr. Nihal Seneviratne did a yeoman service and was one of the finest gentlemen who served this House. I had many interesting engagements with him. Particularly, when he rose from his official chair to advise the Chair on many matters, he had occasionally - several times - shared interesting anecdotes with me about the happenings in the House in the past and what would happen in the future.

He was a very fine gentleman and remained a very loyal Royalist as well. We all were from the same school but from different generations, and all the Royalists would remember that he served the College's every event with dedication as a committed member of the Royal College Union. He was seen at every important match, be it the Bradby Shield or the Royal-Thomian match. Sir, I would like to pay my tribute to that fine gentleman who served this Assembly for many long years. I would also like to convey my condolences to his family, particularly to his son, Satyajit, who was my contemporary at the Royal College.

Sir, I am quite conscious that, as the opening speaker for the Opposition at today's Debate on this important Amendment to the Colombo Port City Economic Commission Act, I am expected to properly dissect the provisions that are to be debated today. Before I come to that, I would like to digress for a moment to speak about the recent disaster caused by Cyclone "Ditwah". In its aftermath, several neighbouring countries such as India, Pakistan and several others sent their Rapid Deployment Forces to this country to assist us. Among that lot, I must remember with gratitude the service of the Search and Rescue Team from the United Arab Emirates because we had the opportunity of watching what an expert and efficient service they rendered to the people of Sri Lanka. I had the privilege of seeing them work in areas such as Deltota. Deltota and Galaha areas were totally cut off from the rest of the country due to the severe and massive landslides occurred everywhere. So, we were unable to reach Deltota for almost a week and that team came there and assisted us in the search and rescue mission with such efficiency. We also remember Mr. Muneer Sadhiq, Member of the Pathahewaheta Pradeshiya Sabha representing the Samagi Jana Balawegaya, who coordinated their visit. They came there, had meetings at the Divisional Secretariat, went all over the place and assisted in the rescue missions as well as in providing dry rations and various other assistance to the affected people of the area.

They came there on 10th December and travelled all over. Particularly, they looked into the hospital in Deltota and also into several necessary infrastructure improvements lacking in the area, particularly the water supply scheme and school buildings. They made a provisional promise that they would convey to their Government about the situation here and try and see whether support could be provided for the development of the hospital, for the water supply scheme in that area, assist in setting up industries to help find productive employment for the people of the area and also in resettlement of the people. Many government lands are available in the area. So, to the people who had been affected and cannot return to their original homes, promises had been made by them to help when

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

resettlement takes place. Therefore, Sir, I would like to acknowledge their good work in Deltota and various other areas.

I would also like to thank the Rapid Deployment Forces from India and Pakistan, who also did a similar service to all the affected people in our area. I would like to especially thank the Emir of the United Arab Emirates, Sheikh Mohamed bin Zayed Al Nahyan and their Embassy for having sent this particular Search and Rescue Team, who served us efficiently. Once again, I would like to convey the gratitude of the Sri Lankans and the Government for sending us such a wonderful team.

Having said that, Sir, I would like to digress a little more on another issue concerning the cyclone, which affected the Karaitivu area in Puttalam.

இப்போது ஏற்பட்ட அனர்த்தத்தின் காரணமாக காரைதீவு - சின்ன நாகவில்லுப் பிரதேசத்தில் பல இடங்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. அங்குள்ள 25க்கும் மேற்பட்ட வீடுகள் இன்னும் வெள்ள நீர் வற்றாமல், நெஞ்சளவுக்குத் தேங்கி நிற்கின்ற ஓர் அபாயகரமான நிலைமையில் இருக்கின்றன. எனினும் அரச தரப்புப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இந்த விடயம் உண்மைக்குப் புறம்பானது என்ற வகையில் நேற்றுப் பாராளுமன்றத்திலே ஒரு கூற்றை வெளியிட்டிருந்தமை மிகவும் கவலைக்குரியது, கண்டனத்துக்குரியது என்பதை நான் இங்கே சொல்லிவைக்க விரும்புகின்றேன். பாதிக்கப்பட்ட அந்த மக்கள் தங்களுக்கான மாற்று வீடுகள் சம்பந்தமாக இன்னும் அங்கலாய்த்துக் கொண்டு இருக்கிறார்கள். ஒரு மாதம் கடந்தும் அங்கு இன்னும் நீர் வற்றவில்லை என்ற காரணத்தினால், அவர்கள் தங்களுடைய வீடுகளில் வசிக்க முடியாத நிலையில், அவர்களுக்கு வேறிடங்களில் அரச நிலங்களைப் பிரித்துக் கொடுப்பது சம்பந்தமாக இன்னும் அரசாங்கம் நடவடிக்கை எடுக்கவில்லை என்ற குற்றச்சாட்டைச் சொல்லிக் கொண்டிருக்கிறார்கள்.

அப்படியிருக்கும்போது நேற்று அந்தப் பாராளுமன்ற உறுப்பினர் அவர்கள் இதற்கு மாற்றமாக, இதை மறுதலித்துப் பேசியது குறித்து என்னுடைய கவலையை நான் தெரிவித்துக் கொள்கின்றேன். அவர் அந்தப் பிரதேசத்தில் வெள்ள நீர் வற்றிவிட்டதாகச் சொன்னாலும், இன்னும் அது வற்றவில்லை, அது உண்மைக்குப் புறம்பானது என்பதை அந்தப் பிரதேசத்திற்குச் சென்றுவந்த, இங்கு என்னோடு இருக்கின்ற சக பாராளுமன்ற உறுப்பினர் சகோதரர் ஹிஸ்புல்லாஹ் அவர்களும் உறுதிப்படுத்துகிறார் என்று நான் சொல்லிவைக்க விரும்புகிறேன்.

Hon. Deputy Chairperson of Committees, may I now come to the subject matter we are debating today - the Amendments to the Colombo Port City Economic Commission Act. As a matter of fact, I think we are trying to bring in these Amendments in order to get away from the situation in the very indeterminate few months, during which time no Regulations were enacted, the existing Regulations lapsed and therefore, new Regulations had to be enacted. That situation has created different perceptions even among the investors. At least now, we have brought in some clarity through these Amendments. However, I must point out here that, perhaps, these are being brought in to please the IMF. The International Monetary Fund may be having their strictures and wanting us to increase our revenue; they are looking at these issues in a different perspective. But in negotiating with them, we must consider whether we have done justice to the investment climate in this country.

Particularly, when you compare a project like the Colombo Port City Economic Commission and the Colombo Port City with that of the rest of the world, we need to have a competitive, concessionary framework. Now, you look at Macau, Mauritius and many other places such as Dubai and Singapore. When you look at the comparative concessions offered by us, we seem to be in a position where we may not be able to attract such investments, if we go on to reduce the concessions that have already been incorporated previously. All of this has been done to please the IMF.

Now, I have before me a statement by Mr. Arjuna Herath, the Chairman of the Board of Investment published in the "Daily Mirror". He says, I quote:

> "IMF acts as biggest impediment in drawing Foreign Direct Investments to Sri Lanka as policies render country unattractive."

This is their own, current Chairman of the Board of Investment. He is tendering his resignation, he says. The "Daily Mirror" further reports, I quote:

> "Mr. Arjuna Herath, the Chairman of Board of Investment, the one stop shop for attracting investments in December announced that he would step down from his post by the end of this month, just under 16 months into his tenure.
>
> Any tax incentive that the BOI wants to offer beyond what is currently there needs the IMF's rubber stamp...."
>
> "Sri Lanka does not offer any compelling reason for global industrialists or investors to relocate to Sri Lanka with its current tax policy and challenges."

The situation being such, your own Chairman of the Board of Investment is saying this about the IMF. So, what type of negotiations have you done with the IMF?

Yesterday, at the Committee on Public Finance, in fact, to a certain extent, we questioned the officials who came representing the Colombo Port City Economic Commission. Of course, its Chairman, Mr. Harsha Amarasekara, was abroad and he could not come. But, he had come on a previous occasion. They shared many of their sentiments with us and we could see that there was also some convergence among the members themselves; it was quite evident. Some of us Members who were there yesterday observed that because there was difference of opinion among the members of the Commission itself as to whether these new revised incentives would be enough to attract investments to our country. Of course, I can go into detail about such proposals. Yesterday, we had members like Dr. Harsha Subasinghe, who himself is a very experienced investor. He has his own firm in Dubai and various other places. So, they themselves had some difference of opinion as to whether this new incentive scheme would be enough to attract investors. In fact, he was urging that we must have a zero per cent Income Tax with regard to employees.

Even the secondary investments that are coming should have that particular provision for employees. If employees are to pay a 36 per cent Income Tax, who will relocate here? That is the issue. So, the incentives we have now revised stand at 7.5 per cent for IT industries. If an IT firm relocates here and wants to export their products abroad, they will be charged 7.5 per cent, whereas outside this special economic zone, they will be charged 15 per cent. That is why they have said that because it is 15 per cent, we will make it more rational and bring it down to seven-and-a-half per cent, whereas there are other economic zones elsewhere in the country which charge only zero per cent tax. In those, there is no charge at all, no Income Tax at all. So, who will come and relocate here? That is the whole problem. So, as far as the IMF is concerned, we should have had much more robust negotiations with them to force their hand to see that the existing concession should continue. But, now we have revised it and brought it to 7.5 per cent, which, again, is uncompetitive when you compare with other zones.

As regards investments, we raised various questions from those who came to the Committee. Mr. Harsha Amarasekara, who is a very prominent President's Counsel and a friend of mine as well as of the Chairman of the Committee on Public Finance, was there. They came and explained, but you could see that they also had inhibition in their minds whether this would be sufficient for them to attract investors. Well, of course, the Director General, having been the acting Director General for some time and being a fine gentleman himself, has to sing for his supper. We cannot blame him. He, of course, was showing some confidence saying, "Well, we will be able to do something."

The, when we look at the entire portfolio of real estate development, they are expecting, by these investments, at least 14 billion dollars to come in. They are expecting these 14 billion dollars to come in, if all the 74 plots are given out and development takes place. With that 14 billion dollars coming in, they are expecting further value addition to the economy or further economic advantages to the tune of almost 13 billion dollars. So, altogether, we are expecting that a range of 30 billion dollars would come in, if all the real estate plots are taken and development does happen. But, when we questioned them how much of it has already come in, they said, "Commitments have come and we are expecting some other developers also. Only three or four of them are there. In the first quarter, we are hoping upon hope that they would start work, at least those four developers". One is a marina development, the other is a residential parcel, there is also a mixed development parcel and they are expecting a hotel parcel as well, which has still not fully committed. They say that the total investment they are expecting from all those four parcels would become a reality. So, if all these four parcels become a reality, they will bring in only 1.2 billion dollars, whereas they are expecting 14 billion dollars!

So, a small pittance is going to come in. If they look at the value-added advantage of this development, they are expecting almost another 13 billion dollars, if all the investments do become a reality. That, again, is a moot point. In fact, the Chairman of the Committee advised that they speak to the Department of Census and Statistics and see whether, realistically, the value addition to the economy would be in the range of 13 billion dollars. Our entire economy is about 100 billion dollars. So, that is about 13 per cent of our GDP! That is a massive change and it would be welcome to the economy, if that happens. But then, with this kind of incentives offered, having the incentive we had originally given revised or downsized, will there be investor confidence in the country's infrastructure sector, especially in this economic zone we have set up?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Nobody will come.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, hardly anybody would come. All of us wish that the dream of the Government would materializes because all of us want the investors to come here. We are not criticizing, but are only sharing our inhibitions, which were also shared by the Chairman and a few other members of the Commission themselves because they are experienced people and leading businessmen. The Chairman himself had been an adviser to many business organizations in the country.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Having shared all those observations, let us hope that the dream of this Government would materialize finally and these new Regulations that are being gazetted would be sufficient enough to attract enough investments to improve our economy.
Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 11.54]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන්නට මට ලැබුණු විනාඩි 12ක කාලය

[ගරු චතුරංග අබේසිංහ මහතා]

තුළ, විශේෂයෙන්ම ආර්ථිකය ගැන අවධානය දක්වන, ආර්ථිකය ගැන උනන්දුවක් තිබෙන අපේ රටේ ජනතාවටත්, විදේශ ආයෝජකයන්ටත්, විදේශීය රටවල ජීවත් වන ලාංකිකයන්ටත් මේ පණිවුඩය හරියාකාරව ලබා දෙන්න අවශ්‍යයි කියලා මම හිතුවා.

Actually, if we really look at the country's current status, we could see that we have been moving on the right trajectory. We all know that past governments failed us over the past 20-30 years and pushed us into an economic crisis, which was mainly due to the foreign debt crisis. That is why Sri Lanka had to go to the IMF in 2022 and get into a programme until 2027 to make our debt sustainable. At that point, when we, the current Government, came into power, we had to go on with the IMF framework. We are in agreement and we are moving ahead very clearly along the indicators that have been set for us. Mainly, fiscal discipline has been achieved and therefore, it has reduced the requirement to borrow. Debt sustainability is now clearly forecastable, indicating where Sri Lanka would be be in terms of our debt and our debt servicing capability by 2030. So, the indicators we should be looking at are whether our exports are improving, whether our FDIs are improving, whether our foreign direct remittances are improving and whether our tourism industry is improving. What we have to say now is that, in 2025, we were able to achieve all of the targeted indicators including the fiscal indicators. Now, there is no criticism for anybody in the Opposition, for those outside or in the economic sphere to make that Sri Lanka is derailing the programme we are on.

So, in that light, the Port City owned by the Sri Lankan Government, which is 269 hectares in extent, is a great asset that is going to give us a bonus beyond the economic opportunities we have at this point in time. That is why this Amendment to this Act is very important and we have brought in the changes to strengthen the regulatory framework. The House needs to know that the regulatory framework under the previous Act was not enough for us to run an economic zone in a global context. Also, rules-based investment incentives were not there and it was very unclear to investors as to how much incentives they would get and what we would get. Basically, earlier, any investor could get 25 years, whether it be a primary investment or a secondary investment. So, it had been like that. There was no standardization across the globe as to how we would really bring these incentives in. So, therefore, this particular Amendment to the Act makes the regulations clear and gives a standard ona global context for the investors to come in. So, this is a change that is going to allow the Colombo Port City Economic Commission to approve more and more investments in the pipeline, which they were unable to do, probably, during last year.

If you take the other change that are going to take place, one is offshore banking, which is going to get regulated properly by the Central Bank. It is being clearly articulated. Then, the Personal Income Tax is going to be equitable. Otherwise, the people who work within the zone would be tax-free while those working outside would be taxed. So, that ambiguity has been cleared. Also, the mandatory tax filing for the IRD is very specifically mentioned and free structure changes have been made to make the investors' lives easier. So, those are the fundamental changes that have come through this Amendment. At the same time, with regard to Ease of Doing Business, there will be another amendment brought in next month to ensure that there would be more ease for investors to come in.

If you really look at this particular plot of land, we have 178 hectares set aside for development purposes, another 91 hectares for public utilities and also a lagoon that is going to be used for many activities.

This would be positioned as a regional business hub and the current Commission and the team are very confident that Sri Lanka would offer more opportunities beyond tax benefits based on its location and the situation in the region. IT industry, financial services, shipping and logistics, professional services and corporate headquarters, regional distribution centres and tourism would be the sectors that would attract most. We are happy to say that there has been a lot of interest shown, especially in 2025.

My Friends in the Opposition who spoke earlier have to understand that this is what the IMF said. This is exactly what Ranil Wickremesinghe agreed on with the IMF on 27th November, 2023, where he agreed to remove all the concessions. When we came into power, we had to negotiate with the IMF and come to an agreement with them on the 24 companies that had been agreed on earlier to be continued. That was the negotiation we did when the IMF said we could not even grant concessions to those 24 companies. That is how they were protected.

At the same time, the IMF clearly said that, now, we need to bring in a proper resolution, a proper Act in line with global standards for us to continue with this project. That is what this Government has done through negotiations. So, by looking at the standards and similar investments made around the world, we have brought in these changes.

Then, if we take the previous approvals, there were four projects amounting to Rs. 1.2 billion approved in this House last July. So, that will be the first investment we are going to get in 2026, the Rs. 1.2 billion worth of investments that would come through the Port City. At the same time, what we need to understand is that the team is quite confident that this project could be taken forward.

We also need to understand that we are within the IMF framework and are adhering to its certain guidelines and rules. Actually, the sovereignty in taking financial decisions had been killed by you all. That is how you governed this country for the last 20 years and the Sri Lankan Government did not get enough tax revenue. So, you continued to borrow locally. Then, you went for ISBs. You got Sri Lanka into trouble, where we had to pay US Dollars 4.4 billion in external payments by 2019. That is how the crisis occurred. Now, we have

restructured that. We had a restructuring programme when this Government came into power and we agreed to it. Now, we can gradually start repaying our debt, which, again, will go up 2032 and by 2028, we only have to pay an additional Rs. 700 million. So, there is nothing to be scared about. We are on the right trajectory now.

Now, this particular framework, this particular change is going to give us a bonus. What is that bonus? Today, I got this data from the team itself. With these changes and Amendments, currently, there are investments in the pipeline worth of Rs. 3.9 billion for the Colombo Port City. That is what we, as citizens, as the Opposition and as the Government of Sri Lanka, we need to be happy about. There is a funnel of Rs. 3.9 billion. And, out of that, Rs. 1.4 billion is already approved. So, it is only a matter of time until they bring in the money this year and commence those four large projects, which are worth of Rs. 1.2 billion. The applications for these projects amount to US Dollars 732,000 million.

With all these aspects, the Colombo Port City Economic Commission and the team are quite keen that with the discipline the Government is maintaining and with the plan that the Government is putting forward, it is quite possible to fill up this space. Moreover, it is very clear that if we really fill up this space based on the analysis that has been done, the total investment will be close to US Dollars 15 billion. You also need to understand that under the DSA that has been agreed with the IMF, our annual requirement of FDIs is hovering around US Dollars 1 billion. This year itself, we crossed US Dollars 1 billion. So, we are bettering exports, FDIs, foreign remittances and now, we are getting a certain amount of grants as well, given the situation after Cyclone "Ditwah". So, our foreign currency reserves and the ability to repay debt is going to get stronger and stronger. Therefore, there is no point in the Opposition and people who have no clue about economics going before the media and saying that Sri Lanka is going to fail.

We are on a very strong growth trajectory and if you really look at the growth forecast for the country next year, the nominal growth is projected at 8.5 per cent, which was in the original plan. But, we all need to know that there is a requirement for us to keep the inflation at 5 per cent; that is a requirement under the programme because for a growing country to sustain a healthy inflation is required. The real GDP growth is planned to be at 3 per cent. That is the expectation of the IMF. With that, we are going to get a Government revenue of 15.4 per cent of GDP, which will allow us to keep bringing down our debt servicing cost. The debt servicing team who looks at debt sustainability today have projected that by 2030, the interest bill of the Government will fall from 52 per cent to 35 per cent, which, again, is going to give us a huge cushion, allowing us to invest in health and education. So, this is the trajectory we are going on. So, as a citizen, as a Parliamentarian and as a member of the Government, I urge the Opposition not to have unnecessary discussions, create false information and engage in the fearmongering campaign you carried out before the elections. Do not do it in 2026.

Sri Lanka is now rebuilding; people have to rebuild their lives; industries have to revive themselves and exports are growing. The four markets we are targeting - the East-Asian, Indian, African and European markets - have grown at 20 per cent in 2025. The exports in five sectors of strategic importance are growing at 20 per cent or more. The coconut industry's exports grew by 40 per cent.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, කාලය අවසන්.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
So, do not try to steer Sri Lanka away from this trajectory, bringing up topics and non-factual information onto the table to drive fear into investors.

We are very happy that Colombo Port City Economic Commission and its team are working very hard, that we would be able to fill up this plot of land with investors for the country's benefit within next the few years with transparency and in accordance with global standards.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා.12.07]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාලීන කරුණු කිහිපයක් පිළිබඳව රජයේ අවධානය යොමු කරන්නට මා බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම දිට්වා සුළි කුණාටුව තුළින් අපේ රටේ නිර්මාණය වූ මහා ව්‍යසනය නිසා අතිවිශාල මූල්‍ය පාඩුවක් සිදු වෙලා තිබෙනවා. රාජ්‍ය පාර්ශ්වයේ බොහෝදෙනා කුමන කාරණා කිව්වත්, ඇත්තවශයෙන්ම මේ පාඩුව මහ හරවාගෙන එයින් ඔබ්බට අපේ රටට ශීඝ්‍රගාමීව ධනාත්මකව ඉදිරියට යන්නට අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර ආධාර සමුළුවක වැදගත්කම මා නැවත නැවතත් පෙන්වා දෙන්න කැමැතියි. අපි මේ ආධාර සමුළුව ගැන පුන පුනාම කථා කළත්, ආණ්ඩු පාර්ශ්වය මේ ගැන වැඩි තැකීමක් නැහැ කියලා අපට පෙනෙනවා. මම මතක් කරන්න කැමැතියි, World Bank එක කළ Global Rapid Post-Disaster Damage Estimation එක ගැන- ඒ කියන්නේ පශ්චාත් සුළි කුණාටු ආපදාවෙන් නිර්මාණය වූ පිරිවැය ගැන. යටිතල පහසුකම්වලින් විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1යි. පොඩ්ඩක් හොයා බලන්න, දැනට අපේ රටට ලැබුණු සම්පූර්ණ ආධාර ප්‍රමාණය සහ ණය ප්‍රමාණය කොපමණද කියලා. තවම ඇමෙරිකානු ඩොලර් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් පමණයි ලැබුණේ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මම මේ කථා කරන්නේ යටිතල පහසුකම් ගැන පමණයි. ඊට අමතරව ජීවනෝපාය, කඩා වැටුණු කර්මාන්ත සහ වෘත්තීන් සඳහාත් විශාල මුදලක් අපට අවශ්‍ය වනවා. ඒ නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළ ඒ පොරොන්දු වට්ටෝරුව කරුණාකරලා අකුරට, තිතට ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, කල් යන්න - කල් යන්න, කල් මරන්න - කල් මරන්න දෙනවා කියපු දේවල අගට එකතු වුණු බින්දු ටික ක්‍රමක්‍රමයෙන් අඩු වෙන්න ඉඩකඩ තිබෙන නිසා. ඒ නිසා කියපු විධියට රුපියල් කෝටිය දෙන්න, රුපියල් ලක්ෂ පණහ දෙන්න, රුපියල් ලක්ෂ විසිපහ දෙන්න. ඒ කියපු දේවල් ටික ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම ජාත්‍යන්තර ආධාර සමුළුවකට වහා යන්න. කල් යන්න - කල් යන්න, කල් මරන්න - කල් මරන්න ලෝකයේ අවධානය වෙනත් කරුණු-කාරණා, මාතෘකාවලට යොමු වනවා කියන එක මම කියන්න කැමැතියි.

මේ "දිට්වා" සුළි කුණාටුව නිසා IMF එකත් එක්ක අලුත් සාකච්ඡාවකට ප්‍රවේශ වෙලා කරුණාකරලා IMF එකේ කොන්දේසි වෙනස් කරගන්න කටයුතු කරන්න. ඒක අපි අවස්ථා ගණනාවකදී පෙන්නුම් කරලා තිබෙනවා. නමුත් මට පෙනෙන්නේ ඒක බීරි අලින්ට වීණා වාදනය කරනවා වාගේයි.

මේ වෙලාවේ මම විශේෂයෙන්ම මතක් කරන්නට කැමැතියි, පසුගිය කාල වකවානුව තුළ අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52කට වැඩි දායකත්වයක් ලබා දෙන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මර උගුල් ගණනාවකට හිර වෙලා සිටින බව. මේ වනකොට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට බරපතළ අසාධාරණකම් සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය ව්‍යසන තත්ත්වය තුළ, විශේෂයෙන් කොවිඩ් වසංගතය පැවති කාලය ප්‍රමුඛ කරගෙන අපේ රටේ වාණිජ බැංකු ක්ෂේත්‍රය අසීමිත ලාභයක් ලබා තිබෙනවා. They have earned super normal profits. ඒ අය සුපිරි ලාභයක් ලබා තිබෙනවා. 2021 -2022 කාල වකවානුව තුළ ආදායම් බදු සමඟ ගණනය කිරීමත් එක්ක රුපියල් බිලියන 304ක ලාභය, රුපියල් බිලියන 467 දක්වා වැඩි වෙලා තිබෙනවාය කියන එක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්, එහෙම නැත්නම් Ceylon Federation of MSMEs එක පෙන්වා දීලා තිබෙනවා.

අපේ රටේ ව්‍යවසායකයන්ට සිදු වෙලා තිබෙන මේ අසාධාරණය නිවැරදි කර ගන්නට ඒ අය ඉදිරි කාලයේදී නීතිමය ක්‍රියාමාර්ග ගන්නට සූදානම් වෙමින් සිටිනවා. ඒ අය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ මහතාට මීට අදාළව යවපු ලිපිය මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ බැංකු පද්ධතිය කොවිඩ්-19 වසංගතය පැවති කාලයේ අසීමිත ලාභයක් ලැබුවා. එම ආයතන එහෙම ලාභයක් ලබන එක සාධාරණයි. නමුත්, ඒ ලැබූ අසීමිත ලාභය, සුපිරි ලාභය මේ රටේ කඩා වැටුණු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ලබා දෙන්නට කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

අපි හැමෝම දන්නවා, මේ රටේ කොටි ත්‍රස්තවාදී යුද්ධය ක්‍රියාත්මක වූ කාලයේ මායිම් ගම්මාන ආරක්ෂා කරන්නට අපේ රටේ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රය අතිවිශාල සේවාවක් කළ බව. අද සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ 34,000ක් පමණ ඉන්නවා. පසුගිය කාලයේ මේ එක්කෙනෙකුට රුපියල් ලක්ෂ 30 බැගින් තුට්টු දෙකේ වන්දියක් දීලා ගෙදර යවන්නට උත්සාහයක් දැරුවා. අපි මේ ගරු සභාවේදී ඒ පිළිබඳව කථා කරලා, ඒ ප්‍රයත්නය පරාජය කළා. මොකද, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේත් ඉන්නේත් අපේ රටේ රණ විරුවන් කොට්ඨාසයක් කියන කාරණය බොහෝදෙනෙක් අමතක කරලා තිබුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? තම තමන්ගේ බල ප්‍රදේශවල සේවය කළ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් ඒ රාජකාරි කටයුතුවලින් ඉවත් කරලා දුර බැහැර ප්‍රදේශවල පොලීසිවල රාජකාරි කටයුතුවලට යොමු කරන්න කටයුතු කරලා තිබෙනවා. සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ සිට රුපියල් 53,000ක පමණ ආදායමක් ලබන අය පොලීසිවලට අනුයුක්ත කිරීම තුළින්, ඒ අයට ලැබෙන දීමනා ටිකත් රුපියල් 28,000ක්, 30,000ක් දක්වා ඇත්තවශයෙන්ම අඩු වනවා. මේ රටේ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ ඉන්න 34,000ක පමණ නිලධාරින්ට මේ වාගේ අසාධාරණයක් කරන එක හරිද? මැදිරිගිරිය ප්‍රදේශය ඇතුළු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ තවත් දිස්ත්‍රික්ක ගණනාවක සේවය කරන සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් බලහත්කාරයෙන් දුර බැහැර ප්‍රදේශවල පොලීසිවලට අනුයුක්ත කරන්නට කටයුතු කිරීම අපි තරයේ හෙළා දකිනවා. ඒ අයගේ ඉල්ලීම වෙලා තිබෙන්නේ, කරුණාකරලා මේ දේ කිරීමෙන් වළකින්න, එසේ නොමැති නම් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමට ඉඩ දෙන්න කියන එකයි. ඒ අයට විශ්‍රාම යෑමේදී ඒ අය කළ විශිෂ්ට සේවාවට රුපියල් ලක්ෂ 30ක සොච්චමක් දෙනවා වෙනුවට ඊට වඩා වැඩි මුදලක් ලබා දීම ඇත්තවශයෙන්ම යුක්තිසහගතයි කියන කාරණාව ඒ අයත් ඉදිරිපත් කරනවා, මමත් මේ අවස්ථාවේ ඒ කාරණාව ප්‍රත්‍යක්ෂ කරනවා.

අපේ ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත් රැඳී සිටින මේ අවස්ථාවේ මම මේ කාරණයත් කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දිට්වා සුළි කුණාටුවත් සමඟ වාහනවලට තිබෙන ඉල්ලුම පහළ යෑම තුළ මේ රටේ වාහන ආනයනකරුවන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. මොකද, ආනයනය කරනු ලබන වාහන දින 90ක් තුළදී විකුණා ලියාපදිංචි කළ යුතු බවට වූ රෙගුලාසියක් තිබෙනවා. එසේ නොකළහොත්, ඊළඟ මාසයේ ඉඳලා මාස්පතා සියයට 3ක දඩයක් ගෙවන්න වනවා. එය මාසයෙන් මාසයට වැඩිවනවා, සියයට 45ක් දක්වා. වාහන ආනයනකරුවන්ගේ සංගම් ඉල්ලීමක් කරනවා, මේ තත්ත්වය සමනය වන තාක් කල් සියයට 3ක දඩය සියයට 1 දක්වා අඩු කරන්නත්, මේ දඩය අය කිරීම දින 90කින් පසුව ක්‍රියාත්මක කරනවා වෙනුවට මාස 6ක විරාමයක් ලබා දෙන්නත් කියලා. මම මේ අවස්ථාවේ ඒ ඉල්ලීමත් ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේකටත් අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තවත් කාරණයක් කියන්න මම තව පොඩි වෙලාවක් ගන්නවා.

Hon. Abeysinghe, you tried your very best to articulate an argument to the fact that we, in the Opposition, are creating an unnecessary discussion regarding the economic context of our country. First and foremost, you have to understand, Sri Lanka is not a dictatorship; it is not an autocracy. There is freedom of speech and first and foremost, we are a democracy. So, within this democratic structure, we, as a progressive and a responsible Opposition, will support the Government when the policies are positive, as far as their impact on the 22 million people of our country is concerned.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

But when the Government gets it wrong - when the Government having stated one thing during the election period and, once in the position of governance, when you are singing another tune - there is a huge discrepancy and divergence in your declarations and action. Did you not promise the Sri Lankan people that the Debt Sustainability Agreement would be changed? Did you not tell the Sri Lankan people, did you not promise them, that you would change the IMF conditions? But what have you done? You all have deceived the people, you all have uttered falsehoods, and today the expectations and aspirations of the Sri Lankan people are dashed. So, what I would suggest to you is - as you know, there was a phrase coined some time ago with regard to a particular economic policy; it was called "voodoo economics". Today, you all are practising voodoo economics. You all have absolutely no comprehension about the macro-economic situation and micro-economic situation in the country. You continue to implement the IMF conditions which has brought upon extreme hardship, severe pressure on the Sri Lankan people. This is not what you promised on stage when you were in the Opposition. You were using populist slogans. You were uttering promises which you all have forgotten, having assumed the Executive Presidency and the two-thirds power in Parliament. So, I urge you, do not keep on practising this policy of misleading the people in our country. Do not utter falsehoods.

Thank you.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
I will just take 30 seconds to respond to the Leader of the Opposition.

Actually, this Government came up with a policy book itself. So, we are adhering to the policy book and, as we all know the DSA has already changed. Every six months, the variables change and what we are expecting the Opposition is to look at the results and the policies that the Government is adopting and, to see whether the results are derailing. That is my proposition to the Leader of the Opposition as well.

The numbers speak for themselves, and we are on the right trajectory. That is what I have to say. We will adhere to the manifesto that we have given. That is what we will be accountable for over the next five years.

Thank you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Madam, just give me a few seconds.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
You say that you will adhere to the manifesto, but you all are violating the very promises that are stated in the manifesto. So, I would urge you to get down to the grassroots level, go and talk to the people and look at the human suffering caused by your economic policies. You know, Hon. Deputy Minister, it is inadequate to just look at macroeconomic figures. You have to look at how the macroeconomic growth has impacted on the various strata of society. You all have promoted injustice and unfairness. There is inequitable redistribution of resources and wealth. Ideologically, your utterances and my utterances have been quite close, but the difference is, we walk the talk. You have forgotten the promises that you gave to the people of the country.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා.12.23]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි සාකච්ඡාවට භාජන කරන්නේ 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට ගෙනෙන සංශෝධනය පිළිබඳවයි. මට කලින් කථා කරපු අපේ ගරු විපක්ෂ නායකතුමා අද මාතෘකාව පිළිබඳව කිසිම සඳහනක් කළේ නැහැ. එවැනි නායකයෙක් තමයි විපක්ෂයේ ඉන්නේ.

කෙසේ වෙතත්, රටක ආර්ථික වර්ධනය ගැන සාකච්ඡා කරනකොට ආයෝජන බොහොම වැදගත්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට ආයෝජන කැන්දා ගැනීමේදී ප්‍රධාන මාර්ග -ප්‍රවේශ- 4ක් ගැන අපි සලකා බලනවා. එහි පළමු ප්‍රවේශය තමයි, ආයෝජන මණ්ඩලය තුළින් සෘජු විදේශ ආයෝජන ලබා ගැනීම. මෙතැනදී අපි දකිනවා, ආයෝජන මණ්ඩලය කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන බව. නමුත්, එතැන යම් යම් ප්‍රමාද වාගේම සැඟවුණු බලපෑම් තිබෙනවා. ඒවා ඉවත් කරන්න අපි මේ වෙනකොට single-window ක්‍රමය ඉදිරිපත් කර තිබෙනවා. මෙන්න මේ කටයුතු හරහා අපි ඒ සෘජු විදේශ ආයෝජන වැඩි කර ගැනීමේ ප්‍රයත්නයක ඉන්නවා.

[ගරු විජේසිරි බස්නායක මහතා]

රටකට ආයෝජන කැන්දා ගැනීමේ දෙවන ප්‍රවේශය තමයි, public-private partnership. මේ පිළිබඳව අපි නුදුරේදීම පනත් කෙටුම්පතක් ගෙනෙනවා. ඒ හරහා රජය විධියට අපි ඒ සුවිශේෂ ව්‍යාපෘති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙමින්, උපාය මාර්ගික ස්ථාන -strategic locations- ලබා දෙමින්, අනෙකුත් පහසුකම් ලබා දෙමින් මෙන්න මේ public-private partnership ක්‍රියාත්මක කරන්න උත්සාහ ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තුන්වැනි ප්‍රවේශය තමයි, බද්ධ ව්‍යාපාර - joint ventures. ඒ කියන්නේ, නිශ්චිත කාර්යයකට ආරම්භයක් සහ අවසානයක් සහිතව සිදු කරනු ලබන ව්‍යාපාර කටයුතු.

හතරවැනි කාරණාව තමයි, අද අපි මේ සාකච්ඡා කරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත. මේ පනත් කෙටුම්පත ගෙන ඒමේ අරමුණ වන්නේ, ඒ කලාපය ගෝලීය වශයෙන් තරගකාරී, විශේෂ ආර්ථික කලාපයක්- Special Economic Zone- ඒ වාගේම financial hub එකක් බවට පත් කරන එක. ඒ තුළින් සෘජු විදේශ ආයෝජන අපේ රටට කැඳවා ගැනීම, ආකර්ෂණය කර ගැනීම. ඒ සඳහා දැනට තිබෙන වගන්ති ප්‍රමාණවත් නැහැ. ඒ සමහර වගන්ති දුර්වලයි. ඒ නිසා අපි තීරණය කළා, මේ පනත සඳහා සංශෝධනයක් ගෙන එන්න.

ඒ සංශෝධනය තුළින් අපි බලාපොරොත්තු වෙනවා, අපි ලබා දෙන දිරි දීමනා හරහා අන්තර්ජාතික හොඳම පරිචයන් -best practices- එක්ක සමපාත වෙන්න. ඒ වාගේම IMF එකෙහතා ලබා ගන්න. ඒ වාගේම, විනිවිදභාවය -transparency- වගවීම -accountability- ඇතිව රාජ්‍ය බදු ප්‍රතිපත්තියත් එක්ක මේ කලාපයේ වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම බදු සාධාරණත්වය -tax equity- තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම preferential treatment, ඒ කියන්නේ කැමැති කැමති විධියට බදු සහන දෙනවා වෙනුවට ඒ සඳහා යම් කිසි ප්‍රමිතියක් -standard - තිබෙන්න ඕනෑ. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අක්වෙරළ බැංකු කටයුතු -off-shore banking- සඳහා අවශ්‍ය ආකෘතියක් ශ්‍රී ලංකා මහ බැංකුවත් එක්ක එකතු වෙලා නිර්මාණය කරලා තිබෙනවා. එහෙම නම් මෙන්න මේ අරමුණු ඉෂ්ට කර ගන්න තමයි, අද අපි මේ පනතට සංශෝධන ගෙන එන්නේ.

එහිදී අපි මුලින්ම ඉදිරිපත් කරනවා, සේවා නියුක්ති ආදායම මත බද්ද -employment income tax- කියන එක. අපි දන්නවා, එහි සේවකයෙකුගේ සේවා නියුක්ති ආදායම මත ආදායම් බද්දෙන් නිදහස්වීමක් තිබුණා. අන්න ඒක මේ පනත් කෙටුම්පත යටතේ අපි අවසන් කරනවා. නමුත්, මේ පනත යටතේ දැනටමත් ලියා පදිංචි වෙලා තිබෙන ආයතන සඳහා අපි සංක්‍රාන්ති නිදහස් කිරීමක් ලබා දෙනවා. මොකක්ද මේ සංක්‍රාන්ති නිදහස් කිරීම කියන්නේ? අපි මේ පනත් කෙටුම්පත සම්මත කළ වහාම, එතැන් සිට වසර තුනක් යනතුරු ඒ රැකියා ආදායම මත බදු නිදහස් කිරීමක් සිදු වෙනවා. හැබැයි, නව ලියා පදිංචිකරුවන් සඳහා ඒ නිදහස ලබා දෙන්නේ නැහැ.

අපි සංශෝධන ඉදිරිපත් කරන දෙවැනි කාරණය තමයි, උපාය මාර්ගික වැදගත්කමක් ඇති ව්‍යාපාර -Businesses of Strategic Importance- කියන එක. මේවා හඳුනා ගන්න අපි නිර්ණායක නියම කරනවා. ඒ පිළිබඳ විධිවිධාන මේ පනත් කෙටුම්පත යටතේ සලසා තිබෙනවා. ඒවා හඳුනා ගැනීමේදී මුදල් අමාත්‍යාංශය විශේෂ තාක්ෂණික විශ්ලේෂණයක් කරනවා. එතැනදී Businesses of Strategic Importance -BSI- සඳහා ඒ බදු නිදහස ලබා දෙනවා. ඒ හරහා අපි ඒ ව්‍යාපාරවලට පනවන රෙගුලාසි ලිහිල් කරනවා. හැබැයි, එතැනදී වැදගත් වන කරුණු කිහිපයක් තිබෙනවා. ඒ අවම ආයෝජන මට්ටම පවත්වා ගැනීම වැදගත් වෙනවා. ඒ වාගේම, ඔවුන් රැකියා නිර්මාණය කිරීම -employment generation - කරන්න ඕනෑ. ඒ වාගේම ඒ අදාළ නිදහස් කිරීම් සම්බන්ධ වලංගු කාලසීමාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහි තුන්වැනි සංශෝධනය තමයි, අක්වෙරළ බැංකු -off-shore banking- නියාමනය කිරීම. විශේෂයෙන්ම අක්වෙරළ බැංකු බලපත්‍ර මේ පනත යටතේ පාලනය වෙන ඒවා බවට මහ පෙන්වීමක් කරනවා. එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු මඟ පෙන්වීම යටතේ සිදු වෙනවා. එතැනදී විදේශීය සංස්ථාපිත ආයතනවල සුදුසුකම් සීමා කරනවා. ඔවුන්ගේ ප්‍රාග්ධනයේ ප්‍රමාණවත්භාවය, -capital adequacy- ද්‍රවශීලතාව, -liquidity- අවදානම් කළමනාකරණය කියන කාරණා මෙහිදී වැදගත් වෙනවා. ඒ තුළින් ඒ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යෑමේදී ඒ බලපත්‍රලාභී, බලයලත් පුද්ගලයන් නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සිදු කරනවා. ඒක කරනු ලබන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුව මඟින්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙනකොට අපි 2025 වර්ෂය පසු කර හමාරයි. අපි මේ ඉන්නේ 2026 වර්ෂයේ. අපි 2025 දෙස ආපසු හැරිලා බැලුවොත්, මොකද වෙලා තිබෙන්නේ? අපි දන්නවා, අපට පාලන බලය දීමට පෙර මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මොකක්ද කළේ කියන එක. මහ විශාල බොරුවක්, අවලාදයක් මේ සමාජය මත පතිත කළා. ඔවුන්ගේ උපාය ක්‍රමය වුණේ, ඒ භය සමාජය මත පැතිරවීමයි. ජාතික ජන බලවේගයට බලය දෙන්න එපා, මේ රටේ ආර්ථිකය, ආර්ථික වර්ධන වේගය සෘණ වෙයි කිව්වා. ඔවුන් කිව්වා, පෙට්ටි කඩයක්වත් කරපු නැති මිනිස්සුන්ට බලය දෙන්න එපා කියලා. නමුත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොකද වෙලා තිබෙන්නේ? 2025 වර්ෂයේ පළමුවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 4.8යි. දෙවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 4.9යි. තුන්වැනි කාර්තුවේදී සියයට 5 ඉක්මවා යනවා. මෙන්න මේක තමයි තත්ත්වය. හැබැයි, මේ රටේ ආර්ථික ඔස්තාර්ලා මෙන්ම, විදේශ රටවල සමහර සංවිධාන ආසන්න වශයෙන් ඒක සියයට 3ක තත්ත්වයක් තමයි පවත්වා ගන්නේ කියලා කියද්දී, අපි ඒ සියලු අභියෝග ජයගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තව දෙයක් කියන්න ඕනෑ. මේ මොහොතේ මේ රටේ විගණකාධිපති ධුරය පිළිබඳව සාකච්ඡා වෙනවා. විගණකාධිපති ධුරය සඳහා පැහැදිලිව සුදුසුකම් තිබෙන, ඒ දක්ෂකම් තිබෙන, පළපුරුදු, competent පුද්ගලයන් ගරු ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යෝජනා කළත්, ඔවුන් ඒක තරයේ ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

ඔවුන්ගේ biodata බැලුවාම පෙනෙනවා, ඒ තනතුර සඳහා නියමානුකූලව සුදුසුකම් ලබපු මිනිස්සු කියලා. ඒ අය competent මිනිස්සු. ඒ අය Chartered Accountantලා. ඒ වාගේම ඒ අයට පශ්චාත් උපාධි තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන් රැකියා ජීවිතය- career life - එක පටන්ගෙන තිබෙන්නේ audit traineesලා විධියට. අපි විපක්ෂයෙනුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙනුත් ප්‍රශ්න කරනවා, ඒ ගොල්ලන්ගෙන් කෙනෙක් පත් කරන්නේ නැත්තේ ඇයි කියලා. අපි මේ වාගේ දේවල් අතීතයේත් දැක්කා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ DG පත් කරන්න හදනකොටත් ඝෝෂාවක් ඇති කරලා ඒකට බාධා කළා. නමුත්, අද වෙනකොට ඒ DG හොඳට, ලස්සනට කොමිෂන් සභාවේ වැඩ කටයුතු ටික කරගෙන යනවා. ඒ නිසා මේ අයට විගණකාධිපති පිළිබඳවත් භයක් තිබෙනවා, මේ වැඩේ

කරලා මේ රට ගොඩ දමයි කියලා. ඒ නිසා අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් සහ විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, මේකට බාධා කරන්න එපා කියලා. අපි පොරොන්දු වෙච්ච, පොහොසත් රට, ලස්සන ජීවිතය නිර්මාණය කරන්න ඔබ සියලු දෙනාම එකතු වෙන්න. අපි මේ රට, ආසියාවේ තිබෙන ප්‍රබල රටක් විධියට නිර්මාණය කරමු.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! පාර්ලිමේන්තුව දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.00 දක්වා අත්හිටවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.00]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2021ஆம் ஆண்டின் 11ஆம் எண் கொண்ட கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம் தொடர்பாக எனது கருத்துகளை இந்த அவையிலே எடுத்துரைக்க விழைகின்றேன்.

2021ஆம் ஆண்டின் 11ஆம் எண் கொண்ட சட்டத்தின்கீழ் கொழும்புத் துறைமுக நகரமானது ஒரு தனித்துவமான அதிகார மண்டலமாக உருவாக்கப்பட்டது. இது 100 சதவீத வெளிநாட்டு உரிமை மற்றும் 16 வெளிநாட்டு நாணயங்களில் வணிகம் செய்வதற்கான உரிமையையும் வழங்கியது. 2025 நவம்பரில் அரச வர்த்தமானப் பத்திரிகையில் வெளியிடப்பட்டு, 2025 டிசம்பரில் இந்த நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்ட கொழும்பு துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு திருத்தச் சட்டமூல இல. 41ஆனது, கொழும்பு துறைமுக நகர சிறப்புப் பொருளாதார மண்டலத்திற்குள் வணிகம், முதலீடு மற்றும் நிருவாகத்தை மேலும் எளிதாக்கும் வகையில், 2021ஆம் ஆண்டின் 11ஆம் எண் கொண்ட கொழும்பு துறைமுக நகர பொருளாதார ஆணைக்குழுச் சட்டத்தைப் புதுப்பிப்பதை நோக்கமாகக் கொண்டுள்ளது. இது இலங்கையின் பொருளாதார சீர்திருத்தத்திற்கான 2025ஆம் ஆண்டின் பரந்த நாடாளுமன்ற முயற்சிகளுடன் இணைந்து, நெறிப்படுத்தப்பட்ட விதிமுறைகள், ஊக்கத் தொகைகள் மற்றும் ஒற்றைச் சாளர ஒப்புதல்களுடன் உலகளாவிய நிதி மற்றும் வணிக மையமாக கொழும்பு துறைமுக நகரச் சிறப்புப் பொருளாதார மண்டலத்தின் பங்கை மேம்படுத்துகின்றது.

2025ஆம் ஆண்டின் 41ஆம் எண் கொண்ட கொழும்பு துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுத் திருத்தச் சட்டமூலமானது இலங்கையின் பொருளாதாரப் பாதையை மறுசீரமைக்க முனையும் ஒரு முதன்மையான மைல்கல்லாகக் காணப்படுகின்றது. இந்தத் திருத்தத்தின் முதன்மை நோக்கம் யாதெனில், துறைமுக நகரத்தை ஒரு 'கட்டுப்பாடற்ற தன்னாட்சி வலயம்' என்ற நிலையிலிருந்து 'மூலோபாய ஒழுங்குமுறை ஒருங்கிணைப்பு' கொண்ட ஒரு வலயம் என்ற நிலைக்கு மாற்றுவதாகும். 2025ஆம் ஆண்டின் 41ஆம் எண் கொண்ட திருத்தச் சட்டமூலமானது, நான்கு முதன்மையான கூறுகளை அறிமுகப்படுத்துகின்றது.

முதலாவதாக, மத்திய வங்கியின் மேற்பார்வை. அதாவது, பன்னாட்டு வைப்பகத் தரநிலைகளுக்கு இணங்க கரைகடந்த வங்கித் தொழிலை ஒழுங்குபடுத்தும் மற்றும் மேற்பார்வையிடும் அதிகாரம் இலங்கை மத்திய வங்கிக்கு வழங்கப்படுகின்றது.

இரண்டாவதாக, நிதி ஒழுக்கம். அதாவது, துறைமுக நகர ஊழியர்களுக்கு வழங்கப்பட்டிருந்த முழுமையான வருமான வரி விலக்கு நீக்கப்பட்டு, இப்பொழுது பணிபுரியும் ஊழியர்களுக்கு புதிய சட்டப் பிரிவு நடைமுறைக்கு வந்ததிலிருந்து மூன்று ஆண்டுகளுக்கு வரி விலக்கு நீடிக்குமெனினும், திருத்தம் நடைமுறைக்கு வந்த பிறகு பணிக்கு அமர்த்தப்படும் ஊழியர்கள் உள்நாட்டு இறைவரிச் சட்டத்தின்கீழ் வரி செலுத்தக் கடமைப்பட்டவராவர்.

மூன்றாவதாக, நிதி ஒருங்கிணைப்பு. அதாவது ஆணைக்குழுவின் தனிப்பட்ட அதிகாரத்தின் கீழிருந்த நாணய மாற்றங்கள், இனி 2017ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட வெளிநாட்டு நாணய மாற்றுச் சட்டத்தின் கீழ்க் கொண்டுவரப்படும்.

நான்காவதாக, BSI - செயல்திறன் கண்காணிப்பு. அதாவது, மூலோபாய முதன்மை வாய்ந்த வணிகங்களுக்கான வரிச் சலுகைகள் இப்பொழுது நிதி அமைச்சின் தொழில்நுட்ப பகுப்பாய்வின் பின்னரே வழங்கப்படும். 2025ஆம் ஆண்டின் 1ஆம் எண் கொண்ட மத்திய வங்கியின் ஒழுங்குமுறைப்படி முதலீட்டு அளவு மற்றும் வேலைவாய்ப்பு உருவாக்கத்தின் அடிப்படையில் வரி விலக்குக் காலம் முடிவு செய்யப்படும்.

மேலும், திருத்தச் சட்டப் பிரிவு 52Cஇன்படி துறைமுக நகரத்தில் உள்ள அனைத்து அங்கீகரிக்கப்பட்ட பணியாளரும் வருமான வரிச் சட்டத்தின்கீழ் வரி அறிக்கைகளை வழங்குவது கட்டாயமாக்கப்பட்டுள்ளது. இது வரிச் சலுகைகளால் ஏற்படும் வருவாய் இழப்பை, அரசு கண்காணிக்கவும் சீரமைக்கவும் உதவும்.

மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2021ஆம் ஆண்டின் முதன்மைச் சட்டத்திற்கும் 2025ஆம் ஆண்டின் திருத்தச் சட்டமூலத்திற்கும் இடையிலான மாற்றத்தை நாம் பகுப்பாய்வு செய்து பார்க்க வேண்டும். 2021ஆம் ஆண்டின் 11ஆம் எண் கொண்ட கொழும்பு துறைமுக நகர பொருளாதார ஆணைக்குழுச் சட்டமானது, துறைமுக நகரத்தை தனிமைப்படுத்தப்பட்ட ஒரு நிலப்பரப்பாகக் கருதியது. இது வணிக வசதிக்காக உள்நாட்டுச் சட்டங்களிலிருந்து பெருமளவு விடுவிக்கப்பட்டிருந்தது. இதன் விளைவாக இத்தகைய ஒரு கட்டமைப்பு 'நிழல் வங்கி' அபாயங்களை உருவாக்கியது. 2025ஆம் ஆண்டின் 11ஆம் எண் கொண்ட கொழும்புத் துறைமுக நகர பொருளாதார ஆணைக்குழுச் திருத்தச் சட்டமூலமானது இந்த வலயத்தை இலங்கையின் தேசிய பொருளாதார நோக்கங்களுடன் இணக்கமாக மாற்றுகிறது.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

2021ஆம் ஆண்டின் சட்டத்தின் கீழ், முதல் 40 ஆண்டுகள் வரை வழங்கப்பட்டிருந்த வரி விலக்கு, 2025ஆம் ஆண்டின் புதிய திருத்தச் சட்டத்தின்கீழ் மேல் எல்லை 15 ஆண்டுகளாகக் குறைக்கப்பட்டுள்ளது. மேலும், 2025 திருத்தச் சட்டத்தின் 42A பிரிவின்கீழ், கரைகடந்த வங்கிகளுக்கு உத்தரவுகளையும் வழிகாட்டல்களையும் வழங்க மத்திய வங்கிக்கு அதிகாரம் அளிக்கப்பட்டுள்ளது. இந்த வழிகாட்டல்கள், வைப்பக மேற்பார்வைக் குழு மற்றும் நிதி உறுதித்தன்மை வாரியம் முதலிய உலகளாவிய நிறுவனங்களின் கொள்கைகளுக்கு இணங்க இருக்கவேண்டும் எனக் கூறப்பட்டுள்ளது.

மேலும் பிரிவு 42Bஇன் கீழ், மத்திய வங்கியால் நிர்ணயிக்கப்பட்ட குறைந்தபட்ச மூலதனத் தேவைகள் மற்றும் போதியளவு மூலதன விகிதங்களை வங்கிகள் பேணவேண்டும். இதன்மூலம் துறைமுக நகரம் ஒரு 'நிழல் வங்கி' மையமாக மாறுவது தடுக்கப்பட்டு, வெளிப்படையான நிதி மையமாக மாற்றப்படுகின்றது. வங்கி உரிமங்களை நீக்கம் செய்யும் அதிகாரம் ஆணைக்குழுவிடமிருந்து நீக்கப்பட்டு, மத்திய வங்கியின் பரிந்துரையின் பேரில் நிதி அமைச்சரிடம் ஒப்படைக்கப்பட்டுள்ளது. இந்த ஒருங்கிணைப்பு, துறைமுக நகரம் ஒரு 'நாட்டிற்குள் ஒரு நாடு' அல்ல, மாறாக உலகளாவிய மூலதனத்திற்கான ஒரு பாதுகாப்பான நுழைவாயில் என்பதை எடுத்துக் காட்டுகிறது. எவ்வாறாயினும், இதிலுள்ள விமர்சனங்கள் குறித்து நாம் வெளிப்படையாக இருக்க வேண்டும்.

2021ஆம் ஆண்டின் மூலச் சட்டமானது, தேசிய இறையாண்மைக்கு அறைகூவல் விடுப்பதாகவும், குடியரசுத் தலைவரால் நியமிக்கப்படும் ஆணைக்குழு உறுப்பினர்களுக்கு முன்னெப்பொழுதும் இல்லாத அதிகாரங்களை வழங்குவதாகவும் உயர் நீதிமன்றத்தாலும் குடிசார் அமைப்புகளாலும் கடுமையாக விமர்சிக்கப்பட்டது. மேலும், இது உள்நாட்டு முதலீட்டாளர்களை ஓரங்கட்டுவதாகவும், பொதுப் பொறுப்புக்கூறல் அற்றதாகவும் கருதப்பட்டது.

அதேபோல், 2025ஆம் ஆண்டின் திருத்தச் சட்டமூலமும் சில விமர்சனங்களை எதிர்கொள்கிறது. முதலீட்டுச் சலுகைகள் கணிசமாகக் குறைக்கப்பட்டுள்ளதால், இம்மாற்றங்கள் முதலீட்டாளர்களுக்குச் 'சாதகம் குறைந்தவை' என ஐக்கிய நாடுகள் சபையின் வர்த்தகம், அபிவிருத்தி பற்றிய மாநாடு - UNCTAD - போன்ற பன்னாட்டு அமைப்புகள் வகைப்படுத்தியுள்ளன. புதிய ஊழியர்களுக்கு வரி விதிப்பு மற்றும் வரி விலக்குக் காலத்தைக் குறைப்பது ஆகிய நடவடிக்கைகள் ஒரு முதன்மையான பொருளாதார மீட்புக் காலத்தில் முதலீட்டாளர்களின் நம்பிக்கையைப் பாதிக்கலாம் என்ற அச்சம் உள்ளது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்கான தீர்வு என்ன? நேரடி வெளிநாட்டு முதலீடுகளை ஈர்ப்பதில் வரிச் சலுகைகள் மிகக் குறைந்த தாக்கத்தையே ஏற்படுத்துகின்றன என ஆய்வுகள் கூறுகின்றன. எனவே, நிலையான வளர்ச்சிக்குப் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்:

முதலாவதாக, நிதியல்லாத வசதிகளில் கவனம் செலுத்துதல். அதாவது, வரிச் சலுகைகளுக்குப் பதிலாக, முதலீட்டாளர்கள் வணிகத்தைத் தொடங்குவதற்கான நடைமுறைகளை எளிமையாக்குதல். விரைவான வதிவிட நுழை விசா வழங்குவதோடு அறிவுசார் சொத்துரிமைப் பதிவு மற்றும் ஊழியர் சட்டச் சிக்கல்களைத் தீர்ப்பதும் இன்றியமையாததாகும்.

இரண்டாவதாக, மூலோபாய முதன்மை வாய்ந்த வணிகங்களுக்கான வரிச் சலுகைகளை நிதி அமைச்சு ஆய்வு செய்யும்பொழுது, அரசியல் தலையீடுகளற்ற வெளிப்படையான தொழில்நுட்ப பகுப்பாய்வாக இருப்பதை உறுதி செய்ய வேண்டும்.

மூன்றாவதாக, உள்நாட்டுப் பொருளாதாரத்துடன் இணைத்தல். அதாவது, துறைமுக நகரத்தின் வெற்றி என்பது உள்ளூர் பொருளாதாரத்தில் ஏற்படுத்தும் தாக்கத்தைப் பொறுத்தது. துறைமுக நகர வணிகங்கள் உள்நாட்டு வழங்குநர்களுடன் இணைந்து செயற்படுவதன்மூலம் தொழில்நுட்ப மற்றும் அறிவுப் பரிமாற்றங்களை ஊக்குவிக்க வேண்டும்.

இறுதியாக, இந்தத் திருத்தச் சட்டமூலம் ஒரு தேவையான 'திருத்தச் சிகிச்சை'யாகும். பன்னாட்டு வைப்பகத் தர நிலைகளை ஏற்றுக்கொள்வதன் மூலமும் தேசிய நிதிச் சட்டங்களுடன் ஒருங்கிணைப்பதன் மூலமும் இலங்கை ஒரு வரிப் புகலிடம் அல்ல; மாறாக. ஓர் ஒழுங்குமுறைப்படுத்தப்பட்ட உலகத்தரம் வாய்ந்த முதலீட்டுத் தளம் என்பதை உலகிற்கு உரக்கச் சொல்லுகிறோம். ஆகவே, கொள்கை அடிப்படையிலான நிலைத்தன்மையைப் பேணி, உலகளாவிய நம்பிக்கையை வென்றெடுக்க, அரசு ஆவன செய்ய வேண்டும் எனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.08]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අප සාකච්ඡාවට භාජන කරන්නේ, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට සංශෝධන ඇතුළත් කිරීම සම්බන්ධයෙන්. ඇත්තටම ශ්‍රී ලංකාව මේ තාක් ආපු ගමන දෙස බලන කොට, ආර්ථිකයේ යම් යම් වර්ධනීය තත්ත්ව සාධනීයව පෙන්නුම් කරපු අවස්ථා තිබුණු නමුත් බොහෝ අවස්ථාවල අප රට ළඟා කර ගත යුතු ඉලක්ක සාධනීය ලෙස ළඟා කර ගත්තේ නැහැ කියන එක ඉතිහාසය දිහා බලන කොට අපට පෙන්නුම් කරනවා. ඒ අනුව මේ රට සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් තමයි තවමත් හඳුනා ගන්නේ. පැවැති ආර්ථික අර්බුදය සහ ව්‍යසන තත්ත්ව යටතේ රටේ ආර්ථිකයේ කඩා වැටීමක් සහ සංවර්ධනය හීනවීමක් අපි දකිනවා. නමුත්, පැවැති රජයන් එය වළක්වා ගැනීමට යම් යම් ආකාරයේ උත්සාහයන් ගෙන තිබුණා. විශේෂයෙන්ම ලංකාවට ආයෝජන ළඟා කර ගැනීම සඳහා, BOI එක හරහා ලංකාව පුරා ආර්ථික කලාප වශයෙන් පිහිටවනු ලැබුවත්, නිශ්චිත ආකාරයට ආයෝජන ළඟා කරගෙන, මේ රට සංවර්ධනය කරා ගෙන යන්න නිසි අවස්ථාව නොලැබුණු වග තමයි ඉතිහාසය සාක්ෂි සපයන්නේ.

ඒ අතරම මෙරටට විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ඉදි වුණු වරාය නගරයේ මූලික අරමුණ වුණේ විශේෂ ආකර්ෂණයක් සහිතව ආයෝජකයන් මෙහි ගෙන්වා ගැනීමයි. ඒ අනුව, මූලික වශයෙන් ඩොලර් බිලියන 1.4ක් ආයෝජනය කරමින් මේ වරාය නගරයේ ඉදි කිරීමේ කටයුතු සිදු වුණු නමුත්, අද දක්වාම මේ වරාය නගරය තුළින් අපේක්ෂා කරපු සාධනීය ප්‍රතිඵලය රටට ළඟා කර ගන්න අපට හැකියාවක් නැති වුණා. ඒ නිසා මේ පනත සංශෝධනය කිරීමට ප්‍රවේශයක් ගෙන තිබෙනවා.

විසිපස් අවුරුද්දක් දක්වා බදු නිදහස ලබා දීපු තත්ත්වයක් මෙයට තිබුණත් රටට ආදායම් අවශ්‍ය වෙලාවක, ඒ ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා අපට තිබෙන එක්තරා විශේෂ මූලාශ්‍රයක් තමයි බදු කියන්නේ. ඒ නිසා එහි සංශෝධනයක් කරමින් දැනට පවතින සමාගම් වෙත තවදුරටත් අවුරුදු තුනක බදු සහනයක් සලසමින්, ඒත් එක්කම අලුතින් ඉදි වන සමාගම්වල සේවකයන් සඳහා සාමාන්‍ය තත්ත්වය යටතේ ආදායම් බදු ගෙවන ආකාරයෙන්ම බදු ගෙවීමට අවස්ථාව සලසා තිබීමත් තුළින් සම තත්ත්වයෙහි ලා සැලකීම කියන කාරණාව අපට දකින්න පුළුවන්.

මොකද, දේශීය වශයෙන් රට තුළ සේවා සපයමින් ආදායම් උත්පාදනය කරන පුරවැසියන් බදු ගෙවනවා වාගේම, මේ කලාපය තුළ රැකියා කරන අයත් ඒ කියන ක්‍රමයට අනුගතව බදු ගෙවීම අවශ්‍යයි කියන කාරණාව මේ පනත් කෙටුම්පත මඟින් ඉස්මතු කරලා තිබෙනවා.

ඒ එක්කම මේ ලබා දෙන සහන පිළිබඳව විශේෂයෙන්ම මා සඳහන් කරන්න කැමැතියි. අයදුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවේදී, ලියාපදිංචිය ලබා ගැනීම සඳහා වන කාරණාවේදී පෙර තිබූ තත්ත්වය යටතේ පනතට අනුකූලව ඔවුන් විසින් අතිරේක ගාස්තු ගෙවිය යුතුව තිබුණා. නමුත්, මේ සංශෝධනය අනුව යම්කිසි ව්‍යාපාරයකට පීඩාවකින් තොරව මේ භූමියට ප්‍රවේශ වීමට ලියාපදිංචිය සඳහා පමණක් ගාස්තු අය කිරීම සිද්ධ වෙනවා. ඒක අපි දකින සාධනීය ලක්ෂණයක්. එවැනි කරුණු සලකා බලනකොට සාමාන්‍යයෙන් කළමනාකරණයේදී ව්‍යාපාරවලට ප්‍රවේශ වීමට ඇති ඉඩකඩ ඇහිරීමට වඩා, ව්‍යාපාරවලට ප්‍රවේශ වීමට ඉඩකඩ සැලසීම තමයි කළ යුතු වන්නේ. මා දකින සාධනීය ලක්ෂණය ඒකයි. එවැනි අතිරේක ගාස්තු සහ වෙනත් කොන්දේසිවලට යටත්කොට අපට ආයෝජන අපේක්ෂා කළ නොහැකියි. මේ ලිහිල් කිරීම නිසා ආයෝජකයන්ට අපේ රටට ඇවිල්ලා, කොළඹ වරාය නගර භූමියේ ඔවුන්ගේ ආයෝජන ආරම්භ කරන්න පුළුවන්.

මෙහිදී මා තවදුරටත් සඳහන් කරන්න කැමැතියි, මේ පනත් කෙටුම්පත මඟින් විවිධ ක්ෂේත්‍රවල ආයෝජන සඳහා ඉඩකඩ සලසා තිබෙන බව. විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, මූල්‍ය ක්ෂේත්‍රය, වෘත්තීය ක්ෂේත්‍රය වාගේ විශේෂ ක්ෂේත්‍ර ගණනාවක ආයෝජන කරන්න පුළුවන්. විශේෂයෙන්ම මා සඳහන් කරන්න අවශ්‍යයි, සංචාරක කර්මාන්තය වාගේ ක්ෂේත්‍ර සඳහාත් මේ භූමිය තුළ ඉඩහසර සලසා තිබෙන බව. මොකද, එවැනි තත්ත්වයක් තුළ තමයි අපේ රටට ආදායම් උත්පාදනය කරන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම ඩොලර් උත්පාදනය කරන්න පුළුවන් වෙන්නේ. මේ කලාපය තුළ ඇති සියලු ආයතන ගනුදෙනු කරනු ලබන්නේ ශ්‍රී ලංකා මුදලින් නොවෙයි. එය මේ පනත් කෙටුම්පතේ තිබෙන එක්තරා විශේෂ කොන්දේසියක්. නිශ්චිත, අනුමත වූ විදේශ මුදල්වලින් පමණයි මේ කලාපය තුළ ගනුදෙනු කළ හැකි වන්නේ. ඒ වාගේම මේ පනත් කෙටුම්පත ඇතුළේ තවත් සාධනීය ලක්ෂණයක් ඇතුළත්ව තිබෙනවා. වරාය නගරය පිහිටුවන අවස්ථාවේදී ඇත්තටම ඒක රටේ නීතියට යටත් නැද්ද කියන ප්‍රශ්නය සමාජය හමුවේ තිබුණා. නමුත්, අද වෙනකොට විශේෂයෙන්ම අක්වෙරළ බැංකු, එහෙම නැත්නම් මේ භූමිය තුළ ක්‍රියාත්මක වන සියලු ආයෝජන කළමනාකරණය කිරීම, අධීක්ෂණය, පාලනය සඳහා මහ බැංකුවේ නියාමනය පවතිනවා. මහ බැංකුවට අනුකූලව, ඒ නියාමනවලට අනුව කටයුතු නොකරන ආයතන සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය මේ පනත් කෙටුම්පත මඟින් ලබා දීලා තිබෙනවා. ඉතින්, අද අපේ රටට ගෙන්වා ගත යුතු ආයෝජන ගෙන්වා ගැනීම සඳහා මෙවැනි ප්‍රමාණාත්මක, සාධනීය සංශෝධන මඟින් අවස්ථාවක් ලැබෙනවා කියන එක තමයි අපට හැඟී යන්නේ.

ඒ වාගේම මෙම භූමියේ අනුනව අවුරුදු බදු මත China Harbour Engineering Company එකෙන් තමයි ඒ ඉදිකිරීම් කරන්නේ. ගිවිසුම්ගත තත්ත්වය යටතේ ඔවුන්ට මේ භූමියෙන් සියයට 75ක් සහ ශ්‍රී ලංකා රජයට සියයට 25ක් අයිතිව තිබෙනවා. මේ අයිතිය තුළ ව්‍යාපාර කටයුතු සඳහා අවස්ථාව ලබා දීමට මේ වෙනකොට ආරාධනා ලැබ, නැත්නම් අයදුම්පත් ලැබ, ලියාපදිංචි වන සියයකටත් වඩා ආයෝජන අවස්ථා තිබෙන බව අප හොඳින්ම දන්නවා.

ඒ එක්කම මේ අවස්ථාවේදී මා කාරණයක් මතක් කළ යුතු වෙනවා. භූමියත් ඉදිකරලා, අලුතින් නගරයක් නිර්මාණය කරලා එය හුදකලාවේ පැවතීම රටට අලාභයක්, පාඩුවක්. එහෙම නම්, මේ කරපු ආයෝජනයේ ප්‍රතිඵල ගන්න නම් අපි ඊට සාධාරණ අවස්ථාව සැලසිය යුතුයි. ඉතින්, ඒ සඳහා වත්මන් රජය -ජාතික ජන බලවේගයේ ආණ්ඩුව- සාධනීය මැදිහත් වීමක් කරමින් ඉන්නවා. මෙතෙක් යම් ආකාරයකට ප්‍රවේශය හෝ වෙනත් ආකාරයේ ගැටලුසහගත තත්ත්වයක් ආයෝජකයන්ගේ පැමිණීමට තිබුණා නම්, මේ සංශෝධනයත් සමඟ ඒවා නිරාකරණය වෙලා ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු අපේ රටට ගෙනැල්ලා කර ගෙන යෑමට හැකියාව තිබෙන බව අපට පෙනෙනවා. අද වනකොට අපේ රට මොන තරම් අර්බුද මැද්දේ තිබුණත්, විපක්ෂය විවිධ විවේචන එල්ල කළත්, මා දකින්නේ ආර්ථිකය බොහොම සාධනීය ලෙස කළමනාකරණය කරමින් මේ වර්ෂය තුළදී සාමාන්‍ය වශයෙන් සියයට 5ක ආර්ථික වර්ධනයක් අත් කර ගෙන තිබෙන බවයි.

ඉතින්, අපේ ප්‍රතිපත්ති අනුව මූල්‍ය විනය, මූල්‍ය කළමනාකරණය කරනවා වාගේම, අයථා ආකාරයට මුදල් උපයා ගැනීමට, සොරකමට, දූෂණයට, වංචාවට තිබිච්ච ඉඩකඩ ද අහුරා තිබෙනවා. මේ කරුණු නිසාම අද අපේ රට යම්කිසි ස්ථාවරත්වයකට ඇවිල්ලා තිබෙනවා. පසුගිය වසර දෙකක කාලය බැලුවොත්, Fitch Ratings වාගේ ආයතනවල ඇගයීම අනුව අපි ණය ගෙවා ගත නොහැකි රාජ්‍යයක් ලෙස නම් කරමින් ණය ශ්‍රේණිගත කිරීමේදී ඉතා පහළ අඩියකට ගෙනැල්ලා තිබුණා. නමුත්, වර්තමානයේදී අපේ රට අත්කරගෙන තිබෙන සංවර්ධනය දිහා බලනකොට ඒ ඇගයීම් සියල්ලක්ම CCC plus කියන තත්ත්වයට ගෙනැල්ලා අද අපේ රට යම්කිසි ආර්ථික ප්‍රගතියක් අත්කර ගෙන තිබෙනවා කියන කාරණාව ලෝකයටම කියා පා තිබෙනවා. අපේ ආණ්ඩුව පත්වුණාට පසු කරගෙන යන කටයුතුවලින් ළඟා කරගෙන තිබෙන සාධනීය තත්ත්වයත්, ජාත්‍යන්තර වශයෙන් ණය ශ්‍රේණිගත කිරීමේදී අපේ රට අත්කර ගෙන තිබෙන ස්ථාවරයත් දිහා බලනකොට අපට ලොකු විශ්වාසයක් තිබෙනවා, මේ සංශෝධන තුළින් ඉදිරියේදී - විශේෂයෙන්ම මේ 2026 වර්ෂය තුළදී- වරාය නගරය තුළට විශේෂ ආයෝජන කැඳවා ගැනීමේ හැකියාවක්, විභවතාවක් පවතින බව. ඒ තුළින් අප රට අපේක්ෂා කරන අරමුණු කරා ගෙනයන්න මේ රජයට ශක්තියක් තිබෙනවා. මේ රාජ්‍ය යන්ත්‍රණය තුළ මේ කටයුතුවලට මැදිහත් වෙන සියලු ආයතනවලට වඩා ශක්තිමත් පදනමකින් යුතුව ඒවා ආරම්භ කරගෙන ඒ ඉලක්ක ළඟා කරගන්න අවශ්‍ය මැදිහත් වීම කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ විශ්වාසයෙන් යුතුව මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.18]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මම පළමුවෙන්ම මේ රටේ සියලුදෙනාට සුබ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරන්න කැමැතියි. මේ විවාදයට අද උදේ ඉඳන් ඇහුම්කන් දෙනකොට අපට හරි සතුටක් දැනෙන්නේ. මොකද, Port City එක නිසා සීගිරියත් කඩන්න වෙනවා කියපු අය, Port City එකේ concessions ටික ආයෝජකයන්ට දෙනකොට ගජ මිතුරන්ට බදු සහන දෙනවා කියපු අය අද උදේ ඉඳන් Port City එකේ ගුණ වයනකොට, තව අවුරුදු 3කට ඒ බදු සහන extend කළා කියනකොට, අනේ ඒ කට්න්ද කථා කරන්නේ කියලා අද අපට මේ ආණ්ඩුවෙන් අහන්න වෙනවා. මොකද, සීගිරිය පවා කඩන්න වෙනවා කිව්වා, Port City එක හැදුවොත්. ඒකට බදු සහන දීලා ආයෝජකයන් ගේන්න හැදුවාම කිව්වා, ඒවා ගජ මිතුරන්ට දෙන්න යන බදු සහන කියලා. ඒ වාගේම කිව්වා, ඒක චීන කොලනියක් වෙනවා කියලා. ඒක ඇතුළට යන්න passport එකක් අරගන්න වෙනවා කිව්වා. ඒකට උඩින් කාක්කෙකුට යන්නත් අවසර ඕනෑ කිව්වා. එහෙම කියපු අය Port City එකට දෙන බදු සහන ගැන ගුණ වයනකොට, Port City එක ගැන ගුණ වයනකොට අපට ඉතින් අහගෙන ඉන්න ටිකක් සතුටුයි.

අද ආණ්ඩුවේ හොඳ පොඩ්ඩක් කියනවා කියලා හිතාගෙනයි මම ආවේ. හැබැයි කනගාටුවෙන් වුණත් අද - පාර්ලිමේන්තුවේ පළමු දවසේම - හෙළි කරන්න වෙන්නේ, රුපියල් කෝටි 1,000ක අමු අමුවේ කරපු වංචාවක් ගැන. පසු ගිය අය වැය වෙලාවේදීත් මම කිව්වා, ලංකාවේ ගල් අඟුරු වංචාවකට මේ ආණ්ඩුව පාර කපමින් ඉන්නවා කියලා. ඒකට අවශ්‍ය දත්ත, සාක්ෂි, ඒ සියල්ලම මම ඉදිරිපත් කළා. සාමාන්‍යයෙන් ලංකාවට ගල් අඟුරු ගේන්න පුළුවන් මාස 8යි තිබෙන්නේ. මොකද, වාරකන් තිබෙනවා මැයි මාසයේ ඉඳන් අගෝස්තු වෙනකල්. ඒ නිසා මාස 8යි ලංකාවට ගල් අඟුරු ගේන්න පුළුවන්. ඒ මාස 8ක කාලය තුළ එක මාසයකට සාමාන්‍යයෙන් නැව් 5යි එන්නේ. නැව් 38ක් ගේන්න ඕනෑ එක අවුරුද්දකට. නැව් 40කට මාස 8ක කාලය තිබෙනවා. සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේ ටෙන්ඩර් කැඳවලා අගෝස්තු වෙද්දී ටෙන්ඩරය පිරිනමලාත් ඉවර කරනවා. මොකද, සැප්තැම්බර් මාසයේ ඉඳන් ගල් අඟුරු ගේන්න ඕනෑ හින්දා. හැබැයි, මේ ආණ්ඩුව මොකක්ද කළේ? අප්‍රේල් මාසයේ කැඳවන්න තිබුණු ටෙන්ඩරය සැප්තැම්බර් වෙනකල් කල් දැම්මා. සුදුසුකම් වෙනස් කරලා, නුසුදුසු, ජාත්‍යන්තර අත්දැකීම් නැති සමාගම් 2ක් register වෙනකල් ටෙන්ඩරය කල් දැම්මා. ටෙන්ඩරය කල් දමලා මොකක්ද කළේ? සාමාන්‍යයෙන් ඕනෑම ජාත්‍යන්තර ටෙන්ඩරයකට අවම කාලය දෙන්න ඕනෑ සති 6ක්. ටෙන්ඩරයට දින 42ක් දෙන්න ඕනෑ.

මොකක්ද කළේ? දින 42 අඩු කරනවා, සති තුනට. දින 21ට අඩු කරලා ටෙන්ඩර් එක දානවා. ඊට පස්සේ සියලු සැපයුම්කරුවන් අමාත්‍යාංශයට ලිඛිතව එවනවා, "අපට වේලාව මදි" කියලා. හැබැයි, එහෙම තිබෙද්දී, තව එක සතියක් විතරක් වැඩි කරලා ටෙන්ඩරය කැඳවනවා. "ඉතාම හදිසියි, සති තුනයි දෙන්නේ" කියලා. එහෙම තමයි ටෙන්ඩරය කැඳෙව්වේ. හැබැයි, මොකක්ද වෙන්නේ? සැප්තැම්බර් මාසයේ වහපු ටෙන්ඩරයට නොවැම්බර් මාසය වෙනකම් කල් ගන්නවා, ටෙන්ඩරය පිරිනමන්නේ නැතුව. මොකද, අර දාපු සමාගමට performance bond එක හොයා ගන්නතුරු, ගල් අඟුරු හොයා ගන්නතුරු. මාස දෙකක් අදිනවා මේ ටෙන්ඩරයේ award letter එක දෙන්නේ නැතුව. ඊට පස්සේ නොවැම්බර් මාසය. ඔන්න දැන් පළමුවෙනි ගල් අඟුරු නැව් දෙක ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ගල් අඟුරු නැව් දෙක ආපු ගමන්ම ලක්විජය බලාගාරයෙන් මේවා test කරලා තිබෙනවා. හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා කියලා අහලා තිබුණත්, අද උදේ පාන්දර බලශක්ති ඇමතිතුමා කෙහෙල් කැනත් අරගෙනම වැටෙන් පැන්නා. එතුමා කියනවා, "Lakvijaya Power Plant එකේ ඒවා පිළිගන්න මම සූදානම් නැහැ, මේක ජාත්‍යන්තර accredited lab එකක් නොවෙයි, ඒ නිසා මම පිළිගන්න සූදානම් නැහැ" කියනවා. මොකද, මේ lab එකෙන් දීපු report එකට අනුව calorific අගය 5,600යි. සාමාන්‍යයෙන් ටෙන්ඩරයේ guidelinesවලම තිබෙනවා, අනිවාර්යයෙන් calorific අගය 5,900ට අඩු නම් reject කියලා. ඊට පස්සේ ලක්විජය බලාගාරයෙන් දීපු reports හතරේම calorific අගය 5,600, 5,800, 5,700, 5,700යි. ඇමතිතුමා උදෙන්ම ඇවිල්ලා කිව්වා, මම ඒක පිළිගන්නේ නැහැ කියලා. හරි කමක් නැහැ කියමුකෝ. ඇමතිතුමා පිළිගන්නේ නැහැ කියමුකෝ. හැබැයි, ඊයේ මේ නැව් දෙකෙන් ගෙනාපු ගල් අඟුරු බොයිලේරුවට දාලා දහනය කරලා තිබෙනවා. ගිය සතියේ ඒවා දහනය කළාම සාමාන්‍යයෙන් පැයකට මෙගාවොට් 300ක් හදන්න යන්නේ ටොන් 107යි. සාමාන්‍යයෙන් උපරිම වශයෙන් යන්නේ ටොන් 107යි. හැබැයි, මේ ගෙනාපු ගල් අඟුරුවලින් මෙගාවොට් 300ක් හදන්න ටොන් 120ක් යනවා. ඒ කියන්නේ, එක බොයිලේරුවක මෙගාවොට් 300ක් හදන්න පැයකට extra ගල් අඟුරු ටොන් 13ක් යනවා. එතකොට බොයිලේරු තුනම වැඩ නම්, ටොන් 39ක් යනවා. සාමාන්‍යයෙන් මේක සාමාන්‍යයෙන් පැය 24කට -දිනකට- බැලුවොත්, ටොන් 936ක් වැඩිපුර යනවා. අවුරුද්දකට බැලුවොත්, ආසන්න වශයෙන් නැව් 6ක් extra ගෙනෙන්න වෙනවා, මේ බාල ගල් අඟුරු ගෙන ඒම නිසා. නැව් 6ක් ගේන්න වෙනවා. එය ආසන්න වශයෙන් කෝටි 1,000ක්. අර ලක්ෂයේ ඒවායින් ජනාධිපතිතුමා කියන විධියට කිව්වොත්, ලක්ෂයේ ඒවා ලක්ෂයක් වැඩිපුර ගෙවන්න වෙනවා, මේ බාල ගල් අඟුරු ටික ලංකාවට ගෙනාවාට පස්සේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පළමුවෙනියට ටෙන්ඩරය කල් දානවා. ඊට පස්සේ සති 6ක කාලය සති 3කට අඩු කරනවා. තමන්ගේ ගජ මිතුරෙක් register කර ගන්නවා. ඔහුට ටෙන්ඩරය දෙනවා. ඊට පස්සේ බාල ගල් අඟුරු එනවා. ලක්විජය බලාගාරයේ lab එක sure නැහැ කියනවා. හැබැයි, අන්තිමට දහනය කරලා බැලුවාම වැඩිපුර ටොන් 13ක් යනවා. කෝටි 1,000ක වංචාවක්. ඒ විතරක් නොවෙයි. මේ නැව එන්නේ South Africaවලින්. සාමාන්‍යයෙන් South Africaවලින් එනකොට RBC Terminal එක ඇතුළේම තිබෙනවා, lab එකක්. ඒ, SGS lab එක. සාමාන්‍යයෙන් South Africaවලින් ගල් අඟුරු එනවා නම්, test කරන්නේ මේ SGS lab එකෙන්. හැබැයි, මේ සමාගම අපූරු දෙයක් කරනවා. Lab report එක ඇවිල්ලා තිබෙන්නේ ඉන්දුනීසියාවෙන්. නැව ඇවිල්ලා තිබෙන්නේ South Africaවෙන්. Lab එකක් තිබෙනවා, ඒ terminal එකේ. හැබැයි, report එක ඇවිල්ලා තිබෙන්නේ ඉන්දුනීසියාවෙන්. ඇමතිතුමාට අර South Africaවලින් ආපු නැවේ ගල් අඟුරුවල ඉන්දුනීසියාවේ report එක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපේ ලක්විජය බලාගාරයේ lab එක sure නැහැ. දහනය කරලා වැඩිපුර ටොන් 13ක් ගිය එක sure නැහැ. ඒ කියන්නේ මේකට අමාත්‍යවරයාගේ තිබෙන සෘජු සම්බන්ධතාව නැවත නැවතත් ඔප්පු වෙනවා. අර නරියාට කුකුළු කොටුව භාර දුන්නා වාගේ තමයි නේද?

ටෙන්ඩර් වංචාවකට වැරදිකාරයෙක් වෙච්ච කෙනෙකුට දීලා කෝටි 1,000ක් අමු අමුවේ අවුරුද්දේ පළමුවෙනි සතියේම හොරකම් කරන්න මේ ආණ්ඩුව පටන් ගත්තා. ගල් අඟුරුවලින් ගහනවා; කැබ්වලින් ගහනවා; හාල් ටිකෙන් ගහනවා; ලූනු

ගෙඩියෙන් හොරකම් කරනවා; අල ගෙඩියෙන් හොරකම් කරනවා. පටන් ගත්ත දවසේ ඉඳන් වංචාවෙන්, දූෂණයෙන් යන ආණ්ඩුවක් බවට පුනරුද ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. හැබැයි, දැන් අන්තිමට වැරදිකාරයෝ වෙලා තිබෙන්නේ නිලධාරින්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

උදේ ඇමතිතුමා කියනවා මම දැක්කා, ඇයි ඒක කලින් test කළේ, ඇයි ඒක කලින් බොයිලේරුවට දැම්මේ කියලා. එහෙම දමපු නිසා තමයි ටොන් 13ක් වැඩිපුර යනවා කියලා හොයා ගත්තේ. අන්තිමට වැරදිකරුවන් වෙලා තිබෙන්නේ ඒක burn කරපු නිලධාරින්. මේකේ වංචාව හොයා ගත්ත නිලධාරින් වැරදිකරුවන් කරලා ඇමතිතුමා සුද්ද වෙන්න හදනවා. පළමුවැනි වංචාව කෝටි 1,000යි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.
බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.27]

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2021ஆம் ஆண்டின் 11ஆம் இலக்க, கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டத்தில் திருத்தங்களை மேற்கொள்வது தொடர்பான விவாதத்தில் நாங்கள் கலந்துகொண்டிருக்கின்றோம். குறித்த திருத்தத்தினை மேற்கொள்வதன் ஊடாக, கொழும்புத் துறைமுக அபிவிருத்தித் திட்டத்தின் முதலீடுகளையும் தொழில் வாய்ப்புகளையும் ஸ்திரமான நிலையில் பேணிக்கொண்டு, நாட்டின் தொழில் வழங்குநர், தொழில் பெறுநர் போன்ற வர்க்கத்தினருக்கான வரிச் சலுகைகள், கடல் கடந்த வங்கிச் சேவைகள் வழங்கும் நிறுவனங்களைப் பதிவு செய்வதன்மூலம் சர்வதேச தரத்துடன் இணைந்த வங்கிக் கட்டமைப்புப் போன்றவற்றின் ஊடாக மத்திய வங்கியின் அந்நியச் செலாவணி வருமான மட்டத்தினை ஸ்திரமான நிலையில் கையாளுதல் மற்றும் முறையற்ற பணப்பரிமாற்றல் செயற்பாடுகளைக் கட்டுப்படுத்தல் போன்ற செயற்பாடுகளை மேற்கொள்ள எதிர்பார்க்கப்படுகின்றது.

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு சட்டத் திருத்தத்தின் ஊடாக எமது நாட்டின் தொழிலாளர் தமக்குரிய வருமானங்களை வெளிநாட்டு முதலீட்டு நிறுவனங்கள் ஊடாக அந்நிய நாணயத்தின் மூலமாகப் பெற்றுக்கொள்ள வாய்ப்புகள் ஏற்படுத்தப்படுவதுடன், அதன்மூலம் கிடைக்கும் வருமானத்திற்கு வரிச் சலுகையினைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பும் ஏற்படுத்தப்படுகின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, துறைமுக அபிவிருத்தித் திட்டத்தில் முதலீடுகளை மேற்கொள்ளும் வெளிநாட்டு முதலீட்டாளர்கள் ஊடாக எமது ஏனைய மாவட்டங்களிலும் விவசாயம் மற்றும் கைத்தொழில் துறை, சுற்றுலாத் துறை போன்றவற்றின்மூலம் அதிகளவான கேள்விச் சந்தைவாய்ப்பினை உருவாக்கிக்கொள்ளக்கூடிய வாய்ப்புகள் உள்ளன. இளைஞர், யுவதிகளுக்கு வெளிநாட்டு நிறுவனங்களில் வேலைவாய்ப்பினைப் பெற்றுக் கொள்ளக்கூடிய தொழிற் பயிற்சிகளைத் திட்டமிட்டு வழங்குவதனூடாக, முதலீட்டுத் துறை நிறுவனங்களிலும், சுற்றுலாத் துறை நிறுவனங்களிலும் அதிகளவான வேலைவாய்ப்பினை அவர்கள் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்படும். எமது அரசாங்கம் எடுக்கும் எந்தத் தீர்மானமும் நாட்டு மக்கள் சார்ந்ததாக இருக்குமே தவிர, முன்னைய ஆட்சியாளர்களைப்போல் தாம் தனிப்பட்ட முறையிலும், நண்பர்கள், உறவினர்கள் முதலானவர்களுடன் ஒன்றிணைந்தும் நாட்டின் வளங்களைப் பங்குபோடும் தீர்மானமாக ஒருபோதும் இருக்கப் போவதில்லை.

அண்மையில் இடம்பெற்ற இயற்கை அனர்த்தத்தின்போது எமது அரசாங்கத்தை விமர்சனம் செய்துகொண்டு, தாங்கள் ஆட்சியைக் கைப்பற்ற எடுத்த முயற்சிகள் அனைத்தின் மூலமாகவும் மக்களால் மீண்டும் மீண்டும் புறக்கணிக்கக்கூடிய தரப்பினராகவே எதிர்த்தரப்பினர் இருந்து வருகின்றனர். மக்களுக்கு வழங்கப்பட்ட நிவாரணங்களைக்கூட விமர்சனம் செய்து, அரசாங்கத்திற்கு எதிராக மக்களைத் திசைதிருப்பி, அதன்மூலம் அரசியல் இலாபம் அடைய முயற்சித்துத் தோல்வி அடைந்துள்ள அரசியல்வாதிகள், தற்பொழுது அரசாங்கத்தின் மக்கள் நலன்சார்ந்த திட்டங்களான 'தேசிய வறுமை ஒழிப்பு' மற்றும் கிராமிய அபிவிருத்தி வேலைத்திட்டமான, 'பிரஜா சக்தி' ஆகியவற்றுக்கு எதிராகவும் கோஷமிட ஆரம்பித்துள்ளனர்.

மூன்று தசாப்தங்களுக்கும் மேலாக, வறுமை ஒழிப்பு, கிராமிய அபிவிருத்தி என்று ஒவ்வோர் ஆட்சியாளரும் நடைமுறைப்படுத்தி வந்த திட்டங்கள் மூலமாக உண்மையில் நாட்டு மக்களின் வறுமை நிலை குறைந்ததா அல்லது அந்த ஆட்சியாளர்களின் குடும்பங்கள், நண்பர்கள் மற்றும் உறவினர்களின் வறுமை நிலை குறைந்ததா என்பதனைச் சிந்தித்துப் பார்த்தால் புரியும்! கிராமப்புற அபிவிருத்தி என்ற போர்வையில் பொருத்தமில்லாத இடங்களில் கட்டிடங்களையும் பொருளாதார வளாகங்களையும் அமைத்ததன்மூலம் நிதி முறைகேடுகளே கடந்த காலங்களில்

[ගරු කන්දසාමි ප්‍රභු මහතා]

இடம்பெற்றிருந்தன. தற்போது எமது அரசாங்கத்தின் ஊடாக அனைத்து அரச துறைகளும் சுயாதீனமாகச் செயற்பட்டு, குறித்த வீண் விரயங்கள் மற்றும் மோசடிகளுக்கு எதிரான சட்ட நடவடிக்கைளைச் சுயாதீனமாக மேற்கொண்டு வருகின்றன.

கடந்த 2025ஆம் ஆண்டு மட்டக்களப்பு மாவட்டத்திற்கு ஒதுக்கீடு செய்யப்பட்ட நிதி முற்றுமுழுதாகச் செலவு செய்யப்பட்டுள்ளதுடன், இடம்பெற்ற அனர்த்த நிலைமையின் காரணமாகத் திட்டமிட்டவாறு தீர்மானிக்கப்பட்ட காலத்தினுள் முடிவுறுத்த முடியாமல் இருந்த சில அபிவிருத்தித் திட்டங்களையும் வேலைத்திட்டங்களையும் தற்போது நிறைவுசெய்யும் நிலை காணப்படுகின்றது. எமது அரசாங்கத்தினால் திட்டமிடப்பட்ட சலக வேலைத் திட்டங்களும் ஒழுங்கமைக்கப்பட்ட கால வேளையில் நடைமுறைப்படுத்தப்பட்டு வருவது தொடர்பில் எதிர்க்கட்சி சார்ந்த சில அரசியல்வாதிகள் விசமத்தனமான பிரசாரங்களை மேற்கொண்டு வருகின்றனர். அவர்களும் கடந்த கால ஆட்சியாளர்களுடன் கூட்டிணைந்து இந்த நாட்டை ஆட்சி செய்தவர்கள் என்பதனை மறந்து, மக்கள் மத்தியில் சிறந்த வேலைத்திட்டங்களை மக்களுக்காகவே செயற்படுத்திவரும் எமது அரசாங்கத்தினைப் போலியாக விமர்சனம் செய்வதன் மூலமாகவும், இனவாதக் கருத்துகளைப் பரப்புவதன் மூலமாகவும், ஆர்ப்பாட்டங்களையும் எதிர்ப்பு நடவடிக்கை களையும் மேற்கொள்வதன் மூலமாகவும் தமது அரசியல் அடையாளங்களை, தமது இருப்பை பெரும் பாடுபட்டுத் தக்கவைத்துக் கொள்வதற்காக இவர்கள் மக்களைத் திசைதிருப்பிக்கொண்டு வருகின்றார்கள். இருந்தாலும், இந்த அரசாங்கம் தனது வேலைத்திட்டங்களைச் சிறப்பாக முன்னெடுத்துக்கொண்டு வருவதை நாட்டு மக்கள் புரிந்து கொண்டிருக்கிறார்கள்.

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு திருத்தச் சட்டமூலத்தினூடாகப் பலவகையான வரிச் சலுகைகள் முதலீட்டாளர்களுக்குக் கிடைக்கப்பெற இருக்கின்றன என்பது உங்களுக்குத் தெரியும். 25 மில்லியனுக்கு உட்பட்ட முதலீட்டுத் தொகைக்கு 8 வருட கால வரிச் சலுகையும், 100 மில்லியனுக்கு உட்பட்ட தொகைக்கு 10 வருட வரிச் சலுகையும், 500 மில்லியனுக்கு உட்பட்ட தொகைக்கு 12 வருட வரிச் சலுகையும், 1 பில்லியனுக்கு மேற்பட்ட தொகைக்கு 15 வருட வரிச் சலுகையும் வழங்கப்படுகின்றது. மக்களுடன் ஒன்றிணைந்ததாக public-private partnership என்ற அடிப்படையிலே முதலீடுகளை மேற்கொள்ளும் வகையில் இந்தச் சட்டமூலத் திருத்தங்கள் மேற்கொள்ளப்பட்டிருக்கின்றது. இதனூடாக, அனைவரும் ஒன்றிணைந்து செயற்படுவது உறுதிப்படுத்தப்படுகின்றது. ஆகவே, இந்த நாட்டின் பொருளாதாரத்தின் மிக முக்கிய பங்காளியாக இந்தச் சட்டமூலம் அமையும். இந்தச் சட்டமூலத்திலே குறிப்பிட்டதைப் போன்று, கொழும்புத் துறைமுக நகரப் பொருளாதாரத்தை அபிவிருத்தி செய்வதற்குப் பாரிய முதலீட்டாளர்களைக் கவர்ந்திழுப்பதற்கு ஏற்றவிதமாகத் திருத்தங்களை மேற்கொள்வதனூடாக, இந்த நாட்டில் பாரியளவு முக்கியமான அபிவிருத்திச் செயற்பாடுகளை வெகு விரைவாக எட்ட முடியும் என்று நாங்கள் நம்புகின்றோம்.

இதிலே குறிப்பாக நாங்கள் சொல்லவேண்டி இருக்கின்றது. அண்மைக் காலத்திலே சுற்றுலாப் பயணிகள் இந்த நாட்டுக்கு அதிகமாகக் கவர்ந்திழுக்கப்படுகின்றார்கள்; சுற்றுலாப் பயணிகள் தொடர்ச்சியாக இந்த நாட்டை அலங்கரித்துக் கொண்டிருக்கிறார்கள். அதனூடாக, நாட்டுக்கு அந்நியச் செலாவணி வருமானம் கிடைத்தவண்ணம் இருக்கின்றது. அதேபோன்று, வரி செலுத்துபவர்கள், வியாபாரிகள் இன்று எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் நம்பிக்கைவைத்து, தங்களது வரியினைச் சுயமாகவே சரியான முறையில் செலுத்திக் கொண்டிருக்கின்றார்கள். ஆகவேதான் இன்று அதிகளவான வரி வருமானத்தை நாம் ஈட்டக்கூடியதாக இருக்கின்றது. அதனூடாக எங்களது வரி வருமானம் அதிகரித்துக் காணப்படுகின்றது. கடந்த கால ஆட்சியாளர்கள் தங்களைச் சார்ந்தவர்களுக்காக விசேட வரிச் சலுகைகளை வழங்கியதை நீங்கள் அறிந்திருப்பீர்கள். அதனூடாக, இந்த நாட்டுக்குக் கிடைக்கவிருந்த பெருமளவு வரி வருமானம் இழக்கப்பட்டிருந்ததை நாங்கள் இந்த நேரத்தில் ஞாபகமூட்ட வேண்டும். தற்போது எங்களுடைய பொருளாதார வளர்ச்சி 6% ஐ எட்டக்கூடிய நிலைமை இருக்கின்றது.

அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயல் காரணமாக நாட்டின் பொருளாதார நிலைமை சற்றுத் தளர்வடைந்துள்ளதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. நாங்கள் எதிர்வரும் காலங்களில் இன்னும் மும்முரமாகச் செயற்பட்டு, பொருளாதார அபிவிருத்திக்கான பல செயற்பாடுகளில் ஈடுபடுவோம் என்பதைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அண்மைக்காலமாக 'பிரஜா சக்தி' வேலைத்திட்டம் தொடர்பாகப் பல விமர்சனங்கள் எதிர்க்கட்சியினால் முன்வைக்கப்பட்டு வருகின்றது. எங்களது மாவட்டத்திலும் இது தொடர்பாகச் சில குளறுபடிகளை அல்லது வேறுவிதமான கருத்துக்களை எதிர்க்கட்சியைச் சார்ந்தவர்கள் முன்வைத்து வருகின்றனர். ஆனாலும், 'பிரஜா சக்தி' வேலைத்திட்டம் மிகவும் நல்லவிதமாக அமைந்துள்ளதை மக்கள் அறிந்திருக்கின்றார்கள். இனிவரும் காலங்களிலும் அரசாங்கத்தின் சிறந்த செயற்பாடுகளுக்கு எதிர்ப்புத் தெரிவிப்பதை விடுத்து, அதிலிருக்கும் தவறுகளைச் சுட்டிக்காட்டி, அதனைச் சரிசெய்துகொண்டு முன்னோக்கிப் பயணிப்பதே சிறந்ததாக அமையுமென நான் நினைக்கின்றேன். ஒரு பிரதேசத்தை அபிவிருத்தி செய்வதற்கு அல்லது பொருளாதார நிலையில் பின்தங்கியிருக்கின்ற கிராமங்களை முன்னேற்றுவதற்கு இந்த வேலைத்திட்டம் சிறப்பானதாக அமையும். மக்களும் அரசாங்க அதிகாரிகளும் ஒன்றிணைந்து இந்தச் செயற்பாடுகளை முன்னெடுக்கின்றனர். இதன்மூலம் நாங்கள் நிரந்தரப் பொருளாதார வளர்ச்சியை எட்டக்கூடியதாக இருக்கும் என்ற விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். "வளமான நாடு - அழகான வாழ்க்கை" எனும் தொனிப்பொருளில் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் முன்னெடுக்கப்படும் அனைத்துத் திட்டங்களும் சிறப்பாக அமைந்திருக்கின்றது. இதனூடாக எமது நாட்டை வளமிக்கதாக மாற்றுவோம் எனக்கூறிக்கொண்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Thilina Samarakoon. You have ten minutes.

[අ.භා. 1.37]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි විවාද කරන්නේ 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට ගෙන එනු ලබන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳවයි. මේ පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්ම අවධානයට ලක් වන්නේ අපේ රටේ ආර්ථිකයට අදාළ ප්‍රතිපත්ති

ඉදිරියේදී අපි කොයි ආකාරයෙන්ද හසුරුවන්නේ කියන කාරණයයි. ඒ කියන්නේ, වරාය නගරය වාගේ සුවිශේෂී තැනක අපේ ආර්ථික කටයුතු කිරීමට අදාළ මැදිහත්වීම රජයක් විධියට අපි කොයි ආකාරයෙන් කළ යුතුද කියන කාරණය පිළිබඳව තමයි මේ හරහා සාකච්ඡාවට ලක් වන්නේ. ඊට අමතරව, මේ පනත් කෙටුම්පත සම්මත වීම හරහා කොළඹ වරාය නගරය තුළ ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රියාකාරිත්වය යම් කිසි නියාමනයකට ලක් කරන්න රජය පැත්තෙන් අපි උත්සාහ දරනවා. ඇත්තටම අපි ඒ දේවල් ටික කරගෙන යන්නේ රට තුළ ආර්ථිකයේ යම් කිසි විධියක යහපත් කළමනාකරණයක් කරන අතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ එක් පාර්ශ්වයක් - විපක්ෂය සහ ඒ ප්‍රමුඛ බලවේග- විසින් රටේ ආර්ථිකය වැටී රට නැවත ආපස්සට ගමන් කරයි කියන සිතුවිල්ලක ඉන්න වටපිටාවක් තුළ තමයි අපි මේ සාකච්ඡා කරන්නේ. විපක්ෂයේ සමහර අය බලාගෙන ඉන්නවා, මේ රටේ ආර්ථිකය කඩාගෙන වැටිලා වෙන කෙනෙකුට බලය ලබාගෙන නැවත මේ රට පාලනය කරන්න අවස්ථාවක් උදා වෙයි කියලා. ඒ වාගේ කථා ඔවුන්ගේ පැත්තෙන් ප්‍රකාශ වෙමින් තිබෙනවා. නමුත් කිසි ලෙසකින්වත් එවැනි දෙයක් සිද්ධ වන්නේ නැහැ. ආර්ථිකයේ ස්ථාවරත්වය පිළිබඳ තොරතුරු වාර්තා පදනම් කරගෙන ඔබට ඒ ගැන බලන්න පුළුවන්. වර්තමානයේ අපි ලබාගෙන තිබෙන ආර්ථික ස්ථාවරත්වය පිළිබඳ හොඳම අදහස් හැම තැනකම වාගේ දැන් අපට දකින්න, අහන්න ලැබෙනවා. නමුත් විපක්ෂයේ අය කවදාවත් ඉටු නොවන බලාපොරොත්තුවක් ගැන සිහින මවමින් තැනින් තැන නොයෙක් ප්‍රකාශ කරමින් යනවා.

පසුගිය කාලයේ අපි දැක්කා, එක් පක්ෂයක ලේකම්තුමියක් වන අපේ රත්නපුර ප්‍රදේශයේ හිටපු මන්ත්‍රීවරියක් කර තිබුණු ප්‍රකාශයක්. "මේ රටේ ආර්ථිකය වැටෙනවා, ඊට පසුව ආර්ථික ඔස්තාර් කෙනෙකුට -අහවල් පුද්ගලයාට- මේ ආර්ථිකය භාර දෙන්න, එදා ඉඳලා එතුමා මේ රට කරගෙන යාවි" වාගේ අදහස් පසුගිය කාලයේ සමාජගත වුණා. ඒ අයගේ කාලය දැන් අවලංගුයි. ඒ අයගේ කාලය තුළ කළ ක්‍රියාකාරකම් එක්ක රට බංකොලොත්භාවයට පත් වුණා. ඊට පසු මේ රජය භාර ගත්ත අපි නව බලවේගයක් විධියට මේ ආර්ථිකය හොඳින් කළමනාකරණය කරමින් ඉදිරියට අරගෙන යන මොහොතක තමයි මේ කටයුතුත් සිද්ධ කරන්නේ.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට අදාළව ගෙන එන මෙම සංශෝධනයට 2025 වර්ෂයේ නොවැම්බර් 24වැනි දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබීමෙන් අනතුරුව, 2025 නොවැම්බර් 28වැනි දිනැති ගැසට් පත්‍රයේ II වන කොටස අතිරේකය මඟින් මෙය ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ අනුව තමයි අපි මේ සාකච්ඡාව කරගෙන යන්නේ. පසුගිය කාලය තුළ කොළඹ වරාය නගරය නොයෙක් මතභේදවලට ලක් වුණත්, අපි මේ ආර්ථිකය කළමනාකරණය කරද්දි, මේ ආර්ථිකය හසුරුවද්දි කොළඹ වරාය නගරය business hub එකක් කරගන්න, ඒ වාගේම උපායමාර්ගික ස්ථානයක් - strategic location එකක් - බවට පත් කරන්න, developmentවලට මූලිකත්වය ගන්නා තැනක් - potential එකක් - බවට පත් කරන්න අපේ පැත්තෙන් අවශ්‍ය මැදිහත්වීම කරමින් ඉන්නවා. අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම හරහා පහත සඳහන් ප්‍රධාන පියවර ක්‍රියාත්මක කරන්න අපේක්ෂා කරනවා.

කොළඹ වරාය නගරය තුළ සේවයේ නියුතු පුද්ගලයන්ගේ සේවා නියුක්ති ආදායම මත අදාළ ආදායම් බදු නිදහස් කිරීම සහ ඉවත් කිරීම, වාර්ෂිකව බදු ආදායම අහිමි වීම ප්‍රකාශයට පත් කිරීම සහ ඇස්තමේන්තුගත කිරීම, අනිවාර්ය ස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම සහ තවදුරටත් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් කාර්ය සාධන ඉලක්ක අධීක්ෂණය හරහා අනුකූලතාව අධීක්ෂණය ශක්තිමත් කිරීම ඒ කරුණු අතර තිබෙනවා. ඒ අනුව කොළඹ වරාය නගරය තුළ සිද්ධ වන සියලු කටයුතු මේ කොමිෂන් සභාව හරහා අධීක්ෂණය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී බැංකු අධීක්ෂණය ඇතුළු නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම Basel III කියන ජාත්‍යන්තරව පිළිගත්, බැංකු නියාමනයට අදාළ ප්‍රතිපත්ති මත ඉඳලා මේ කටයුතු ටික කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Basel III ප්‍රතිපත්තිය යටතේ මේ කොළඹ වරාය නගරය තුළ ක්‍රියාත්මක වන බැංකු නියාමනයට අපි කොයි වාගේ කාර්යයන්ද කරන්නේ කියන එකත් මම විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අවධානයට ලක් කරන්නම්. මේ තුළ බැංකුවක් ක්‍රියාත්මක වෙනවා නම් Basel III කියන ප්‍රතිපත්තිය යටතේ මෙන්න මේ කාරණා අප විසින් සොයා බලනවාය කියන එක තමයි මේ හරහා අපි කියන්න උත්සාහ කරන්නේ. අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, ඒ කියන්නේ බැංකුවේ තබා ගත යුතු ප්‍රාග්ධන අවශ්‍යතාව, ද්‍රවශීලතා අවශ්‍යතාව, උත්තෝලන අනුපාතය - leverage ratio, ඒ කියන්නේ ණය ගැනීම සම්බන්ධව බැංකුවකට තිබෙන තත්ත්වයන් සලකා බලද්දී ඒ ratio එක අදාළ කර ගන්නවා. ඒ වාගේම ආර්ථික උච්චාවචනයක් සිද්ධ වන මොහොතේ ඊකට සරිලන අයුරින් බැංකුවේ ප්‍රාග්ධනය සකසා ගන්නට ඕනෑ. ඒක සකසා ගැනීම තුළින් තමයි බැංකුවට යම්කිසි විධියකට ස්ථාවරව ගමන් කරමින්, තමන්ගේ ගනුදෙනුකාර පදනම රැක ගනිමින් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්න පුළුවන් වෙන්නේ. එතකොට මෙන්න මේ Basel III කියන ප්‍රතිපත්තියට අමතරව අපි මුදල් අමාත්‍යාංශය හරහා, කොළඹ වරාය නගරය තුළ පිහිටුවන බැංකු නියාමනයට ලක් කරන්න මෙන්න මේ කාරණා මත පදනම්වත් කටයුතු කරනවා. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය බැංකුකරණයට අදාළව මැදිහත් වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ මත. ඒ නිර්දේශ මත තමයි මුදල් අමාත්‍යාංශය මේකට අදාළ කටයුතුවලට මැදිහත් වෙන්නේ.

විශේෂයෙන්ම මේ තුළ ක්‍රියාත්මක වන බැංකු අවලංගු කිරීම, අත්හිටුවීම, එහෙම නැත්නම් සම්පූර්ණයෙන් අවලංගු කරලා ඔවුන්ගේ බිස්නස් සම්පූර්ණයෙන් නතර කිරීමට අදාළ මැදිහත්වීම් පවා සිද්ධ කරන්නේ මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ මත. බැංකුකරණයට අදාළ තවත් කාරණා විධියට ගත්තාම අවසරලත් ක්‍රියාකාරකම් ප්‍රමාණයක් තමයි මේ තුළ සිද්ධ කරන්න දෙන්නේ. ඊට අමතරව සීමාසහිත ගනුදෙනු, විදෙස් මුදල් මඟින් ගනුදෙනු කරන ලංකාවේ ඉන්න අනේවාසික සහ නේවාසික - non-resident and resident - පුරවැසියන්ට යම්කිසි සීමා යටතේ අවසරලත් ක්‍රියාකාරකම් ප්‍රමාණයක් විදෙස් මුදල් භාවිත කරලා මේ හරහා කරගෙන යන්න පුළුවන්. ඒ වාගේම දේශීය බැංකු පනත යටතේ තිබෙන සමහර කාරණා මේ කොටසින් අපි ඉවත් කරලා තිබෙනවා. ඔන්න ඔය කාරණාවලට අමතරව බැංකුවලට අදාළව ගත්තාම, විගණන අවශ්‍යතා සපුරන්න ඕනෑ. විශේෂයෙන්ම මහ බැංකුව අනුමත ආයතනවලින් audit කරන්න ඕනෑ. ඒ කියන්නේ, මහ බැංකුව අනුමත කරලා තිබෙන ආයතනවලින් තමයි මේ වරාය නගරය තුළ පවතින බැංකු ටික අපි විගණනය කරන්න ඕනෑ. ඒ වාගේම මේ තුළ තිබෙන බැංකුවල audit reports ටික මහ බැංකුවට භාර දෙන්න ඕනෑ. ඊට අමතරව කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවටත් ඒවා භාර දෙන්න ඕනෑ. ඔන්න ඔය වාගේ ඒ බැංකු පද්ධතිය නියාමනයට අදාළව සැලකිය යුතු කාරණා කිහිපයකට අපි අවධානය යොමු කරලා තිබෙනවා. අපි මේ කාරණා හඳුන්වා දෙන්න හේතු වුණේ ප්‍රධාන වශයෙන්ම බැංකුවල සුරක්ෂිතභාවය, තිරසරභාවය හා

[ගරු තිළිණ සමරකෝන් මහතා]

ආර්ථික අර්බුදවලට ප්‍රතිවිරෝධතා දැක්වීම සඳහායි. ආර්ථික අවපාතයක් සිද්ධ වන අවස්ථාවක බැංකුවක් ඒකට මුහුණ දෙන්න සමත් වෙන්න ඕනෑ. ඒ නිසා Basel III කියන ජාත්‍යන්තරව පිළිගත් නියාමන ප්‍රතිපත්තිය ඔස්සේ අපි වරාය නගරය තුළ ක්‍රියාත්මක වන බැංකුවල නියාමන කටයුතු කරන්න උත්සාහ දරනවා.

ඊළඟ කාරණය, මුදල් විශුද්ධිකරණය. මුදල් විශුද්ධිකරණයට අදාළ නීති රීති, රෙගුලාසි මේ බැංකු පද්ධතිය තුළත් අනිවාර්යයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඔන්න ඔය වාගේ කාරණා තුළ මේ බැංකු පද්ධතිය නිසි විධියට නියාමනය කරලා, ඒවායේ ගනුදෙනු කරන ව්‍යාපාරිකයන්ට එහෙම නැත්නම් ව්‍යවසායකයන්ට විශ්වාසදායී බැංකු පද්ධතියක් කොළඹ වරාය නගරය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මැදිහත් වීම තමයි අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ඒ විධියට රටේ ආර්ථික සුරක්ෂිතතාව පවත්වාගෙන යෑම සඳහා සහ අපේ රට තුළට එන ආයෝජකයන්ගේ විශ්වසය තවදුරටත් වැඩි කිරීම සඳහා තමයි මේ දේවල් අපි කරගෙන යන්නේ. මේ දේවල් අපි රට තුළ කරගෙන යන අතරතුර පසුගිය දිනවල අපි සුළි කුණාටුවකටත් මුහුණ දුන්නා. ඒ සුළි කුණාටුවත් එක්ක ආපදාවට ලක් වූ ජන ජීවිත නැවත ගොඩනැඟෙමින් තිබෙන මොහොතක තමයි මේ කටයුත්තත් සිද්ධ කරන්නේ. ඒ සුළි කුණාටුවෙන් සිදු වූ බලපෑම, විශාල බලපෑමක් නොකරගෙන ආර්ථිකය ගොඩනැඟීමට අදාළ මැදිහත්වීම අපි සිදු කරමින් ඉන්නවා. ඒ ජනතාවට අවශ්‍ය සහන සැපයීම අපි මේ වනවිටත් සිදු කරමින් ඉන්නවා. ආපදාවට ලක් වෙලා නිවාස අහිමි වූ පුද්ගලයන්ගේ නිවාස හදන වැඩසටහන අපේ ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම සහ මූලිකත්වය මත අපි 9වැනි දා අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ විධියට අපේ රටේ සිදු වූ ආපදාවත් කළමනාකරණය කර ගනිමින්, රටේ ආර්ථිකය ස්ථාවර පදනමක් මත ඉදිරියට ගෙනයන්නට අවශ්‍ය නායකත්වය, මූලිකත්වය අපි ලබා දෙන ගමන්, අපි 2025 වර්ෂයේ සිට ඉදිරියට ගෙනාපු ආර්ථිකය 2026 වර්ෂයේත් ඊට වඩා ඉහළ පියවරකින් ඔසවා තබා, අපේ රටේ ජනතාවට යහපත් ආර්ථික, සමාජ වටපිටාවක් ගොඩනඟන්නට අවශ්‍ය මැදිහත්වීම අප කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව මට ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් කාරණයක් මම මේ මතු කරන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමා මේ විවාදය අතරතුර ඉතාම වැදගත් කාරණයක් ගැන තමයි කථා කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Wealth Trust Securities Limited සමාගම අද දිනයේදීම share market එකේ කොටස් වෙළෙඳාම පටන් ගෙන තිබෙනවා. මේක price band කරලා තිබුණේ නැති නිසා මොකද වුණේ කියලා ඔබතුමා දන්නවාද? රුපියල් 7.00ට තිබුණු share එක රුපියල් 25,000ට ඉහළ ගියා. ඒ විධියට 6,326,664ක shares විකිනුණා. මේ කොටස් වෙළෙඳ පොළ පාලනයක් නොකරපු එකේ ප්‍රතිඵලය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මේ තුළින් රටේ ආයෝජන පිළිබඳ විශාල අර්බුදයක් ඇති වනවා. මොකද, මේ අය share market එකට එන්නේ යම් විශ්වාසයක් තියාගෙන. Share market එක අද වැහුවා. මේක ඉතාම වැරදි වැඩක්. ඇත්තටම share market එකේ ඉන්න අය ඉල්ලා අස් වෙන්න ඕනෑ. ආයෝජන සම්බන්ධයෙන් ඉතාම වැදගත් සාකච්ඡාවක් පවතින මොහොතකයි මම මේ කාරණය කියන්නේ. ඇත්තටම කොටස් වෙළෙඳ පොළේ සිටින නිලධාරින් විශාල විනාශයක් මේ කර තිබෙන්නේ. Share එකක් රුපියල් 25,000කට ඉහළ ගියා. ඒ නිසා කරුණාකරලා මේ ගැන සොයා බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, the Ministerial Consultative Committee is going on now. You can go and take part in it.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have 11 minutes.

[අ.භා. 1.49]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සංශෝධන පනත් කෙටුම්පත ගැන කථා කරද්දී, මේ ආයෝජනත් එක්ක 2025දී සිද්ධ වෙච්ච යම් කරුණු - කාරණා කිහිපයක් මේ සභාවට හෙළි කරන්න මගේ කථාව තුළින් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයේ හිටපු 2021 අවුරුද්දේ පුනර්ජනනීය බලශක්තිය සඳහා EOI projects කියලා ආයෝජකයන් කැඳෙව්වා. පුනර්ජනනීය බලශක්තියට අදාළ ව්‍යාපෘති 47ක් සඳහා EoI projectsවලට ආයෝජකයන්

කැඳෙව්වා. එහිදී පුනර්ජනනීය බලශක්තිය සඳහා යෝජනා 533ක් ඒ ආයෝජකයන් ඉදිරිපත් කළා. ඒක 2021 අවුරුද්දේ පටන් ගත්ත ක්‍රියාදාමයක්. 2024 නොවැම්බර් මාසයෙන් පසු වර්තමාන ආණ්ඩුව බලයට පත් වුණාමත් දැන් මේ ක්‍රියාදාමය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒ ක්‍රියාදාමය ඉදිරියට ඇවිල්ලා, 2025 නොවැම්බර් මාසයේ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය හේමපාල මැතිතුමා පුනර්ජනනීය බලශක්ති අධිකාරියට ලිපියක් යවනවා, ආයතන 7කට ඒ ලයිසන් එක නිකුත් කරන්න කියලා. මේ ලිපිය යවන්නේ 2025 නොවැම්බර් මාසයේ.

ඒ ලිපියේ reference අංකය, PE/DEV/02/04. මේ ලිපිය යවලා එතුමා කියනවා, ආයතන 7කට ලයිසන් එක නිකුත් කරන්න කියලා. ආයතන 47ක් shortlist කළා. ඒ ආයතන 47න් ආයතන 7ක් තෝරා ගෙන ඒ ආයතන 7ට පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කරන්න ලයිසන් එක දෙන්න කියනවා. පුනර්ජනනීය බලශක්ති අධිකාරියට - SEA එකට - තමයි මේ ලිපිය යවන්නේ. මේ ආයතන 7 මොනවාද? පළමු එක, Solar Forge Batticaloa Limited ඒක ඔට්ටමාවඩිවල මෙගාවොට් 100ක සූර්ය බලශක්ති ව්‍යාපෘතියක් පටන් ගන්නේ. දෙවැනි එක, Seek Energy Private Limited. ඒක මෙගාවොට් 100ක Solar Power Plant එකක් පූනානිවල පටන් ගන්නේ. තුන්වැනි එක, Asia Wind Power Limited. ඒක මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාරයක් කල්පිටියේ පටන් ගන්නේ. හතරවෙනි එක, 3W Power Management Limited. ඒක මෙගාවොට් 100ක සූර්ය බල ව්‍යාපෘතියක් ත්‍රිකුණාමලයේ නිලාවේලිවල පටන් ගන්නේ. පස්වැනි එක, Orbital Energy Private Limited. ඒක මෙගාවොට් 100ක සූර්යබල ව්‍යාපෘතියක් ත්‍රිකුණාමලයේ මුතූර් ප්‍රදේශයේ පටන් ගන්නේ. හයවෙනි එක, Bluesun Technology Limited. ඒක මෙගාවොට් 50ක සූර්යබල ව්‍යාපෘතියක් ත්‍රිකුණාමලයේ පටන් ගන්නේ. හත්වෙනි එක, Ceylon Electric Power Development Limited. ඒක මෙගාවොට් 50ක සූර්යබල ව්‍යාපෘතියක් යාපනයේ පටන් ගන්නේ. එතකොට මෙගාවොට් 550ක් නිෂ්පාදනය කරන්න පසුගිය නොවැම්බර් මාසයේ අනුමැතිය ලබා දීලා මේ Authority එකෙන් ලයිසන් නිකුත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හැම එකක්ම ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දීපු ඒවා. මේ එකකටවත් ටෙන්ඩර් කැඳවලා නැහැ. මට මතකයි මේ ආණ්ඩුව කැබිනට් මණ්ඩලයෙන් තීන්දුවක් ගත්තා ටෙන්ඩර් කැඳවීමකින් තොරව කිසිදු ව්‍යාපෘතියක් ප්‍රදානය කරන්නේ නැහැයි කියලා. එහෙම තීන්දුවක් ගත්තා. නමුත් මේවා ටෙන්ඩර් කැඳවීමකින් තොරව දීලා තිබෙනවා. මේකේ ප්‍රධානම දේ තමයි, මේ සූර්ය බලශක්තිය වෙනුවෙන් දීලා තිබෙන ව්‍යාපෘතිවල unit එකක් රුපියල් 18ට ගන්නවා. ඒ කියන්නේ මෙගාවොට් 100ක සූර්යබල ව්‍යාපෘතියක unit එකක් රුපියල් 18ට තමයි ගන්නේ. නමුත්, මීට කලින් මෙගාවොට් 10ක් සඳහා දීපු සූර්යබල ව්‍යාපෘතියේ unit එකක් රුපියල් 17ට ගන්නේ. ඒ කියන්නේ මෙගාවොට් 10ක ව්‍යාපෘතියක unit එක ගන්නවා රුපියල් 17ට. නමුත් මෙගාවොට් 100ක ව්‍යාපෘතියකින් ගන්නේ රුපියල් 18ට. එතකොට මෙගාවොට් 100ක් වනකොට තවත් ඒ ගණන අඩු වෙන්න එපායැ. නමුත් අඩු වෙලා නැහැ. ඒක එහෙම වෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට සුළං විදුලි ව්‍යාපෘති සම්බන්ධව ගත්තොත්, අවසාන එක ආණ්ඩුව ලබා දුන්නේ unit එකක් රුපියල් 11.80කට. ඒ කියන්නේ, ඩොලර් සත 3.77කට. දැන් මේ ලබා දීලා තිබෙන සුළං විදුලි බලාගාරවලින් ආණ්ඩුව unit එක රුපියල් 20 ගණනේ ගන්නවා. බලන්න! කලින් එක දුන්නා unit එක රුපියල් 11.80ට. පසුගිය නොවැම්බර් මාසයේ දීපු ව්‍යාපෘතිවල unit එක රුපියල් 20ට ගන්නවා. කාටද මේ කොමිෂන් යන්නේ? කාටද මේ තරම් මුදලක් යන්නේ? දැන් ගණන් බලා තිබෙන විදියට මේ ලබා දීලා තිබෙන ව්‍යාපෘතිවලින් රුපියල් බිලියන 20කට වඩා වැඩි ප්‍රමාණයක් මුදල් ආණ්ඩුවට අහිමි වෙනවා. කාටද ඒක යන්නේ? රුපියල් බිලියන 20ක්! ඒ වාගේම ටෙන්ඩර් කැඳවන්නේ නැතිවයි මේවා දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ තිබෙනවා තව හොඳ හොඳ සෙල්ලම් ටිකක්. එකක් තමයි විනිවිදභාවය පිළිබඳ කාරණය. දැන් මේ ආයතනවලින් දෙකක් ලංකාවේ ඉන්න ප්‍රසිද්ධ ක්‍රීඩකයෝ දෙදෙනකුට අයත් ඒවා. ඒගොල්ලෝ ජනාධිපතිතුමාගේ හැම වැඩසටහනකටම ගියා. ඒ දෙදෙනාගේ කොම්පැනි දෙකටත් solar power ව්‍යාපෘති හම්බ වෙලා තිබෙනවා. ඒ දෙන්නා හැම දාම ගිහිල්ලා ජනාධිපතිතුමා වර්ණනා කර කර voice-cuts දීපු අය. මම ඒ අයගේ නම කියන්නේ නැහැ වැඩේ කැත නිසා. මොකද, ලංකාවේ නමක් තියා ගත්ත ක්‍රීඩකයෝ දෙන්නෙක් නිසා මම ඒ නම් දෙක කියන්නේ නැහැ. ක්‍රිකට් ක්‍රීඩකයෝ දෙන්නෙක්. නමුත් කරන වැඩේ ලජ්ජයි. ජාත්‍යන්තරව පිළිගත් ක්‍රිකට් ක්‍රීඩකයෝ දෙන්නෙක්. නමුත්, වැඩේ කැතයි. ජනාධිපතිතුමාගේ පස්සෙන් ගියේ ටෙන්ඩර් නැතිව ව්‍යාපෘති ගන්නද?

ඒකද පස්සෙන් ගිහිල්ලා Clean Sri Lanka එකටයි, අරකටයි, මෙකටයි voice-cuts දුන්නේ? ඒකටද අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාට පෙනෙන්න ඉස්සරහ වාඩි වෙලා හිටියේ? අපට තේරෙනවා මේවා ගන්න තමයි ඒ විදියට කටයුතු කළේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ ප්‍රශ්නය. කවුද මේ Bluesun Technology Limited කියන්නේ? මේ Bluesun Technology Limited කියන ආයතනය 2024දී shortlist කරනකොට තිබුණේ නැහැ. ඒ ආයතනය proposals දැම්මෙත් නැහැ. නමුත්, Bluesun Technology Limited එක මිලදී ගන්නවා, NEM ආයතනයෙන්. NEM ආයතනයේ කවුද වැඩ කළේ? NEM ආයතනයේ වැඩ කළා, වර්තමාන විදුලිබල ඇමතිතුමාගේ පරණ කොම්පැනිය. එයා NEM එක 2025දී අරගෙන දැන් ඒගොල්ලන්ටත් ව්‍යාපෘතියක් දීලා තිබෙනවා. ඒක shortlist කරපු 47 අතර හිටපු නැති කොම්පැනියක්. කොහොමද ගජ මිතුරු ආර්ථිකය? මේ Bluesun Technology Limited එක ලැයිස්තුවේ හිටියෙත් නැහැ. අන්තිමට NEM එක ගන්නවා, Bluesun Technology Limited එකෙන්. අරගත්තාට පස්සේ Bluesun Technology Limited එක එනවා, shortlist එකේත් නැතිව ව්‍යාපෘති කරන්න.

ඉතින් මොකක්ද මේ කථා කරන විනිවිදභාවය? අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා තරම් විනිවිදභාවය ගැන කථා කරපු කෙනෙකු ලොවෙත් හිටියේ නැහැ. ලොවෙත් නොවෙයි, ලොව් ගහෙත් හිටියේ නැහැ. එතුමා විනිවිදභාවය, පාරදෘශ්‍යභාවය, විගණනය ඒවා තමයි අපට ඉගැන්වුයේ. දැන් විනිවිදභාවය නම් නැහැ. "විනි" නැහැ. හැබැයි, විදිනවා. බොරු විදිනවා, පව විදිනවා, ටෙන්ඩර් නැතිව විදිනවා. ඒවා තමයි දැන් අපට දකින්න තිබෙන්නේ. විනිවිදභාවය කෙසේ වෙතත් විදින එක නම් වෙනවා. විදින එක යටින් වෙනවා. ග්‍රාම නිලධාරි පගාව ගත්තාම අල්ලනවා. පොලිසියේ රාළහාමිලා පගාව ගත්තාම අල්ලනවා. ඒවා ඔක්කොම අල්ලනවා. නමුත්, තමුන්නාන්සේලාගේ ඉහළ තන්ත්‍රය ටෙන්ඩර් නැතිව ව්‍යාපෘති දෙනවා.

මම කලිනුත් මේ කාරණය මතු කළා. ජනාධිපතිතුමාගේ හිතවතාට දුන්නා, මන්නාරමේ මෙගාවොට් 50ක wind power ව්‍යාපෘතිය. ටෙන්ඩර් කොමිටියෙන් අනුමත වෙච්ච කොම්පැනියට ඒක දුන්නේ නැහැ. Reject වෙච්ච කොම්පැනිය appeal කළා. Appeal එකත් reject වුණා. ඒ appeal එකත් reject වෙච්ච කොම්පැනියට ජනාධිපතිතුමා දුන්නා. මොකද, එතුමාගේ දකුණු

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අත නිසා. එතුමන්ලාගේ පැලවත්තේ කාර්යාලය හදන්න සල්ලි වියදම් කරපු නිසා. එයාට ටෙන්ඩර් එක දුන්නා, ක්‍රියාපටිපාටියෙන් බැහැරව ගිහිල්ලා. දැන් පරණ ආණ්ඩු කරපු දේම නේද මේ කරන්නේ? ඒකම නේද මේ කරන්නේ? පරණ ආණ්ඩු කරපු දේ කරන්න නොවෙයි නේද ජනමතය ගත්තේ. පරණ ආණ්ඩු කරපු දේ කරන්න නොවෙයි නේද තමුන්නාන්සේලාට මේ රටේ මිනිස්සු mandate එකක් දුන්නේ? ඒ mandate එකට එහා ගිහිල්ලා, පරණ ආණ්ඩුවලටත් වඩා දැන් හොරකම් සිද්ධ වනවා. ඔය කියන විධියට කරන්න පරණ ආණ්ඩුවලට නම් අවුරුදු 76ක් ගියා නේ. අවුරුදු 76ක් ගිය ඒවා මේගොල්ලන් අවුරුද්දෙන් කරනවා. අවුරුද්දයි මාස හතරෙන් කරනවා.

දැන් කන්ටේනර් තුන්සිය ගණන ගැන කථාවක් නැහැ. දැන් විගණකාධිපතිතුමා පත් කරන්නේ නැහැ. දැන් මාස 11ක් වෙනවා විගණකාධිපති කෙනෙක් නැහැ. විගණකාධිපති පත් කිරීම ප්‍රමාද කර කර ඉන්නවා. ඒ තනතුරට තමන්ගේ හිතවතෙක් පත් කරන්න උත්සාහ කළා. ඒකට නම් තුනක් එව්වා. ඒ නම් තුනම ප්‍රතික්ෂේප වුණා. වැඩ බලන විගණකාධිපතිවරයා අවුරුදු 30ක් විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ඉන්නවා. ඔහු ස්ථිර කරන්නේ නැහැ. ඇයි, වැඩ බලන විගණකාධිපතිවරයා ස්ථිර කරන්න බැරි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තමුන්නාන්සේලා මේ රටේ ජනතාවගේ බලය ලබා ගත්තා, විනිවිදභාවයකින් රට පාලනය කරනවා කියලා. නමුත් අපට පෙනෙනවා, ඒ විනිවිදභාවය අද යටපත් වෙලා තිබෙනවා කියලා. "විනි" එකක් අපට පෙනෙන්නේ නැහැ. නමුත්, "විදින" එකක් නම් දැන් අපට පෙනෙන්න තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ajith Agalakada. You have 10 minutes.

[අ.භා. 2.00]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගන්නේ ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 24වැනි දා කැබිනට් අනුමැතිය ලද 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතයි.

අපේ රටේ මිලියන 22ක ජනතාවක් ජීවත් වනවා. මේ ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගන්න ඕනෑ වන භාණ්ඩ සියල්ලම අපේ භූමිය ඇතුළේ නිෂ්පාදනය කර ගන්න අපට පුළුවන්කමක් නැහැ. භූගෝලීය පිහිටීම අනුව අපට වුවමනා දේවල් ඔක්කොම මේ භූමිය තුළ සම්පත් විධියට අපට නැහැ. ඒ නිසා අපට හදා ගන්න බැරි දේවල් ලෝකයේ වෙනත් රටවලින් මිලදී ගන්න අපට විදේශ විනිමය එහෙම නැත්නම්, ඇමෙරිකානු ඩොලර් කියන මුදල් ඒකකය සොයා ගන්න සිදු වෙලා තිබෙනවා.

මුල්ම කාලයේදී අපි තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස්, කොකෝවා අපනයනය කරලා ඒ සල්ලි ටික සොයා ගත්තා. ඊට පසුව අපි ඇඟලුම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිව නිරත වෙලා විදේශ විනිමය සොයා ගන්න උත්සාහ කරමින් සිටියා. එහිදී අපට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් සොයා ගන්න බැරි වුණා. හේතුව තමයි, ඉඳිකටුවේ ඉඳලා, නූල් බෝලයේ ඉඳලා සියල්ලම අපි පිටින් අරගෙන ඒමයි. ශ්‍රමය විතරයි ඒ සඳහා එකතු කරන්න අපට පුළුවන්කම තිබුණේ.

ඊට පස්සේ අපේ පුහුණු, නුපුහුණු ශ්‍රමය අපනයනය කරලා විදේශ විනිමය සොයා ගැනීමට උත්සාහ කළා. ඒක යම් ප්‍රමාණයකට සාර්ථකයි. මේ වනකොට සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් අපි විදේශ ප්‍රේෂණ හරහා ලබා ගන්නවා.

අපේ අවශ්‍යතාවල ප්‍රමාණය දවස ගාණේම වර්ධනය වෙනවා. ඒ වාගේම 2028 අවුරුද්දේ ඉඳලා අප මීට පෙර ලබාගෙන තිබෙන විදේශ ණය ගෙවන්න පටන් ගන්න තිබෙනවා. එම නිසා අපේ රජය ලොකු ඩොලර් භීතියකින් පෙළෙමින් සිටිනවා. ඒ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න අපට වෙනත් මාර්ගවලට යන්න වෙනවා. විදේශ ආයෝජන වැඩි කර ගන්න, මේ ඩොලර් ඌනතාව මගහරවා ගන්න අපට කරන්න පුළුවන් දේවල් මොනවාද කියලා බලන කොට, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය මඟින් කරනු ලබන BoI projectsවලට අපි විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. එහිදී ආයෝජකයෙකුට වුවමනා සියලු දේවල් තනි කවුළුවකින් - Single Window එකකින් - සම්පූර්ණ කරගෙන අපේ රට ඇතුළේ ආයෝජනය කරන්න පහසුකම් සපයා තිබෙනවා. ඒ විධියට අපි BoI එක හරහා ආයෝජන ආකර්ෂණය කරන්න උත්සාහ කරමින් ඉන්නවා.

දෙවැනි එක විධියට PPP ව්‍යාපෘති - public-private partnership projects - හරහා රජයේද දායකත්වය ඇතිව, විදෙස් ආයෝජකයන් ආකර්ෂණය කරගෙන විදේශ ආයෝජන ගෙන්වා ගැනීමේ උත්සාහයක අපි ඉන්නවා.

ඊළඟට, joint ventures විධියටත් ආයෝජකයන් ලංකාවට ගෙන්වා ගන්න අපි කටයුතු කරනවා. එහිදී රජය විධියට අපට සපයන්න පුළුවන් සම්පත් දායකත්වය සහ පහසුකම් සපයා joint ventures හරහාත් ආයෝජකයන් ගෙන්වාගෙන විදේශ විනිමය ගෙන්වා ගන්න අපි උත්සාහ කරමින් ඉන්නවා. මෙහෙම කටයුතු කරගෙන යන අතරේ, මීට කලින් ඉදිකිරීම් කටයුතු කරලා තිබුණු, ඒ වාගේම තවම සක්‍රිය මට්ටමට ගන්න බැරි වුණු ආයතනයක් විධියට තිබෙන කොළඹ වරාය නගරය හඳුනාගෙන, ඒකත් අපේ රටට ඩොලර් සොයා ගැනීම සඳහා භාවිත කරන්න පුළුවන් කොයි විධියටද කියන කාරණාව සාකච්ඡාවට ගෙන තිබෙනවා.

අපි දන්නවා, කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය ගැන නොයෙක් වාද විවාද, මතවාද තිබෙන බව. අපි අතීතයේදී ඒ වාද විවාද සියල්ලටම සහභාගි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි කැමති වුණත්, අකමැති වුණත් අද වන විට ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ඉන්දියාවට බදු දීලායි තිබෙන්නේ. ඒ බදු ගිවිසුම්වලට අනුව අපට හිමි පංගුවත් එක්ක කටයුතු කරගෙන යන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. අපි කැමති වුණත්, අකමැති වුණත් හම්බන්තොට වරාය සම්බන්ධයෙන් අපි චීනයත් එක්ක ගිවිසුමකට ගිහිල්ලායි තිබෙන්නේ. එහිදී අපට

අයිති කොටස් ප්‍රමාණයට අදාළ ලාභාංශත් එක්ක ආර්ථිකය පවත්වාගෙන යන්න අපට සිදු වෙනවා. අපි කැමති වුණත්, අකමැති වුණත් අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට IMF ගිවිසුමට ගිහිල්ලායි තිබුණේ. එම නිසා IMF එකත් එක්ක තිබෙන කොන්දේසි negotiate කරමින් මේ ආර්ථිකය පවත්වාගෙන යන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ විධියට කොළඹ වරාය නගරය කියලා එකක් ඉදි වෙලා තිබෙනවා. චීනයේ කොම්පැනියක් සහ අපේ රජය ඩොලර් බිලියන 2.4ක් විතර දැනට එහි ආයෝජනය කරලා තිබෙනවා. එම නිසා ඒකෙන් නිසි පරිදි ප්‍රයෝජන ගන්න අපි මැදිහත් වෙන්න ඕනෑ. එහිදී නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් වුණාද, පාරිසරික බලපෑම් කොයි වාගේ වෙයිද, භූ දේශපාලනික බලපෑම් කොයි වාගේ වෙයිද, සංස්කෘතියට හා සදාචාර සම්පන්නභාවයට කොයි වාගේ බලපෑමක් වෙයිද කියන ප්‍රශ්න, මතවාද ගණනාවක් අපට තිබෙනවා. ඒ සියල්ල තිබුණත්, කොළඹ වරාය නගරය අපේ ආර්ථිකයට, විදේශ විනිමය සොයා ගැනීමේ අපේ අවශ්‍යතාවට දායක කර ගන්නේ කොයි විධියටද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. ඒ සඳහා අපි මැදිහත් වෙමින් ඉන්නවා.

2021 වර්ෂයේදී මේ පනත ඉදිරිපත් කරද්දී ප්‍රධාන වශයෙන් පොදු පනත් 7ක ක්‍රියාකාරිත්වය වරාය නගර සීමාවේ ඇතුළේ අඩපණ වෙලා තිබුණා. උදාහරණයක් ගත්තොත්, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත, (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනත, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත ආදි වශයෙන් පනත් 7ක භාවිතාව, ක්‍රියාකාරිත්වය ඒ භූමිය ඇතුළේ නැති වන විධියට තමයි 2021 අවුරුද්දේ මේ පනත ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ආයෝජකයන් සම්බන්ධයෙන් වන බදු පනත් 13ක් ලංකාවේ මේ භූමියට අදාළව ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

උදාහරණ විධියට ගන්න පුළුවන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 1989 අංක 13 දරන සුරා බදු (විශේෂ විධිවිධාන) පනත, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු පනත. ඒ ආදි බදු පනත් 13ක් ඒක ඇතුළේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මේක විශේෂිත තත්ත්වයක්. අප මේ දක්වා ක්‍රියාත්මක කරලා තිබුණු පනත සහ වරාය නගරය ඇතුළේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක්, විමර්ශනයක්, සොයා බැලීමක් කරන්න වුවමනාව අපට තිබුණා. අන්න ඒ නිසා අපි මේ සඳහා විද්වත් කමිටුවක් පත් කළා. ඒ විද්වත් කමිටුව මේකේ සියලු පැති පිළිබඳව සොයා බලා අපට යෝජනා සහ නිර්දේශ ලබා දීලා තිබෙනවා. අන්න ඒවා පදනම් කරගෙන තමයි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට සංශෝධන එකතු කරන්න අපි ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ 24වැනි දා කටයුතු කළේ. මේ සංශෝධන මඟින් ප්‍රධාන කරුණු තුනක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. පළමුවැනි එක, සේවා නියුක්තිය, ආදායම් බදු ඇතුළුව බදු දිරිගැන්වීම් සහ නිදහස් කිරීම සීමා කිරීම. ඒක ඇතුළේ සේවකයන් ආදායම් බදුවලින් නිදහස් කරලා තිබුණා. අපි ඒක නැවත සලකා බැලීමක් කරලා තිබෙනවා. බදු ආදායම එකතු කර ගැනීම රටට අයිති සියලු කොටස්වල ඒකාකාරීව ක්‍රියාත්මක විය යුතුයි කියන තැන අපි ඉන්නවා. ඒ නිසා සේවා නියුක්තිකයන්ගේ ආදායම් බද්ද සම්පූර්ණයෙන් නිදහස් කරලා තිබෙන එක අපි නැවත සංශෝධනය කළා. මේ පනත් කෙටුම්පත අද සම්මත වුණාට පස්සේ, මෙය සම්මත වීමට පෙර ලියාපදිංචි වෙලා තිබුණු ආයතනවලට දැනට බඳවා ගෙන සිටින සේවකයන් සඳහා වසර තුනක කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරන්නත්, අලුතින් ලියාපදිංචි වන ආයෝජකයන්ගේ ආයතනවල වැඩ කරන සේවකයන් සඳහා ආදායම් බදු රටේ අනෙක් තැන්වල ක්‍රියාත්මක වන විධියට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව ක්‍රියාත්මක කරන්නත් අපි කටයුතු කරලා තිබෙනවා. එහෙම සංශෝධනයක් අපි අරගෙන ඇවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපාය මාර්ගික ව්‍යාපාර සඳහා වැඩි දියුණු කළ නියාමන, අධීක්ෂණ සහ අනුකූලතා බැඳීම් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. මෙහිදී BSI - Business of Strategic Importance - Projects කියලා උපාය මාර්ගික වශයෙන් වැදගත් ආයතන කොටස් හතරකට බෙදලා, ඒගොල්ලන් ඒ තුළ කරන ව්‍යාපාර සඳහා වන ඉදිකිරීම් කටයුතු සඳහා සහන කාලයක් දෙන්නත්, ඒ ඉදිකිරීම් කටයුතුවලින් පස්සේ ඒගොල්ලන්ගේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කළාට පසුව අය කරන බදු ප්‍රමාණ මෙහි සඳහන් කර තිබෙනවා. කලින් තිබුණේ වසර 25ක් දක්වා බදු නිදහස් කරලායි. නමුත් අපි දැන් ඒක categories හතරකට බෙදලා ඒ අවුරුදු ප්‍රමාණය තීරණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන අදහසක් මතු වුණා, මේ බදු අය කිරීමත් එක්ක කවුද මේවායේ ආයෝජනය කරන්න එන්නේ කියලා. විදේශික ආයෝජකයන් මුදල් ආයෝජනය කරන්න රටකට එන්නේ තනිකරම බදු නිදහස මත නොවෙයි. මේ වනකොට අපි රටවල් හයක් එක්ක ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒ නිසා එම ආයෝජකයන් අපේ රටේ ව්‍යාපාර කරලා අරගෙන යන ලාභයෙන් එහේ බදු ගෙවන කොට අපේ රටේ ගෙවපු බද්ද නිදහස් වෙනවා. ඒ නිසා ද්විත්ව බදුකරණයකට ලක් වෙන්නේ නැහැ. එම නිසා ආයෝජකයන් රටකට එන්නේ තනිකරම බදු ගැන හිතලා විතරක් නොවෙයි. දේශපාලන ආර්ථික ස්ථාවරත්වය, යටිතල පහසුකම්වල ස්වභාවය, දියුණු පුහුණු මානව සම්පත් ලබා ගැනීමේ හැකියාව, නීතියේ ආධිපත්‍යය, රටේ පාරදෘශ්‍යභාවය ක්‍රියාත්මක වෙනවාද ආදි කාරණා සැලකිල්ලට ගෙන තමයි ආයෝජකයන් රටක ආයෝජනය කරන්න එන්නේ. අපි මේ වන විට ශක්තිමත්ව මේ පදනම් ටික අපේ රට ඇතුළේ ගොඩ නඟමින් සිටිනවා. අපි මේ වන විට උද්ධමනය පාලනය කරලා තිබෙනවා; රජයේ ආදායම් එකතු කර ගැනීම සාර්ථකව කරගෙන යනවා; ණය ගෙවීම් පිළිබඳ ratingsවලින් ඉහළට ඇවිත් තිබෙනවා; බැංකු පොලී අනුපාතය තනි ඉලක්කමක පවත්වා ගෙන යනවා; ආර්ථික වර්ධන වේගය අවශ්‍ය මට්ටමට ක්‍රමානුකූලව වැඩි කරමින් ඉන්නවා.

මේ ටිකත් එක්ක පසුගිය අවුරුද්ද ඇතුළේ අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17.2ක්, විදේශ ප්‍රේෂණ ඩොලර් බිලියන 7.8ක්, සංචාරක කර්මාන්තයෙන් ඩොලර් බිලියන 3ක් ලබා ගන්න සහ සෘජු විදේශ ආයෝජන ඩොලර් බිලියන එකක් වන මට්ටමට ගෙන එන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එහෙම නම්, අපි මේ ආර්ථිකය හසුරුවාගෙන යන දිශානතිය ආයෝජකයන්ට පෙනෙනවා. අපි ඒවායේ සාර්ථකත්වයක් ළඟා කරගෙන තිබෙනවා. ඒකත් එක්ක, විනිවිදභාවයෙන් පාරදෘශ්‍යභාවයෙන් කටයුතු කරන මේ ක්‍රියාවලියත් එක්ක තමයි ආයෝජකයන් එන්නේ. තනිකරම බදු ගැන හිතලා විතරක් නොවෙයි ආයෝජකයන් එන්නේ. ඒ නිසා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට මේ ගෙනාපු සංශෝධන හරහා සාර්ථක ආයෝජන බිහි කරගෙන, අප ඉලක්ක කරන රැකියා ප්‍රමාණය සහ විදේශ විනිමය ප්‍රමාණය සපයා ගන්න හැකි වෙයි කියන බලාපොරොත්තුවෙන් මේ සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා අපි පූර්ණ වශයෙන් කැප වෙලා කටයුතු කරනවාය කියන අදහස ප්‍රකාශ කරමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Aboobucker Athambawa. You have 10 minutes.

[பி.ப. 2.11]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதில் பெருமகிழ்ச்சியடைகின்றேன். கொழும்புத் துறைமுக நகரத்தை இலங்கையினுடைய தேசிய வர்த்தகத்திலே இணைத்துக் கொள்ள வேண்டிய ஒரு சந்தர்ப்பத்திலே, நாங்கள் இன்றைய நாள் முழுவதும் அது தொடர்பாக விவாதத்தை நடாத்திக் கொண்டிருக்கின்றோம். கொழும்புத் துறைமுக நகரமானது மொத்தமாக 664 ஏக்கர் விஸ்தீரணமுடையதாகக் காணப்படுகின்ற வேளையிலே, இலங்கையினுடைய நிலப்பரப்பில் புதிதாக 269 ஹெக்டயர் - 2.6 சதுர கிலோமீற்றர் - பரப்பளவு இணைக்கப்படுகின்றது. கடந்த காலங்களிலே அந்நிய உதவிகள்மூலம் எமது நாட்டுக்குக் கொண்டுவரப்பட்ட ஒரு வளமாக இந்த நிலப்பரப்பை நாங்கள் பார்க்கின்றோம். இந்தத் துறைமுக நகர நிலப்பரப்பில் கட்டிடங்களை நிர்மாணிப்பதற்காக 47% ஒதுக்கப்பட்டிருக்கின்றது. அலுவலக இடங்களுக்காக 18%உம், வணிகக் கடைகளுக்கு 13%உம், விருந்தோம்பலுக்காகக் கொட்டகைகளை அமைப்பதற்காக 6% உம் ஒதுக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, தகவல் தொழில் நுட்பம் தொடர்பான விடயங்களை அங்கு புகுத்துவதற்கு இந்த அரசாங்கம் எதிர்பார்த்துக் கொண்டிருக்கின்றது.

நாட்டினுடைய கடன் தொகை, இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த பிற்பாடு, 52%இல் இருந்து 35%ஆக வீழ்ச்சியடைந்திருக்கின்ற, குறைவடைந்திருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே, இந்தக் கொழும்புத் துறைமுக நகரம் இந்த நாட்டினுடைய பொருளாதாரத்துக்குப் பெரும் பங்களிப்பைச் செய்யும் என்று எதிர்பார்த்திருக்கின்ற அதேவேளை, விஞ்ஞானபூர்வமான ஆய்வின் மூலமாகவும் இது கண்டறியப்பட்டிருக்கின்றது. இதனை இந்த நாட்டினுடைய பொருளாதாரத்துக்குத் தேவையான டொலர்களைக் கொண்டுவருவதற்கான வாய்ப்பாகப் பயன்படுத்துவதற்கு இந்த அரசாங்கம் முற்பட்டுக் கொண்டிருக்கின்றது. இலங்கையினுடைய பொருளாதார அபிவிருத்திக்கு இந்த மண்டலத்தை நாங்கள் பயன்படுத்துவதற்கு ஏதுவாக, சர்வதேச வர்த்தக நிறுவனங்களுக்கும், உள்நாட்டு வர்த்தக நிறுவனங்களுக்கும் அங்கு முதலீடு செய்வதற்கான வரிவிதிப்புத் தொடர்பாக - வரி இறுப்புத் தொடர்பாக - மிகத் தெளிவாக விளங்கப்படுத்தப்பட்டு வருகின்றது. அதுபோன்று, நேரடி வெளிநாட்டு முதலீடுகளை ஈர்க்க முடியும் என்ற எதிர்பார்ப்பும் காணப்படுகின்றது. அந்த வகையில், இந்தத் துறைமுக நகரத்தை உலகளாவிய ரீதியில் போட்டித்திறன்மிக்க விசேட பொருளாதார மண்டலமாக உருவாக்குவதற்கு இந்த அரசாங்கம் எதிர்பார்த்துக் கொண்டிருக்கின்றது.

மொத்த வணிகத்தை மேற்கொள்வதற்கான எளிமையை அடிப்படையாகக்கொண்ட தரவரிசையில், இலங்கையை உலகளாவிய ரீதியில் வலுப்படுத்துவதற்கு கொழும்புத் துறைமுக நகரம் பயன்படுத்தப்பட இருக்கின்றது என்பதை நான் இச்சந்தர்ப்பத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். புதிய சிந்தனையின்கீழ், பல சுற்றுப் பேச்சுவார்த்தைகள் மற்றும் ஆய்வுகளின்மூலம் கொழும்புத் துறைமுக நகரத்தை இலாபமீட்டுகின்றதொரு நிலையமாக மாற்றியமைப்பதன் மூலமாக நாங்கள் எதிர்பார்க்கின்ற பெருமளவான டொலர்களை ஈட்டுவதற்கான ஏற்பாடுகள் மேற்கொள்ளப்பட்டு வருவதைப் பார்க்க முடிகின்றது. குறிப்பாக, நாட்டிலும் வெளிநாடுகளிலும் இருக்கின்ற முதலீட்டாளர்களை இங்கு வந்து முதலீடுகளை மேற்கொள்ள ஊக்குவிப்பதன்மூலமாக இந்த நாட்டின் பொருளாதாரம் பற்றிய பாரிய எதிர்பார்ப்பை ஏற்படுத்திக்கொள்ள முடியும்.

இன்று இந்நாட்டினுடைய தலைமை எம்மை மிகவும் சிறப்பாக வழிநடாத்திக் கொண்டிருப்பதை நாங்கள் காண்கின்ற அதேநேரம், எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் இந்த அரசாங்கம் நாட்டைப் பிழையாக வழிநடாத்துகின்றது என்று அடிக்கடி பேசிக் கொண்டிருக்கின்றார்கள். இவர்களுக்கிடையியே பல்வேறுபட்ட போட்டித் தன்மைகளும் வெவ்வேறுபட்ட கொள்கைகளும் இருந்தாலும், அண்மையில் ஏற்பட்ட இயற்கை அனர்த்தத்தைப் பயன்படுத்தி எல்லோரும் ஒன்றிணைந்து ஆட்சி அதிகாரத்தைக் கைப்பற்றிக் கொள்ள முடியும் என்று எதிர்பார்த்தார்கள். இந்த ஊழல் மோசடிக்காரர்கள் "டிசம்பர் மாதம் ஆட்சியை நாங்கள் கைப்பற்றுவோம்" என்று கூறியிருந்தார்கள். ஆனால், அவர்களால் எதுவுமே செய்ய முடியவில்லை. "ஆறு மாதம்தான் இந்த அரசாங்கத்தின் ஆட்சி நீடிக்கும்" என்று சொன்னார்கள்; அந்த எதிர்பார்ப்பும் இன்று சுக்குநூறாகிப் போயிருக்கிறது.

இன்று இந்த நாட்டினுடைய பொருளாதாரம் 4.8% வளர்ச்சியைக் கொண்டதாக மாண்புமிகு சனாதிபதியாலும், அரசாங்கத்தினாலும் கட்டியெழுப்பப்பட்டுள்ளது. மக்களின் மனதை வென்ற, மக்கள் நம்புகின்ற அரசாங்கமாக இந்த அரசாங்கம் இருந்து கொண்டிருக்கின்றது. இந்த நாட்டினுடைய சனாதிபதி அவர்கள் தொடர்பாக அப்பொழுது சரியாக விளங்கிக்கொள்ள முடியாமல், அவருக்கு வாக்களிக்காதவர்கள் கூட இன்று தங்களுடைய அன்புக் கரத்தை அவருக்காக நீட்டிக் கொண்டிருக்கிறார்கள். முன்னர் வெளிநாட்டு முதலீட்டாளர்கள் இந்த நாட்டுக்கு வருவதற்குப் பயந்தார்கள். வெளிநாட்டு முதலீடுகள் மூலமாகப் பெறப்படுகின்ற வரிகளை அப்போதைய ஆட்சியாளர்கள் கொள்ளையிட்டார்கள்; ஊழல், மோசடி செய்தார்கள். ஆனால், இன்று இந்த நாட்டிலே ஊழல், மோசடி இல்லாத நிலை கட்டியெழுப்பப்பட்டுள்ளது. அத்தோடு, மனித வளம் போதியளவு பயிற்சியளிக்கப்பட்டிருக் கின்றது. ஆகவே, இவ்வாறான வளங்களைப் பயன்படுத்தி, நாட்டின் நன்மையைக் கருதி, நம்பிக்கையின் அடிப்படையில் வெளிநாட்டவர்களை இந்த நாட்டுக்கு கொண்டுவரும் எதிர்பார்ப்புடன்தான் கொழும்புத் துறைமுக நகரத்தை - Port Cityஐ - வர்த்தக நோக்கத்துக்காகக் கையளிக்க வேண்டி இருக்கின்றது.

அவ்வாறு சர்வதேச வர்த்தக நிறுவனங்களுக்கு கையளிப்பதன்மூலம் இந்த நாட்டினுடைய அபிவிருத்திக்கு அவர்கள் பெருமளவு பங்களிப்புச் செய்ய முடியுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். நாங்கள் அதற்காக அவர்களுக்குப் பல்வேறு மட்டங்களில் வரி விதிப்புகளைச் செய்திருக்கின்றோம். அதாவது, கொழும்புத் துறைமுக நகர முதனிலை முதலீட்டாளர்கள், துணை முதலீட்டாளர்கள் அதிகளவு இலாபம் பெறக்கூடிய வகையிலே வரி விதிப்புக்களை மேற்கொள்வதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றது. குறிப்பாக, இதுபற்றிய தெளிவான கலந்துரையாடல்கள் மேற்கொள்ளப்பட்டிருக்கின்றது. இங்கு முதலீடு செய்கின்றவர்களுக்கு முதலீட்டுத் தொகையைப் பொறுத்து வரி விதிப்பை, வரியிறுப்பை நிர்ணயிக்க முடியுமென்று பேசப்பட்டிருக்கின்றது. நாங்கள் இதைப் பெறுமதியான ஒரு நிலப்பரப்பாகப் பார்க்கின்றோம். இந்த நிலப்பரப்பை இந்த நாட்டினுடைய வளர்ச்சிக்காக, அபிவிருத்திக்காகப் பயன்படுத்த வேண்டிய நிலைமையில் இருக்கின்றோம். இந்தப் பெறுமதியான நிலப்பரப்பைப் பயன்படுத்தி நாங்கள் பெருமளவு டொலர் வருமானத்தை எதிர்பார்க்கக்கூடியதாகவும் இருக்கின்றது.

கோட்டாபய ராஜபக்ஷவை விரட்டியடித்தது போன்று இந்த நாட்டின் ஆட்சியைக் கைப்பற்றிவிட முடியும் என்று எண்ணியவர்கள் இன்று கலக்கமடைந்திருக்கிறார்கள், குழப்பமடைந்து இருக்கிறார்கள். எதிர்க்கட்சியிலே இருந்து கொண்டு குதர்க்கம் பேசுகின்ற இவர்களால் எதுவுமே செய்ய முடியாது. இன்று சர்வதேசத்திலே எங்களுடைய நாட்டுக்குச் சாதகமான நிலைமை காணப்படுகின்றது. அண்மையில் ஏற்பட்ட அனர்த்தத்துக்கு 45க்கும் மேற்பட்ட நாடுகள் எமது நாட்டுக்கு உதவி செய்ய முன்வந்திருந்தன. கடந்த காலங்களிலே இதை நாங்கள் அவதானிக்க முடியவில்லை. நாட்டின்மீதும் தலைமைமீதும் நம்பிக்கை வைத்ததன் காரணமாகத்தான் இன்று இந்த நிலைமை ஏற்பட்டிருக்கின்றது. அது மாத்திரமல்ல, இந்த நாட்டின் முன்னேற்றம் பற்றி சர்வதேச அரங்கிலே பேசப்படுகின்றது. இந்த நிலையில் இந்தத் துறைமுக நகரத்தை முதலீடுகளுக்காக வெளிநாட்டு நிறுவனங்களுக்குக் கையளிப்பதனால் பெருமளவு நிதியைப் பெற்றுக்கொள்ள முடியும்; அதை இந்த நாட்டினுடைய அபிவிருத்திக்குப் பயன்படுத்த முடியும். அது மாத்திரமல்ல, வெளிநாட்டு முதலீட்டாளர்களுக்கு நம்பிக்கையளிக்கும் வகையில் இன்று இந்த நாட்டின் பொருளாதார, அரசியல் நிலைமைகளில் உறுதித்தன்மை காணப்படுகின்றது. இதனால் எமது நாட்டின்மீது சர்வதேசத்துக்கு நம்பிக்கை ஏற்பட்டிருக்கின்றது. இந்தத் துறைமுக நகரத்தில் உட்கட்டமைப்பு வசதிகள் சிறப்பாக மேற்கொள்ளப்பட்டு வருகின்றன. இதனால் இந்த நாட்டில் பெருமளவு முதலீடுகளைச் செய்வதால் அதிக இலாபமீட்ட முடியுமென்று வெளிநாட்டு நிறுவனங்களும் எதிர்பார்க்கின்றன. எங்களுடைய சட்ட வரைபிலும் முதலீட்டாளர்களுக்கு நன்மை பயக்குமுகமாகப் பல்வேறு ஏற்பாடுகளைச் செய்திருக்கின்றோம். அது தொடர்பில் பல்வேறு மட்டப் பேச்சுவார்த்தைகளும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. ஆகவே, முதலீட்டாளர்களுக்குச் சட்ட ஏற்பாடுகளும் சாதகமாக உள்ளது.

சர்வதேச அளவில் போட்டிமிக்க பொருளாதாரத்தை எமது நாட்டிலும் கொண்டுவருவதன்மூலம், சர்வதேசத்தில் பேசக்கூடிய ஒரு நாடாக எமது நாட்டையும் நாம் மிளிர வைக்க முடியும். எனவே, எதிர்க்கட்சியினர் அரசாங்கத்தைத் தொடர்ச்சியாகத் தூற்றிக் கொண்டிருக்காமல், நாட்டைக் கட்டியெழுப்புவதற்கும் வளமான நாட்டில் அழகான வாழ்க்கையை அமைப்பதற்கும், அரசாங்கத்துக்கு முழுமையான ஒத்துழைப்பை வழங்க முன்வர வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டு, விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have eight minutes.

[பி.ப. 2.22]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி!

கொழும்புத் துறைமுக நகரம் தொடர்பிலான வரி விலக்களிப்பு உட்பட இன்னும் சில விடயங்களை அரசாங்கம் கொண்டுவந்துள்ளதை நான் வரவேற்கின்றேன். குறிப்பாக, சீனாவின் குறுநிலப்பரப்பு போன்று இருந்துவந்த கொழும்புத் துறைமுக நகரத்துக்குள் இலங்கை அரசானது வருமானத்தை ஈட்டுவதற்குரிய செயற்பாடுகளை முன்னெடுக்க நினைப்பது உண்மையிலே சாலச்சிறந்த விடயமாகும். ஏனெனில், கடந்த காலத்தில் கொழும்புத் துறைமுக நகரத்திலிருந்து ஈட்டப்பட்ட வருமானம் அனைத்தும் எங்களுடைய நாட்டுக்குச் சொந்தமற்றதாகத்தான் கணிக்கப்பட்டது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுகாதார அமைச்சுக்குப் புதியதொரு CT scanner கிடைத்திருப்பதாக நான் அறிகின்றேன். கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் மன்னாருக்கு விஜயம் செய்திருந்த சந்தர்ப்பத்தில், மன்னார் மாவட்ட பொது வைத்தியசாலைக்கு CT scanner ஒன்றைப் பெற்றுத்தருவதாக வாக்குறுதி அளித்திருந்தார். மேற்குறித்த செய்தி பற்றிய உண்மைத்தன்மை தெரியவில்லை. எனினும், அதில் அந்த வைத்தியசாலையின் பெயர் இடம்பெறவில்லை என்பதைச் சுட்டிக்காட்டி இருந்தார்கள். நான் இந்த உயரிய சபையில் ஏற்கனவே இந்த வைத்தியசாலை சம்பந்தமாகக் குறிப்பிட்டிருக்கின்றேன். அந்த விடயம் இங்கிருக்கின்ற வன்னித் தேர்தல் மாவட்ட நாடாளுமன்ற உறுப்பினர்கள் அனைவருக்கும் தெரியும். அரசாங்கத்தைச் சார்ந்த உறுப்பினர்களும் அதனை வலியுறுத்தி, இந்த CT scannerஐ மன்னார் மாவட்ட பொது வைத்தியசாலைக்குப் பெற்றுக்கொடுப்பதற்கு முயற்சி செய்ய வேண்டும். அதேபோல், இந்த CT scannerஐ அந்த வைத்தியசாலைக்கு வழங்க வேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் தயவாகவும் வினயமாகவும் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், மன்னார் மாவட்ட பொது வைத்தியசாலையானது இப்பொழுது ஒரு கிராம வைத்தியசாலையாகத்தான் பார்க்கப்படுகின்றது. இந்த வைத்தியசாலையின் நிலவரம் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் அரசாங்கத்துக்கும் தெரியும். எனவே, அதனை முன்னேற்றுவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அதன் ஒரு நடவடிக்கையாக வன்னித் தேர்தல் மாவட்ட நாடாளுமன்ற உறுப்பினர்கள் அனைவரும் இந்த CT scannerஐ அந்த வைத்தியசாலைக்குப் பெற்றுக்கொடுப்பதற்குரிய அனைத்து முயற்சிகளையும் மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

நேற்றையதினம் அரசாங்கமானது மாகாண சபைத் தேர்தல்கள் எந்தத் தேர்தல் முறைமையின்கீழ் நடத்தப்பட வேண்டும் என்பதை ஆராய்ந்து அறிக்கையிடுவதற்கென தெரிகுழு ஒன்றை நியமித்தது. ஆட்சிக்கு வருகின்ற ஒவ்வோர் அரசாங்கமும் பிரச்சினைகளைத் தணிப்பதற்கு இவ்வாறான குழுக்களை நியமிப்பது வழமை! நியமிக்கப்படுகின்ற குழுவானது, குறித்த விடயத்தை ஆராய்ந்து அறிக்கை சமர்ப்பிப்பதற்கு நீண்ட காலம் எடுக்கும். எனவே, இது காலத்தைக் கடத்துகின்ற ஒரு செயலாகத்தான் நாங்கள் கடந்த காலங்களில் பார்த்திருக்கிறோம். இந்த அரசாங்கமானது, மாகாண சபைத் தேர்தலை நடத்தாமல் காலத்தைக் கடத்துவதற்காகவா மேற்படி தெரிகுழுவை நியமித்திருக்கிறது என்ற சந்தேகம் எங்களுக்கு ஏற்பட்டு இருக்கின்றது.

மாகாண சபைத் தேர்தலை நடத்துவதாகப் பலமுறை அமைச்சர்களும் அரசாங்கமும் சொல்லியிருந்தார்கள். இப்பொழுது தெரிகுழு நியமிக்கப்பட்டு இருப்பதைப் பார்க்கும்போது, மாகாண சபைத் தேர்தல் பிற்போடப்படுகின்றதா? என்ற கேள்வி எழுகின்றது. உடனடியாக பழைய முறையில் இந்தத் தேர்தலை நடத்தி, அதன் பின்பு என்ன செய்ய வேண்டும் என்பதை ஆராய வேண்டுமே ஒழிய, இந்தத் தேர்தலைப் பிற்போடுவதற்கான ஒரு யுக்தியாக தெரிகுழுவை அமைக்கின்ற செயற்பாட்டை

[ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

மேற்கொள்ளக் கூடாது. இன்று நாங்கள் மாகாண சபைத் தேர்தல் நடத்தப்படவேண்டிய காலகட்டத்திலே இருந்துகொண்டு இருக்கிறோம். இந்த அரசாங்கமானது உடனடியாக இந்தத் தேர்தலை நடத்துவதற்கான முயற்சிகளை மேற்கொள்ள வேண்டுமே ஒழிய, தெரிகுழுவை அமைத்து காலத்தைக் கடத்தி தேர்தலை நடத்தாமல் அப்படியே கைவிடுகின்ற நிலைமையை ஏற்படுத்தக் கூடாது.

புதிய அரசியல் சாசனம் எழுதப்பட இருப்பதாகச் சொல்லப்படுகின்றது. இதன்மூலம் மாகாண சபை முறைமை இல்லாதொழிக்கப்படப் போகின்றதா? என்ற கேள்வியை நான் இந்தச் சபையில் கேட்க விரும்புகின்றேன். புதிய அரசியல் சாசனம் எழுதப்படும்போது, சகல தமிழ்த் தரப்பினரையும் இணைத்துச் செயற்பட வேண்டும். எங்களுடைய தமிழ் பேசும் மக்களும் விரும்புகின்ற வகையில் அதனை எழுதுவதற்கான வாய்ப்பை இந்த அரசாங்கம் ஏற்படுத்த வேண்டும். அதுதான் ஜனநாயகம்மிக்க, நேர்மைத் தன்மைமிக்க ஒரு சூழலை உருவாக்கும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். மாகாண சபைத் தேர்தலை பிற்போடுவதற்கான யுக்திகளை இந்த அரசாங்கம் கையாளக் கூடாது. மக்கள் உங்களுக்கு வாக்களித்து இருக்கிறார்கள். அவர்கள் மாகாண சபைத் தேர்தலை நடாத்த வேண்டுமென எதிர்பார்க்கின்றார்கள்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அண்மையில் ஏற்பட்ட இயற்கை அனர்த்தத்தின் பின்னர், மன்னார் மாவட்டத்தில் இடம்பெற்ற அபிவிருத்திக் குழுக் கூட்டத்துக்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் வருகை தந்திருந்தார். அப்போது அவர் பல விடயங்களை உடனடியாகச் செய்யுமாறு உத்தரவிட்டிருந்தார். நேற்றைய தினம் எங்களுடைய மீனவர்களுக்கு அரசாங்கத்தால் அறிவித்தலொன்று விடுக்கப்பட்டு இருக்கின்றது. அதாவது, தாழமுக்கம் காரணமாக காற்று வேகமாக வீசக்கூடும் என்பதால் கடலுக்குச் செல்ல வேண்டாம் என்று. ஒவ்வொரு முறையும் இயற்கை அனர்த்தம் ஏற்படும்போது, எங்களுடைய மீனவர்களைத் தொழிலுக்குச் செல்ல வேண்டாமென அரசாங்கம் சொல்கின்றது. இவ்வாறு மீனவர்கள் தொழிலுக்குச் செல்ல முடியாத காலப்பகுதியில் அவர்களுக்கு உலர் உணவுப் பொதிகளை அல்லது நிவாரணங்களை வழங்க வேண்டுமென நான் கோரிக்கை முன்வைத்தபோது, மாண்புமிகு சனாதிபதி அவர்கள் ஓர் உத்தரவை இட்டிருந்தார்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Amirthanathan Adaikkalanathan, your time is up now.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Sir, please give me one more minute.

அதாவது, மீனவர்கள் தொழிலுக்குச் செல்லமுடியாத நிலை ஏற்படும்போது, அவர்களுக்கு உலர் உணவுப் பொதிகளைக் கொடுக்குமாறு உத்தரவிட்டிருந்தார். எனினும், அங்கு ஒரு பிரச்சினை இருக்கிறது. அதாவது, பிரதேச செயலகத்தால் வெள்ளத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு உலர் உணவுப் பொதிகள் கொடுக்கப்படுகின்ற போதிலும், எங்களுடைய மீனவ சமூகத்துக்கு அவை வழங்கப்படாத நிலையே காணப்படுகின்றது. இதனை நாங்கள் ஒருபோதும் அனுமதிக்க முடியாது. மாண்புமிகு சனாதிபதி அவர்கள் உத்தரவிட்ட பின்னரும், எங்களுடைய மீனவர்களுக்கு அப்படி வழங்கப்படுவதில்லை. எனவே, எந்தவித பாகுபாடும் இன்றி இந்த உலர் உணவுப் பொதிகள் எங்களுடைய மீனவ சமூகத்தினருக்கும் வழங்கப்பட வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ruwan Wijeweera. You have 10 minutes.

[අ.භා. 2.30]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා ගෙනෙන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එකතු වන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. ඕනෑම රටක් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමේදී ඒ රටේ පැවතිය යුතු වැදගත්ම සාධකය වන්නේ ඒ රටේ ආර්ථික ස්ථාවරභාවය ඇති කිරීමයි. රටක් ආර්ථික ස්ථාවරභාවය මත පදනම්ව ආර්ථික සංවර්ධනය කරා යනකොට විශේෂයෙන්ම ඒ රටට සෘජු විදේශ ආයෝජන - Foreign Direct Investments, FDIs - ඉතාම වැදගත් භූමිකාවක් ඉෂ්ට කරනු ලබනවා. සෘජු විදේශ ආයෝජන අපේ රටට ආකර්ෂණය කර ගැනීමේදී ප්‍රමුඛ භූමිකාවක් කරන තැනක් විධියට අපට කොළඹ වරාය නගරය හඳුනාගන්න පුළුවන්.

2021දී සම්මත කරන ලද කොළඹ වරාය නගරයට අදාළ පනතට ඉදිරිපත් කරනු ලබන සංශෝධන කිහිපයක් පිළිබඳව තමයි අද විවාදයට ගනු ලබන්නේ. මේ සංශෝධන පනත් කෙටුම්පතට අවධානය යොමු කළොත් එහි 3වන වගන්තිය යටතේ සඳහන් 35(1)හි පැති සටහනෙහි මෙසේ සඳහන් වනවා:

> "වාසික හෝ නිර්වාසික තැනැත්තකු සේවයේ යෙදවීමට බලයලත් තැනැත්තකුට අවසර ඇති බව"

විශේෂයෙන්ම වාසික හෝ නිර්වාසික තැනැත්තන්ට හිමිවනු ලබන බදු කොන්දේසි, එසේ නැත්නම් tax extemptions, ඔවුන් ගෙවිය යුතු ආදායම් බදු පිළිබඳව මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම මෙහි 5වන වගන්තියේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් යොදන විධිවිධාන ගැන සඳහන් කරලා තිබෙනවා. මෙහි 6වන වගන්තිය යටතේ සඳහන් වනවා, ජාත්‍යන්තර බැංකුකරණ ප්‍රමිති අදාළ කර ගැනීම, අවදානම් කළමනාකරණය හා අධීක්ෂණ සමාලෝචනය, ඒ වාගේම විධාන, මාර්ගෝපදේශ සහ විචක්ෂණශීලී ප්‍රමිති ගැන. ඒ වාගේම offshore bankingවලට අදාළව ගත්තොත් බලපත්‍රයක් අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම කියන කාරණාවලට අදාළ විධිවිධානත් මෙහි සඳහන් කරලා තිබෙනවා.

මෙහි 13වන වගන්තිය ඉතාම වැදගත් වගන්තියක්. ඒ යටතේ ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වගන්තිය සංශෝධනය කිරීම ඉතා වැදගත් වනවා. එහි සඳහන් කරනවා, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල පසු අධීක්ෂණය - Ex-post Monitoring of Businesses of Strategic Importance - කියන කාරණාව. ඒ යටතේ ඒ ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමේදී - සෘජු විදේශ ආයෝජකයන් කොළඹ වරාය නගරය සඳහා ආකර්ෂණය කර ගැනීමේදී - ලබා දෙන බදු සහනවල ස්වරූපය කුමක් විය යුතුද,

ඒවා ලබා දෙන්නේ කොයි කාල සීමාවකටද, ඒවා ලබා දීමේදී ඒ ව්‍යාපාරවල තත්ත්වය කුමක්ද, ඒ ව්‍යාපාරවල ප්‍රමාණය, ඒ වාගේම සේවක සංඛ්‍යාව වැනි කාරණා සඳහන්ව තිබෙනවා. ඒවා පදනම් කරගෙන තමයි මේ බදු සහන ලබා දීමේ ක්‍රියාවලිය මේ සංශෝධනයට ඇතුළත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, we have identified the Port City as a major economic space available in our country to boost the economy. There are four major projects which have already been started worth US Dollars 1.4 billion. Those four projects had been approved. Then, when it comes to projects nearing completion, they are worth US Dollars 1.2 billion. There are some more projects in the near-completion stage.

Sir, in the morning, the Hon. Leader of the Opposition made an argument about the macroeconomic stability of this country; whether we, as a Government, have achieved macroeconomic stability is what he questioned. Sir, I would like to quote especially from the Report issued by the International Monetary Fund in Washington, D.C dated 19th of December, 2025, which clearly states,

> "The cyclone struck as Sri Lanka is emerging from a deep economic crisis and the IMF supported reform programme under the EFF is bearing fruit."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, අපි ඉතාම බරපතළ ආර්ථික ව්‍යසනයකින් - deep economic crisis එකකින් - පසුව නැඟිටිමින් තිබෙන රටක් බව. ඒ නැඟිටීමේදී EFF programme එක එක්ක, ඒ තිබෙන සාකච්ඡා එක්ක අපි ඉතාම ධනාත්මකව මේ දේවල් කළමනාකරණය කරගෙන තිබෙනවා, that we are coming out of the crisis කියන කාරණාව මෙහි සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "Sustained adherence to the reform agenda has underpinned a robust economic recovery,...."

අද විපක්ෂ නායකතුමා මතු කරපු කාරණාවෙන් කියන්නේ මෙන්න මේවා achieve කරලා නැහැ කියලා. නමුත් මේ Report එකේ සඳහන් වන ආකාරයට, we have achieved those.

> "......prices stability, substantial-revenue based fiscal consolidation...."

Fiscal consolidation is very important for the economy of all the countries. Within the past few years, most of the governments could not achieve that; fiscal consolidation did not reach the expected levels. That was the situation in the country. The Leader of the Opposition mentioned that macroeconomic stability has not been achieved by this Government. But, it has been accepted by the IMF that we have achieved macroeconomic stability.

විශේෂයෙන්ම අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක අපේ රටේ ඇති වෙච්ච තත්ත්වය. එම ව්‍යසනයෙන් පසු ඇති වූ තත්ත්වයට රජය මුහුණ දුන් ආකාරය පිළිබඳව ප්‍රශංසනීයව මෙහි සඳහන් වනවා. It states, I quote:

> "The Government responded swiftly with a package of relief measures, supported by strong fiscal overperformance in 2025"

We had an overperformance; අපට දුන් projections ඉක්මවා යමින් ඉතාම හොඳින් අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම නිසා භාණ්ඩාගාරය පුරවාගන්න පුළුවන් වුණා. එම නිසා පොදු ජනතාව ආපදාවට පත් වෙච්ච වෙලාවේදී, that acted as a cash buffer and we were able to do something for the affected common people of this country.

ඒ වාගේම, දැන් මෙතැන සඳහන් කරපු කාරණා ගත්තොත්, අපි රටක් විධියට ගිය අවුරුද්දේ achieve කළේ මොනවාද කියන කාරණාව මම කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. I would like to take up some economic indicators of 2025. If we consider the economic growth of this country, it was around 5 per cent. At the same time, inflation hung around 2 per cent. If we take the capital expenditure, in October, it was around 65 per cent and definitely, it would go up. Then, foreign direct investment was more than US Dollars 1 billion. Specially, we received the highest ever worker remittances in 2025 and it was a historical moment. So, that was the highest amount of remittances we had received for a year. It was around US Dollars 7.8 billion. The previous highest amount of remittnces was reported in 2016 and was around US Dollar 7.24 billion.

ඒ වාගේම, සංචාරක කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, ඉතිහාසය තුළ වාර්තා කරන ලද වැඩිම සංචාරකයන් ප්‍රමාණය ගිය අවුරුද්දේ අපේ රටට ඇවිල්ලා තිබෙනවා. ඒක නිසා ආර්ථික වශයෙන් තිබෙන්නා වූ පෙන්වන්න පුළුවන් දර්ශක - economic indicators - ගත්තොත්, ඒ සෑම දර්ශකයකින් පාහේම අපේක්ෂා කරන ලද මට්ටමට වඩා අපි ඉහළට ඇවිල්ලා තිබෙනවා. 2025 වර්ෂයේදී සියයට 3.5ක ආර්ථික වර්ධනයක් අත් කර ගනියි කියලා IMF එක කියනකොට අපි ආර්ථික වර්ධනය සියයට 5කට ගෙනැල්ලා තිබෙනවා. අනෙක් දේවල් ගත්තත් එහෙමයි. හැම දේම ගත්තත් එහෙමයි. රටකට වැදගත් වන විදේශ ප්‍රේෂණ, සංචාරක කර්මාන්තයට අදාළ දේවල් ඇතුළු මේ හැම දේම ගත්තොත්, අපි අපේක්ෂා කරන මට්ටම ඉක්මවා ගිහිල්ලා ඒ හැම එකක්ම achieve කරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF එකේ වාගේම World Bank එකේ තිබෙන reportsවලින් ඒ බව පිළිගන්නවා. තව බොහෝ දේවල්වලින් ඒ බව පිළිගත්තත්, සමහර වෙලාවට විපක්ෂය අපේක්ෂා කළා, අපේ රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය වැඩිවෙලා, අපේ රටේ තිබෙන ආර්ථික දර්ශක ඉතා ශීඝ්‍රයෙන් පහළට බැහැලා රටේ ආර්ථික අර්බුදයක් නිර්මාණය වෙලා, අපට මේ රටේ ආර්ථිකය කළමනාකරණය කර ගන්න බැරි වෙයි කියලා. ඔක්කෝටම නොවෙයි, විපක්ෂයේ සමහරුන්ට එහෙම අපේක්ෂාවක් තිබුණා. එහෙම අපේක්ෂාවක් තිබුණේ නැති අයත් හිටියා. හැබැයි, අපි ඒවා ළඟා කර ගත්තාම, achieve කර ගත්තාම ඒක පිළිගන්න පුළුවන් ඉතා හොඳ මනසක් විපක්ෂයේ අයට තිබිය යුතු වෙනවා. එහෙම අය එක්කෙනෙක්, දෙදෙනෙක් විපක්ෂයේ ඉන්නවා. හැබැයි, බහුතරයක් කරන්නේ ඉතාම කුඩා දෙයක් අල්ලාගෙන පුළුවන් තරම් ඒවා විවේචනය කිරීමයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගත්තොත්, අපේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරලා නැහැ. අපේ රටේ අධ්‍යාපනය තිබෙන්නේ අවුරුදු 20කට, 30කට පිටුපසින්, ලෝකයත් එක්ක සන්සන්දනය කරලා බලනකොට. ඒක නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වෙන්න ඕනෑ. That process was started in 2019.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Give me one more minute, Hon. Deputy Speaker.

That programme was started in 2019. So, it has been on. ඒක නිසායි අපි කියන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙනවා කියලා. ආර්ථික ප්‍රතිසංස්කරණ වාගේම රට සංවර්ධනය කිරීම සඳහා ගෙනෙන්නා වූ අනෙකුත් සියලු ප්‍රතිසංස්කරණ සමඟ ඉතා ගුණවත්, නැණවත්, විසිඑක්වැනි සියවසට ගැළපෙන දරුවෙක් නිර්මාණය කරන්න අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙනවා. ඒ නිසා එක දෙයක් අල්ලාගෙන ඒ ගැන කථා කරන්න එපා. සමස්තයක් විධියට ඒ ගැන බලන්න. අපේ රටේ ගුරුවරු, විදුහල්පතිවරු ඇතුළු මේ සමස්ත ප්‍රජාවත් එක්ක එකතු වෙලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන එකට එකතු වෙන්න කියන ඉල්ලීම කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Champika Hettiarachchi. You have ten minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
Sir, I propose that the Hon. (Prof.) Sena Nanayakkara do now take the Chair.

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 2.41]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳව අද විවාද කරනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව භාර අරගෙන විශේෂයෙන්ම වසරක් වැනි කාලයක් ඇතුළත රටේ ආර්ථිකය සැලකිය යුතු ප්‍රමාණයකින් ශක්තිමත් කරලා තිබෙනවා. ඒකට බලපාන විවිධ සාක්ෂි කිහිපයක් මට මේ අවස්ථාවේදී කියන්න පුළුවන්. රට නිදාගෙන උදේ නැඟිටිනකොට උද්ධමනය වෙනස් වෙලා, භාණ්ඩ මිල ඉහළ ගිය යුගයක් අපි පහු කළා. හැබැයි, වසරක් වැනි කෙටි කාලයක් ඇතුළත උද්ධමනය කළමනාකරණය කරලා, එය පාලන මට්ටමකට ගෙනෙන්න අපට හැකි වුණා.

ඒ වාගේම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අතින් අපි ඉහළින් ඉන්නවාය කියන එක විවිධ දර්ශක තුළින් අපට දැක ගන්න පුළුවන්. පසුගිය අය වැය විවාදය පැවති කාලයේදීත් ඒ පිළිබඳව විවාදයට ලක් වුණා. ආණ්ඩුව පසුගිය අය වැයෙන් බලාපොරොත්තු වූ රාජ්‍ය ආදායම අභිභවා ගිහින් තිබෙනවා. විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 41ක් අතිරේකව උත්පාදනය කරලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා රේගුව බලාපොරොත්තු වූ ආදායමට වඩා රුපියල් බිලියන 288ක් අතිරේකව උත්පාදනය කරලා තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවත් රුපියල් බිලියන 5ක් අතිරේකව උත්පාදනය කරලා තිබෙනවා. මම හිතන විධියට, විපක්ෂයේ කවුරුවත් හිතුවේ නැහැ, මෙහෙම සංඛ්‍යාලේඛන මේ ආණ්ඩුව ඉදිරිපත් කරයි කියලා. එතුමන්ලා කිව්වේ, "තේ කඩයක්වත් කර ගන්න බැරි පක්ෂයක් කොහොමද රටක් පාලනය කරන්නේ" කියායි. මෙන්න, ඒකට සංඛ්‍යාලේඛන. මට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කළා. එතුමා ඇහුවා, "කිව්ව දේවල්වලින් මොනවාද කළේ" කියලා. අවුරුදු 76කට කරන්න බැරි වුණු දේවල් පිළිබඳ තොරතුරු මේ සංඛ්‍යාලේඛන තුළ තිබෙනවා. ඒවා තමයි කෙටි කාලයක් ඇතුළත මේ ආණ්ඩුව කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපනයන ආදායම වැඩි කරගෙන තිබෙනවා. ඒ අනුව, අපනයන ආදායම ඩොලර් බිලියන 17.2ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මන්ත්‍රීවරු කිව්වා වාගේම සංචාරකයන් විශාල ප්‍රමාණයක් ආපු වර්ෂය බවට පසුගිය වර්ෂය පත් වුණා විතරක් නොවෙයි, සංචාරකයන්ගෙන් අපේ රටට උත්පාදනය කළ ආදායම ඩොලර් බිලියන 3ක් වෙලා තිබෙනවා. විදේශ ප්‍රේෂණවල තත්ත්වයත් ඒ වාගේම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විදේශ ප්‍රේෂණත් ඩොලර් බිලියන 7.8ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා.

ඊළඟට, සෘජු විදේශ ආයෝජන ගනිමු. අපි ඇත්තටම වරාය නගරය ආශ්‍රිතව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේත් සෘජු විදේශ ආයෝජන සම්බන්ධයෙන්. විශේෂයෙන්ම පසුගිය අවුරුද්දේ සෘජු විදේශ ආයෝජන ඩොලර් බිලියනයක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. අපි එතැනින් නතර වෙලා නැහැ. සෘජු විදේශ ආයෝජන රටට ගෙන ඒම සඳහා Single-window concept එක ඇතුළේ BoI ආයතනය නැවතත් ප්‍රතිනිර්මාණය කරමින්, ශක්තිමත් කරමින් අපි මේ ගමන තවදුරටත් ඉදිරියට යමින් ඉන්නවා. ඒ අතරතුර තමයි මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ. ඒ වාගේම public-private partnership සඳහා අවශ්‍ය වන පනත්, joint ventures සඳහා අවශ්‍ය වන පනත් ඇතුළු නියාමන ක්‍රියාමාර්ග ඉදිරියේදී ගෙනැල්ලා රටේ ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පසුබිම හදමින් තමයි මේ රජය ගමන් කරමින් ඉන්නේ. අපි මේ ආණ්ඩුව භාර ගන්නකොට අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙලා ලෝක ණය ශ්‍රේණිගත කිරීම්වල default මට්ටමට වැටිලා තිබුණාට, අද වනකොට Fitch Ratings වැනි ආයතන අපේ රට ඉහළ තැනකට ගෙනැල්ලා තිබෙන බව අප දන්නවා.

ණය තිරසරකරණය ඇති වෙලා, ආයෝජන පිළිබඳ විශ්වාසය, සහතිකය ආයෝජකයන්ට ලැබිලා තිබෙන පසුබිමක තමයි අපි කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයෝජකයෙක් රටට එනකොට ආර්ථික කාරණා විතරක් නොවෙයි, දේශපාලන කාරණාත් බලනවා.

විශේෂයෙන්ම අදූෂිත, අවංක දේශපාලන ව්‍යාපාරයක් තිබිය යුතු බවත්, ඒ ව්‍යාපාරය කොච්චර දුරට ස්ථාවර ද, පවතින රජය කොච්චර දුරට ස්ථාවර ද කියන නිර්ණායකත් ඔවුන් සලකා බලනවා. විපක්ෂය බලාගෙන ඉන්නවා, ආණ්ඩුව අද වැටෙයි, හෙට වැටෙයි කියලා. හැබැයි, මේ සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරන්නේ මේ ආණ්ඩුව තව අවුරුදු ගණනකට වැටෙන්නේ නැහැ කියන එක බව මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ නිසා තමයි මේ ස්ථාවරභාවය එක්ක අපට කථා කරන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, වරාය නගරයක් නිර්මාණය වෙලා තිබුණත් ඒ නගරය තුළ ආයෝජන නැතුව නිකම් ඔහේ ගමන් කරපු කාලයක් තිබුණු බව. ඒ නිසා අපි හිතුවා, මේකත් අපේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ තුළට ගන්න ඕනෑ නිසාත්, ආයෝජකයන් කැන්දාගෙන ආ යුතු නිසාත් මේ බදු සහන ලබා දීලා තවදුරටත් මේක ශක්තිමත් කරන්න. ඒ නිසා මේක නියාමනය කර, අධීක්ෂණය කරන්න පුළුවන් මට්ටමට මේ පනත ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, මේක ඇතුළේ ආයතන ව්‍යුහ කිහිපයක් තිබෙන බව. අපි දන්නවා, වරාය නගරය ඇතුළේ Primary Business of Strategic Importance කියන category එකත්, Secondary Business of Strategic Importance කියන category එකත් වශයෙන් categories දෙකක් තිබෙන බව. මෙහි ප්‍රාථමික BSI කියන ආයතන වන්නේ පළමුව මේ ආයෝජන බිමට - වරාය නගරයට - එන ආයතන. ඔවුන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආයතන වෙන්න පුළුවන්. ඔවුන් තමයි, මේක ගොඩනඟන කණ්ඩායම. ඒ සඳහා අපි නිර්ණායක කිහිපයක් ඉදිරිපත් කළා. එවන් ආයතනයක් වරාය නගරයේ ආයෝජනය කරනවා නම් ඔවුන්ගේ සේවක පිරිස අනුව වාගේම ඔවුන් ආයෝජනය කරන මුදල් ප්‍රමාණය අනුව වර්ගීකරණය කර තිබෙනවා.

ඒ අනුව, type "A" කියන කාණ්ඩය ගත්තොත්, සේවකයන් 300ක්, ඩොලර් මිලියන 100ට වැඩි ආයෝජනයක් තිබෙනවා නම් ඔවුන්ට වසර 10ක සමාගම් ආදායම් බදු සහන කාලයක් ලැබෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ project implementation time එක විධියට අපි ලබා දී තිබෙනවා, අවුරුදු 5ක්. ඒ කාලය ඇතුළත Cess, PAL වාගේ බදුවලින් ඔවුන් නිදහස් වෙනවා. ඒ වාගේම type "B" කියන කාණ්ඩය ගත්තොත්, සේවකයන් 300ක්, ඩොලර් මිලියන 500ත්, බිලියනයත් අතර ආයෝජනයක් තිබෙනවා නම් වසර 12ක සමාගම් ආදායම් බදු සහන කාලයක් ලැබෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ project implementation time එක විධියට වසර 6ක් ලබා දෙනවා. Type "C" කියන කාණ්ඩය ගත්තොත්, සේවකයන් 300ක්, ඒ වාගේම ඩොලර් බිලියනයට වඩා වැඩි ආයෝජනයක් ඔවුන් මේ වරාය නගරයට ගෙනෙනවා නම් ඔවුන්ට අවුරුදු 15ක බදු සහන කාලයකුත්, වසර 8ක project implementation time එකකුත් ලැබෙනවා. සේවකයන් 100ක් සිටින ආයතනයක් සඳහා ඩොලර් මිලියන 25ක අවමයක් යටතේ අවුරුදු 8ක බදු සහන කාල සීමාවක් සහ වසර 4ක project implementation time එකක් ලැබෙනවා. මේවා තමයි පසුගිය කාලයේ මෙවැනි නිර්ණායක නැතුව වසර 25ක් දක්වා දීලා තිබුණු බදු සහනවලට මේ අලුත් පනත් කෙටුම්පතින් ගෙනාපු සංශෝධන ටික. ඒ විතරක් නොවෙයි, අපි මේ කලාපය මහ බැංකුවේ අධීක්ෂණයට අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අක්වෙරළ බැංකුවක් - offshore bank එකක් - විධියට ඔවුන් නියාමනය කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, මෙතැන financial hub එකක් විධියට හදන්න ඕනෑ නම්, ඒ financial hub එක හදනකොට හොඳ ශක්තිමත් බැංකු පද්ධතියක් තිබෙන්න ඕනෑ කියලා. ඒක මහ බැංකුව යටතේ නියාමනය වෙන්න ඕනෑ. එම නිසා ඒ සඳහා වූ විවිධ වගන්ති කිහිපයක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා. විශේෂයෙන්ම 42අ.(1) කියන අලුත් වගන්තිය ඇතුළේ එම කොටස මෙසේ සඳහන් කර තිබෙනවා:

> "මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ලැබිය යුතු ය."

ඒ වාගේම එම වගන්තියට පහළින් කියා තිබෙනවා, මහ බැංකුව විසින් වරින් වර පනවන නීති රීතිවලට හා රෙගුලාසිවලටත් යටත් වෙනවා කියලා. අන්න එහෙම තමයි මේක නියාමනය කර තිබෙන්නේ. අපි දන්නවා, ආණ්ඩුවක් වැඩ කරනකොට විශේෂයෙන්ම නීති පද්ධතිය ශක්තිමත් කරන්න ඕනෑ කියන එක. දේශපාලකයන් විධියට වැරදි නොකර සිටිනවා වාගේම, වැරදි සිදු වන තැන්වල ඒ සඳහා තිබෙන ඉඩකඩ අහුරන්නත් මහජනතාවගේ ඡන්දයෙන් පත් වෙච්ච ආණ්ඩුවක් විධියට අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම පෙරදැරි කරගෙන තමයි අපි මේ වැඩ කරන්නේ.

පසුගිය වසර ඇතුළත අපි අණපනත් 26කට ආසන්න ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා තිබෙනවා. ඒකට හේතුව තමයි තිබුණු සමහර අක්‍රමිකතා, දූෂණ, වංචනික තැන් නිවැරදි කර ගැනීමේ අවශ්‍යතාව. අපි දන්නවා 2028 කියන්නේ අපට තීරණාත්මක වර්ෂයක්. නමුත් ඒ වර්ෂය ළඟා වෙනකොට ආර්ථික ශක්තිමත්භාවය ළඟා කර ගන්න පුළුවන් තැනක අපි ඉන්නවා.

අපි දැක්කා ඊයේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා කථා කරනවා. එතුමා අහනවා සංඝයා වහන්සේලා ගැන කථා කරද්දී ඇයි ආණ්ඩු පක්ෂය හිනා වෙන්නේ කියලා. ඒ එතුමා ගෙදරින් හදාගෙන ආව කථාව. ආණ්ඩුවේ අපි කවුරුත් එහෙම හිනා වුණේ නැහැ. හැබැයි, අපි හිනා වුණා එතුමාගේ දැනුමට. කඳු නාය යනකොට, ගංවතුර ගලනකොට කකුළුවෝ මුහුදට යනවා කියලා එතුමා කියපු කථාවට අපි හිනා වුණා මිසක් අපි කවුරුත් භික්ෂූන් වහන්සේලා ගැන කියනකොට හිනා වුණේ නැහැ. එතුමන්ලාට ඕනෑ මේ රට අස්ථාවර කරන්න. ඒ අස්ථාවර කිරීම මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන එතුමන්ලා කරනවාය කියන එකත් මතක් කරමින්, ඒ ගැනත් සැලකිලිමත් වෙන්න කියා ඉල්ලමින්, මට මේ අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.52]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විෂයයන් දෙකක් විවාදයට භාජන කළත්, මම එයින් එක් විෂයක් ගැන පමණයි කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ තමයි අංක 2465/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී කරන්න යන්නේ අපට donation එකක් ලැබෙනවා නම්, ඒවාට යම්කිසි ආනයන සීමා දාලා තිබෙනවා නම් ඒවා ඉවත් කරන එක සහ, VAT, Cess, PAL කියන බදු සහ Customs Duty එක අයින් කරන එක. ඒක 2004දී සුනාමියත් එක්ක ගෙනාපු සංශෝධනයක්. ඒක 2017 ගංවතුර වෙලාවේත් පාවිච්චි කළා. දැන් "දිට්වා" සුළි කුණාටුවටත් ඒක පාවිච්චි කරනවා. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඇත්ත වශයෙන්ම අපට donations එනකම් බලාගෙන ඉන්න හැකියාවක් නැහැ. මොකද, ලෝක බැංකුව කියා තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුවේ damage එක දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4 ඉක්මවා යනවා කියලා. ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක විතර, එහෙමත් නැත්නම් රුපියල් බිලියන 1,200ක විතර ප්‍රමාණයක්; විශාල ප්‍රමාණයක්. මම අහගෙන ජනාධිපතිතුමාත් කියනවා අපි ආධාර සමුළුවක් කැඳවන්න ඕනෑ, ඒ ආධාර සමුළුවෙන් අපි රටවලින් ආධාර ලබා ගන්න ඕනෑ කියලා. ඊට පස්සේ ඒ ගැන කවුරුත් කථා කළේ නැහැ. අපි දැනගන්න කැමැතියි, ඒ ආධාර සමුළුව පවත්වනවාද කියලා. ඒ ආධාර සමුළුවෙන් අපට භාණ්ඩමය ද්‍රව්‍ය ලෙස ආධාර ලැබෙනවා නම් ඒ සඳහා මේ පනත එකතු කරගන්න පුළුවන්.

අපි සොයලා බැලුවා, "Rebuilding Sri Lanka" කියලා අරමුදලක් ආරම්භ කළා කියලා ආණ්ඩුව කිව්වාට එහෙම අරමුදලක් නැහැ. මම ඒ ගැන තව පොඩ්ඩකින් කථා කරන්නම් මූල්‍ය වශයෙන් ආධාර කොච්චර ලැබිලා තිබෙනවාද කියලා. ලැබිලා තිබෙන්නේ රුපියල් බිලියන 7යි. රුපියල් බිලියන 7න් කරන්න පුළුවන් දෙයක් නැහැ. ඇත්ත වශයෙන්ම අපට වියදම් කරන්න වෙනවා අවම වශයෙන් රුපියල් බිලියන 1,200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මේ කුණාටුවෙන් වෙච්ච හානිවලින් මිදෙන්න. එහෙම නම් අපි කල්පනා කරමු කුඩා ව්‍යාපාරයක්, එහෙමත් නැත්නම් කර්මාන්තශාලාවක් ගැන. මම උදාහරණයක් හැටියට ගන්න කැමැතියි එක්සත් සහල් නිෂ්පාදකයන්ගේ සංගමයෙන් ගරු ජනාධිපතිතුමාටත්, වසන්ත සමරසිංහ ඇමතිතුමාටත් ලියලා තිබෙන ලියුම. ඒකේ තිබෙනවා මධ්‍යම පරිමාණයේ සහල් මෝල් 7ක් විනාශ වෙලා තිබෙනවා කියලා මේ කුණාටුව නිසා. ඔවුන්ගේ loss එක පෙන්වලා තිබෙනවා. Stocksවලට damage වෙලා තිබෙනවා බිලියන 1,100 ගාණක්. Civil work, stock and machinery කියන ඔක්කෝටම බිලියන 1,600 ගාණක damage එකක් තිබෙනවා. මේ equipment, යන්ත්‍ර සූත්‍ර ගේනකොට VAT එක, Cess එක, SSCL එක වදිනවා. අපි ඊයේ මුදල් කාරක සභාවේදී ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කරලා මුදල් අමාත්‍යාංශයට යෝජනාවක් ඉදිරිපත් කළා.

ඒ තමයි, මේ අවස්ථාවේදී නිකම් ලැබෙන ඒවාට විතරක් නොවෙයි, ඔවුන් සල්ලි ගෙවලා නැවත ගෙන්වන, ඒ විනාශ වූ යන්ත්‍රෝපකරණවලටත් VAT එක අය කරන්න එපා කියලා. මම හිතන විධියට, ඒක සාධාරණ ඉල්ලීමක්. සියලු මන්ත්‍රීවරුන් ඒ යෝජනාවට එකඟ වුණා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයට නැවතත් අවධාරණය කරනවා, ආධාරවලට විතරක් නොවෙයි, මේ සුවිශේෂ අවස්ථාවේදී ව්‍යාපාරිකයන් මුදල් දීලා ආනයනය කරන භාණ්ඩවලට VAT එක අය කරන්න එපා කියලා. එතැනදී යම් කිසි administrative regulations තිබෙන්න පුළුවන්, යම් කිසි භාණ්ඩයකට කොච්චර මුදලක් වියදම් වෙනවාද කියන එක තීරණය කරන්නේ කවුද කියන එක වාගේ. ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඒ අවස්ථාවේදී කිව්වා, කර්මාන්ත අමාත්‍යාංශය හරහාත් ඒක තීරණය කරන්න පුළුවන් කියලා. එහෙමත් නැත්නම් අපට ඒක decentralize කරන්න පුළුවන්. අපි හිතමු, පොළොන්නරුවෙන් නම් ඒක කරන්නේ, පොළොන්නරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පුළුවන් expertsලා යොදා ගෙන ඒ ගැන සොයා බලා ඒකද නිවැරදි ප්‍රමාණය කියලා තීරණය කරන්න. එහෙම නැතුව insurance ලැබෙනවා නම්, "මෙන්න මේ ගණන තමයි මේකට වියදම් වෙන්නේ" කියලා ඒ insurance එකේ condition එකක් දෙනවා. මම හිතන විධියට ඒ යෝජනාවට මේ මන්ත්‍රීවරුන් 225දෙනාම එකඟ වෙයි. මේ අවස්ථාවේදී ඒ සහනය ව්‍යාපාර කරන අයට ලබා දෙන්න කියලා අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒක තමයි පළමුවැනි කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවැනි කාරණය කියන අතරවාරයේදී කිව්වා, "Rebuilding Sri Lanka" Fund එක තවමත් ස්ථාපිත කරලා නැහැ කියලා. ඒක අවුලක්. මොකද, මේ අවස්ථාවේ රටේ විගණකාධිපතිවරයෙකුත් නැහැ. රුපියල් කෝටි ගණන්වලින් මුදල් එහෙට මෙහෙට යනවා. මුදල් ලැබෙනවා, ඒවා රජයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අරමුදලට යනවා. ඒක ඇත්ත. අපි කියන්නේ නැහැ, ඒවා කවුරු හරි සාක්කුවේ දමා ගත්තා කියලා. නමුත්, පස්සේ දවසක ප්‍රශ්නයක් අහන්න පුළුවන්, "ඇයි මේක කළේ නැත්තේ, කෝ, මේකේ විනිවිදභාවය?" කියලා. අරමුදලක් ස්ථාපිත කරලා නැත්නම්, කොහොමද මේ අරමුදල් විගණනය කරන්නේ? අපි ඊයේ මුදල් අමාත්‍යාංශයෙන් විමසුවාම ඔවුන් කිව්වේ, ඒක කරගෙන යනවා කියලා. කරගෙන යනවා කියලා කිව්වාට දැන් සති හයක්, හතක් විතර ගත වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රශ්න එන්නේ අද නොවෙයි. ප්‍රශ්න එන්නේ ආණ්ඩුව මාරු වුණාම තමයි. ආණ්ඩුව මාරු වුණාම ඊළඟට එන ආණ්ඩුව ඔබතුමන්ලාගෙන් අහනවා, "කෝ, මේකේ විනිවිදභාවය, කෝ, මේ අරමුදල, කොහේටද මේ සල්ලි ගියේ?" කියලා. ඒ නිසා කාගේත් හොඳට තමයි මම මේවා කියන්නේ. මේ කටයුතු තවදුරටත් postpone කරන්න එපා.

ආපදා කළමනාකරණ පනත යටතේ තිබෙනවා, ආපදා අරමුදලක් ස්ථාපනය කරන්න කියලා. ඇත්ත වශයෙන්ම ඒක කරලාත් නැහැ. මාස හයකට විතර කලින් තිබුණු කමිටු රැස්වීමේදී තීරණය කරලා තිබෙනවා, ඒක කළ යුතුයි කියලා. ඒකට අවශ්‍ය වෙන්නේ, රුපියල් මිලියන 100ක් රජයෙන් ඒ අරමුදලට යොදවන එකයි. ඒක පැය භාගයකින් කරන්න පුළුවන් දෙයක්. ආයෙත් ඒකට පනත් සම්මත කර ගන්න ඕනෑ නැහැ. ඒ අරමුදල තිබෙනවා නම්, අපට විනිවිදභාවයෙන් මේ කටයුතු කරන්න පුළුවන්.

මේ ඔක්කොම කරන අතරවාරයේ නැවතත් මම මතක් කරන්න කැමැතියි, විගණකාධිපතිවරයෙක් නැති එක පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද කිව්වා කියලා මතක තබා ගන්න, ඉස්සරහට ඒක ප්‍රශ්නයක් වෙනවාමයි. මොකද, පුද්ගලයෝ මේ ගැන අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ හිටියා නම් ඒ ප්‍රශ්නය ඔබතුමාත් අහයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කාරණාව තමයි, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන් ගෙවන්න තිබුණු ණය. "දිට්වා" සුළි කුණාටුව එන්න කලින් රුපියල් බිලියන 900ක විතර stage 3 loans, ඒ කියන්නේ ගෙවා ගන්න බැරි ණය තිබුණා. අපි හිතනවා, මේ කුණාටුවෙන් පස්සේ ඒ මුදල රුපියල් ට්‍රිලියනය ඉක්මවා ඇති කියලා. මම ඒකට පොළොන්නරුවේ උදාහරණය වාගේ උදාහරණයක් ගන්නම්. ඒ පුද්ගලයා මට නමත් සඳහන් කරන්න කිව්වා. ඔහු "අනුර" කියලා පුද්ගලයෙක්. ඔහු කොළඹ දිස්ත්‍රික්කයේම ෂෙඩ් එකක් තිබෙන exclusive distributor කෙනෙක්. ඔහු ණයක් අරගෙන තිබෙනවා. මම මේ එක උදාහරණයක් විතරයි කියන්නේ. නමුත් මේ වාගේ උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. ඔහු රුපියල් මිලියන 165ක ණයක් අරගෙන තිබෙනවා. නමුත්, අවාසනාවකට ආර්ථික අර්බුදය නිසා, ඊට කලින් තිබුණු කොරෝනා අර්බුදය නිසා, ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව නිසා දැන් රුපියල් මිලියන 570ක් ගෙවන්න වෙලා තිබෙනවා. රුපියල් මිලියන 165යි අරගෙන තිබෙන්නේ. දැනට රුපියල් මිලියන 300 ගණනක් ගෙවලා තිබෙනවා. හැබැයි, දැන් ඒක ගෙවන්න හැකියාවක් නැහැ. මොකද, ඔහුගේ උකසට තබා තිබෙන ගෙවල් ඔක්කොම විකුණා දැම්මත්, මේ රුපියල් මිලියන 570ක මුදල සොයා ගන්න බැහැ. මෙතැන ගැටලුව වෙලා තිබෙන්නේ, අර්බුදය තිබුණු දවස්වල බැංකුවලින් සියයට 30ක පොලියක් එකතු කරලා තිබෙන එක. ඒක කෙටි කාලයක් තිබුණේ. නමුත්, ඒ කාලයේ සියයට 30ක පොලියක් එකතු කළාම, වැල් පොලී ක්‍රමය යටතේ ගත්ත ණයක් නිසා ඒක ඉතා ඉහළ ගිහින් තිබෙනවා.

මහ බැංකුවෙන් ඉදිරිපත් කර තිබෙන නිර්දේශ අනුව ඒ පොලිය තිබෙන්න පුළුවන් සියයට 9ක් ලෙස. එහෙම තිබියදීත් බැංකුවලින් සියයට 30ක පොලියක් අය කරන්නේ කොහොමද? අපි මේක තේරුම් ගන්න ඕනෑ. මම ඒ උදාහරණයට ගත්තේ ලොකු ව්‍යාපාරිකයෙක්. අපි ලංකාවේ නොයෙකුත් ප්‍රදේශවලට ගියා. ගම්පොළ ප්‍රදේශය ගත්තොත්, ගම්පොළ ටවුමේ කුඩා කර්මාන්ත, සාප්පු ආදි ඔක්කෝම වාගේ සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙලා. ඒ ව්‍යාපාරිකයන්ටත් මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා.

මම කියන්න හදන්නේ මේකයි. අපේ රට නැවත ගොඩ නැඟීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වෙනවා. ඒවා donationsවලින් බලාපොරොත්තු වෙන්න එපා; ඒවා donationsවලින් එන්නේ නැහැ. අද ඉන්න මිනිස්සු එහෙම donations දෙන්නේ නැහැ. ඉන්දියාවෙන් ඩොලර් මිලියන 100ක් දුන්නා. ඒ ඇරෙන්න අනෙක් රටවලින් දුන්නේ, ඩොලර් මිලියනයයි, දෙකයි, තුනයි වාගේ ගණන්. සොයලා බැලුවාම, ඇත්තටම ඩොලර් මිලියන තිස්ගණනයි ලැබිලා තිබෙන්නේ. රජයට මේ මුදල් වියදම් කරන්න සිද්ධ වෙනවා. එහෙම වන කොට වියදම් කරන්න බලාපොරොත්තු වෙච්ච ඒවාට මුදල් වියදම් කරන්න බැරි වෙනවා. මම එදාත් කිව්වා වීදුරු ජනේලයේ උදාහරණය. වීදුරු ජනේලයට ගලක් ගැහුවොත්, ජනේලය කැඩෙනවා. ජනේලය කැඩුණාම වීදුරු විකුණන කෙනාටයි, වඩු බාස්ටයි, බට්ටා ලොරිය එළවන driverටයි යම්කිසි ආදායමක් ලැබෙනවා. එතකොට දළ දේශීය නිෂ්පාදනය ඉහළ යනවා. මහ බැංකුවේ අධිපතිවරයා කියනවා මා අහගෙනයි, බලාපොරොත්තු වුණාට වඩා දළ දේශීය නිෂ්පාදනය ඉහළ යයි කියලා. ඉහළ යයි. හැබැයි, එහෙම ඉහළ ගියාට අර කියපු ජනේලය විතරයි තිබෙන්නේ. කැඩිච්ච පාරවල් ටික හැදුවාම, ඒ පාරවල් ටික විතරයි තිබෙන්නේ. කැඩිච්ච බෝක්කු ටික, ඉස්පිරිතාල ටික හැදුවාම ඒවා විතරයි තිබෙන්නේ. ණය අරගෙන, එහෙම නැත්නම් donations අරගෙන කටයුතු කරනවාට වඩා අප කළ යුතු දේ තමයි, මේ ආර්ථිකය ලිහිල් කරන එක. ආර්ථිකය ලිහිල් කරලා ආයෝජනවලට අවස්ථාව ලබා දෙන එක. ආයෝජනවලට අවස්ථාව ලබා දුන්නොත් අපට පුළුවන්, පෞද්ගලික ආයෝජකයන්ටත් යටිතල පහසුකම්වලට ආයෝජනය කරන්න අවස්ථාව ලබා දෙන්න. ඒ නිසා මම නැවතත් රජයට කියනවා, මේ කාරණයට අවධානය යොමු කරන්න කියලා. උදාහරණයක් හැටියට airports ගනිමු. අපි හිතාගෙන ඉන්නේ, airports හදන එක ආණ්ඩුවෙන්ම කරන්න ඕනෑ දෙයක් කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

හැබැයි, ඉන්දියාව බලන්න. එහේ සියලු airports හදන්නේ පෞද්ගලික අංශයෙන්. ආණ්ඩුවේ ඉඩමේ පෞද්ගලික අංශයෙන් හදනවා airport එක. එතකොට කිසිම බරක් ආණ්ඩුවට එන්නේ නැහැ. Topline එකෙන් සියයට 40ක් ආණ්ඩුවට ලැබෙනවා.

අපට මේ තිබෙන අභියෝගය ඉතාම ලොකු අභියෝගයක්. ඒ අභියෝගය ජය ගන්න traditional විධියට හිතලා බැහැ. අපි මේක disrupt කරන්න ඕනෑ. Disrupt කරනවා නම්, ආර්ථිකයේ යටිතල පහසුකම්වලට ආයෝජනය කරන්න දේශීය හෝ විදේශීය හෝ වෙච්චා පෞද්ගලික අංශයටත් ඒ ලිහිල් කිරීම කරන්න ඕනෑ. ඒ ටික තමයි මට කියන්න ඕනෑ වෙලා තිබුණේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.04]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳටම දන්නා සහ පළපුරුදු අය විසින් බිඳ වට්ටන ලද ශ්‍රී ලාංකීය ආර්ථිකය ගොඩ නැඟීමේදී ඉතාම වැදගත් වන සෘජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීමේදී අපේ එක් උපාය මාර්ගයක් වන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන මේ වෙලාවේ අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම මම සතුටක් විධියට සලකනවා.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ මූලික අරමුණු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, මේ කලාපය ගෝලීය වශයෙන් තරගකාරී විශේෂ ආර්ථික කලාපයක් බවට පත් කිරීම. දෙවැනි අරමුණ, රට තුළට සෘජු විදේශ ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමයි. අනෙක් එක, සමස්තයක් විධියට ව්‍යාපාර කිරීමේ පහසුව පිණිස ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවේ ගෝලීය මට්ටම ශක්තිමත් කරන එක. මෙන්න මේ අරමුණු ඉටු කර ගන්න තමයි අපි අද මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

යම් රටකට සෘජු විදේශ ආයෝජන එනකොට ඒ රටේ තිබෙන ආර්ථික ස්ථාවරත්වය, ඒ රටේ රජය කෙරෙහි ජාතික සහ අන්තර්ජාතික වශයෙන් තිබෙන විශ්වාසය ඉතාම වැදගත් වනවා. අන්න ඒ නිසා තමයි අප මේකට ආනුෂංගික වන ලෙස 2025 වසර අලුත් විධියකට අර්ථකථනය කර ගන්න ඕනෑ. මම එහෙම කියන්නේ ඇයි? දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැඩිම ආදායමක් ඉපැයූ වර්ෂය තමයි 2025 වර්ෂය.

ඒ වාගේම රේගුව ගත්තොත්, 2025 වර්ෂය තමයි වැඩිම රේගු ආදායම් උපැයූ වර්ෂය වෙන්නේත්. සුරාබදු දෙපාර්තමේන්තුව ගත්තොත්, වැඩිම සුරාබදු ආදායම ලබපු වර්ෂය 2025. වැඩියෙන්ම සෘජු විදේශ ප්‍රේෂණ ලැබුණු වර්ෂය ගත්තොත්, ඒත් 2025. රටට විදේශ ආදායම් එන තවත් ක්ෂේත්‍රයක් තමයි, සංචාරකයන්ගේ පැමිණීම. ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණි වර්ෂයත් 2025. අද ආයෝජකයන් තුළ විශ්වාසයත් ගොඩ නැඟී තිබෙනවා, කොටස් වෙළෙඳ පොළේ වර්ධනයත් එක්ක. කොටස් වෙළෙඳ පොළේ වැඩිම වර්ධනයක් පෙන්වපු වර්ෂයත් 2025. ඒ වාගේම ඉතිහාසයේ වැඩිම අපනයන ආදායමක් ගෙන ආ වර්ෂයත් 2025. මා මෙම කරුණු කීපය දැක්වූයේ, අපි මේ බිඳ වැටුණු රට භාර අරගෙන 2025 වර්ෂයේදී අපේ ආර්ථික අරමුණු, අපේ ආර්ථික සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ස්ථාවර පදනම ලාංකීය ආර්ථිකය තුළ ඇති කර තිබෙනවා කියන එක පෙන්වීමටයි. මේවාට දෙස් දෙවොල් තබන, මේ රට හෙට වැටෙයි, අනිද්දා වැටෙයි, කුණාටු ආවත් මේ ආණ්ඩුව වැටෙයි කියා බලාගෙන ඉන්න, වෙනත් කොහේ හරි යුද්ධයක් ඇති වුණත් ඒ හේතුවෙන් මේ රටේ ආර්ථිකය වැටෙයි කියන බලාපොරොත්තුවෙන් ඉන්න විපක්ෂයේ පිරිස හිතන මාර්ගයේ නොව අප ඊට වඩා වෙනස් මාර්ගයක රට ගොඩ නඟමින් ඉදිරියට යනවා.

අපට කොයි තරම් බාධා තිබුණත් ඉතිහාසයේ මෑත කාලීන වර්ෂ ගත්තාම අපි 2025දී රාජ්‍ය සේවකයන් වැඩිම පිරිසක් බඳවා ගත්තා. ඒ විතරක් නොවෙයි, නොසිතූ පරිදි, නොසිතූ ප්‍රමාණයක

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

වැටුප් වැඩි වීමකුත් ඔවුන්ට ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, 2025 වර්ෂය දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින පුරවැසියන්ට සමාජ ආරක්ෂණය වැඩිපුරම තහවුරු කරපු වර්ෂය ද වනවා.

මට කලින් කථා කරපු අපේ සහෝදර මන්ත්‍රීවරුත් විවිධ කරුණු ඉදිරිපත් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරනවා, "මේ අයට පළපුරුද්ද නැහැ, මේ අය රටේ ආර්ථිකය භාර ගත්තාට පසුව හරි ඉක්මනින් ආර්ථිකය බිඳ වැටෙනවා. එම නිසා නැවත වතාවක් ආර්ථික අර්බුදයක් ඇති වෙයි" කියලා. පුරෝකථනවල තිබුණේ සියයට දෙකක්, තුනක් අතර ආර්ථික වර්ධනයක් ගැනයි. නමුත්, වර්ෂය අවසාන වන කොට අපට පුළුවන්කම ලැබුණා, සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගන්න. එම නිසා මම 2025 වර්ෂය හඳුන්වා දෙන්නේ, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය ඇති කරපු වර්ෂයක් විධියටයි. අන්න ඒ නිසා මේ රජය කෙරෙහි, මේ ආණ්ඩුව කෙරෙහි දේශීය වශයෙන් වාගේම විදේශීය වශයෙනුත් ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු වෙලා තිබෙනවා. ඒක ඉබේම සිද්ධ වුණේ නැහැ. අපි ඒ විශ්වාසය තහවුරු කළේ 76 වසරක් පුරා බලය පවත්වා ගෙන ගිය රජයයන් පවත්වාගෙන ආ දූෂණය, වංචාව, නාස්තිය තුරන් කරලා, මනා ආර්ථික කළමනාකාරිත්වයක් පෙන්නුම් කරලායි. අපට ඒක තවදුරටත් තහවුරු වෙනවා, ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන බංකොලොත් වෙලා තිබුණු ශ්‍රී ලාංකීය ආර්ථිකය CCC+ තත්ත්වයට උසස් කර තිබීමෙන්; අපේ රට බංකොලොත්භාවයෙන් මිදුණු රටක් විධියට ප්‍රකාශයට පත් කර තිබීමෙන්. අන්න අපට තවත් තහවුරුවක් ලබා දෙනවා. පසුගිය වර්ෂය තුළ ඩොලර් බිලියනයකට ආසන්න සෘජු විදේශ ආයෝජන අපට ලැබෙනවා. ඒකෙන් පෙන්වන්නේ මොකක්ද? අපේ ආර්ථික ගමන නිවැරදියි, අපි ආර්ථිකය හසුරුවන දිශාව නිවැරදියි කියන එකයි. එහෙම නැත්නම් අපි ආර්ථිකය නිවැරදි දිශාවට ගමන් කරවනවා කියන එකයි. එම නිසා තමයි අපට උද්ධමන අනුපාතය සියයට 5කට වඩා අඩු මට්ටමක පවත්වා ගෙන යන්න පුළුවන්කම තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි කිව්වා වැඩිම බදු ආදායම ලැබිච්ච වර්ෂයත් 2025 වර්ෂය කියලා. බදු ගෙවන්නන් තුළ රජය කෙරෙහි විශ්වාසය වැඩි කර තිබෙනවා. ඒ අය දන්නවා, රජයට බදු ගෙව්වාට පාඩු නැහැ කියලා. ඒවා ආර්ථිකයට ප්‍රතිලාභ විධියට නැවත ලැබෙනවා. ඒ නිසා බදු සල්ලි කාගේවත් සාක්කුවලට, වෙනත් පාරවල යන්නේ නැහැ. ඒ වාගේම මේ ආර්ථික කළමනාකරණය තුළ පසුගිය වර්ෂයේදී රාජ්‍ය මුදල් අපි ඉතාම අරපරිස්සමින් වියදම් කළා. ඒ තුළින් අපි රාජ්‍ය මූල්‍ය විනය තහවුරු කළා. 2016 වාගේ වර්ෂයක දත්ත ගත්තොත්, රජයේ ප්‍රාග්ධන වියදම්වලින් සියයට 50ක් විතර තමයි ඒ අවුරුදුවල වියදම් කරලා තිබෙන්නේ. නමුත්, පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් වෙනකොට රජයේ ප්‍රාග්ධන වියදම්වලින් සියයට 65ක් විතර අපි වියදම් කරලා තිබෙනවා. මට දැඩි විශ්වාසයක් තිබෙනවා, 12වෙනි මාසය වෙනකොට ආසන්න වශයෙන් අපි සියයට 80ක්වත් රජයේ ප්‍රාග්ධන වියදම ළඟා කරගෙන ඇති කියලා. අපි මේ රටේ පොලී අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යනවා වාගේම, ගෙවුම් ශේෂ තුලනය ධන අගයක පවත්වා ගෙන යනවා. මේ තත්ත්වය සලකා බලද්දී ඉදිරි ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ඉතාම වැදගත් වෙනවා, සෘජු විදේශ ආයෝජන ලබා ගැනීම. සෘජු විදේශ ආයෝජනයක් කියන්නේ, හුදෙක් ඩොලර් විතරක් නොවෙයි. අපට ආයෝජන එනකොට ඩොලර් එනවා. ඒ නිසාම අපේ ආනයන සහ අපනයන වෙළඳාමත් දියුණු වෙනවා. මේ රටේ විරැකියාව තුරන් වෙනවා. මේ රටේ පුරවැසියන්ට රැකියා අවස්ථා ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. දැනට ප්‍රශස්ත ආර්ථික කාර්යයක යෙදිලා නැති මේ රටේ සම්පත්වලට විශාල වටිනාකමක් එකතු වෙනවා. අපි මේ Colombo Port City එක සලකන්නේ, අපට විදේශ ආයෝජන ගෙනෙන එකම මාර්ගය විධියට නොවෙයි. මීට අමතරව අපේ ආර්ථික උපාය මාර්ග විධියට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, public-private partnerships, joint ventures වැනි උපාය මාර්ගත් තිබෙනවා. මේ හැම දේකටම රජය කෙරෙහි තිබෙන විශ්වාසය ඉතාම වැදගත් වෙනවා. අපි මේ පනත සංශෝධනය කිරීමෙන් බලාපොරොත්තු වෙන අරමුණු කිහිපයක් තිබෙනවා. ඒ තමයි, සේවා නියුක්ති ආදායම් බදු සහ සහන ඇතුළුව බදු දිරිගැන්වීම්, නිදහස් කිරීම් සහ ගළපා ගැනීම. ඒ වාගේම උපාය මාර්ගික ව්‍යාපාර සඳහා වැඩි දියුණු කළ නියාමන සහ අධීක්ෂණ වැඩ පිළිවෙළක් තහවුරු කිරීම, අක්වෙරළ බැංකු මෙහෙයුම් පාලනය කරන නව විධිවිධාන සැලසීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මට තව විනාඩි භාගයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙන්න මේ වෙනස්කම් මඟින් අපි සෘජු විදේශ ආයෝජන කෙරෙහි තිබෙන විනිවිදභාවය ශක්තිමත් කරලා, මේ කටයුතු ජාතික ආර්ථික අරමුණුත් සමඟ සමපාත කරලා, සමගාමී කරලා කොළඹ වරාය නගරය තුළ දිරිගැන්වීමේ ව්‍යුහයක් ඇති කරන බව පැහැදිලිව කියන්න පුළුවන්. ඒ තුළින් ඉදිරි ආර්ථික ඉලක්ක, සංවර්ධන ඉලක්ක අපි ජය ගන්නවා. ඔබ වැටෙනවා, වැටෙනවා කියලා මතුරමින් තිබුණු රට අපි ආපස්සට ගෙනියන්නේ නැහැ. මේ ඉලක්ක ජයගෙන මිසක්, අපි ආපස්සට යන්නේ නැහැ. අපි රට ගොඩ නඟනවා කියන විශ්වාසය ලබා දෙමින් මං නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ශ්‍රී බවානන්දරාජා මහතා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් ලැබෙනවා.

[පි.ප. 3.16]

**ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) எஸ். ஸ்ரீ பவானந்தராஜா)
(The Hon. (Dr.) S. Sri Bavanandarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெற்றுக்கொண்டிருக்கின்ற கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு திருத்தச் சட்டமூலம் மீதான விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி கூறிக்கொண்டு எனது உரையை ஆரம்பிக்கின்றேன். முதலில், அண்மையில் 'தித்வா' புயலினால் ஏற்பட்ட அனர்த்தத்தின் காரணமாக மரணமடைந்தவர்களுக்கு எனது அஞ்சலியைச் செலுத்திக்கொள்வதுடன், பாதிக்கப்பட்ட மக்களுக்கு ஆறுதலையும் தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன், எமது நாடு இந்தப் பாரிய அனர்த்தத்தில் சிக்கியபோது எமக்கு உதவி செய்த - உதவிக் கரங்களை நீட்டிய - அனைத்து நாட்டு அரசாங்கங்களுக்கும் அந்த நாட்டு மக்களுக்கும் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மேலும், எமது ஜனாதிபதி அவர்களால் அறிவிக்கப்பட்ட நிவாரண உதவிகள் பாதிக்கப்பட்ட மக்களுக்கு மிகத் துரிதமாகச் சென்றடைய உதவியாக இருந்த அரச அதிகாரிகளுக்கும் நன்றி கூறக் கடமைப்பட்டுள்ளேன்.

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டமூலம் மீதான விவாதத்தில் முதலில் நான் தெரிவிக்க விரும்புவது என்னவெனில், எமது நாடு பொருளாதார நெருக்கடியிலே சிக்கித் தவித்துப் பாரிய நிதி நெருக்கடிகளை எதிர்கொண்டபோதும், எமது அரசாங்கத்தின் முன்னேற்றகரமான பல நடவடிக்கைகளின்மூலம் குறிப்பிடத் தக்க வளர்ச்சியை அடைந்துகொண்டு வருகின்றது; இதனை எமது எதிர்க்கட்சி உறுப்பினர்களும் நேரடியாகவே அவதானித்திருந்திருப்பார்கள். ஆனால், அவர்கள் அதனை ஏற்றுக் கொள்வதாக எனக்குத் தெரியவில்லை. எனவே, அவர்கள் அதனை ஏற்றுக்கொள்ள வேண்டும் என்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இன்று நாங்கள் ஒரு புதிய அடிவானத்தின் விளிம்பில் நிற்கின்றோம். இந்தத் துறைமுக நகரம் - Port City என்பது வெறும் கல்லாலும் மண்ணாலும் கட்டப்பட்ட ஒரு கட்டிடமல்ல, இது நவீன இலங்கையின் இதயத் துடிப்பாகும். இந்தியப் பெருங்கடலில் மறைந்திருக்கும் 'முத்து' என்ற நிலையிலிருந்து, உலகளாவிய கண்டுபிடிப்புகளின் மையமாக நாம் மாறுவதற்கான எமது இலட்சியத்தை இது பிரதிபலிக்கின்றது. எனவே, உலகின் முதலீடுகளும் இலங்கையின் ஆற்றலும் கைகோர்க்கும் இடமாக இது அமைந்திருக்கின்றது. இதை முன்னேற்ற வேண்டிய, வினைத்திறனாக நடத்த வேண்டிய பாரிய பொறுப்பு எங்களுக்குண்டு. முக்கியமாக, அதிகளவான சர்வதேச முதலீட்டாளர்களின் நேரடி முதலீடுகளுக்கு வழிவகுக்கும் விதமாகத் தேவையான ஒழுங்குவிதிகளையும் வழிகாட்டுதல்களையும் உருவாக்கி, எமது நாட்டில் முதலீடுகளுக்கு அவர்களை அழைப்பதுதான் எங்களது பிரதான நோக்கமாக இருக்கின்றது.

அந்த வகையிலே, மேலதிகமாக உருவாக்கப்பட்டிருக்கின்ற இந்த 664 ஏக்கர் பரப்பளவைத் திறம்பட வினைத்திறனாகப் பயன்படுத்த வேண்டிய தேவை எமது அரசாங்கத்திற்குண்டு. எனவே, முதலீட்டாளர்களை ஊக்கப்படுத்தும் இத்தகைய திருத்தச் சட்டங்களை எமது நாட்டு மக்களும் ஏனைய எதிர்க் கட்சியினரும் பெரிதும் வரவேற்க வேண்டுமென்று கேட்கின்றோம். ஏனென்றால், இந்த முதலீடுகள் நாட்டுக்கு நன்மை பயக்கும் என்பதில் துளியேனும் எமக்குச் சந்தேகமில்லை. இத்திட்டங்களின்மூலம் நாங்கள் மேலதிக வருமானங்களை ஈட்டுவதோடு, எமது நாட்டு மக்களுக்குரிய வேலைவாய்ப்புகளை வழங்குவதற்கும், வரி விதிப்புகளின்மூலம் எமது நாட்டுக்கு அதிகரித்த வருமானத்தைப் பெற்றுக்கொள்ளவும் ஏதுவாக இருக்கும். அந்த வகையிலே, இந்தத் திருத்தச் சட்டமூலத்தை அனைவரும் ஏற்றுக்கொண்டு, இன்றைய தினம் இதனை நிறைவேற்றுவதற்கு ஆதரவளிக்க வேண்டுமென்று சகல கட்சியினரையும் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், கிடைக்கின்ற இந்தச் சந்தர்ப்பத்தைத் திறம்பட உபயோகிக்க வேண்டியது இலங்கை மக்களாகிய எங்களது கடமையாகும்.

இலங்கையிலே இன்று சுற்றுலாத்துறை மிக வேகமாக விரிவடைந்து வருகின்றது. எமது வட மாகாணத்தைப் பொறுத்தமட்டில், அங்குள்ள பல சுற்றுலாத் தலங்களையும் நாங்கள் அபிவிருத்தி செய்வோம். குறிப்பாக, யாழ்ப்பாண நகரம் சிறந்த சுற்றுலாத் தலமாக அறிவிக்கப்பட்டிருக்கின்றது. அத்தோடு, அதனோடு சேர்ந்த பல தீவுகளும் காணப்படுகின்றன. உதாரணமாக, நெடுந்தீவு, நயினா தீவு, அனலை தீவு, எழுவை தீவு போன்ற தீவுகள் கடற்பரப்பை அண்டிக் காணப்படுகின்றன. ஏற்கனவே, சில அபிவிருத்தி வேலைகள் அங்கு ஆரம்பமாகிவிட்டன. அவற்றின்மூலம் மேலதிகமாக சுற்றுலாப் பயணிகளை அங்கு வரவழைப்பதற்குத் தேவையான நடவடிக்கைகளை எடுத்துக்கொண்டு இருக்கின்றோம். அதன்மூலம் மிகவும் பின்தங்கிய சமூகங்களும் தூய்மையான, நிலையான ஆற்றலைப் பெறுவதை நாம் உறுதிசெய்வோம்.

அங்குள்ள தீவுகளுக்கும் நிலப்பரப்புக்களுக்கும் இடையிலான இடைவெளிகளைக் குறைக்கும்வகையில் நவீன படகுச் சேவைகளை ஆரம்பித்து மக்களின் வேகமான, பாதுகாப்பான பயணத்தை உறுதி செய்வதற்கும் அங்கு வாழ்கின்ற மக்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்தும்வகையில் புதிய வாய்ப்புகளை உருவாக்குவதற்கும் நாம் செயற்பட்டு வருகின்றோம். இதனை நாங்கள் ஒரு புரட்சியாகவே பார்க்கின்றோம். முதலீட்டை ஊக்குவிக்கும் இத்தகைய திட்டங்கள் நமது நாட்டுக்கு மிகவும் முக்கியம் என்பதில் சிறிதேனும் ஐயமில்லை.

அந்த வகையிலே, கொழும்புத் துறைமுக நகரப் பொருளாதாரத் திட்டமும் மிக முக்கியமான ஒன்றாகும். அந்தத் திட்டத்தின்மூலம் எமது நாட்டு மக்களுக்குரிய சகல வசதிகளையும் ஏற்படுத்திக் கொடுத்து, அங்கிருக்கின்ற வியாபார ஸ்தலங்கள் மற்றும் தொழில் புரியும் ஆட்களின் வருமானம் மீதான வரியை நீக்குதல், வருடாந்த வரி இழப்பைப் பிரகடனம் செய்தல் மற்றும் மதிப்பீடு செய்தல், கட்டாயக் கூட்டுத்தாபன வருமான வரி இகல்களைத் தாக்கம் செய்தல் என்பவற்றுடன், கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுவின் செயலாற்று இலக்குகளையும் வேலைவாய்ப்பு, முதலீடு, காலக்கெடு, மேலதிக் கண்காணிப்பு என்பவற்றினூடாக இணக்கத்தையும் கண்காணிப்பையும் பலப்படுத்துவதற்கு இந்தத் திருத்தச் சட்டம் பெரிதும் உதவுமென்பதோடு, சர்வதேச தரங்களுக்கு இணங்க வினைத்திறன்மிக்க வங்கி மேற்பார்வை உள்ளிட்ட ஒழுங்குபடுத்தல் நடவடிக்கைகளையும் இது வலியுறுத்துகின்றது. இவை முக்கியமானது.

கொழும்புத் துறைமுக நகரப் பொருளாதாரத் திட்டத்தின்மூலம் அதிகமான அந்நியச் செலாவணியை ஈட்டிக்கொள்ள முடியும். அங்கே உருவாக்கப்படுகின்ற வியாபாரத் தலங்கள் சர்வதேசத் தரம் மிக்கவையாகவும் நாட்டுக்கு மிகவும் பயனாகவும் அமையக்கூடிய வகையில் இந்தத் திருத்தச் சட்டத்தின்மூலம் ஏற்பாடுகளைச் செய்து கொடுப்பதனூடாக மேலும் வருமானத்தை ஈட்டி எமது பொருளாதாரத்தை முன்னேற்ற முடியும். ஏற்கனவே எதிர்க்கட்சியினர் குறிப்பிட்டதுபோலச் சர்ச்சைகளை உருவாக்கிய இந்தத் துறைமுக நகரம், இன்று பல்வேறு வினைத்திறன் நிறைந்த பொருளாதார மையமாக உருவாகிக்கொண்டு இருக்கின்றது. அந்த வகையில், சர்வதேச முதலீட்டாளர்கள், வியாபார நிறுவனங்கள் எமது நாட்டில் நேரடி முதலீடுகளைச் செய்து எமது நாட்டுக்குச் சிறந்த பெயரை ஏற்படுத்தித் தரவேண்டும். அதனால் நாங்கள் இந்தத் திருத்தச் சட்டமூலத்தை ஆதரித்து, நிறைவேற்றி எமது பொருளாதாரத்தை முன்னேற்றுவோம் என்று கூறி, சந்தர்ப்பம் அளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් අවුරුද්දෙන් පසුව ඉස්සෙල්ලාම පැවැත්වෙන පාර්ලිමේන්තු සැසි වාරයේ පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කරන දවසේ, අභියෝග සියල්ල ජයග්‍රහණය කරගත හැකි සාර්ථක වසරක් බවට මේ වසර පත් වෙන්න කියලා මා ප්‍රථමයෙන්ම ප්‍රාර්ථනා කරනවා.

අද දවසේ Port City එක පිළිබඳව අපි කථාබහ කරනවා. Port City එක පිළිබඳව වසර ගණනාවක් තිස්සේ අපි පාර්ලිමේන්තුවේ විවාද කළා. ඒ පිළිබඳව අපි සංවාද ඇති කර ගත්තා. ඒ වාගේම යෝජනාවලින් විවිධ ව්‍යාපාරිකයන් දිරිගන්වන්නට, ආයෝජකයින් කැඳවා ගන්නට අපි රටක් හැටියට විශාල උත්සාහයක් දැරුවා. මේ වෙනුවෙන් අපේ රටේ මුහුද ගොඩ කරලා අපි ලොකු ආයෝජනයක් කළා. ව්‍යාපාරික වශයෙන් ලෝකයේ අනෙක් රටවල් එක්ක තරග කිරීමට හැකිවන ආකාරයෙන් යම්කිසි කාල වකවානුවක නිර්මාණය කරපු අපේ භූමි භාගයක් තමයි මේ වරාය නගරය. ඉතින්, මේක වෙනම විශේෂ ආර්ථික කලාපයක් විධියට කටයුතු කරන්නට තමයි සූදානම් කරලා තිබුණේ. නමුත් ඒ පිළිබඳව විවිධ චෝදනා පසුගිය කාලය පුරාවටම එල්ල වුණා. විපක්ෂයේ ඉඳගෙන ඔබතුමන්ලා කථා කළා. කොහොම හරි කමක් නැහැ මෙය කාන්තාරයක් විධියට පවත්වාගෙන යනවා වෙනුවට ඔබතුමන්ලා මේ ගෙනෙන සහන ප්‍රමාණය අඩු කරලා හරි ව්‍යාපාරිකයන් ගෙන්වා ගැනීම වැදගත්. මේක කාන්තාරයකින් ඔබ්බට ගෙන ගිහිල්ලා අපේ රටට ආයෝජකයන් පැමිණෙන, අපේ රට දිශාවට ජාත්‍යන්තර අවධානය යොමු වෙන කලාපයක් බවට පත් කරන්න ඔබතුමන්ලාට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මේ පිළිබඳව කරපු චෝදනා අතරේ, යන්තම් සීගිරි ගල බේරුණා. ඔබතුමන්ලාගේ නායකතුමා මේ ගැන කථා කළේ, මේ සඳහා මුහුද ගොඩකර ගන්න සීගිරි ගලත් මදි වෙනවා කියලායි. සීගිරි ගල බේරා ගත්තාට, අද වෙනත් ගල් කර්මාන්තකරුවෝ ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් අපේ 6 වසරේ ඉංග්‍රීසි පොතටත් ගල් කර්මාන්ත, ආප්ප කඩ එහෙම තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඒ වාගේ තැනකට ගෙන යන්න මේ කටයුතු කරන්නේ මොකක් නිසාද? අපේ රටේ පැවතගෙන ආපු අපේ සංස්කෘතිය, අපේ අධ්‍යාපන රටාව අපි මේ කොහෙටද ගෙන යන්නේ? අපි විශ්වාස කරපු, JVP එකෙන් ඔබ්බට ගිහිල්ලා, NPP එක තුළ සිටින අධ්‍යාපනයක් තිබෙන, රට පිළිගත්ත නායිකාවක් විධියට හිටපු අපේ අග්‍රාමාත්‍යතුමියට තමයි විශේෂයෙන්ම මෙකේ චෝදනාව එල්ල වෙන්නේ. මේ එතුමියගේ අමාත්‍යාංශය. අනෙක් පැත්තෙන් එතුමිය සමාජය තුළ පෙනී හිටපු කාරණාවක් තමයි මේ පොත අස්සෙන් මතු වෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව ආණ්ඩුවට ලෙහෙසියෙන් පැනලා යන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් කර්මාන්ත ගැන ගත්තොත්, මම අවුකන ඉපදුණු, හැදුණු වැඩුණු කෙනෙක්. හෙළයේ ගල් කර්මාන්ත ගැන හොඳ ප්‍රසිද්ධ ඉතිහාසයක් තිබෙන, ඇගයිය හැකි, ආඩම්බර විය හැකි කර්මාන්ත තිබිච්ච රටක පුරවැසියෝ විධියට අද අපට කථා කරන්න වෙලා තිබෙන්නේ, මේ කවදාවත් අහපු නැති websites ගැනයි. ඒවා අපේ අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් කරන්න තමයි මේ හදන්නේ. නමුත් වෘත්තීය අධ්‍යාපනයට ගෙන යන්න තමයි අපි කථා කරන්නේ. අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතුයි කියන එක ගැන සංවාදයක් නැහැ. ඒක ධවල පත්‍රිකාවක් මඟින් ඇවිල්ලා, පාර්ලිමේන්තුව දැනුවත් කරලා, ඒක ගැන රටේ සංවාදයක් ඇති කරලා, එහි තිබෙන ගුණාත්මක දේවල් අරගෙන, නරක දේවල් හැලීම තමයි අපේ ඉතිහාසය පුරාවට සිද්ධ වුණේ. හැබැයි, අද මොකක්ද වෙන්නේ? ඒවා මොකුත් නැතුව කෙළින්ම print කරලා දරුවන්ගේ අතටම මේවා යන්න තමයි වැඩ සැලසුවේ. එතකොට, මේකට පුහුණුවීම් කළා, දවස් ගණනාවක්. අනිකුත් විෂය මාලාවත් එක්කත් පුහුණු කළා. හැබැයි, ඉංග්‍රීසි පුහුණු වෙච්ච අයට විතරක් මුදල් ගෙවීමක් සිද්ධ වෙලා තිබෙනවා. එතකොට මේ සියල්ල හරහා පෙනෙන්න තිබෙනවා, මේකට විතරක් විශේෂ අවධානයක් ආණ්ඩුව පැත්තෙන්, නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන්, අමාත්‍යවරියගේ පැත්තෙන් යම්කිසි බලපෑමක් තිබුණාද කියන කාරණය. දැන් CID එකට ගිහිල්ලා හොයන්න කටයුතු කරන්න කලින් මේ පිළිබඳව සොයන්න කටයුතු කළා නම්, මේ පිළිබඳව විනිවිදභාවයක් ඇතිව කටයුතු කළා නම්, වැදගත්.

අපි වෘත්තීය අධ්‍යාපනයට අපේ අධ්‍යාපනය ගෙනියන්න ඕනෑ. හැබැයි, ගණිකා ව්‍යාපාරයට නොවෙයි, එය ගෙනියන්න ඕනෑ. නමුත් ගණිකා වෘත්තියද මේ නීතිගත කරන්නේ? ආයෝජනය කරන්න වත්කම් නැති රටක් විධියට ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුළ බලාපොරොත්තු වෙන්නේ මේ ශරීරයද? වෘත්තීය අධ්‍යාපනයට ගෙනිහිල්ලා අපි ආයෝජනය කරන්න හදන්නේ මේ කර්මාන්තයද? අපේ සංස්කෘතිය ආරක්ෂා කරගෙන මෙවැනි දේවල් සිදුනොවීමට ආණ්ඩුව විධියට කටයුතු කරන්න කියන කාරණය මතක් කරනවා. ඒ වාගේම ආණ්ඩුවේ මේ අධ්‍යාපන ප්‍රතිපත්ති එක්ක තමන්ගේ දරුවන්ට අත් වෙන ඉරණම පිළිබඳව අවධානයෙන් සිටින්න කියලා අපි දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේක නිකම් එක පාරම ආවා කියන්න බැහැ. කරුණු කාරණා ගණනාවක් නිරන්තරයෙන් මේ පැත්තෙන් කියැවුණා. දරුවන්ගේ අතට රුපියල් 5,000ක් දෙන එක, ලිංගික අධ්‍යාපනය ලබන්න අයිතියක් තිබෙනවා කියන කථාව, ලිංගිකව හැසිරීම සම්බන්ධව දඬුවම් කරන්න ගුරුවරුන්ට බැරි වෙන්න, දෙමව්පියන්ට බැරි වෙන්න නීති ගෙනෙන්න කටයුතු කිරීම වාගේ කරුණු කාරණා ගොඩක් අස්සේ මේක වැරදිලා වැටුණා කියලා අපට කියන්න බැහැ. ඒ නිසා අපේ රටේ සංස්කෘතිය විනාශ නොකර කටයුතු කරන්න කියන කාරණය කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අලුත් අවුරුද්දේ අභියෝග ගණනාවකට මුහුණ දෙන අතර, තවත් අලුත් ප්‍රශ්නයක් මාලිමාව, නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ අප මතට ගොඩ කරන්න හදනවා. අපි දැක්කා, වෙනිසියුලාවේ ප්‍රශ්නය. වෙනිසියුලාවේ ප්‍රශ්නය සම්බන්ධව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශය එකක්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රකාශය තව එකක්. ලංකාවේ ජනතාවට මේක ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. මේ සම්බන්ධව නොයෙක් දේවල් කියලා ඔබතුමන්ලාගේ ඡන්ද දායකයින්ව අන්දවන්න ඔබට පුළුවන්. හැබැයි, ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරනකොට එහෙම බැහැ. මොකද, මේ රටේ සහ ලෝකයේ හැමෝම දන්නවා, මේ ආණ්ඩුවේ ප්‍රධාන කොටස්කරුවා ජනතා විමුක්ති පෙරමුණයි කියලා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ අදහස් ප්‍රකාශ කරනකොට, රට ගැන හිතලා ඒ දේ කළ යුතුයි. සමස්ත ආණ්ඩුව විධියට රට ගැන හිතන්න පුළුවන් නම්, ජනතා විමුක්ති පෙරමුණත් අදහස් ප්‍රකාශ කරනකොට, ඒ කාරණය ගැන සැලකිලිමත් විය යුතුයි. ඒ සම්බන්ධව ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමාට සහ ඇමෙරිකානු තානාපතිතුමියට ශ්‍රී ලංකාවේ සැලකිලිමත් පුරවැසියන් සහ ගෝලීය ලාංකික ඩයස්පෝරාවෙන් සෘජුවම දැනුම් දීමක් කර තිබෙනවා, ඒකට reply letter එකකුත් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවේ සිටින ඇමෙරිකානු තානාපතිතුමියටත් මේ පිළිබඳව දැනුවත් කර ලිපියක් යවා තිබෙනවා. එතුමිය දැනුම් දී තිබෙනවා, තව කෙටි කාලයකින් එතුමිය මෙහෙන් අයින් වෙන නිසා අලුතින් එන තානාපතිතුමිය හෝ තානාපතිතුමා මේ සම්බන්ධව ක්‍රියාත්මක වෙයි කියලා. මේකෙන් වෙන්නේ මොකක්ද? නැති ප්‍රශ්නයක් අපේ රට තුළ ගොඩනහා ගන්නයි මේ හදන්නේ.

ජනතා විමුක්ති පෙරමුණට මතවාදයක් තිබෙන්න පුළුවන්. ඒ ගැන වෙනම ප්‍රකාශ කරන්න ගියාම මොකද වෙන්නේ? එක්කෝ උපක්‍රමශීලීව මේකෙන් මඟ හැර ඉන්න ඕනෑ. එහෙම නැත්නම් ඍජුව ප්‍රකාශයක් කරන්න ඕනෑ. එහෙම කරන්නේ නැතුව ජනතා විමුක්ති පෙරමුණෙන් එක මතවාදයකුත්, ආණ්ඩුවෙන් තව මතවාදයකුත් ඉදිරිපත් කර තිබෙනවා.

අපි ඔක්කෝම දන්නවා, මත්ද්‍රව්‍ය ව්‍යාපාරයේ hub එකක් විධියට ලංකාව පාවිච්චි කරන බව. ලෝකයේ වෙනත් රටවලින් තොග වශයෙන් ලංකාවට මත්ද්‍රව්‍ය ගෙනැල්ලා මෙහෙන් බෙදා හැරීම සිද්ධ වනවා කියන එක අපි දන්නවා. එම නිසා අපේ රටේදී මත්ද්‍රව්‍ය කිලෝ ගණන්වලින් හසු වනවා. හුඟාක් වෙලාවට රට ඇතුළට ගෙනෙන ඒ මත්ද්‍රව්‍ය ආපසු අපේ රටින් අපනයනය කිරීම තමයි සිද්ධ වන්නේ. එවැනි දේවල් අස්සේ තමයි වෙනිසියුලාවත් එක්ක, මදුරෝ එක්ක සම්බන්ධතාවක් තිබෙනවා කියන කරුණු ඔප්පු කරලා ඒ අය ඒ ලියුම යවා තිබෙන්නේ. එතකොට මේ හරහා අපේ රටත් නැවත අභියෝගයකට ලක් වන්නේ නැද්ද? මේ නිසා ඉන්දියානු සාගරයේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන රටවල තර්ජනයට අපව ලක් වන්නේ නැද්ද? එම නිසා මාලිමා රජයට අපි කියන්නේ මේකයි. ඔබතුමන්ලා ඕනෑම දේශපාලන මතවාදයක් දරාගන්න. හැබැයි, අපේ රටේ ඡන්ද දායකයන් රවටන්න කටයුතු කරනවා වාගේ ජාත්‍යන්තරය රවටන්න ගිහිල්ලා අපේ රට අර්බුදයකට පත් කරන්න, ජාත්‍යන්තර වශයෙන් සම්බාධකවලට ලක් වෙච්ච රටක් බවට පත් කරන්න කටයුතු කරන්න එපා කියන එක අපි ආණ්ඩුවට මතක් කරනවා.

අර කියනවා නේ, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව පාවිච්චි කරනවාය කියලා බොරු කියන්න. ඒ වාගේම අර කුණාටුව එන්න ඉස්සෙල්ලා ක්‍රියාත්මක කරන්න ඕනෑ දේවල් හරියට කරගන්න බැරිව ගිය නිසා, අශ්වයා ගියාට පසුව ඉස්තාලය වහනවා වාගේ වැඩක් වුණේ. කොවිඩ් කාලයේ වුණා වාගේ මේ ව්‍යසනය නිසා සිදු වුණු අපහසුතා වසාගන්නට, ඒකෙන් පීඩාවට පත් වුණු ජනතාවගෙන් එල්ල වන චෝදනාවලින් ගැලවෙන්නට එතුමා ඇවිල්ලා පාර්ලිමේන්තුව ඇතුළේ ලොකු කථා ගණනාවක් කිව්වා. වහලේ තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා වාගේ කථා කියමින් ජනතාව තුළ අපේක්ෂා කන්දක් ගොඩනැඟුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් ඉන්නේ අනුරාධපුරයේ. ජනාධිපතිතුමා පැමිණි අනුරාධපුරයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මමත් සහභාගි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ආපදාවට ලක් වුණු පවුල් සංඛ්‍යාව 22,838ක්. හැබැයි, මේ අයගෙන් වන්දි දෙන්න තෝරාගෙන තිබෙන්නේ පවුල් දහතුන්දහස් ගණනයි. එතැනින්ම පවුල් 10,000කට වැඩිය හැලිලා. ඊළඟට, රුපියල් 50,000 දෙන්න තේරිලා තිබෙන්නේ ගෙවල් විසිදහස් ගණනින් පන්දහස්තුන්සිය ගණනක්. ආපදාවට පත් පවුල්වල පාසල් යන දරුවන් 10,575ක් විතර ඉන්නවා කිව්වා. හැබැයි, ඒ අතරින් පාසල් දරුවන් හාරදහස් ගණනකට තමයි මේ දීමනාව ලැබෙන්නේ. මෙහෙම ඒ අය හැලිලා තිබෙන්නේ ඇයි? එකක්, දේශපාලන වුවමනාව. අනෙක් පැත්තෙන්, ඒ ජනතාවට එම දීමනා ලබා නොදීමට, ඒ අය හලන්නට මේගොල්ලන් විවිධ නිර්ණායක නිර්මාණය කරනවා.

ඊළඟට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවට බලපාන තවත් ගැටලුවක් ගැන මා සඳහන් කරන්න කැමැතියි. අනුරාධපුරයේ ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනීමට එන පිළිකා රෝගීන්ට අවශ්‍ය කරන radiotherapy machine එක මේ වසරේ ජනවාරි මුල සිට ක්‍රියාත්මක වන්නේ නැහැ කියලා; එම යන්ත්‍රය ප්‍රමිතියට අනුව හරි විධියට ක්‍රියාත්මක වන්නේ නැහැ කියලා දන්වා තිබෙනවා. අලුතින් ගොඩනැඟිලි හදලා ටෙන්ඩර් කරලා මේ අවුරුද්දේ මේ යන්ත්‍ර ලබා ගන්න අපට හැකියාවක් නැහැ. තිබෙන යන්ත්‍රය අක්‍රිය වනකොට වසරකට වැඩි කාලයක සිට වෛද්‍යවරුන් මේ සම්බන්ධව ඉල්ලීම් කර තිබෙනවා. හැබැයි ආණ්ඩුවට තවම බැරි වෙලා තිබෙනවා, ඒ වෙනුවට තාවකාලිකව, එහෙම නැත්නම් ඊට වඩා කුඩා ප්‍රමාණයක යන්ත්‍රයක් හෝ ලබා දීමට. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින පිළිකා රෝගීන් වැඩි පිරිසක් පැමිණෙන්නේ එම රෝහලට. ඒ වාගේම වසරකට පිළිකා රෝගීන් 1,600ක් විතර අලුතින් එම රෝහලට යොමු වනවා, ප්‍රතිකාර ලබා ගැනීමට. දවසකට 100කට එහා ගිය රෝගීන් ප්‍රමාණයක් මේ radiotherapy machine එක භාවිතයෙන් ප්‍රතිකාර ලබා ගන්නවා. නමුත් එම යන්ත්‍රය ලබා දීමට ආණ්ඩුව කටයුතු කර නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ ගමයි කියන තඹුත්තේගම තිබෙන රෝහලේ operation theatre එකට පදවිය රෝහලේ operation theatre එකේ තිබෙන බඩු භාණ්ඩ ටික, මැෂින් ටික ගෙනෙනවා, ඇඳන් ගෙනෙනවා. ඒ, ජනාධිපතිතුමාගේ ගම නම්, ඒකටවත් අවධානය යොමු කරන්න ඔබතුමන්ලාට බැරිද?

එම නිසා අටුව කඩලා පුටුව හදන කටයුත්ත කරන්නේ නැතිව, පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන්න අනුරාධපුර රෝහලට අවශ්‍ය ඒ මැෂින් එක වාගේම තඹුත්තේගම රෝහලේ operation theatre එකත් දියුණු කළ යුතුයි. තඹුත්තේගම රෝහල කියන්නේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙවැනියට තිබෙන ලොකුම රෝහල. එම නිසා ඒ ගැනත් අවශ්‍ය අවධානය යොමු කරන්න කියන කාරණය මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිවිල් ආරක්ෂක භටයින් පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මට මතක විධියට, මේ අයට කිව්වේ රුපියල් ලක්ෂ 30ක විතර වන්දියක් දීලා ඒගොල්ලන් අයින් කරන්න පුළුවන් කියලායි. ඒක සාධාරණ නැහැ කියලා ඒ ගැන කතිකාවක් ඇති වුණාම, දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මේ අය එහාට මෙහාට මාරු කරලා මේ අයට වන්දියකුත් නොදී රැකියාව දාලා යන තැනට පත් කරන්න කටයුතු කරමින් ඉන්නවා. මේ අය හුරු වෙලා සිටි සාම්ප්‍රදායික ක්‍රමයක් තිබෙනවා. මේ අය පිළිබඳව මම ඔබතුමාට විග්‍රහ කරලා කියන්න අවශ්‍ය නැහැ. මේ අය එදිනෙදා අවශ්‍යතා වෙනුවෙන් බඳවා ගත් ගමේ හිටපු සාමාන්‍ය මිනිස්සු. මේ, තුවක්කුවක් හසුරුවන්න විතරක් පුහුණුව ලබා දීලා අවශ්‍යතාවට බඳවා ගත් පිරිසක්. ඒ විධියට බඳවාගෙන තමයි මේ අය සේවය කරගෙන ආවේ. දැන් මේ අය අයින් කරන්න වුවමනාවක් තිබෙනවා නම් සාධාරණ වන්දියක් දීලා ඔවුන්ව අයින් කරන්න කටයුතු කරන්න. එහෙම නැතිව, මේ වාගේ එහාට මෙහාට ඇදලා, ඒ අය මානසිකව වට්ටලා, තමන්ගේ සාමාන්‍ය ජීවන රටාව වෙනස් කරලා, වෘත්තිය දාලා යන තැනට පත් නොකරන්න කටයුතු කරන්න කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.35]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ පාර්ලිමේන්තුවේ විවාදයට ලක් කරන්නේ Colombo Port City Economic Commission Act, No. 11 of 2021 සම්බන්ධ Amendment එකක් පිළිබඳවයි. මේ Amendment එකේ අරමුණ හැටියට ප්‍රධාන වශයෙන්ම වැදගත් කාරණයක් තිබෙනවා. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ හැකියාවක් තිබුණා, වරාය නගරයට ගෙන එන ආයෝජනවලට යම් tax incentives, එහෙම නැත්නම් බදු සහන ලබා දෙන්න. ඒ කියන්නේ, original

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මහතා]

Colombo Port City Economic Commission Act එකේ 52(3) වගන්තිය යටතේ මේ බදු සහන ලබා දීමේ හැකියාව තිබුණා. එතකොට මේ පනතට ගෙන එන අලුත් සංශෝධනය යටතේ විශේෂයෙන්ම සිද්ධ කරන්නේ මේ හැකියාව තවදුරටත් ගුණාත්මක වශයෙන් ක්‍රියාත්මක කිරීමයි. ඒ කියන්නේ බදු සහන ලබා දීමේ හැකියාව ඉවත් කරලා නැහැ. මුදල් අමාත්‍යාංශය මඟින් මෙහිදී බදු සහන ලබා දීමේ හැකියාව කොමිසමට ලබා දී තිබෙනවා. නමුත්, ඒ බදු සහන ලබා දීමේ හැකියාවට යම් යම් රෙගුලාසි ප්‍රමාණයක්, යම් යම් සීමාවන් ප්‍රමාණයක් එකතු කර තිබෙනවා. මොකද, බදු සහන ලබාගෙන ලංකාවට ආයෝජන ගෙනාවාට, ඒ ආයෝජනවලින් දීර්ඝ කාලීනව ආර්ථිකයට ලැබෙන වාසිය කුමක්ද කියන එක නිශ්චය කර ගන්න අමාරුයි. මොකද, බද්දක් කියන්නේ රටේ ආර්ථිකයට එකතු වන ආදායමක්. ඒක රජයේ ආදායමේ කොටසක්. රජයේ ආදායමේ කොටසක් අපි ආයෝජනයක් වෙනුවෙන් කැප කරනවා නම්, ඒ සම්බන්ධයෙන් අපට යම්කිසි නිශ්චිත නිර්ණායක තිබෙන්නට අවශ්‍යයි, ඒක සිද්ධ කරන්නේ මොන පදනමෙන්ද කියලා. ඒ අනුව තමයි මේ 52(3) කියන වගන්තිය තවත් qualify කරලා මේ බදු සහන ලබා දීමේදී මුදල් අමාත්‍යාංශයේ තාක්ෂණික විශ්ලේෂණයක් කිරීම අනිවාර්ය කරලා තිබෙන්නේ. ඒ වාගේම යම්කිසි උපාය මාර්ගික ආයෝජනයක් රට තුළට එනවා නම් එහිදී අවම ආයෝජන ප්‍රමාණයක්, අවම ආයෝජන මට්ටමක්, ඒ වාගේම අවම රැකියා නිර්මාණය කිරීමේ මට්ටමක් වැනි නිර්ණායක යටතේ මේ බදු සහන ලබා දීමේ හැකියාව අලුත් සංශෝධන යටතේ ඇති කර තිබෙනවා. එතකොට blanket, එහෙම නැත්නම් කිසිදු කොන්දේසියක් රහිතව, කිසිදු නිර්ණායකයක් රහිතව බදු සහන ලබා දීමේ ක්‍රමවේදය වෙනුවට යම්කිසි නිශ්චිත නිර්ණායක යටතේ, නිශ්චිත ආයෝජන මට්ටම් යටතේ, නිශ්චිත රැකියා නිර්මාණය කිරීමේ පදනම් යටතේ බදු සහන ලබා දීමේ හැකියාවක් ඇති කිරීම තමයි මේ සංශෝධනයෙන් මූලික වශයෙන්ම සිද්ධ කරන්නේ.

ඊට අමතරව දීර්ඝ කාලීනව, කාලයෙන් කාලයට මේ ආයෝජනය ආර්ථිකයට ඵලදායී ලෙස සම්බන්ධ වනවාද, මේ ආයෝජනය තුළින් යම්කිසි වාසියක් ආර්ථිකයට ලැබෙනවාද, මේ කියන අරමුණු වෙනුවෙන් මේ ආයෝජනයෙන් කටයුතු සිදුවනවාද කියන කාරණා, එහෙම නැත්නම් මෙහි strategic importance එක ගැන අපි බලන්න ඕනෑ. ඇත්තටම උපාය මාර්ගිකව අපි මේකට දෙන සහනයේ වැදගත්කම කාලයෙන් කාලයට monitor කිරීමේ හැකියාවත් අලුත් සංශෝධන යටතේ ඇති කර තිබෙනවා. මූලික වශයෙන්ම මෙන්න මේ කාරණයත්, Colombo Port City Economic Commission යටතේ තිබෙන සේවකයන්ගේ බදු ගෙවීම් වාගේ දේවල් නැවතත් රටේ පවතින නීතිය තුළට රැගෙන ඒමේ වැඩක්, එවැනි කාර්යයක් තමයි මේ සංශෝධන යටතේ සිද්ධ කරන්නේ.

ඒක නිසා වරාය නගරයට - Colombo Port City එකට - ආයෝජන ගෙන ඒම අධෛර්යවත් - discourage - කිරීමක් හෝ සීමා කිරීමක් වෙනුවට ඇත්තටම ඒ ආයෝජන ඵලදායීව රටේ ආර්ථිකයට සම්බන්ධ කරගන්නේ කොහොමද කියන එක ගැන හොඳ ක්‍රමවේදයක් - scheme එකක් - සකස් කිරීම සඳහා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීතුමා ගොඩක් දේවල් කිව්වා. සමහර දේවල් ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන අහගෙන ඉන්න සිදුවීම ගැන විශේෂයෙන් මන්ත්‍රීවරු ලජ්ජා වෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව තුළට ඇවිල්ලා ඍජුව ඒ වාගේ කතන්දර කියන්න පුළුවන් සහ ඒවා හිනා වෙවී අහගෙන ඉන්න සමහර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් විපක්ෂයේ ඉන්නවා. මේ ගැන අපි ලජ්ජා වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව හැටියට මේක අපි ලජ්ජා වෙන්න ඕනෑ කාරණයක්. මේ ගැන දවසක්, දෙකක් නොවෙයි, අදත් කිව්වා. ඒ මන්ත්‍රීතුමා Colombo Port City එක යටතේ අපි ආයෝජන ගෙනෙන එක ගැන තත්පර 30ක් කථා කරලා, ඊට පසුව වෙන කතන්දර ගොඩක් කිව්වා. ගැලරියේ ළමයි ඉන්නවා, මේවා මාධ්‍යයේ පළ වෙනවා, මේවා online බලන මිනිස්සු ඉන්නවා, ඒ මිනිස්සුන්ට අහගෙන ඉන්න පුළුවන් දේවල් ද මේ කියන්නේ කියලා මන්ත්‍රීවරු හිතන්න ඕනෑ. තමන් ළමයින්ගේ සදාචාරය, සංස්කෘතිය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මේවා අහගෙන ඉන්න ළමයි මොනවාද හිතන්නේ කියන එක ගැන හිතන්න ඕනෑ. ළමයින්ගේ සදාචාරය, සංස්කෘතිය ගැන කියමින් තමයි මේවා කියන්නේ. මෙතැනට ඇවිල්ලා කුණුහරුප කියන්න කාටවත් free licence දීලා නැහැ. පොඩ්ඩක් ඒ ගැන කල්පනා කර බලන්න ඕනෑ. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් ලබා දීලා තිබෙන්නේ මිනිස්සුන්ට අහගෙන ඉන්න පුළුවන් දේවල් කියන්නයි; වැදගත්කමක් තිබෙන දේවල් කියන්නයි. ඒක කියන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා කුණුහරුප කියනවා. It is utter filth, Hon. Presiding Member. If somebody was saying this outside Parliament, මේක පාර්ලිමේන්තුවෙන් එළියේ කවුරු හරි කිව්වා නම් ලබා දෙන ප්‍රතිචාරය මොකක්ද? මේවා කොහොමද පාර්ලිමේන්තුව ඇතුළේ කියන්නේ? ඒ ගැන අපි ලජ්ජා වෙන්න ඕනෑ; අපේ මන්ත්‍රීවරු ලජ්ජා වෙන්න ඕනෑ; මේ ගරු සභාවම ලජ්ජා වෙන්න ඕනෑ, මේ වාගේ දේවල් අහගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙන එක ගැන. සංස්කෘතිය, සදාචාරය සහ දරුවෝ ගැන කථා කරන්නේ. නමුත්, කුණුහරුප කියන්නේ. මට තේරෙන්නේ නැහැ, අපේ මන්ත්‍රීවරුන්ට ඇති වෙලා තිබෙන මානසික විකෘතිය මොකක්ද කියලා. ඇත්තටම මේ තත්ත්වය කනගාටුදායකයි. කෙසේ වෙතත්, ඒ මන්ත්‍රීතුමා කිව්වා වාගේ කිසිම ආකාරයකින් ආයෝජන discourage කිරීමක්වත්, සීමා කිරීමක්වත් මේ පනත හරහා සිද්ධ වෙන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත හරහා සිද්ධ වෙන්නේ මේක streamline කරන එකක්; තවදුරටත් ඵලදායී කිරීම හරහා ආර්ථිකයට දීර්ඝ කාලීනව වාසි ලබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීමක් තමයි මේ සංශෝධනය හරහා සිද්ධ කරන්නේ. ඒක, එක කාරණයක්.

මම බොහොම කෙටියෙන් ප්‍රතිචාර දක්වන්න කැමැතියි, වෙනිසියුලාව සම්බන්ධයෙන් කරපු කථාව පිළිබඳව. මම දැක්කා, මේක සමාජ මාධ්‍යවලත්, අනිකුත් මාධ්‍යවලත් පළ වෙනවා, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශය සහ රජයේ ප්‍රකාශය කියලා. Cabinet Press Conference එකේදී ඇමතිතුමා ඒකට බොහොම නිශ්චිත උත්තරයක් දීලා තිබෙනවා, පක්ෂවලටත් ස්ථාවර අදහස් දැරීමේ අයිතිය තිබෙනවා, ඒ වාගේම රජයේ ස්ථාවරය රජය හැටියට ප්‍රකාශ කර තිබෙනවා කියා. දැන් මෙතැන තිබෙන්නේ සාරාත්මකව, හරයාත්මකව රජයේ ස්ථාවරය සහ මේ කියලා තිබෙන මොකක් හරි ස්ථාවරයන් අතරේ වෙනසක්මක්. Political party එකකට යමක් කියන්න තිබෙන විධියයි, රජයක් යමක් ප්‍රකාශ කරන විධියයි අතර බොහොම පැහැදිලිව ව්‍යුහයේ සහ භාෂාවේ වෙනස්කම් තිබෙන්නට පුළුවන්. ඒකේ ගැටලුවක් නැහැ. නමුත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලධර්මවලට - principlesවලට - අනුකූලව, ජාත්‍යන්තර නීතියට අනුකූලව රටවල් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක කවුන්සලය කටයුතු කරයි කියලා තිබෙන බලාපොරොත්තුව රජයේ ප්‍රකාශයෙන් බොහොම පැහැදිලි වෙනවා. That is in line with international statements. That is what every country expects; මේක තමයි හැම රටකම බලාපොරොත්තුව. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලධර්මවලට රටවල් හැටියට අපි එකඟ වෙලා තිබෙනවා, ස්වෛරීත්වය පිළිගන්නවා, ජාතීන්ගේ නිදහස පිළිගන්නවා කියලා. රටවල් හැටියට අපි එකඟ වෙලා තිබෙන ප්‍රතිපත්ති, මූලධර්මවලට අනුව කිසිම රටකට තවත් රටක් ආක්‍රමණය කිරීමේ හැකියාවක් නැහැ. ඒක මූලධර්මවලට විරුද්ධයි. ඒක බොහොම නිශ්චිතයි. එහෙම මූලධර්මවලට

විරුද්ධව කටයුතු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ ආරක්ෂක කවුන්සලයට. ඒ ආරක්ෂක කවුන්සලය UN Charter එකේ principlesවලට අනුකූලව කටයුතු කරයි කියන අපේක්ෂාව රජය ඉතාම පැහැදිලිව සන්නිවේදනය කර තිබෙනවා. මොකද, රජයක් වුණාම ඒ සම්බන්ධව ස්ථාවරයක් ප්‍රකාශ කරන්න ඕනෑ නිසා. එතකොට අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට සහ සමහර වෙලාවට මාධ්‍යවල ඉන්න අයට පවා මේවා තේරෙන්නේ නැද්ද කියලා මට හිතෙනවා. UN Charter එක කියන්නේ මොකක්ද, principles කියන්නේ මොකක්ද, ඒවා violate කරනවා කියන්නේ මොකක්ද, රටකට තව රටක් ආක්‍රමණය කරන්න පුළුවන්ද, ඒකට ජාත්‍යන්තර නීතියේ හැකියාව තිබෙනවාද කියන මේවා ගැන යම්කිසි අදහසක් එක්ක නේ කථා කරන්න ඕනෑ.

එහෙම කථා කරන්නේ නැතුව ඉතාම සරල ලෙස වචන දෙක තුනක් කථා කරන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් පුරුදු වෙලා තිබෙනවා. ඒ වාගේම මාධ්‍ය තුළින් මේවා වාර්තා කරද්දීත් මේක අරකට විරුද්ධයි වාගේ ඉතාම confusing විධියට කථා කරනවා. UN Charter එකේ principles violate කරනවාට ඕනෑම රටක් විරුද්ධයි; අපිත් විරුද්ධයි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මේ කාරණයත් කියා ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මන්ත්‍රීවරු හැටියට public policies සම්බන්ධයෙන් මේ වාගේ සරල දේවල්වත් අපට මේ සභාව තුළ කථා කරන්න බැරි නම් තත්ත්වය මොකක්ද? ඒ වාගේම, නිකම් cheap political pointsවලට අපි මේවා කථා කරන්න පටන් ගත්තොත්, ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ කථා කරන දේවල් අහන්න හිතෙන්නේත් නැහැ. මෙතැනට ඇවිල්ලා කුණුහරුප කියනවා, public policies ගැන කථා කරන්න විධියක් නැහැ. මම හිතන විධියට, මේක පාර්ලිමේන්තුව තුළ consider කරන්න ඕනෑ. කථානායකතුමාගේ සිට අපි හැමෝම මේක consider කරන්න ඕනෑය කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ප්‍රථමයෙන්ම ලක්වාසී සියලු ජනතාවට සහ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලු දෙනාටම 2026 අවුරුද්ද සුබ අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

Sir, I think, we are getting onto a very important topic, about the development of the Colombo Port City Economic Commission. I may preface it by mentioning that the country's economic situation could be buttressed with the effective implementation of the operations of the Colombo Port City.

One of the main things that come up in that is the IMF's interference in the fiscal policy of our country. Entering into an Agreement with Sri Lanka does not necessarily mean that the IMF could basically dictate over or navigate our economic activities. Yes, there is an Agreement. While the Agreement is there, with revenues being earned and expenditure being very well controlled by the Government, that gives flexibility for us to bring our own investors into the country. If the investors who come to this country are blocked by the IMF, they must be told that the Agreement on debt sustainability they have imposed on the country would also be in jeopardy, if we are unable to attract investments. So, that is the most important thing I want to start with because I think we missed the woods for the trees.

මේ අවස්ථාවේදී මට කියන්න තිබෙන වැදගත්ම දේ මෙයයි. අපි යම් විධියකට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගිවිසුම්ගත වුණාට ඒගොල්ලන් එක්ක බැඳිලා නැහැ, මේ කියන හැම දෙයම ඒ ආකාරයෙන්ම කරන්න. අපට ආයෝජන ගේන්න බැරි නම්, ආයෝජන ගේන්න දිරිගැන්වීම් කරන්නේ නැත්නම්, අපි ලංකාවට ආදරෙයි කියලා කවුරුවත් ඇවිල්ලා මේ රටේ ආයෝජනය කරන්නේ නැහැ. අපි මේකට යටත් වෙලා කටයුතු කරන්නේ ඇයි කියලා මම ප්‍රථමයෙන්ම මේ ආණ්ඩුවෙන් අහනවා.

අපි Port City එක හදලා තිබෙන්නේ අලුත් ආයෝජන කලාපයක් ලෙස සලකායි. 1977දී ජේ.ආර්. ජයවර්ධන ඇවිල්ලා, මේ රටේ GCEC - Greater Colombo Economic Commission - කියලා එකක් ඇති කළා. ඒ මඟින් අද BoI - Board of Investment - එක ඇති කරලා තිබෙන්නේ පිට රට සිටින ආයෝජකයින් මේ රටට ගෙන්වා ගන්නයි. අපේ රටේ තිබෙන සීමිත සම්පත නිසා හෝ ආයෝජනය කරන්න තිබෙන සීමිත හැකියාව නිසා අපි තාක්ෂණය වාගේම ආයෝජනත් වෙනත් රටවල්වලින් ගෙනෙනවා. ඒ සඳහා තමයි BoI එක ඇති කරලා තිබෙන්නේ. දැන් ඊටත් වැඩිය පුළුල් වෙලා තිබෙන නිසාත්, අපේ රටේ තාක්ෂණය සහ ඉතුරු කිරීමක් නැති නිසාත් අපි ආයෝජන ගෙන්වා ගන්න දිරිගැන්වීම් කරනවා.

BoI එක මදි නිසා Port City එක ඇති කරලා තිබෙනවා. දැන් Port City එකට දීලා තිබෙන දිරිගැන්වීම් බලන්න. Colombo Port City Economic Commission එක හදපු අවස්ථාවේදී කිව්වා, විකුණන්න බොහොම අමාරුයි කියලා. එම නිසා මම ආණ්ඩුවට යෝජනා කරන්නේ, මේවා මීට වැඩිය දිරිගැන්වෙන විධියට කටයුතු කරන්න අවශ්‍යයි කියන එකයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම මේ වසරේ දෙසැම්බර් 26වැනි දා හෝ 31වැනි දා වනකොට අවසන් වෙනවා. ඉතින්, අපි ආයෝජන ගේන්න ඒ දවස වෙනකල් ඉන්න අවශ්‍ය නැහැ. අපි දැන් ගිවිසුම් සහගතව කටයුතු කරලා ඉදිරියට යන්න ඕනෑ. මේ රට වල්මත්ව පාලනය කරන එක තමයි ඒ අයට තිබෙන භය. පාලනය නිසියාකාරව ක්‍රියාත්මක කිරීම තමයි මම හිතන විධියට මුලින්ම කළ යුතු වෙන්නේ.

ඒ වාගේම අපේ රටට ආයෝජන ගෙන්වා ගැනීමට, the overall economic status of our country must be improved.

[ගරු රවී කරුණානායක මහතා]

Today, we found out that trading at the Colombo Stock Exchange was stopped at 9.51 a.m. Trading was stopped due to an error of technical nature, they say. A new company came into trading and its initially imposed share price was Rs. 724 and it went up to Rs. 25,000! So, it created a problem of technical nature. Meanwhile, there was another company that was taking control of 51 per cent shares of another reliable company. For some reason or the other, it had got stopped. That problem of technical nature could have been rectified. But, why had the day's trading been stopped?

ඉතින්, අපි Port City එක විකුණන්න ගිහිල්ලා මේ වාගේ දේවල් ඇති වුණාම සමස්ත ලෝකය බලන්නේ ලංකාවේ මේ වාගේ ආයෝජන කරන්න හැකියාවක් තිබෙනවාද, නැද්ද කියලායි. මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන දවසේම Colombo Stock Exchange එකේ මෙහෙම වෙන එක මම හිතන විධියට එච්චර ඔබින්නේ නැහැ. අපි මේවා තමයි නිවැරදි කරන්න අවශ්‍ය වන්නේ.

ඒ වාගේම අපි මේ අවස්ථාවේ බදු දිරි ගැන්වීම් ගැන කථා කරනවා. දැන් අපි කොහේටද මේක ගෙන යන්න අවශ්‍ය වන්නේ? KPMG එකේ සුරේෂ් පෙරේරා මැතිතුමා බොහොම දක්ෂ, පළපුරුද්දක් තිබෙන පුද්ගලයෙක්. අපි දැන් Pillar Two challenges ගැන බැලුවොත්, අපි මෙහේ සියයට හතහමාරක බදු දෙනවා කියලා කිව්වාට, අපේ OECD's Pillar Two challenges යටතේ බදු අය කරන්න පුළුවන් හැකියාව සියයට 15කට යනවා. ඉතින්, අපි සියයට හතහමාරක් පිටරට කට්ටියට හෝ multinational company එකකට මෙහේ දීලා අන්තිමට එයාට හතහමාරක් දුන්නාට, එයාගේ මවු රටේ හැකියාව තිබෙනවා සියයට 15න් හතහමාර අඩු කරලා ඒ හතහමාර ඒ වාගේ රටකට ගන්න. ඒ කියන්නේ එංගලන්තය වෙන්න පුළුවන්, ඇමෙරිකාව වෙන්න පුළුවන්, ජපානය වෙන්න පුළුවන්. ඒ ඉතිරි ප්‍රමාණය ඒකෙන් ගන්න. ඉතින්, අපි මීට වඩා සූක්ෂ්මව කටයුතු කරන්න අවශ්‍යයි.

I beg that the Colombo Port City Economic Commission would understand that multinationals which trade more than Sterling Pounds 750 million has to get a rectification in relation to this particular Pillar Two problem that comes up. So, there is no point in giving them only tax advantages; we need to give them non-tax benefits as well. That gives market access. We must show them that Sri Lanka is a geographically well-placed location.

Then, look at the market access we have to India. The Indo-Sri Lanka Free Trade Agreement gives us a wonderful opportunity to take any person who invests in Sri Lanka to the Indian market. That is normally a closed market, but owing to the fact that we have a very strong Indo-Sri Lanka Free Trade Agreement, we could ensure that anybody who comes and invests here could go into the Indian market, using value addition of more than 35 per cent.

The Port City is basically being marketed as an offshore marketing point. Well, that is absolutely essential. While that fact is there, the Colombo Port City Economic Commission is trying to become a real estate entity. Now, the fact is, that basically needs over-marketing on real estate and under-marketing is the business aspect. We need offshore investments. The Port City could be headquartered as a place which ensures offshore banking and offshore manufacturing, bringing in global earnings here. That is what needs to be targeted. Singapore is a standing example. In Bahrain, Thailand, Malaysia, the Bahamas, in all such places, global earnings have become tax- free. So, if Sri Lanka joins late as the last player into the investment climate, what is it-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව විනාඩි තුනක් විතර දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

What lacks here is a clear credible value proposition. There needs to be a unique selling proposition. At this particular moment, we must set it up either as a financial hub with offshore services or as a manufacturing hub, a place that collects global earnings. That is what needs to be done. With regard to the Port City, after the interference of the IMF, they say they cannot give tax holidays for strategic development. Well, yes, that is good; then, that could be controlled. We do not ask you to give complete, *ad-lib* benefits. First, we must strategize as to what we need to give. There is no point in saying that we are going to give a seven-and-a-half per cent tax because no multinational would get duped into that. We have to give them non-tax benefits.

Then, the trust deficit. Sri Lanka's neighbouring partner India is one of the biggest assets it has. Like what Hong Kong is to China, Sri Lanka could be to India. Today, India is the fourth largest economy in the world with US Dollars 4.2 trillion worth of investments and driving forward into the next year, they may become the third largest economy in the world beating Germany. So, getting into 2 or 3 per cent of the total Indian market would be far in excess of what we could hope for. So, that is why we have got to take the distrust out, showing that this is not one-country operation, but a neutral operation which basically creates a South Asian neutral platform for capital trade and risk management. Then, ensure that we give out a neutrality design, look at the time zone advantages, the cost-efficient, non-incentive dependence we could market and our geographically well -positioned location. The authorized businesses should basically be more incentivized to come in and take advantage of. We are far too over-regulated.

The role that the Central Bank plays is such that any bank which considers coming here would think ten times before coming in. The Central Bank has to be a facilitator, not an entity that regulates, stopping the operations coming into the country.

Likewise, the staff. We have a very ingenious staff.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවකින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

So, ensure that we maximize the talents of the staff in Sri Lanka; ensure that we would be able to take this talent out and say, "We have a very good, efficient staff working here."

Then, the other matter is, delay in getting approvals. Whether it be under registration of companies or whether it is a BoI operation or a Port City operation, we still find that an exporter basically takes three to nine months to get approvals in this country. I will give you one example. Today I took part in the Ministerial Consultative Committee on Finance, Planning and Economic Development presided by the President. There was an investor who wanted to bring vehicles from America, get them converted from left-hand driven to right-hand driven and export to another country. To start that, they wanted the approval of the President. So, here is a situation where, when we could grab investments into the country, we are losing out owing to regulations. So, this over-regulation would destroy our country. Foreign exchange regulations are not necessary. If we have the same regulations on business operations in other parts of Sri Lanka applied to the Port City, then why should they come into the Port City?

Sir, I know we are fighting against time. Finally, all I want to say is, ensure that we incentivize the new investors who come in. Make the Port City service-oriented and manufacture-oriented. We need to tap into their investments. We are not the only country which is willing to attract investments. As a result, all what I want to say is, ensure that we give out not only tax incentives, but also non-tax based concessions.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරමු, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ කථා කරන මොහොතේ Sri Lanka Bureau of Foreign Employment කියනවා, Sri Lankans ලා 350,000ක් මේ අවුරුද්දේ එළියට යනවා කියලා. පුද්ගලයන් 350,000ක් රටින් පිට යනවා නම්, මේ රටේ වැඩ කරන්නේ කවුද? ඉතින්, මේක තමයි ඉස්සෙල්ලාම දිරිගන්වන්න අවශ්‍ය වන්නේ. Port City එක ඉතාම සාර්ථකව සංවර්ධනය කරලා, ආයෝජකයන් දිරිගන්වලා මේ රටට බිලියන තුන හතරක ආයෝජන ගෙනෙන්න ඕනෑ කියලා කියනවා වාගේම, ඒක ක්‍රියාත්මක කරලා පෙන්වන්න කටයුතු කරන්න ඕනෑ කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරනවා.

මම බොහොම අගය කරනවා, ඔබතුමා මට අවස්ථාව ලබා දීම. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[3.57 p.m.]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
Hon. Presiding Member, I am pleased to speak about the proposed Amendments to the Colombo Port City Economic Commission Act, No. 11 of 2021. Historically, Sri Lanka used lengthy tax holidays and broad tax exemptions to lure foreign investors and FDIs. Especially, strategic development projects including those in the Colombo Port City often operated without transparent, rules-based criteria, which raised concerns about the fiscal cost and governance. Therefore, with the proposed Amendments we are introducing today, there will be structured benefits to the economy such as corporate tax holidays, which were earlier proposed to be for 20 to 30 years and will now be shortened for eight to 15 years.

There were also VAT exemptions, Import Duty exemptions, waivers of levy for chosen projects and full employment tax exemptions. Those are certain concerns that we have had. If we take one real-world example, let us say that the ABC Company receives a 25-year Corporate Tax exemption plus a 10-year concessionary period of exemption from VAT and Import Duty for a mixed-use development. That will have long-term impact on our economy. As the previous speaker mentioned, that will definitely offer some attraction to foreign investors, but there is a fiscal cost and revenue loss on granting such long-term lavish exemptions to investors. Those extended exemptions would impact on public revenue, especially when Sri Lanka faces IMF debt reform obligations.

Also, there was lack of transparency and consistency. Many exemptions were discretionary and were granted without clear rules, attracting criticism domestically and from international lenders. Also, uneven benefits were given to different stakeholders. So, small businesses and capital-intensive sectors struggled to qualify for such benefits. Employment and incentives were limited in that sense.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගොඩනඟන කොට ආයෝජන අතිශයින්ම තීරණාත්මකයි කියලා. විශේෂයෙන්ම, සෘජු විදේශ ආයෝජන. Port City එක වැනි ව්‍යාපෘතියකින් අප බලාපොරොත්තු වන්නේ එවැනි ආයෝජන ආකර්ෂණය කර ගන්න තමයි. අපි ඉදිරි දශකය තුළ සියයට 7ක, සියයට 8ක ආර්ථික වෘද්ධියක් පවත්වාගෙන යන්න නම් අනිවාර්යයෙන්ම පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගත යුතුයි. මොකද, රාජ්‍ය අංශයට මේ සමස්ත ආයෝජන දරන්න බැහැ. අපි දන්නවා, සාමාන්‍යයෙන් රජයේ

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ආයෝජන තිබෙන්නේ සියයට 3ක, 4ක වාගේ මට්ටමක බව. ඒ නිසා අපි පෞද්ගලික අංශයේ ආයෝජන සියයට 90කට වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගත යුතුයි. එම ආයෝජන ආකර්ෂණය කරගෙන අපේ ආර්ථිකයට ඒවායින් ලැබෙන ප්‍රතිලාභය කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. මෙවැනි තත්ත්වයක් හමුවේ තමයි අපි මේ වාගේ Amendments කිහිපයක් ඉදිරිපත් කරන්නේ, Colombo Port City Economic Commission Act එකට. ඒ ආයෝජනවලින් අපේ ආර්ථිකයට දීර්ඝ කාලීනව ප්‍රතිලාභ ලැබෙන්නේ අල්ප වශයෙන් නම්, මා හිතන විධියට එවැනි ආයෝජන ආකර්ෂණය කර ගන්න කොට ඒ පිළිබඳව අපි නැවත සලකා බැලිය යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් අමතර විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා මුලින් සඳහන් කළා වාගේ පසුගිය රජයන් යටතේ ව්‍යාපෘති ආවාම අවුරුදු 20ක, 30ක tax holidays දුන්නා. එවිට බදු ආදායම් විශාල වශයෙන් අපට අහිමි වුණා. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක යම් වැඩසටහනක ඉන්නේ. මේ වසරේ අපේ අය වැයත් එක්ක, අප ඉදිරිපත් කරපු බදු අහිමි වීම පිළිබඳ ප්‍රකාශය තමයි මා අතේ මේ තිබෙන්නේ. 2022/2023 අවුරුද්දේ රුපියල් බිලියන 978ක් අපේ ආර්ථිකයට බදු වශයෙන් අහිමි වෙලා තිබෙනවා. 2023/2024 ගත්තොත්, ඒක රුපියල් බිලියන 900ක් විතර වෙනවා. 2025 ගත්තොත්, ඒක රුපියල් ට්‍රිලියනය -රුපියල් බිලියන 1,000- ඉක්මවනවා. මෙවැනි දැවැන්ත බදු ආදායමක් අපේ රටට අහිමි වෙලා යනවා, අන්න ඒ විධියට, විචක්ෂණශීලී - prudent - නොවන විධියට ඒ ආයෝජනවලට යම් යම් ප්‍රතිලාභ ලබා දෙන්න උත්සාහ කිරීම නිසා.

අප මෙතැනදී විශේෂයෙන් සඳහන් කරන්න අවශ්‍යයි, Strategic development projects ගැන. Strategic development projects ගැන අප ඉතාම සූක්ෂ්ම අධ්‍යයනයක් කරලා බැලුවොත් පෙනෙනවා, මා මුලින් සඳහන් කරපු පරිදි අපේ ආර්ථිකයට විශාල වශයෙන් බදු ආදායම් අහිමි වෙන්නට හේතු වෙලා තිබෙන්නේ, පසුගිය දශකය තුළ strategic development projects කියන scheme එක යටතේ බදු සහන දීලා තිබෙන ව්‍යාපෘති නිසා බව. අපි දන්නවා, විපක්ෂයේ මේ කෑ ගහන සමහර මන්ත්‍රීවරු එදා ඒ ව්‍යාපෘති ගෙනාවේ කොහොමද කියලා; strategic investments කියන scheme එක misuse කළේ කොහොමද කියලා. එදා එතුමන්ලා බොහෝ වෙලාවට අපේම අරමුදල්වලින් කොහේ හරි රටකට ගිහිල්ලා - රාජ්‍ය අරමුදල්වලින් පිටරට ගිහිල්ලා - ව්‍යවසායකයන් හමු වෙලා, ඔය කියන ආයෝජකයන් හමු වෙලා ඒ ව්‍යවසායකයන් සහ ආයෝජකයන් එක්ක මෙහේට එනවා. ඒ ඇවිල්ලා එතුමන්ලාම Cabinet Paper එකක් දානවා, මෙන්න මේක strategic investment එකක් කියලා. ඊට පස්සේ ඒගොල්ලන් tax holidays එක්ක ඒ ව්‍යාපාරය හොඳට කරගෙන යනවා. මම යෝජනාවකුත් කරනවා, පසුගිය දශකයේ කරපු strategic investments මේවායි කියලා එසේ පවත්වාගෙන යන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුයි කියා. මේවා හරහා තමයි අර මා මුලින් සඳහන් කරපු විශාල බදු ආදායමක් අපේ රටට අහිමි වෙමින් යන්නේ.

අපේ රටට ආයෝජන අවශ්‍යයි. ඒ වාගේම, ජාතික ආර්ථිකයට, රටට ඒ ආයෝජනවල ප්‍රතිලාභ අවශ්‍යයි. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, දැනට තිබෙන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය විය යුතුයි කියලා. ඒ වාගේම, ආර්ථික ප්‍රගමනයට මේ කියන ව්‍යාපෘතිවල දායකත්වය අවශ්‍යයි. ඒ දායකත්වය ලබා ගන්න අපි යම් යම් යෝජනා කීපයක් කරනවා. විශේෂයෙන් අවුරුදු 20ක, 30ක පමණ tax holidays දීලා තිබුණු තත්ත්වය අවුරුදු 8කට, 15කට වාගේ තත්ත්වයකට ගෙන එන්න යෝජනා කරනවා. එතකොට අපේ රටේ ආර්ථිකයට දීර්ඝ කාලීන සිදු වන බදු ආදායම් අහිමි වීම අවම කර ගන්න අපට පුළුවන් වෙනවා.

ඒ වාගේම තමයි, සේවා නියුක්ති ආදායම් බදු. මා මුලිනුත් මේ ගැන සඳහන් කළා. කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. වරාය නගරය ගත්තොත්, එහි සේවකයන් සේවා නියුක්ති ආදායම මත වන බදුවලින් විශාල වශයෙන් නිදහස් කර තිබෙනවා. නමුත්, කොළඹ නගරයේ වැඩ කරන සේවකයෙකු ගත්තොත්, ඔහු ආදායම් බදු ගෙවන්න අවශ්‍යයි, ඔහුගේ ආදායම්වලට; ඔහුගේ වැටුප්වලට අදාළව. හැබැයි ඊට එහා පැත්තේ පිහිටි කොළඹ වරාය නගරයේ වැඩ කරන කෙනා ඒකෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරලා තිබෙනවා. අපි යෝජනා කරනවා මෙන්න මේවාත් amend කළ යුතුයි කියලා.

ඒ වාගේම තමයි, transparency. අපි අපේ මේ අලුත් Amendments යටතේ ආදායම් බදුවලින් නිදහස් කිරීම පිළිබඳව යම් යම් transparent mechanisms propose කරනවා. පොදුවේ ගත්තොත්, මේ යෝජනා කරන Amendmentsවලින් අප බලාපොරොත්තු වන්නේ වරාය නගරයට එන ආයෝජකයන් කිසිසේත් discourage කරන එක නොවෙයි. හැබැයි, කැන්දාගන්නා ආයෝජන තුළින් උපරිම දායකත්වයක්, ප්‍රතිලාභයක් රටේ ජාතික ආර්ථිකයටත් ලබා ගන්න අවශ්‍යයි කියන ප්‍රතිපත්තිය මත ඉඳලා තමයි අපි යෝජනා කළේ, මේ පනතට Amendments ගෙනෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි තවත් කරුණු කිහිපයක් සඳහන් කරන්න. මුලින් කථා කරපු මන්ත්‍රීවරයා කියපු කාරණය ගැන අපේ ගරු ලක්මාලි මන්ත්‍රීතුමියත් සඳහන් කළා. සුදුසු නැති, පාර්ලිමේන්තුවක කථා නොකළ යුතු තත්ත්වයටම ගිහිල්ලා එතුමා විවිධ ක්ෂේත්‍ර පිළිබඳව කථා කළා. එතුමා ගල් කර්මාන්තය පිළිබඳ ගුරයෙක් කිව්වා. එවැනි ගම්මානයකින් ආවේ කිව්වා. මා කියන්නේ අපි මේ වාගේ උත්තරීතර සභාවක කථා කරන්න ඕනෑ, පාවිච්චි කරන්න ඕනෑ වචන පිළිබඳව basic standards තියා ගත්තොත් හොඳ බවයි. මොකද, අර කිව්වත් වාගේ මුළු රටක් මේ සභාව දිහා බලාගෙන ඉන්නවා. විශේෂයෙන්ම පාසල් දරුවෝත් මේ කථා බලනවා. ඒ නිසා විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ කථා කරන දේවල් පිළිබඳව ඒ දරුවන්ට බලන්න, අහන්න පුළුවන් මට්ටමේ quality standard එකක් තිබුණා නම් හොඳයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳවත් මෙහිදී විශේෂයෙන් කථා කළා. මා හිතන විධියට, ඊට අදාළව මතු කළ කාරණය පිළිබඳව මේ වනකොට විමර්ශන වාර්තාවක් ලැබිලා තිබෙනවා. ඒවා කුමන්ත්‍රණද, ඒවා කොහොමද මේ විධියට වෙනස් වෙලා තිබෙන්නේ කියන කාරණා පිළිබඳවත් විමර්ශනය කරමින් ඉන්නවා. මම හිතනවා, ඒ විමර්ශන වාර්තාවලට අනුව ඉදිරියේදී රටට ඒ ගැන දැන ගන්න පුළුවන් වෙයි කියලා. ඒ අදාළ පුද්ගලයන් කවුද කියන එක හෙළි කර ගන්න අපට පුළුවන් වෙයි. මම හිතනවා, මේ වාගේ කුමන්ත්‍රණ හෝ කඩාකප්පල්කාරී වැඩවලින් රටක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නතර කළ

යුතු නැහැ කියන එකට මේ සභාවේ ඉන්න උගත් මන්ත්‍රීවරු එකඟ වෙයි කියලා. මොකද, අපි දන්නවා, අධ්‍යාපනය කියන එක ලෝකයත් එක්ක වෙනස් වෙන්න අවශ්‍යයි කියලා. ආර්ථිකයේ, තාක්ෂණයේ, සමාජයේ වෙනස්කම්වලට සාපේක්ෂව අපේ අධ්‍යාපන ක්‍රමයත් අනුගත කළ යුතුයි. ඒ පිළිබඳ කිසි විවාදයක් නැහැ. ඒවා ඉලක්ක කරගෙන තමයි මේ ප්‍රතිසංස්කරණ කරන්නේ.

විශේෂයෙන් වෘත්තීය අධ්‍යාපනය පිළිබඳවත් සාකච්ඡා කළා. වෘත්තීය අධ්‍යාපනය අත්‍යවශ්‍ය දෙයක්. මෙතෙක් academic අංශය තමයි focus කරගෙන තිබුණේ. විභාග කේන්ද්‍ර කරගත් අධ්‍යාපනයක් තුළ තමයි අපි කාලාන්තරයක් තිස්සේ ඉන්නේ. අපි ඒ අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපන දිශාවකට යොමු කරන්න අවශ්‍යයි. ඒවා පදනම් කරගෙන තමයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම නැතුව ගල් කර්මාන්තය ගෙනෙන්න නොවෙයි. අපි යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යනවා. අර වාගේ පුහු, අශික්ෂිත ප්‍රකාශ තුළින්, කඩාකප්පල්කාරී වැඩ නිසා මේ ක්‍රියාවලිය නවත්වන්නට අපි කිසිසේත් බලාපොරොත්තු වන්නේ නැහැ. අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනිවාර්යයෙන් ඉදිරියට මෙහෙයවනවා.

අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කළා, "දිට්වා" අරමුදල ගැන; "Rebuilding Sri Lanka" Fund එක ගැන. ඒ එන fundsවලට වෙනම fund එකක් හදලා නැහැ. මේවා transparent නැහැ; මේවා වියදම් කරන්නේ කොහොමද, මේවාට ගැටලු එනවා කියලා එතුමා කිව්වා. නමුත් කිසිසේත්ම නීත්‍යනුකූල නොවන ක්‍රියාවලියක් නොවෙයි සිදු වෙන්නේ. මේ funds සම්පූර්ණයෙන් Treasury එකට තමයි එන්නේ. මහා භාණ්ඩාගාරයට තමයි මේ අරමුදල් එකතු වෙන්නේ. ඉතිහාසයේ එහෙම වෙලා නැහැ. අදාළ ගිණුම් අංක, ඒවාට වග කියන පුද්ගලයන් අපි ප්‍රසිද්ධ කරලායි තිබෙන්නේ. ඒ ගිණුම්වලට තමයි මේ මුදල් එන්නේ. මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ ඉතිහාසයේ එහෙම නොවෙයි වුණේ. ඉතිහාසයේ මෙවැනි අරමුදල් කොහේටද ගියේ, මොනවාටද ඒවා පාවිච්චි කළේ, මොනවාටද වියදම් කළේ කියලා අපි අදටත් දන්නේ නැහැ. අපට ඒවා හොයාගන්නත් නැහැ. හැබැයි, මේ අරමුදල් සම්පූර්ණයෙන්ම මොන ගිණුමටද එන්නේ, කොහේටද එන්නේ කියලා අපි ඉතා පැහැදිලිව අපේ foreign Missions හරහා ලෝකයට පවා ප්‍රකාශ කර තිබෙනවා. ඒ හරහා තමයි මේ අරමුදල් එන්නේ. ඒවා Treasury එකට තමයි එන්නේ. ඒවාට අදාළව ක්‍රියාත්මක වෙන්නේ, ඒවා අදාළ ව්‍යාපෘතිවලට යොදවන්නේ රාජ්‍ය යන්ත්‍රණය හරහාම තමයි. මූල්‍ය රෙගුලාසි ආදි සියලු දේවලට අනුකූලව තමයි ඒ මුදල් එකතු කිරීම සහ වියදම් කිරීම සිදු වන්නේ. තමන්ගේ criteria එක හැමෝටම apply කරන එක එච්චර හොඳ නැති බව මම ඒ ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. එතුමාට එතුමා ගැන measurement එකක් ඇති. හැබැයි, ඒ measurement එක හැමෝටම apply කරන්න ගියොත් ඒක යෝග්‍ය වෙන්නේ නැහැ කියලා මම ඒ මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ වරාය නගරයට ආයෝජන ආකර්ෂණය කර ගැනීමත් එක්ක ආර්ථිකය ඉදිරියට මෙහෙයවනකොට, දිගින් දිගටම අපේ රටට ආයෝජන ආකර්ෂණය කර ගන්න නම් අපි ස්ථාවර ආර්ථිකයක් ගොඩනහන්න අවශ්‍යයි. අපි පසුගිය අවුරුද්දේ සිට රටේ ස්ථාවර ආර්ථිකයක් ගොඩනහමින් සිටිනවා. මේ අතරේ තමයි අපට "දිට්වා" සුළි කුණාටුව එන්නේ. "දිට්වා" සුළි කුණාටුවෙන් වූ විනාශයෙන් රට ගොඩනහන්න අපට දැවැන්ත කාර්යයක් කරන්න ඉතුරු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ගොඩනඟුවාට ඒ පාරවල් ටික, බෝක්කු ටික විතරක් ඉතුරු වෙයි කියලා. නැහැ, ඒවා විතරක් නොවෙයි ඉතුරු වෙන්නේ. උඩරට දුම්රිය මාර්ගය තිබුණාට වඩා හොඳින් ගොඩනඟන්න අපි කටයුතු කරමින් ඉන්නවා. කැඩී බිඳී ගිය ජලාශ, පාලම් තිබුණාට වඩා හොඳට දශක ගණනාවක් ඉදිරියට පවතින්න අවශ්‍ය ශක්තියෙන් ගොඩනඟන්න අපි කටයුතු කරමින් ඉන්නවා. අපි ඒවාට මුදල් වෙන් කරන අතරේ, අපේ රටේ ආර්ථික සංවර්ධනය ඉදිරියට මෙහෙයවන්න අවශ්‍ය අරමුදලුත්, ආයෝජනත් රජය විධියට යොදනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගන්නත් කටයුතු කරනවා. එම ආයෝජන සාර්ථකව ආර්ථිකයට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි විධියට තමයි අපි මේ පනතට Amendments ගෙනෙන්නේ.

Sir, I would like to conclude by saying that the tax amendments to the Colombo Port City represent a strategic evolution in Sri Lanka's approach to attract foreign direct investments. While the previous framework prioritized maximum incentives to investors, it lacked fiscal safeguards particularly with regard to the national economy. And, the new Amendments tighten incentives with clear investment and employment thresholds, introduce shorter and more targeted tax reliefs and build greater transparency and regulatory oversight, aligning with international best practices and IMF commitments. So, I need to reiterate that these Amendments are purely to make it more transparent and effective in terms of the national economy and not to discourage any potential investments in the Colombo Port City.

Thank you very much for giving me time, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[අ.භා. 4.13]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විවාද කරන්නේ ලංකාවේ ආර්ථිකය විශාල පිම්මකට ගෙන යන්නට සුදුසු වන ආකාරයට නිර්මාණය කළ ව්‍යාපෘතියක් හා සම්බන්ධ පනත් කෙටුම්පතක් ගැන. මෙම පනත් කෙටුම්පත ඉතාම වැදගත්, රටේ ආර්ථිකය ශීඝ්‍රයෙන් ඉහළට ගෙන යෑම සඳහා. එම නිසා ඒ පිළිබඳව අදහස් දැක්වීමට ලැබීමත් භාග්‍යයක්කොට සලකනවා.

ඉතිහාසය තුළ ලංකාවේ ආර්ථිකය වෙනුවෙන් අලුත් පියවර තැබුවේ ඉඳලා හිටලා. Colombo Port City ව්‍යාපෘතිය කියන්නේ එහෙම එකක්. Port City ව්‍යාපෘතිය ආරම්භ කළ වෙලාවේ ඒ පිළිබඳව විවිධ චෝදනා කරපු, ඒකට යන කළු ගල් ප්‍රමාණය ගණන් කරපු, ඒ ආයෝජනය පිළිබඳ හැකිතාක් දුර්මත සමාජගත කරපු දේශපාලන ව්‍යාපාරයක් අද ඒ ව්‍යාපෘතිය තුළ පවතින හොඳ ලක්ෂණ ටික කියන වෙලාවේ අපට අහගෙන ඉන්න ලැබීමත් සතුටක් විධියට සලකනවා. ඒ වාගේම රටේ ජනතාවත් දැන ගන්න ඕනෑ, තමන් විසින් දැරූ ස්ථාවරය කොයි තරම් වැරදි ද කියලා තමන් විසින්ම ප්‍රදර්ශනය කරන දැවැන්තම සහ එකම දේශපාලන ව්‍යාපාරය තමයි ජවිපෙ කියලා. අවුරුදු 40ක් තිස්සේ එතුමන්ලා දැරූ සෑම ස්ථාවරයක්ම රජය භාර ගත්ත වෙලාවේ ඉඳන් කඩමින්, කලින් ගත්ත ස්ථාවරය වැරදියි කියලා එතුමන්ලා දැන් මේ රටේ මහ ජනතාවට ඔප්පු කරමින් ඉන්නවා. මේක තමයි ඉතිහාසය තුළ අපේ රටට අහන්න ලැබුණු කනගාටුදායකම කථාව. ඒක එතුමන්ලා මීට කලින් තේරුම් ගත්තා නම් බොහෝ ප්‍රශ්නවලට විසඳුම් හොයා ගන්න තිබුණා.

මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී මොන ගැටලු ආවත්, දැන් ඒක ලංකාව ඇතුළේ තිබෙන, ලංකාවට සම්බන්ධ කොටසක්. එහෙම නම්, කොහොමද මේක ලංකාවේ ජාතික ආර්ථිකයට සම්බන්ධ කරගෙන ලංකාවට මේකෙන් වාසි ගන්නේ කියන එක තමයි අපි දැන් නිරන්තරයෙන්ම සෙවිය යුත්තේ.

Port City ව්‍යාපෘතිය චීනයට සින්නක්කරව ලබා දී තිබුණු වෙලාවක, 2015 ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා, සජිත් ප්‍රේමදාස මැතිතුමා, පාඨලී චම්පික මැතිතුමා වාගේ ඇමතිවරු එකතු වෙලා මේ ව්‍යාපෘතිය ලංකාවට අරගෙන, ඒක 99 අවුරුදු බද්දට දීලා ලංකාවටත් අයිතියක් ලබා ගැනීමට කටයුතු කිරීම, ඒ ආයෝජන හා සම්බන්ධව ලංකාවටත් අයිතියක් ඇති කිරීම අපි මේ වෙලාවේ අගය කරන්න ඕනෑ.

මේ Port City එක ජාතික ආර්ථිකයට සම්බන්ධ කරන්න පුළුවන් මූලික ක්‍රම 2ක් තිබෙනවා. එක් ක්‍රමයක් තමයි, ආයෝජන. 2017 ඉඳලා 2025 වෙනකල් අවුරුදු 8ක් විතර ගෙවුණත් තවමත් ලංකාව බලාපොරොත්තු වන මට්ටමේ විදේශීය ආයෝජන අපේ රටට නොඑන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි අපි නිරන්තරයෙන්ම සාකච්ඡා කිරීමට සහ අවධානයට යොමු කළ යුත්තේ. මෙවැනි කොමිෂන් සභාවකින් අපි බලාපොරොත්තු විය යුතු දේ තමයි ආයෝජන පැමිණීමේදී පවතින අඩුපාඩු අවම කරගන්න එක. මේ විධියට පනත් දිගින් දිගටම ඉදිරිපත් කළත්, ඒ පනත්වලින් ආයෝජන වර්ධනයක් වෙන්නේ නැත්නම්, මේ පනත් ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉෂ්ට වෙන්නේ නැත්නම් ඒ පිළිබඳව යළි යළිත් සලකා බලන්නට සිද්ධ වෙනවා. ඒ නිසා ආණ්ඩුවට තිබෙනවා වගකීමක්. මේ පනත ඉදිරිපත් කිරීමෙන් මූලික වශයෙන් බලාපොරොත්තු වන දේ තමයි විදේශීය ආයෝජන ලංකාව තුළට වේගයෙන් ගෙන්වා ගැනීම. මේ වෙලාවේ ඒ පිළිබඳව අවධානය යොමු කිරීම හැර, මෙතැන ඒ ව්‍යාපාරය කළොත් මෙහෙමයි, එහා පැත්තේ කළොත් මෙහෙමයි වාගේ හිතලා කටයුතු කරන්න ගියොත් කවදාවත් ආයෝජන ගෙන්වාගන්න බැහැ.

ඇයි මේකට ආයෝජන එන්නේ නැත්තේ කියන කාරණාව පිළිබඳව අපි සොයා බලපුවාම ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. මේ Port City එකට ආයෝජකයෝ එනවා. ඒ එන ආයෝජකයෝ Port City එකේ බිම් කඩක් ගන්න ගියොත්, Port City එකේ කළමනාකාරිත්වය එක් එක් ආයෝජකයාට - මේක බරපතළ කථාවක් - රටේ නම අනුව එකම බිම් කඩ සඳහා එකිනෙකට වෙනස් මුදල් කියනවා. එතකොට ආයෝජකයන් අධෛර්යවත් වෙනවා. මේක ප්‍රධාන ප්‍රශ්නයක්. ඒ නිසා මේ කොමිෂන් සභාව නිර්මාණය කරලා අනිවාර්යයෙන්ම එහි පාලනාධිකාරිය, එහෙම නැත්නම් මේක පාලනය කරන කණ්ඩායම ඇයි මෙහෙම කරන්නේ කියන එක පිළිබඳව සොයා බැලීමේ වගකීමක් ආණ්ඩුවට තිබෙනවා. ඒක නොකළොත් අපි බලාපොරොත්තු වන ආයෝජන එන්නේ නැහැ. දැනට මේ කළමනාකාරිත්වය ක්‍රියාත්මක වන්නේ ආයෝජන ආකර්ෂණය කිරීම වෙනුවට real estate වාගේ ගනුදෙනු වෙනුවෙන්. ඒ කියන්නේ මේ ඉඩම් ටික වැඩි මිලකට විකුණාගන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා. ඒ හැර ආයෝජකයන් ගෙන්වීම සඳහා විශේෂ ක්‍රියාවලියක් කරන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න ඕනෑ. එහෙම නොවුණොත් ආයෝජකයන් මේ Port City ව්‍යාපෘතියේ ආයෝජනය කරන්න පෙලඹෙන්නේ නැහැ.

දෙවැනි එක හැටියට eventsවලට මේක පාවිච්චි කරන්න පුළුවන්. තවමත් මේ ප්‍රදේශයේ විශාල ජනාකීර්ණ තත්ත්වයක් නැති නිසා ලෝකයේ ප්‍රචලිත විවිධ සංචාරකයන් ඉලක්ක කරගත් eventsවලට මේක භාවිත කරන්න පුළුවන්. හැබැයි, event එකකට මේක ගන්න ගියොත් එතැනත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, දින කිහිපයකට හෝ දිනකට මෙහි බිම් කොටසක් වෙන් කරගන්න ගියොත් ඒකට ඉල්ලන මුදල -අය කරන මුදල- විශාල අගයක් ගැනීම. එතකොට event එක කරන්න බලාපොරොත්තු වන අයට ඒ මුදල දරාගෙන ඒක කරන්න බැහැ. සංචාරක ආදායම වැඩියෙන් ගන්න බලාපොරොත්තු වන රටක් නම්, සංචාරකයන්ට ලංකාවට ඇවිල්ලා මේ eventsවලට සම්බන්ධ වෙලා enjoy කරන්න නම්, ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්නම වෙනවා.

තවත් හේතුවක් තිබෙනවා. කාලයක සිට ලංකාවට එන්නේ අඩුවෙන් වියදම් කරන සංචාරකයන් බව අපි දන්නවා. මම මේක මීට කලිනුත් කියා තිබෙනවා. අඩුවෙන් වියදම් කරන ඒ සංචාරකයන් ලංකාවට ඇවිල්ලා ලොකු හෝටලයක නැවතිලා ලොකු මුදලක් දෙන්නේ නැහැ. ඒ කාලසීමාව තුළ පුළුවන් තරම් විවිධ වැඩවලට, eventsවලට සම්බන්ධ වෙන්න තමයි මේ අඩු වියදම් කරන සංචාරකයන් බලන්නේ. එහෙම නම්, අපි කළ යුතු දේ මොකක්ද? හෝටල් ඉදිකිරීම කියන කාරණාව වැඩි මුදලක් වියදම් කරන සංචාරකයන් කරා යොමු කරවන විට, අඩු මුදලක් වියදම් කරන සංචාරකයන් මේ eventsවලට යොමු කරගන්න උත්සාහ කරන්න ඕනෑ.

Eventsවලට යොමු කරන්න ගියාම තිබෙන ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එයින් එක් ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ලෝකයේ දැනට පවත්වන සමහර events එක දිගට සතියක් පමණ පවත්වන එක. ඉන්දියාවේ ගෝවා වාගේ ප්‍රදේශවල සමහර events තිබෙනවා දවස් 3, 4 වාගේ යන ඒවා. නමුත්, ලංකාවේ තිබෙන ප්‍රශ්නය තමයි එවැනි events කරන්න බැරි එක. ඒකට හේතුව තමයි ලංකාවේ තිබෙන පරිසර නීති. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිකුත් කළ නියෝග තිබෙනවා, රාත්‍රී 12.00න් පසු අධික ශබ්දය නඟන ක්‍රියා කරන්න බැහැ කියලා. අපි ඒකට එකඟ වෙනවා. නමුත්, ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, පරිසර අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය, නීතිය හා කටයුතු කරන අමාත්‍යාංශ එක්ක එකතු වෙලා මේ ගැන සාකච්ඡා කරලා, මේ කරුණු අධිකරණයේ අවධානයට යොමු කර, තෝරාගත් ප්‍රදේශවලවත් - ඒ කියන්නේ විශේෂයෙන්ම මේ Port City එක ඇතුළේ - රාත්‍රිය මුළුල්ලේම සංචාරකයන් ආකර්ෂණය කරගන්න පුළුවන් events අඩු මුදලකට පවත්වන්න අවස්ථාව සලසා දෙන්න. ඒ ක්‍රමවලින් හැර Port City එක හරහා ආදායම් උපයන්න ක්‍රමයක් නැහැ.

සංගීත ක්ෂේත්‍රයෙන් ලෝකයම පිළිගත්ත තරුණ කලාකරුවන් දැන් ලංකාවේත් ඉන්නවා. ඒ අය ලෝකයේ තැන් තැන්වලට ගිහින් ඔය වාගේ සංගීත සංදර්ශන පවත්වනවා. හැබැයි, ලංකාවේ ඒ වාගේ දේවල් පවත්වන්න අවධානය යොමු කරන්නේ නැත්තේ මේ events රාත්‍රි 12.00ට වාගේ නවත්වන්න සිද්ධ වුණොත්, එයාලාට ඒක සම්පූර්ණ කරගන්න බැරි වෙන නිසායි.

ඊළඟ කාරණය මේකයි. මහ නගර හා සම්බන්ධ විශේෂඥයන් එක්ක කථා කළ වෙලාවක ඒ අය කියපු තව ප්‍රශ්න ටිකක් තිබෙනවා. දැනට ලංකාවට මුදල් එවන්න පුළුවන් විධි දෙකක් තිබෙනවා. එකක් තමයි TT system එක. අනෙක MT103 system එක. මේ ක්‍රමවලට අමතරව තව GPI වාගේ system එකක් ගෙනාවොත් මුදල් සම්ප්‍රේෂණ පද්ධතිය සක්‍රිය වෙලා, මේක මූල්‍ය hub එකක් බවට පත් කරගන්න පුළුවන්. ඒ සඳහා ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියලා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, digitization පිළිබඳ ඇමතිතුමාත් ඉන්නවා. මේක ඉතාම හොඳින් සක්‍රියව ක්‍රියාත්මක වෙන්න නම් ඩිජිටල්කරණය වෙන්න ඕනෑ. නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා නේ. තවම ඉන්නවා නේ, නියෝජ්‍ය ඇමතිතුමා. ඇමතිතුමාත් කැන්ටිමේ ඉන්නවා මම දැක්කා. ඒ නිසා ඇමතිතුමාටත් පුළුවන්, ඕනෑ නම් ඇවිල්ලා මේවාට උත්තර දෙන්න.

තවමත් Sri Lanka Telecom එක සම්බන්ධව ප්‍රාථමික ප්‍රශ්න තිබෙනවා. අද උදේත් මෙවැනිම ප්‍රශ්නයක් අපට වාර්තා වුණා. "Telecom line එක එපා disconnect කරන්න" කියලා ලිපියක් දීලා disconnect කළාට, බිල් හදන තැනට ඒ පණිවුඩය යන්නේ නැහැ. ඒ කියන්නේ ඒ ආයතනය ඇතුළේ අන්තර් සබඳතාවක් නැහැ. හොරකම් නොකරන එක විතරක් නොවෙයි, අමාත්‍යාංශයක් භාර ගත්තාම එහෙම වැඩ ටිකකුත් කරන්න තිබෙනවා. ඒ නිසා, ඉක්මනින්ම Sri Lanka Telecom එක ඇතුළේ අන්තර් සබඳතා ටික අලුත් කරලා line එක disconnect කළාම, බිල ලියන තැනට ඒක දැනුම් දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ඉන්න නිසා මේ කථාවත් කියන එක හොඳයි. SLT Mobitel mobile App එක හදන්න ටෙන්ඩර් කැඳෙව්වා නේ. ඒ ටෙන්ඩර් කැඳෙව්වේ මේ අවුරුද්දේ. මා සතුව ටෙන්ඩර් කැඳවීමේ ලිපියත් තිබෙනවා.

Omobio (Pvt.) Limited කියලා ආයතනයක් ඒකට ටෙන්ඩර් එකක් දාලා තිබෙනවා. දැම්මා නේද? ඊට පස්සේ මම මේ ප්‍රශ්නය කිව්වාට පස්සේ ඒ ටෙන්ඩර් එක අයින් කරගෙන තිබෙනවා. Telecommunication Engineers' Union එකෙනුත් මට ඒ පිළිබඳ තොරතුරු වාර්තා කරලා තිබෙනවා. ඒ ටෙන්ඩර් එක අයින් කර ගත්තේ ඇයි කියන එක ගැනත්, ඒක දැම්මේ ඇයි කියන එක ගැනත් මට කියන්න පුළුවන්.

ඊළඟ ප්‍රශ්නය ඊට වඩා බරපතළයි. රජය ව්‍යාපාර කරනවාට අපි එකඟ නැහැ. ඒක පුළුවන් තරම් අවම කරන්න ඕනෑ. රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ, පාඩු ලබනවා නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
විනාඩියකින් අවසන් කරනවා.

නමුත්, කෘත්‍රිමව ඒවා පාඩු කරන්න උත්සාහ කරනවා නම් එතැනත් අර්බුදයක් තිබෙනවා. විදුලි සංදේශ ඉංජිනේරු සංගමයෙන් මට එවලා තිබෙන ලියුමක් මම මේ වෙලාවේ **සභාගත*** කරනවා.

ටෙලිකොම් ආයතනයේ ඉහළ නිලධාරීන් ලෙස ලෝකයේ සමහර ආයතනවලට බඳවා ගන්නේ නැති නිලධාරීන් ඉතාම සැලසුම්සහගතව බඳවාගෙන මේ ආයතනය කඩා වැටෙන තත්ත්වයට පත් කරලා, ඊට පස්සේ පෞද්ගලීකරණය කිරීමේ සැලසුමක් මේ ආණ්ඩුවේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වෙන බවට සාක්ෂි සහිත සටහන් ඇතුළත් ලිපිය මම මීට පෙර සභාගත කරලා තිබෙනවා.

අවසාන වශයෙනුත් දිගින් දිගටම කියන්න තිබෙන්නේ මේ ආණ්ඩුවේ අඩු පාඩු, වැරදීම තමයි. නොරොච්චෝලේ පිළිබඳවත් තිබෙනවා. මම ඒ ගැන කලින් කිව්වා, ගල් අඟුරු ප්‍රශ්නයක් තිබෙනවා කියලා. එහෙම එකක් නැහැ කියලා ඇමතිතුමා කිව්වා. හැබැයි, දැන් ඒ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. අද ඒ ගැන ඩී.වී. චානක මන්ත්‍රීතුමා කියපු නිසා මම ඒ ගැන කියන්න යන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මම තව තත්පර කිහිපයකින් අවසන් කරන්නම්.

මෙය ඉතා වැදගත් දෙයක්. ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ "වඳුරා පැනපු වෙලාවේ" current supply එක නැති වුණා. ඒ වෙලාවේ විදුලි බලය අඛණ්ඩව පවත්වාගෙන යන්න, සමතුලිත කර ගන්න battery packs ගේනවා කිව්වා. මේ අවස්ථාවේ ඇමතිතුමා සභාවේ ඉන්නවා. දැන් ඒ සිද්ධියට අවුරුද්දකටත් ළඟයි. ඒ battery pack එක හා සම්බන්ධ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර තිබෙනවාද, ක්‍රියාත්මක කරමින් යනවාද, ඒ පිළිබඳ අලුත් තත්ත්වය කුමක්ද කියන්න. මම එහෙම අහන්නේ, මාර්තු මාසය වාගේ වියළි කාලයක එවැන්නක් සිද්ධ වුණොත් නැවත විදුලිය බිඳ වැටීමක් වෙන්න පුළුවන්. ආණ්ඩුවට ඒකට සූදානම් වෙන්න කියලා කියනවා. හේතුව, මාසයකට වාර කිහිපයක් දිගින් දිගටම අත්වැරදි කරන ආණ්ඩුව, ආයෙත් අත්වැරදි කළොත් ඒක රටේ ආර්ථිකයට බලපානවා. එහෙම නම් ආණ්ඩුව වාගේම, දැන් කැන්ටිමේ ඉන්න ඩිජිටල් ආර්ථික ඇමතිතුමාටත් ඒකට අවධානය යොමු කරන්න කියා ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මට මේ කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.24]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගන්නා මේ අවස්ථාවේදී, ඒ සම්බන්ධයෙන් යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි, මේ සංශෝධනයේ අරමුණු සහ ඉලක්ක මොනවාද කියන කාරණාත් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය නගර භූමිය අක්කර 664ක විතර ප්‍රමාණයක්. එහි අක්කර 439ක විතර ප්‍රමාණයක ඉදි කිරීම් කරන්න පුළුවන්. මෙවැනි විශේෂිත කලාපයක් ගොඩ නඟලා ඒ ගොඩ නඟන කලාපය තුළින් බලාපොරොත්තු වෙන යම් ඉලක්ක ප්‍රමාණයක් තිබෙනවා. අපි ආර්ථිකයක් විධියට ගෝලීයව තරගකාරී ආර්ථිකයක් බවට පත්වීම ඉතාම තීරණාත්මක කටයුත්තක්. ආසියාවේ වෙළෙඳ පොළ චීනය, ඉන්දියාව, අප්‍රිකාව, අනෙක් පැත්තෙන් ආසියා පැසිෆික් කලාපය. විශාල ජනගහනයක් සිටින කලාපයක ප්‍රධාන භූගෝලීය මර්මස්ථානයක සිටින, geopositioning සහිත අපි වාගේ රටක, අපි ගෝලීයව සාර්ථක වෙන්න නම් තරගකාරිත්වය අත්පත් කර ගන්න ඕනෑකම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැන්නක අවශ්‍යතාව තිබෙන්නේ විශේෂයෙන්ම ගෝලීය තරගකාරී විශේ�ෂ ආර්ථික කලාපයක් අත්පත් කර ගන්නයි. ඊළඟ කාරණය තමයි, රටක් සංවර්ධනය කරන්න නම් ඍජු විදේශ ආයෝජන අවශ්‍යයි. එවැනි ආයෝජන අත්පත් කර ගන්න අපට විශේෂ පහසුකම් සලසන්න අවශ්‍යයි. ඔව්, එවැනි තත්ත්වයකට මෙවැනි කලාපයක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්ත වශයෙන් ගත්තාම අපි ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකයේ ගෝලීයව ශක්තිමත් ස්ථානයක් අත්පත් කර ගන්න අවශ්‍යයි. ඒ නිසා අපට මෙවැන්නක අවශ්‍යතාවක් තිබෙනවා.

දැන් මේ ආර්ථික ක්‍රියාවලිය යම් ප්‍රමාණයක් දුර ඇවිල්ලා තිබෙනවා. නමුත් අපි දකිනවා, මුල් පනත ඇතුළේ තිබෙන යම් යම් වගන්ති නිසා, යම් යම් අණ පනත් තුළින් ගෙනාපු නීති ක්‍රියාත්මක කිරීමේදී තිබෙන තාක්ෂණික ගැටලු සහ ඒවා ක්‍රියාත්මකවීම තුළින් රටට, ආර්ථිකයට අවශ්‍ය බලපෑම ලබා දෙනවාද, වුවමනා ඉලක්කවලට යන්න පුළුවන්ද කියන කාරණය සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙලා තිබෙන බව. ඒ නිසා තමයි මේ සංශෝධන ගෙන ඒම අවශ්‍ය වන්නේ. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා 2026 වර්ෂය සඳහා අය වැය කථාව ඉදිරිපත් කරද්දී, ඒ ප්‍රතිපත්තිය ඉදිරිපත් කරද්දී මේ බදු නිදහස් කිරීම් පිළිබඳ විනිවිද පෙනෙන රාමුවක - transparent framework එකක - අවශ්‍යතාව මතු කළා. ඒ අනුව තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ. ඒ අනුව තමයි සේවයේ යෙදෙන අයට බදු සහන ලබා දීම සහ ඒවායේ සීමා නිර්ණය කරන්න කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතට සංශෝධන ගෙන එන්නේ. මොකද, උපාය මාර්ගික ව්‍යාපාර සඳහා වූ නියාමනය අපි වැඩිදියුණු කරන්න ඕනෑ. උපාය මාර්ගික ව්‍යාපාර එනවා, ඒවා නියාමනය කරන්න ඕනෑ. අන්න ඒ නියාමනය කරන එක මේ සංශෝධන පනත් කෙටුම්පතින් වැඩිදියුණු කරලා තිබෙනවා.

ඊට පස්සේ, අපි බලාපොරොත්තු වන ඉලක්කවලට යන්න ඒවා කොච්චර අනුකූලද කියන කාරණය අපි KPI හරහා බලන්න ඕනෑ. කොමිෂන් සභාවට කරන්න තිබෙන්නේ අන්න ඒක. ඊට පස්සේ අක්වෙරළ බැංකු - offshore banking - ගත්තොත්, අපි ඒකට අවශ්‍ය නියාමනයත් මේ පනත් කෙටුම්පත තුළින් මතු කරලා තිබෙනවා. ඒ නියාමනය මතු වන්නේ මේ CPCEC Act එක, එහෙම නැත්නම් Colombo Port City Economic Commission Act එක හරහා forex, එහෙම නැත්නම් විදේශ විනිමය ගනුදෙනු monitor කරන්න මහ බැංකුවට ලැබෙන අවස්ථාව සමඟයි. ඒක රටේ ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට දෙන්නත්, ප්‍රධාන ආර්ථික වටිනාකම් එකතු කරන්නත්, ආයෝජකයන්ට අවශ්‍ය සහන සලසන්නත් ඉතාම වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දැන් කියනවා ඇහෙනවා, දැන් මේක ඉවරයි, දැන් ඔක්කෝම බදු පැනෙව්වා, මේක හිර කළා, දැන් මේකට තිබුණු පහසුකම් නැති කළා, Port City එක ඉවරයි, ඒකේ අරමුණුවලින් පිට පැනලා තිබෙනවා කියලා. නමුත් මෙතැනදී එහෙම දෙයක් වන්නේ නැහැ. මේ කොමිසමට පුළුවන්කම තිබෙනවා, වසර පහෙන් පහට අවශ්‍ය නම් මේවා සංශෝධනය කරන්න, අලුත් කරන්න, වෙනස්කම් කරන්න, review කරන්න; ඒ හැකියාව මෙහි තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැමදාම වාගේ බොරු බිල්ලා මවලා, දැන් ආයෝජන එන්නේ නැහැ, ආයෝජන ගෙන්වන්න බැහැ, මේ වැඩේ කරගන්න බැහැ, නීති තද කරනවා, නීතියට වැඩ කළොත් හරි අමාරුයි වාගේ කාරණා මතු කරන්න විපක්ෂය උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රටක් විධියට ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව වැඩ කරන එක හොඳ නැද්ද? ඇමෙරිකාව වැඩ කරන්නේත්, යුරෝපීය රටවල් වැඩ කරන්නේත්, චීනය වාගේ නැඟී එන දැවැන්ත ආර්ථිකයක් තිබෙන රටවල් වැඩ කරන්නේත්, ඉන්දියාව පවා අද වැඩ කරමින් ඉන්නේත් මේ ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුවයි. අපි මේකේ කටයුතු ඕසෙට විවෘත කරලා නැහැ, ඕනෑම හොරෙකුට ඇවිල්ලා මේක ඇතුළේ සල්ලි dump කරන්න පුළුවන් විධියට. කළු සල්ලි ගෙනැල්ලා මේක ඇතුළේ අතහරින්න පුළුවන් විධියට ඕනෑම රටකින් එන්න පුළුවන් විධියට මේ දේවල් විවෘත කරලා නැහැ. අද ලෝකයේ good practices තිබෙනවා. ඒවා පාවිච්චි කරලා තමයි අද සංවර්ධිත රටවල ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙන්නේ. අපි කැමැති නැහැ, අපේ රට කළු ආර්ථිකයේ ගොදුරක් බවට පත් වනවාට. අපි කැමැති නැහැ, අපේ රට මත්ද්‍රව්‍ය වෙළෙන්දන්ගේ, විනාශකාරී මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ කොටසක් බවට, ඒකේ hub එකක් බවට පත් වනවාට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ, criteria-based concessions දෙන්න.

ඒ වාගේම Primary Business of Strategic Importance සමඟ ඇමෙරිකානු ඩොලර් මිලියන 25ක ආයෝජනයක් සඳහා සේවකයන් 100ක් එනවා නම්, ඒකේ රැකියා හැදෙන්නේ කොහොමද, ඒකට දෙන සහන මොනවාද කියන එක මෙහි සඳහන් වනවා. ඊට පස්සේ strategy එක ගත්තොත්, ඩොලර් මිලියන 100ක් නම් Category A, ඩොලර් මිලියන 500ක් නම් Category B, ඩොලර් මිලියන 1,000ක් නම් Category C ආදී වශයෙන් මෙහි categories හදලා තිබෙනවා.

ඒ විධියට categories හදලා tax concessions දෙනවා. ඒ අනුව ඩොලර් මිලියන 100ට බදු සහනය අවුරුදු 10යි, grace period එක අවුරුදු 05යි. ඩොලර් මිලියන 500ට බදු සහනය අවුරුදු 12යි, grace period එක අවුරුදු 06යි. ඩොලර් මිලියන 1,000ට බදු සහනය අවුරුදු 15යි, grace period එක අවුරුදු 08යි ආදී ලෙස 300කට වඩා රැකියා උත්පාදනය කරනවා නම් එහෙම තමයි criteria-based concessions දීලා තිබෙන්නේ. එහෙම

නැතිව ඕනෑම හොරෙකුට ඇවිල්ලා පාවිච්චි කරන්න හදපු එකක් නොවෙයි මේ. ඒක තමයි මේ ආණ්ඩුවේත්, මේ ජන වරමේත් තිබෙන වෙනස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ඇතුළට ආයෝජන ගෙනෙන්න BoI එක තිබෙනවා, ඒ වාගේම Colombo Port City එක තිබෙනවා. ඉස්සරහට අපට public-private partnerships සඳහා නීති ගෙනෙන්න තිබෙනවා. ඊළඟට joint venturesවලට අවශ්‍ය පසුබිම හදන්න තිබෙනවා. එහෙම තමයි ආර්ථිකයට අලුතින් ආදායම් ගේන්නේ, අලුතින් ආයෝජන ගේන්නේ, අලුතින් රස්සා හදන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපට කුණුහරුප විපක්ෂයක් ඉන්නවා. අපි මොන තරම් හොඳ ජාති ගෙනාවත්, කුණු ගොඩක් ගෙනැල්ලා මේ සභාවේ හලනවා. කුණු කථාවක් ගේනවා, මේ සභාවේ හලනවා. ඊට පස්සේ voice-cut එකක් දෙනවා. ඒ කුණුහරුප විපක්ෂයට රට හදනවාද, නැද්ද කියන එක වැඩක් නැහැ. ඒ අය බලන්නේ කාටහරි මඩක් ගහන්නේ කොහොමද කියලායි. ඒක තමයි තර්කනය. ඒක තමයි මෙතැනදී ඒගොල්ලන්ට කරන්න තිබෙන වැඩේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනවා නැතත් අපට කුණුහරුප විපක්ෂයක් ඉන්නවා. අපට වෙන කරන්න දෙයක් නැහැ, ඒකත් එක්ක යන්න වෙනවා. හැබැයි, අපේ රටේ ජනතාවගේ අවශ්‍යතා සහ වුවමනා වෙනුවෙන් මේ රටේ ආර්ථිකය මෙහෙයවන වගකීම අපි භාරගෙන තිබෙනවා. ඒක අපි නිසි පරිදි ඉටු කරනවා.

බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[4.34 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I am privileged to speak on the Port City Economic Commission (Amendment) Bill.

First, I would first to congratulate the Hon. President for appointing Mr. Harsha Amarasekera, President's Counsel, as the Chairman of the Colombo Port City Economic Commission. He is a dynamic leader, both in the legal field and in the corporate world. Therefore, I believe that his abilities would contribute a lot to developing the activities in the Colombo Port City.

Hon. Deputy Minister, as a former Deputy Minister of Investment Promotion in charge of the Board of Investment of Sri Lanka, I would like to remind you that a Director General for the BoI has not been appointed for four years. I believe that the BoI being a very important institution, you would consider making the appointment of the Director General of the BoI expeditiously.

The Minister is not in the House and Hon. Deputy Minister, I would like to make some constructive criticism with regard to this Bill. I would like to say with responsibility that the proposed Amendments create systematic risks, which could destabilize the domestic economy. Sir, the Amendment to Section 42(1) states that the Banking Act would not apply on the offshore banking businesses in the Colombo Port City. Prior to this Amendment, the Banking Act was applicable. Now, with this Amendment, the Banking Act will not be applicable to those offshore banking businesses. Hon. Deputy Minister, I would like to ask you a very vital question. Prior to the Amendment, licences for offshore banking business were issued in terms of the Banking Act. However, with this Amendment, licences are to be issued by the Port City Economic Commission. Therefore, I humbly ask the Hon. Deputy Minister whether the Port City Economic Commission has the expertise to issue licences. There is some ambiguity. In fact, the Hon. Ravi Karunanayake asked me, "Is it true that licences are to be issued in terms of the Banking Act?" Prior to the Amendment, the answer was, yes. But, if this Amendment gets passed, the Colombo Port City Economic Commission would be able to issue banking licences, thereby creating a shadow banking system. Also, the offshore banks operating in the Colombo Port City will be able to borrow funds from domestic banks in dollars. That is a very dangerous phenomenon because that could result a drain on our foreign exchange reserves and affect the domestic banking system.

Prior to the Amendment to Section 42, the Banking Act operated, except for Part IV. Now, with the Amendment, the Central Bank has to make regulations in terms of the international banking standards. In terms of the Banking Act, international banking standards are made practicable as far as possible. For example, the capital adequacy ratio in terms of the Basel III is eight per cent. However, the Central Bank issued a directive that it should be 10 per cent, thereby protecting our domestic banking system.

With the present Amendment, whatever directives issued would be in terms of the international banking standards. International banking standards are very fluid and there is no proper definition. So, there is greater ambiguity. Therefore, I propose that an amendment be made to make the international banking standards practicable as far as possible, thereby giving the Governing Board of the Central Bank to take decisions in the interest of our banking system with regard to minimum capital adequacy.

If you look at the GIFT City in India, it has been able to attract their professionals to work in India. However, Sri Lankan residents should have to pay Income Tax after this Amendment. Therefore, I humbly request the Government to consider this. We are talking about brain drain. After the Covid-19 pandemic, Sri Lankans left the country; after the "*Aragalaya*", Sri Lankans left the country and now our youth are leaving the country because of the higher tax slab of 36 per cent. So, therefore, if you want to retain the Sri Lankans working here, I humbly request you to reconsider the Amendment, under which Sri Lankans who work in the Port City would have to pay taxes.

Sir, now, I would like to bring some other matters to your notice. We talk about foreign investments coming in and the Sri Lankans investing especially in the real estate

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

sector need about 21 approvals. Other than the UDA and a few other authorities, the Department of Wildlife Conservation, the Department of Forest Conservation and the Department of Coast Conservation are hesitant to grant approval or that process takes hell of a long time, thereby creating major problems. Therefore, I say that there should be a one-stop shop. You are talking about FDIs coming in, but, first, we should prevent the Sri Lankans who are getting frustrated and going to invest in Dubai. They are leaving Sri Lanka and going to all parts of the world to invest. So, first, please create a platform where Sri Lankans could easily invest in Sri Lanka and get substantial returns. Sir, if a real estate company in Sri Lanka sells a property, 35 per cent of that goes for taxes. At this point in time, this Government survives on the revenue collected from Income Tax, the Excise Department and the Sri Lanka Customs. So, please make available a fair and equitable process where Sri Lankans could invest in Sri Lanka because they are getting frustrated.

Also, if you take the Colombo Port City Economic Commission Act, when approval is sought, there is no timeline for it to be either accepted or rejected. So, therefore, if you want to have investments, please bring in, either through regulations or a statute, a proper process where when one makes an application to the Colombo Port City Economic Commission, it would be dealt with within a specific period, either accepting or rejecting it. Do not keep it in abeyance because under the Act, there is no provision requiring the approval or rejection to be made within a specific period. In addition, if there is to be investments made in Sri Lanka, the regulatory process and our banking process have to be investment-friendly because, otherwise, great frustration would take place.

Today, the BoI has become a white elephant. I believe you have brought in some amendments to the Strategic Development Projects Act. And also, please do not be dictated by the IMF. Sri Lanka has suffered a massive disaster. Also, we need to give tax concessions. If you take our region, Sri Lanka is not competitive with our energy costs and labour costs being high.

Therefore, why should a foreigner come and invest in Sri Lanka? Now, we are talking about offshore banking, but our tax regime is very high. I want to ask the Deputy Minister, who are you trying to bring to Sri Lanka? Who will come and set up an offshore bank in Sri Lanka now? Also, for a commercial bank to operate in Sri Lanka, they need US Dollars 60 million. However, for an offshore bank, it is only US Dollars 15 million. At present, you have brought in Amendments so that only a foreign entity carrying out banking business overseas could set up an offshore bank here. Therefore, there is no level playing field with regard to Sri Lankan banks, because a Sri Lankan bank is issued an offshore licence in terms of the Banking Act, whereas a foreign offshore bank would get a licence under the Colombo Port City Economic Commission Act. Therefore, the fundamental issues are these.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Please give me a minute, Sir.

There are various issues. I would say that you cannot allow the Colombo Port City Economic Commission to issue a banking licence. We have a very strong Banking Act; we have a regulatory process; we have experts working in the Central Bank of Sri Lanka, which has about 1,000 employees. Now, you are trying to give the power to issue a banking licence to the Colombo Port City Economic Commission, which would be very detrimental to our banking system. I am not trying to point a finger at anybody. I would like to ask the Deputy Minister, why are you bringing in this Amendment - earlier, an offshore banking licence was issued in terms of the Banking Act - taking that power away and giving it to the Port City Economic Commission, leaving the Central Bank only a supervisory role only on certain matters?

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින විවාදයට බඳුන් කරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අවසාන අදහස් දැක්වීමයි මම මේ සිදු කරන්නේ. අපි ආණ්ඩු බලයට පත් වුණාට පසුව අපට විශේෂ වගකීමක් පැවරුණා වාගේම ජන වරමක් ලැබුණා, මේ රට විශාල පරිවර්තනයකට ලක් කරන්න. එලෙස විශාල පරිවර්තනයකට යන ගමනේ කළ යුතු කාර්යයන් රාශියක් තිබෙනවා. එහි පළමුවැනි කාර්යය බවට පත් වුණේ රට ස්ථාවර කර ගැනීමයි. රට ඇතුළේ නිර්මාණය වූ ආර්ථිකය විසින් හදපු බාධකත්, බාහිර පාර්ශ්වයන්ගෙන් ආපු බාධකත්, දේශපාලන පැත්තෙන් ආපු බාධකත් කියන සියල්ලක්ම මැඩගෙන අපට පුළුවන්කම ලැබුණා, ඉතාම සාර්ථකව 2025 වර්ෂයේදී මේ ස්ථාවරත්වය ස්ථාපිත කරන්න. ඒක ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් පිළිගනිමින් තිබෙනවා; ඇගැයීමට ලක් කරමින් තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට අපේ ණය වර්ගීකරණයත් ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා.

අපි පියවරෙන් පියවර ඉදිරියට යනකොට ඊළඟ අදියර තමයි, මේ රටට සෞභාග්‍යය කැන්දන, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් අත්පත් කර දෙන්න අපේ ආර්ථිකය ශක්තිමත් කිරීම. ශක්තිමත් ආර්ථිකයක් ගෙන එනකොට ආයෝජන ඉතාම වැදගත් වනවා. ඒ සඳහා ප්‍රමාණාත්මක ආයෝජන එන්න ඕනෑ. විවිධ ක්ෂේත්‍රවල ආයෝජන එන්න ඕනෑ. ඒ වාගේම නිෂ්පාදන ඉලක්ක කර ගත් ආයෝජන එන්නට ඕනෑ. අපි ඒ වැඩකටයුතු කරන අතරතුර විශේෂිත කලාපයක් වූ කොළඹ වරාය නගරය ප්‍රදේශය විශේෂ ආයෝජන කලාපයක් විධියට තිබෙනවා. අපි ආණ්ඩු බලය පිහිටුවනකොටත් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සම්මත කරලා යම් ආකාරයකට ආයෝජන කැන්දවීමට ප්‍රතිපාදන සකස් කර තිබුණා. නමුත් අපි දැක්කා, ඒ පනත ඇතුළේ ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒ පනත තුළින් හුදෙක් ආයෝජකයින්ට ප්‍රජාතන්ත්‍රවාදී විධියට, සාධාරණ විධියට, ඔවුන්ගේ විශ්වාසය ගොඩනැඟෙන විධියට ප්‍රතිපාදන තිබෙනවා වෙනුවට ගැටලු නිර්මාණය වෙලා තිබුණා. ඒවා වෙනස් කර ගැනීම අපේ ප්‍රධාන අරමුණ වුණා. ඒ ස්ථාවරත්වයෙන් ඔබ්බට ආයෝජන ගෙන යනකොට ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම, ආයෝජකයින්ගේ ආරක්ෂාව ඇති වන විධියට ඒ ආයෝජන සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කළ යුතු වනවා වාගේම බදු සහන ඇතුළු අනෙකුත් සහන ලබා දෙනවා නම් අභිමතාර්ථය - discretion එක - වෙනුවට යම් රීති පදනම් කරගෙන - rules-based ක්‍රමවේදයකට - ඒ කටයුතු සිද්ධ කළ යුතුයි. ඒ අනුව අපි මේ පනත් කෙටුම්පත ඇතුළේ විශේෂ අවධානය යොමු කරපු කාරණා ගණනාවක් තිබෙනවා. එකක් තමයි, බදු සහන. ඒ කියන්නේ, සමාගමට ලබා දෙන ආදායම් බදු. අපි මේ පනත සංශෝධනය කරන්න කලින් ආයෝජනය මොකක්ද, කවුද ආයෝජනය කරන්නේ, කොහෙන්ද ආයෝජන එන්නේ කියලා කිසිවක් බලන්නේ නැතුව අවුරුදු 25කට වැඩි ප්‍රමාණයකට මේ බදු සහන ලබා දීලා තිබුණා. අපි ප්‍රධාන වශයෙන් නිර්ණායකයක් ඉදිරිපත් කරනවා, ඒ ආයෝජනයේ ප්‍රමාණයත්, එමඟින් ජනනය කරන රැකී රක්ෂා ප්‍රමාණයත් මූලික වටයෙන් බලලා මේ බදු සහනය ලබා දෙන්න. ඒ අනුව ප්‍රධාන ආයෝජන වර්ග 4ක් "A", "B", "C", "D" කියලා වර්ගීකරණයකට ලක් කරනවා, ඩොලර් බිලියනය, ඩොලර් මිලියන 500, ඩොලර් මිලියන 100 වාගේම ඩොලර් මිලියන 25 යනාදී වශයෙන්. ප්‍රධාන වශයෙන් පවතින උපාය මාර්ගික වැදගත්කමක් තිබෙන ප්‍රාථමික ආයෝජකයින්ට මෙන්න මේ සහන ලබා දෙනවා. ඒ අනුව ඔවුන්ට ලබා දෙන උපරිම බදු සහන කාල සීමාව අවුරුදු 15කට සීමා කරනවා. ඒ වාගේම උපාය මාර්ගික වැදගත්කමක් තිබෙන ද්විතීයික ආයෝජන ව්‍යාපාර සඳහාත් අපි යම් සහනයක් ලබා දෙනවා. සමාගම්වලට හිමි බදු අනුපාතය අඩු කරලා පළමුවැනි අවුරුදු 4 ඇතුළතදී සියයට 7.5ක් වුණු අඩු බදු අනුපාතයක් ළඟා කරලා දෙනවා. එයින් අදහස් කරන්නේ යම් පොදු, සාධාරණ රීතියක් මත පදනම් කර ගත් බදු ක්‍රමවේදයක්.

ඊළඟට, පෞද්ගලික ආදායම් බදු සම්බන්ධයෙනුත් කථා කළා, විශේෂයෙන්ම ලංකාවේ වෘත්තිකයින් රට හැර යනවා කියලා. නමුත්, මෙතැන තිබෙන්නේ බදු පිළිබඳ සාධාරණත්වයේ මූලධර්මය. පුද්ගල ආදායම් බදු ගෙවීම ගත්තොත්, විවිධ ආදායම් මත අපි කවුරුත් බදු ගෙවීමට එකතු වෙනවා.

ඉන් එකක් තමයි සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම. ඒ සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමේදී අපි කවුරුත් බද්දට යටත් වෙනවා. හැබැයි, මේ සංශෝධනයට කලින් වරාය නගරයේ සමාගම් ලියාපදිංචි කරලා තිබුණා නම්, එතැනදී ඔවුන්ගෙන් පෞද්ගලික ආදායම් බද්ද නිදහස් කරලා තිබුණා. අපි ඒ වෙනුවට, සාධාරණත්වයේ පොදු බව ගෙන ඒම සඳහා ඒ නිදහස් කිරීම අහෝසි කරනවා. හැබැයි, දැනටමත් ඒ සහනය විඳින අයට, අනුමතිය ලද තැනැත්තෙකුට - authorized person කෙනෙකුට - අවුරුදු තුනක් දක්වා සහන කාලය ලබා දෙනවා. මොකද, ඔවුන් යම් ආකාරයකට සේවකයින් බඳවාගෙන වැඩ කටයුතු කරන නිසා. නමුත්, ඉදිරියේදී සේවකයින් බඳවා ගන්නකොට ඔවුන් දැන ගන්නවා, තමන්ගේ ආදායම බද්දට යටත්වෙනවා කියලා. ඒක, අදාළ ආයෝජකයාට හෝ සමාගමට බලපාන්නේ නැහැ. ඒක බලපාන්නේ සේවකයින්ට. ලංකාවේ වාසික පුද්ගලයන්ට. නිර්වාසික පුද්ගලයින් නම්, ඔවුන් ලංකාවෙන් උපයන ආදායම විතරයි මේ බද්දට යටත් වෙන්නේ.

ඒ වාගේම වැදගත් වෙන තවත් කාරණයක් තමයි බදු අනුකූලතාව. බදු අනුකූලතාව පවත්වා ගැනීමට ඔවුන්ට බදු සහනය ලබා දෙන කාලයේදී පවා ඔවුන් ලිපිගොනු, බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලබා දෙන්න ඕනෑ. ඒ අනුව තමයි අපට අධීක්ෂණ කටයුතු, නිරීක්ෂණ කටයුතු සහ අදාළ මඟ පෙන්වීම් කරන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා ඉතාම වැදගත් වන සංශෝධනයක් අපි මේ පනතට ගෙනැවිත් තිබෙනවා. ඒ අධීක්ෂණය සිදු කිරීම සඳහා අවශ්‍ය බලතල මේ සංශෝධනය ඇතුළේ දීලා තිබෙනවා.

ඒ වාගේම විශේෂයෙන්ම සාකච්ඡාවට භාජන වුණා, අක්වෙරළ සමාගම් - offshore banking units - සම්බන්ධව. මේ කියන ආකාරයට, කිසිදු ගැටලුවක් ඇතිවෙන විධියට සහන ලබාදීමක් හෝ අවසරපත් ලබා දීමක් සිදුකරලා නැහැ. අපි දන්නවා, අක්වෙරළ සමාගම් හරහා මේ වැඩ කටයුතු, මූල්‍ය ක්‍රියාකාරකම් වෙනකොට එය අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම ඉතාම වැදගත් කියලා. ඒ නිසා මේ පනතට සිදුකරන සංශෝධනය අනුව විදේශ විනිමය පනත බලාත්මක කරලා, ඒක සම්බන්ධ කරලා තිබෙනවා. ඒ වාගේම මහ බැංකුවට, 42 වන වගන්තිය අනුව -කොටස් 6කින්- විශේෂිත වූ බලතල පවරා තිබෙනවා, අධීක්ෂණ කටයුතු කිරීමට සහ නියාමනය කිරීමට. ඒ අනුව යම් ගැටලුවක් පැන නඟිනවා නම් ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. ඒ වාගේම මේකට ඉදිරියේදී තව සංශෝධන ඉදිරිපත් කරන්නත් පුළුවන්. අපි කිසිදු ආකාරයකින් ඉඩක් තබා නැහැ, අනවශ්‍ය වැඩ කටයුත්තකට යන්න. ඉතා පැහැදිලිවම මේ අධීක්ෂණ කටයුතු ඉදිරියට සිදුවෙමින් පවතිනවා. දැනටමත් වරාය නගරයට අනුමත ලද තැනැත්තන් - authorized persons - 149 දෙනෙකු ඇවිල්ලා ඉන්නවා. ඒ අය අතුරින් උපාය මාර්ගික වැදගත්කමක් තිබෙන ප්‍රාථමික ව්‍යාපාර 4කට අවසර දීලා තිබෙනවා. ඒ වාගේම duty-free සමාගම් 3ක්, ද්විතීයික උපාය මාර්ග වැදගත්කමක් තිබෙන ආයතන 24ක් වශයෙන් සැලකිය යුතු සමාගම් ප්‍රමාණයක් තිබෙනවා. දැන් ඔවුන්ට නිශ්චිත පොදු පදනමක් යටතේ මේ ආයෝජනවල නියැළෙන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණයක් ඉදිරිපත් කරන්න මම පුංචි කාලයක් ගන්නම්. විශේෂයෙන්ම අද දින විවාදය ඇතුළෙත්, විවාදයෙන් පිට විවිධ සමාජ මාධ්‍ය සහ විවිධ මාධ්‍ය ඔස්සේත් අපි ගන්නා වූ මේ ක්‍රියාමාර්ගය ආපස්සට හැරවීම සඳහා විවිධ වූ අවලාද, බොරු ප්‍රකාශ නිකුත් කරනවා; අවිශ්වාසය ගොඩ නඟන්න උත්සාහ කරනවා. අදත් පාර්ලිමේන්තුවේදී මතු කළා, අපි ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පතේ පරිපූරක ඇස්තමේන්තු විධියට ජූලි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා virement ක්‍රියාපටිපාටිය යටතේ ඒ වැය ශීර්ෂ මාරු කිරීම සම්බන්ධයෙන් අදාළ වාර්තාව දෙසැම්බර් 31ට කලින් නිසි පරිදි එවා නැහැ කියලා. දෙසැම්බර් 31වැනි දාට එවන්න කියලා වාර්තාවක් නැහැ. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ තිබෙන වාර්තා සියල්ලක්ම නිසි පරිදි එවා තිබෙනවා. අපි අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැහැ. කියලා, පසුව වැරදුණා කියලා සමාව ගන්නේ නැහැ. පැහැදිලිව කියනවා, ඒ දින වකවානුව තුළ වාර්තා එවා තිබෙනවා. එතකොට දෙසැම්බර් 31ට එවන්න වාර්තාවක් නැහැ. හැබැයි, වාර්තාවක් එවන්න තිබෙනවා,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

Virement ක්‍රියාපටිය ඇතුළේ අපි කරන මෙවැනි මාරුකිරීම් තිබෙනවා නම්, ඒ මාරු කිරීම සිද්ධ කරපු, පළමුවැනි ප්‍රතිපාදනය සිද්ධ කරපු දවසේ ඉඳලා මාස 6ක් ඇතුළත. එතකොට ප්‍රතිපාදනය වෙන් කරන්නේ ජූලි මාසයේ 07වැනි දා. ගණනය කර බැලුවොත්, ජූලි මාසයේ 7වැනි දා ඉඳලා 2026 ජනවාරි 07වැනි දා වෙනකොට තමයි ඒ මාස හය කල් පිරෙන්නේ. එතකොට ඒ වාර්තාව අපි නිසි පරිදි ඉදිරිපත් කර තිබෙනවා. කිසිදු ගැටලුවක් නිර්මාණය වෙලා නැහැ.

ඒ වාගේම සමහර තාක්ෂණික කාරණා ගත්තොත්, ඇත්තටම ඒවා ආර්ථිකයට හෝ අද කථාවට අදාළ නොවුණත් අනවශ්‍ය බයක් හදන්න උත්සාහ කරනවා. අද විශේෂ සිද්ධියක් වුණා, කොළඹ කොටස් වෙළඳපොළ තුළ. WealthTrust Securities Limited කියන සමාගමේ IPO එක, ප්‍රාථමික නිකුතුව කරනකොට ඔවුන් නිකුත් කර තිබුණේ රුපියල් 7ක වටිනාකමට. රුපියල් 7ක වටිනාකමට කොටස් වෙළඳපොළේ කොටස් හුවමාරුව තුළ ගනුදෙනු කරනකොට ඒ බ්‍රෝකර්වරු කිහිපදෙනෙක් හරහා රුපියල් 25,000ක් වාගේ ඉතාම අධික මිලකට මිලදී ගැනීමක් සිදු වී තිබෙනවා. එය තාක්ෂණිකව හෝ ප්‍රායෝගිකව වෙන්න පුළුවන් දෙයක් නොවෙයි. එවැනි මිලකට ගනුදෙනු ගණනාවක් වෙච්ච නිසා අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ආණ්ඩුව පැත්තෙන් එය නියාමනය කරන යන්ත්‍රණය තමයි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - Securities and Exchange Commission of Sri Lanka. ඔවුන් වහාම මැදිහත් වෙලා ඒ සමාගමේ කොටස් ගනුදෙනු යම් කාල සීමාවකට අත්හිටෙව්වා. නමුත්, හෙට නිසි පරිදි ඒ කටයුත්ත සිද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි, එහෙම සිද්ධ වුණේ මොකද කියන එක සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබනවා. ඒ අනුව කවුරු හෝ වරදක් කර හෝ ගැටලුවක් නිර්මාණය කර තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අපි ක්‍රියාමාර්ග ගන්නවා. නමුත් අපි අතීතයේදී දැක්කා, කොළඹ කොටස් වෙළඳපොළ මොන ආකාරයේ සූදු පොළක් බවට පරිවර්තනය කරගත්තාද කියලා. Pumping and dumping strategies කරලා ලංකාවේ තිබුණු ගොඩක් රාජ්‍ය ආයතනවල අරමුදල් විනාශ කරපු තත්ත්වයකට සම්බන්ධකම් තිබෙන කණ්ඩායම් තමයි අද මේවා ගැන කියන්නේ. නමුත් අපි ආයෝජකයන්ට පැහැදිලි කිරීමක් කරනවා, කිසිදු ආකාරයක බියක් ඇති කරගත යුතු වෙන්නේ නැහැ, මේ ඇති වුණු තත්ත්වය පරීක්ෂා කර ඉදිරියේදී අපි අදාළ ක්‍රියාමාර්ග ගන්නවා කියන එක.

මේ වෙලාවේ "දිට්වා" සුළි කුණාටු තත්ත්වයෙන් අපි ඉදිරියට ගමන් කරමින් තිබෙනකොට තවත් කාරණාවක් ඉදිරිපත් කළා, අපි ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව හරිද, තව මුදල් තිබෙනවාද, ඉදිරියේදී ප්‍රමාණවත් වෙයිද කියලා. ඒ විධියේ විවිධ සැක සංකා හදනවා. ඇත්තටම, අපි යම් ව්‍යසනයකට මුහුණ දී තිබෙනවා නම්, යම් ආපදා තත්ත්වයකට මුහුණ දී තිබෙනවා නම්, එයින් යම් ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා නම්, පළමුවෙන් සිදු කළ යුතු වෙන්නේ, ඒ ගැටලුව සඳහා උත්තර සෙවීමයි. මිනිස්සුන්ට වාසස්ථාන අහිමි වෙලා තිබෙනවා නම්, ඔවුන්ගේ ආහාරවේල සොයා ගන්න බැරි වෙලා තිබෙනවා නම්, ඉස්සෙල්ලාම කරන්න ඕනෑ තිබෙන ප්‍රතිපාදනවලින් ඒ වැඩ කටයුත්ත කිරීමයි. එහෙම නැතුව ලබන මාසයට දෙන්න පුළුවන් වෙයිද, ඊළඟ අවුරුද්දට මේ වැඩේ කරන්න පුළුවන් වෙයිද කියලා අනවශ්‍ය බියක් හෝ සැකයක් නිර්මාණය කරන එක නොවෙයි. අපි නිසි පරිදි මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකම් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකාව නැවත ගොඩ නැඟීම සහ ව්‍යසනයෙන් පීඩාවට පත් මිනිසුන්ගේ ජීවිත තිබුණාටත් වඩා හොඳ මට්ටමකට පත් කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ තුළ නිවාස සකස් කිරීම විතරක් නොවෙයි, ව්‍යාපාරවලට හානි සිද්ධ වුණා නම් ඒ සඳහාත් ආධාර ලබා දීම හා වගාවන්ට හානි සිද්ධ වුණා නම්; වී, පලතුරු, එළවලු, අපනයන භෝග ආදී සෑම ක්ෂේත්‍රයකටමත් මුදල් වෙන් කර තිබෙනවා. ඒ මුදල් ගෙවන්නේ කොහොමද කියන කාරණය පිළිබඳ යන්ත්‍රණය චක්‍රලේඛන මඟින් නිකුත් කරමින් තිබෙනවා. ඒ නිසා අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. ඒ අනුව තමයි රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළේ. ඉතින් අපේ වගකීම වෙන්නේ, ඒ මුදල් නිසි පරිදි වියදම් කර ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීමයි.

ඒ වාගේම චෝදනා ඇතුළේ තවත් කාරණයක් තිබුණා, මේ රටේ අරාජිකත්වයක් තිබෙනවා, වැඩ කටයුතු කරන්න බැහැ, විගණකාධිපතිවරයා පත් කර නැහැ කියලා. ඇත්තටම, විගණකාධිපතිවරයා වශයෙන් පත් වෙන්න සුදුසුකම් තිබෙන්නේ, වරලත් ගණකාධිකාරීවරයෙකුටයි. ඒ මූලික සුදුසුකම් ලබපු කෙනෙක්ව යෝජනා කළාට පසුවත් විශේෂයෙන්ම විපක්ෂය සහ අර ස්වාධීන යැයි කියන කණ්ඩායම් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී එය ප්‍රතික්ෂේප කළා. බාධා කිරීම් මැද වුණත් ජනාධිපතිවරයාගේ වගකීම නිසි පරිදි ඉෂ්ට කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය තවත් බයක් නිර්මාණය කළා. විශේෂයෙන්ම ඒ බය නිර්මාණය කිරීමේදී ඔවුන් ඉලක්ක කර ගන්නේ ආයෝජකයන්. අපි කවුරුත් දන්නවා, රට ගොඩනැඟීමේ අපේ වැඩසටහන සැලසුම් සහිතව ඉදිරියට එනකොට එය ක්‍රියාත්මක වන්නේ විශේෂයෙන්ම ජාත්‍යන්තර සංවිධානවල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් සම්බන්ධ කරගෙන බව. එහි තිබුණා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අදාළ වැඩසටහනේ අප ළඟා කරගත යුතු ඉලක්ක; ආදායම් ඉලක්ක, ණය ඉලක්ක, ණය ආපසු ගෙවීමේ ඉලක්ක, ඒ වාගේම යහපත් ආණ්ඩුකරණය පිළිබඳ ඉලක්ක. අප ඒ සියල්ල නිසි පරිදි ඉෂ්ට කරමිනුයි එන්නේ. නමුත් සමහරු දැන් හදනවා කථාවක්, IMF එක 6වන වාරිකය දුන්නේ නැහැ කියලා. නැහැ, ඒක එහෙම නොවෙයි සිද්ධ වුණේ. අපි කවුරුත් බලාපොරොත්තු වුණේ නැති දෙයක් නොවැම්බර් 27වන දා සිද්ධ වෙනවා. ඒ නිසා ආණ්ඩුවේ වගකීමක් විධියට මැදිහත් වෙලා පරිපූරක ඇස්තමේන්තුවක් ගේන්න අපට සිද්ධ වෙනවා. මොකද, දැනට තිබෙන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව අවුරුද්දකදී වියදම් කරන්න පුළුවන් වන්නේ අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක් විතරයි. ඒ සියයට 13 තිබෙන්නේ අපේ ඉලක්කගත සංවර්ධන කටයුතුවලටත්, අවශ්‍ය කරන පුනරාවර්තන වියදම් සඳහාත් වියදම් කරන්නයි. ඒකට හානියක් කර ගන්නේ නැතුව, ඒකට බාධා කර ගන්නේ නැතුව මේ ආපදාවෙන් විපතට පත් වෙච්ච තත්ත්වය පාලනය කරන්නේ කොහොමද කියලා අපි කල්පනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අදාළ ප්‍රතිපාදනය තිබෙනවා. මේ ප්‍රතිපාදනයට යටත්ව අපි ඒ අදාළ වෙන් කිරීම සිදු කර ගත්තා. ඒ අනුව එය සියයට 14.4 දක්වා ඉහළ යනවා. කෙසේ වෙතත්, ඒ අදාළ වෙන් කිරීම කරලා අපි නිසි පරිදි වැඩකටයුතු කරමින් සිටිනවා. කිසිදු දෙයක් නීතියට පරිබාහිරව, එහෙම නැත්නම් පාරදෘශ්‍යභාවයට හානි කරමින්, ගැටලු සහිතව සිදු කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම සඳහන් කරන්න කැමැතියි, 2025 වර්ෂයේදී ඕනෑම ක්ෂේත්‍රයකින්; රාජ්‍ය මූල්‍ය එකතු කර ගැනීමේ කටයුත්තේ සිට, ආණ්ඩුකරණය පිළිබඳ කටයුත්ත, බාහිර අංශයේ සංචිත එකතු කර ගැනීම, අපනයනය, සංචාරක කර්මාන්තයේ ආදායම යනාදි සියලු කරුණු කාරණා අතින් අප අපේක්ෂා කරපු ඉලක්ක අභිභවමින් ඉදිරියට යමින් සිටින බව. ඒ නිසා මම දැඩි විශ්වාසයකින් මහ ජනතාවටත්, මේ ගරු සභාවටත් සඳහන් කරනවා, අපට ලැබුණු අභියෝගය හමුවේ, මේ අභියෝගය නොවෙයි, මීටත් වඩා කුමන අභියෝගයක් ආවත් අප ඒ කටයුත්ත විශ්වාසවන්තව ඉදිරියටම කරගෙන යන බව. ඒ වාගේම 2026දී අප සැලසුම් කළ පරිදි මේ ආයෝජන ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂිත වෘද්ධි අනුපාතය දැනට තිබෙන ඉලක්ක අභිභවමින් ඉදිරියට යනු ඇති. එසේ ඉදිරියට යන්න පුළුවන් වේවි කියන විශ්වාසය ඇතිව මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***

***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*

*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]*

*Resolved:*

*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 18 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2025 දෙසැම්බර් 28 දිනැති අංක 2468/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.01.06 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු චාමර සම්පත් දසනායක මහතා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

# කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ ගරු පරිසර අමාත්‍යතුමාටයි.

(අ) i. ලංකාවේ දැනට වනඅලි සංගණනයක් කර තිබේද? ඒ අනුව දැනට ලංකාවේ සිටින වනඅලි සංඛ්‍යාව කොපමණද?

ii. 2025 වර්ෂයේ විවිධ මානව ක්‍රියාකාරකම් නිසා වනඅලි කී දෙනෙකු මිය ගොස් ඇත්තේද?

iii. ලංකාවේ වනඅලි ගැටලුවට නිසි ක්‍රියාමාර්ග නොගතහොත්, සංචාරක කර්මාන්තය බිඳ වැටී ආර්ථිකයට බලපෑමක් එයින් එල්ල වන බවත්, මේ පිළිබඳව පසුගිය රජයන්ද කිසිදු පියවරක් නොගත් අතර, වර්තමාන රජය විසින් මේ පිළිබඳව ගනු ලබන පියවර කුමක්ද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසර සංවිධාන එකමුතුව විසින් පවසන පරිදි ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ පාලුකඩවල නාකොලගනේ රජමහා විහාරය ආසන්නයේ පවතින වනාන්තරයේ අක්කර 5,400ක් පමණ එළි කිරීමට යෝජිතයි. එම ප්‍රමාණය අක්කර 400කට පමණ සීමා කරන්නේ නම් හොඳයි. එමෙන්ම, අඹන්පොළ-ගල්ගමුව අතර ඇති ගැටදිවුල පාලම අසල පිහිටි අලිමංකඩෙන් නිතරම වනඅලි මාරු වන නිසා, ඒ පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම සඳහා පොලිස් මුරපොළක් ඉදි කිරීම වඩාත් මැනවි. වනඅලි මරණ වැඩිපුර සිදු වන්නේ පොලීසිය විෂය භාර ඇමතිතුමා නියෝජනය කරන ගල්ගමුව ප්‍රදේශයේ සහ අලි වැට ගැසීමට මුලින්ම විරුද්ධ වුණු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා නියෝජනය කරන යාපහුව ප්‍රදේශයේ බැවින්, එතුමන්ලාගේ අවධානය ද මේ සඳහා වැඩි වශයෙන් යොමු කළ යුතුයි.

වනඅලි දුම්රියේ ගැටීමෙන් සිදු වන අනතුරු බහුල බැවින් විශේෂයෙන්ම "මීනගයා" දුම්රියට බිලි වන වනඅලි සංඛ්‍යාව පිළිබඳව සලකා බලා, එම අනතුරු අවම කිරීමට විශේෂිත ආලෝක සංඥා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමටද රජය උත්සාහ ගත යුතුය. මඩකලපුව හා මහව දුම්රිය ස්ථාන අතර "මීනගයා" දුම්රිය ධාවනය කරවන රියැදුරා සමහර අවස්ථාවලදී බීමත්ව රාජකාරිය කරන බවට පරිසර සංවිධාන එකමුතුව විසින් නොයෙකුත් චෝදනා කරන අතර, ඒ පිළිබඳව සලකා බලා අතිරේක දුම්රිය රියැදුරෙකුගේ සහාය ඔහුට ලබා දීම ද ප්‍රායෝගිකය.

දැන් රජයෙන් කියන්නේ විපක්ෂය අලි මරනවා කියලායි. මෑතකදී "මීනගයා" දුම්රියේ ගැටී අලි 12ක් පමණ මිය ගියා. ආණ්ඩුවේ අය කියන පරිදි, එම දුම්රියේ රියැදුරාත් විපක්ෂයේ කෙනෙක් වෙන්න ඇති. එහෙම නම් අවුරුදු 67ක් වන ඔහුව ආණ්ඩුව විසින් ඉවත් කළ යුතුයි. එමෙන්ම, විදුලි වැටත් ප්‍රමිතිගතව ඉදි කළ යුතුයි. සමහර විදුලි වැටවල විදුලිය විශාල ධාරිතාවකින් පැවතීම නිසා අලින්ගේ ජීවිතවලට තර්ජනයක් පවතිනවා. ඒ වාගේම හක්ක පටස් සඳහා භාවිත කරන වෙඩි බෙහෙත් මිනිසුන් සපයා ගන්නා ආකාරය ද සොයා බැලිය යුතුයි.

මේ වන විට රටේ කවුරුත් කථා කරන සුවිශේෂ හස්තියෙකු වන "කාවන්තිස්ස" හස්තියා සම්බන්ධවත් සඳහන් කළ යුතුයි. නීති විරෝධී ක්‍රියාකාරකම්, මත්පැන් පෙරීම් සිදු වන ප්‍රදේශවල එම හස්තියා නිරන්තරයෙන් ගැවසෙන බැවින්, එම හස්තියාට විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව සැපයිය යුතු යැයි පරිසර සංවිධාන ප්‍රකාශ කරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්ද සම්පූර්ණයෙන්ම මේ රට පාලනය කළේ ජාතික ජන බලවේගය ආණ්ඩුව. අලි-මිනිස් ගැටුම නිසා මේ වෙනකොට වනඅලි 409ක් මිය ගිහිල්ලා තිබෙනවා. ලංකාවේ සංචාරක ව්‍යාපාරයට මේක බලපානවා. යුරෝපයේ රටවල් කොච්චර දියුණු වුණත් ඒ රටවල අලි කෙන්දක්වත් දකින්න නැහැ. ලංකාව ඇතුළු ආසියාතික රටවල සහ අප්‍රිකානු රටවල තමයි මේ අලි විශේෂයෙන්ම ඉන්නේ. ඒ නිසා මේ විධියට අපේ රටේ අලි මියයෑම ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

"මීනගයා" රාත්‍රී දුම්රියේ රියැදුරා මහව දුම්රිය ස්ථානයේදී මාරු වෙනවා. මහව දුම්රිය ස්ථානයේ ඉඳන් මඩකලපුව දක්වා මේ දුම්රිය ධාවනය කරන්නේ වෙනත් රියැදුරෙක්. මේ රියැදුරා ධාවනය කරපු දුම්රියේ ගැටීමෙන් දැනට වනඅලි 12ක් මැරිලා තිබෙනවා. මේ රියැදුරා මහව සිට මඩකලපුව දක්වා දුම්රිය ධාවනය කරපු අවස්ථාවලදී විතරක් වනඅලි 12ක් දුම්රියේ ගැටී මිය ගිහිල්ලා තිබෙනවා. මේ රියැදුරාගේ දැන් වයස අවුරුදු 67යි. එයා තවමත් දුම්රිය රියැදුරකු හැටියට මහව ඉඳන් මඩකලපුව දක්වා ගමන් ගන්නා දුම්රියේ සේවය කරනවා. මේ අලි-මිනිස් ගැටුම නිසා 2025 අවුරුද්දේ විතරක් අලි 409ක් මිය ගිහිල්ලා තිබෙනවා. අලි 409ක් කියන්නේ පොඩි ගණනක් නොවෙයි. අලි 409ක් මිය ගියා කියන්නේ රටට වටිනා විශාල අලි සම්පතක් නැති වුණා කියන එකයි. විශේෂයෙන්ම ගල්ගමුව, යාපහුව කියන මැතිවරණ කොට්ඨාසවල අපි ඊයේ පෙරේදාත් දැක්කා, කැලෑ ශුද්ධ කරනවා; බොරලු කපනවා. මේ දේවල් නිසා අලින්ට ඉන්න තැන් නැති වෙනවා. මේ ප්‍රශ්නය ලොකුවටම තිබෙනවා. අපි ඇහිල්ල දිගු කරන්නේ නැහැ, මේ ආණ්ඩුවම මේකට වග කියන්න ඕනෑ කියලා. පසුගිය කාලයේ ඉඳලාම මේ අලි මරණ සිදුවීම කාටවත් නවත්වා ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මේ වැඩේ දිගින් දිගටම වුණොත් අනාගතයේදී ලංකාවේ අපට අලියෙක් දැකගන්න වෙන එකක් නැහැ. තව අවුරුදු 10ක්, 15ක් යනකොට අපේ රටේ සිටින මේ අලි අපට නැතිවන ලකුණු පේනවා. මේකට අපි කවුරුත් වගකිව යුතුයි. පරිසරවේදීන් දිගින්

දිගටම මේ වෙනුවෙන් සටන් කරනවා; උසාවි යනවා. මේ අලි-මිනිස් ගැටුම වෙනුවෙන් පෙනී හිටපු කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමහර වනජීවී නිලධාරින් ස්ථාන මාරු කර තිබෙනවා. ඒ වෙනුවෙන් කථා කරපු නිලධාරින්ට ප්‍රශ්න ඇතිවෙලා තිබෙනවා. ඒක එච්චර හොඳ දෙයක් නොවෙයි. අපට මිනිස්සුත් ඕනෑ, අලිත් ඕනෑ. ඒ නිසා මේ දෙපැත්තම අපට බලන්න වෙලා තිබෙනවා. හැබැයි, අපේ රටේ අලි නැති වුණොත් අපේ රටට එන සංචාරකයන් ප්‍රමාණයත් අඩු වෙන්න පුළුවන්. මොකද, අපේ රටට එන සංචාරකයන් සියලුදෙනාම වාගේ එන්නේ මේ අලි බලන්නත් එක්ක. ලංකාව තුළ අලි කොච්චර ඉන්නවා ද කියලා එක එක සංවිධාන තවමත් සංගණන කරනවා. ඒ සංවිධාන තුළින් මොන සංගණන කළත් මේ වෙනකොට අපේ රටේ කොච්චර අලි ප්‍රමාණයක් ඉන්නවා ද කියලා තවම සංගණනයක් කරලා නැහැ. 2025 අවුරුද්ද ඇතුළත අලින් 409ක් මියගියා කියන්නේ පොඩි ගණනක් නොවෙයි. ඊයේ පෙරේදා මිහින්තලේදී ඇස් පේන්නේ නැති අලියෙක් ගිනි තියලා මැරුවා. ඒ වාගේ තවත් සිදුවීම් ගොඩක් සිද්ධ වෙනවා.

ලංකාවේ වැඩියෙන්ම අලි මැරිච්ච අවුරුද්ද වෙලා තිබෙන්නේ 2025 අවුරුද්ද. 2025 අවුරුද්දේ අලින් 409කට වැඩි ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. 2025 අවුරුද්ද තමයි වැඩියෙන්ම අලි මැරිච්ච අවුරුද්ද බවට පත්වෙලා තිබෙන්නේ. වගකිව යුතු රජයක් හැටියට මේ අලි ආරක්ෂා කර ගත්තේ නැත්නම් අපේ රටට විදේශිකයන්ගේ පැමිණීම අඩු වෙන්න පුළුවන්. මොකද, අපේ රටට විදේශිකයන් ආවොත් අනිවාර්යයෙන්ම අලි බලන්න යනවා. විදේශිකයන් අපේ රටට ආවාම අනිවාර්ය දෙයක් තමයි අපේ රටේ අලි නැරඹීම. ඒක නිසා අපේ රටේ අලින් මිය යෑම අද වෙනකොට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපේ වාගේ රටකට මේ අලි සම්පත කොච්චර වටිනවා ද කිව්වොත්, අපට ඒක ඩොලර්වලින් මැනලා කියන්න බැහැ. මම මේ සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනාවේ මේක කථා කරන්න ඕනෑ ප්‍රශ්නයක් නිසායි. මේ වෙනුවෙන් අපි පෙනී සිටිනවා; විවිධ සංවිධාන පෙනී සිටිනවා.

මේ වෙනුවෙන් හැමෝම එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. ඒ නිසායි මම මේ යෝජනාව ගෙනාවේ. 2026 අවුරුද්දේ හැමෝම එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. පසුගිය අවුරුද්දේ අලි මරණ 409ක් වුණා නම්, 2026 අවුරුද්දේවත් අඩුම වශයෙන් අපි මේ ගැන හිතලා වැඩ කරලා අලින් ආරක්ෂා කර ගන්න ඕනෑය කියන යෝජනාව තමයි මම මේ වෙලාවේ කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පරිසර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් සභාව කල් තබන අවස්ථාවේදී අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) i. ඔව්.

ලංකාවේ වනඅලි සංගණනයක් අවසන් වතාවට 2024 වර්ෂයේ දී කළා. ඒ සංගණනය අනුව ලංකාවේ වනඅලි අඩුම ගණනේ 7,451ක් සිටිනවා. 2024 වර්ෂයට කලින් 2011දී තමයි වනඅලි සංගණනයක් කළේ. ඒ සංගණනයේ දී වාර්තා වුණු අඩුම ගණනේ අලි 5,879ක් රට තුළ ජීවත් වෙනවා කියලා. ඒ අනුව 2011 වසරේ සිට 2024 අතර කාලය තුළ ලංකාවේ වනඅලි ගහනය 1,572කින් වැඩි වෙලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත්, ඒක සියයට 26.7ක වැඩිවීමක්. මේ සංගණනය අනුව හෙළිදරව් වුණා තරුණ ඇතුන් - දළ සහිත ඇතුන්- සංඛ්‍යාව සියයට 17.6ක් කියලා. 2011 වර්ෂයේ දී හිටපු දළ සහිත අලි සංඛ්‍යාව සියයට 8.4යි. 2024 වර්ෂය වන විට එම සංඛ්‍යාව සියයට 17.6ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩිවීම දළ වශයෙන් සියයට 9.2ක වැඩිවීමක්. මුළු ඇතුන්ගේ ප්‍රතිශතය ගත්තොත්, 2024 වසරේ දී සියයට 6.5ක්. 2011දී ඒ ප්‍රතිශතය සියයට 6ක් හැටියට වාර්තා වුණේ. ඒ නිසා මුළු ඇතුන්ගේ සංඛ්‍යාව මේ කාලය තුළ සියයට දශම 5කින් වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා ලෝකයේ සිටින අලින්ගේ තත්ත්වය පිළිබඳව. ආසියානු අලියා කියන්නේ ලෝකයේ වඳ වී යෑමේ තත්ත්වයට මුහුණ දීලා සිටින සත්වයෙක්. ආසියානු අලින්ගෙන් සියයට 60ක් ජීවත් වෙන්නේ ඉන්දියාවේ. ඉන්දියාවේ අවසන් වරට සංගණනයක් කළේ 2025 වර්ෂයේ දීයි. 2025 වර්ෂයේ අවසන් භාගයේදී -නොවැම්බර් මාසයේදී වාගේ- තමයි ඒ සංගණන වාර්තාව නිකුත් වුණේ. ඒ අනුව 2025 වසරේ ඉන්දියාවේ අලි ගහනය 22,446යි. ඊට කලින් අවසන් වතාවට ඉන්දියාවේ අලි සංගණනයක් කරලා තිබුණේ 2017දී. එතකොට වර්තා වුණා අලි 29,964ක් ඉන්දියාව තුළ සිටිනවා කියලා. ඒ අනුව ඉන්දියාවේ අලි ගහනය 2017-2025 කාලයේ දී සියයට 25කින් අඩු වෙලා තිබෙනවා. ඒ අනුව වසර 8ක දී අලි සංඛ්‍යාව 7,518කින් අඩු වෙලා තිබෙනවා. පොදුවේ ගත්තොත්, මේ ආසියානු අලි වඳ වී යෑමේ තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. ඉන්දියාව සහ ලංකාව සංසන්දනය කළාම ඉන්දියාවේ අලි ගහනය සියයට 25කින් අඩු වෙද්දී, 2011 සිට 2024 කාලයේ දී ලංකාවේ අලි ගහනය සියයට 26.7කින් වැඩි වෙලා තිබෙනවා.

ii. මිය ගිය වනඅලි සංඛ්‍යාව කොපමණ ද කියලා එතුමා සඳහන් කළා. එතුමා ජනතාව නොමඟ යවන වැරදි ප්‍රකාශයක් කළා, 2025 වර්ෂයේ දී තමයි වැඩිම අලි මරණ සංඛ්‍යාවක් සිදු වුණේ කියලා. ඒක අමූලික බොරුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට වැඩිම අලි මරණ සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙන්නේ 2023 වසරේදී. එහිදී අලින් 488ක් මිය ගිහිල්ලා තිබෙනවා. 2024දී ඒක 388 දක්වා අඩු කර ගන්න හැකියාව ලැබුණා. 2025 වසරේදී ඒක 409ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලයේ අලි-මිනිස් ගැටුම තීව්‍ර වීමත්, අලි දුම්රියේ ගැටීම, "දිට්වා" සුළි කුණාටුව විසින් ඇති කළ තත්ත්වයත් මේ අලි මරණ වැඩි වීමට හේතු වෙලා තිබෙනවා. අලි මරණ අතරින් සියයට 44ක් පමණ සිදු වෙලා තිබෙන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසා. වෙඩි තැබීම් මඟින් 76ක්, විදුලි සැර වැදීම් මඟින් 62ක්, හක්ක පටස් මඟින් 53ක් සහ විෂ ශරීරගත වෙලා අලින් දෙදෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. අපේ රටේ එක පැත්තකින් අලි මරණ 409ක් සිදු වෙද්දී ඒ අතරින් සියයට 44ක් පමණ සෘජුවම මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු වෙලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

iii. අලි-මිනිස් ගැටුම සම්බන්ධයෙන් එතුමා iii වන ප්‍රශ්නය මතු කර තිබෙනවා. අලි-මිනිස් ගැටුම ගත්තොත්, අපේ රටේ අලි-මිනිස් ගැටුමට බලපාන විශේෂ සාධක කිහිපයක් තිබෙනවා. ආසියානු අලින් ජීවත් වන රටවල් ගත්තොත් ඔබ දකින්න ඇති, වැඩිපුරම -සියයට 60ක්- ඉන්නේ ඉන්දියාවේ බව. හැබැයි, ඉන්දියාවේ අලි ගහනය අඩු වෙමින් තිබෙනවා. ලංකාවේ අලි ගහනය වැඩි වෙමින් තිබෙනවා. ආසියානු අලින් ජීවත් වන රටවල් අතරින් වැඩිම අලි ඝනත්වය සහිත රට ශ්‍රී ලංකාවයි. සමස්ත භූමි ප්‍රමාණයට සාපේක්ෂව ගත්තත්, වැඩිම අලි ගහනය සහිත රට ශ්‍රී ලංකාවයි. අනෙක් පැත්තෙන් අලින් ජීවත් වන අලින්ගේ වාසස්ථානවලට සාපේක්ෂව ගත්තොත්, වැඩිම අලි ඝනත්වය සහිත රට ශ්‍රී ලංකාව හැටියට තමයි වාර්තා වෙන්නේ. අලි ඇතුන්ගේ වාසස්ථානවලට සාපේක්ෂව ලංකාවේ අලි ඝනත්වය ගත්තොත්, කිලෝමීටරයක් තුළ අලින් 25කට වඩා ජීවත් වනවා. ඒ වාගේම මේ ආසියානු අලින් ජීවත් වන කලාපය තුළ වැඩිම ජනගහන ඝනත්වයක් සහිත රට තමයි ශ්‍රී ලංකාව. අපේ රටේ අලි-මිනිස් ගැටුම තීව්‍ර වෙන්න මේ කාරණා බලපා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපිට මේ ප්‍රශ්නය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් මැදිහත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු චාමර සම්පත් මැතිතුමා අහන ප්‍රශ්නය තමයි, ලංකාවේ වනඅලි ගැටලුවට නිසි ක්‍රියාමාර්ග නොගතහොත් සංචාරක කර්මාන්තය බිඳ වැටී ආර්ථිකයට බලපෑමක් එයින් එල්ල වන බවත්, මේ පිළිබඳව පසුගිය රජය ද කිසිදු පියවරක් නොගත් බවත්, වර්තමාන රජය විසින් මේ පිළිබඳව ගනු ලබන පියවර කුමක්ද කියන එක. පසුගිය රජයන් මේ සම්බන්ධයෙන් පියවර ගෙන තිබුණේ නැහැ. ඒ නිසා තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපට මේ සම්බන්ධයෙන් විශේෂ මැදිහත්වීමක් කරන්න සිදු වෙලා තිබෙන්නේ.

අපේ රජය තේරී පත් වුණාට පස්සේ අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා විශේෂ මැදිහත්වීමක් කර තිබෙනවා. මේ රජය තේරී පත් වුණාට පස්සේ අපි හඳුනා ගත්තා, අලි-මිනිස් ගැටුමට කාලයක් තිස්සේ පැවති වැරදි දේශපාලන සංස්කෘතියත්, වැරදි ආර්ථික ප්‍රතිපත්ති විසින් ඇති කර තිබෙන තත්ත්වයත් හේතු වෙලා තිබෙන බව. එහි ප්‍රතිඵල හැටියට අලින්ගේ වාසස්ථාන අහිමි කර තිබෙනවා, සුපෝෂණ ස්ථාන අහිමි කර තිබෙනවා.

මේ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙද්දී අපි දැකපු දේ තමයි, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මෙහිදී ප්‍රධාන කාර්යභාරයක් පැවරෙනවා කියන එක. නමුත්, පසුගිය කාලය තුළ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන කාර්යය ඉටු කිරීම සඳහා මානව සම්පත් හා භෞතික සම්පත් අවශ්‍ය ප්‍රමාණයට සම්පාදනය කර තිබුණේ නැහැ. අපේ රජය ඒ කටයුතු ආරම්භ කරපු ගමන්ම මානව සම්පත් හා භෞතික සම්පත් සම්බන්ධයෙන් අවශ්‍ය මූලික පියවර ගත්තා.

ඒ අනුව අපි 2025 වසරේ අලිවැට සහායකයින් 3,551ක් බඳවාගෙන තිබෙනවා. සිවිල් ආරක්ෂකයන් 5,000ක් බඳවාගෙන තිබෙනවා. වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අදාළ සංරක්ෂණ කටයුතුවලට අවශ්‍ය නිලධාරින්ගේ විශාල හිඟයක් තිබුණා. අපි නිලධාරින් 569ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන තිබෙනවා.

ඒ වාගේම ඔවුන්ව දිරිමත් කිරීම සඳහා වන දිරි දීමනා අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, අපේ ආණ්ඩුව තේරී පත් වෙනකොට අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා අවශ්‍ය කරන භෞතික සම්පත් තිබුණේ නැහැ. ඒ සඳහා ගමන් කරන්න වාහන තිබුණේ නැහැ. එම නිසා අපි මේ රජය මඟින් කැබ් රථ 100ක්, යතුරු පැදි 181ක්, ඒ වාගේම ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් ආදී භෞතික සම්පත් ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අලින් දුම්රියවල ගැටෙන එක වැළැක්වීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයත්, පරිසර අමාත්‍යාංශයත් විවිධ ආයතන සම්බන්ධ කර ගනිමින් පසුගිය කාලය පුරාම විශේෂ මැදිහත් වීමක් කළා. විශේෂයෙන්ම දුම්රිය සඳහා වේග සීමා පැනෙව්වා. මාර්ගය හොඳින් දර්ශනය වන දුම්රිය එන්ජින් අපි ඒ තැන්වලට මාරු කළා. දුම්රිය කාල සටහන් වෙනස් කළා. දුම්රිය මාර්ග දෙපස තිබෙන කැලෑ එළිපෙහෙළි කරලා පැහැදිලි දර්ශනයක් ඇති වන විධියට සකස් කළා. ඒ වාගේම දුම්රිය රියදුරන්ට වනඅලින්ගේ හැසිරීම් සම්බන්ධයෙන් අපි විශේෂ වැඩසටහන් සහ පුහුණු වැඩමුළු කළා. ඒ සඳහා නවීන තාක්ෂණය ලබා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2026 අය වැය තුළිනුත්, මේ වසර තුළත් ඒ අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම පරිසර සංරක්ෂණය සඳහා රුපියල් බිලියන 8.55ක්, අලි වැට ඇතුළු වනජීවී සංරක්ෂණය සඳහා රුපියල් බිලියන 6.4ක්, ඒ වාගේම වන ආවරණය පුළුල් කිරීම සඳහා රුපියල් බිලියන 1ක් ආදී වශයෙන් මෙවර අය වැයෙනුත් මුදල් වෙන් කර ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරලා අපි මේ සඳහා මැදිහත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා මේ රජය අනෙකුත් කිසිදු රජයකට වඩා වැඩි මැදිහත් වීමක් කරලා තිබෙනවා. ඒ අනුව, වනඅලි-මිනිස් ගැටුමට ඉක්මන් විසඳුමක් ලබා දීලා, එක පැත්තකින් සංරක්ෂණය කළ යුතු අලි ඇතුන් ආරක්ෂා කර ගැනීමටත්, මිනිස් ජීවිත සහ දේපළ ආරක්ෂා කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් කඩා වැටෙන්නේ සංචාරක ව්‍යාපාරය විතරක් නොවෙයි. සංචාරක ව්‍යාපාරය වාගේම මිනිසුන්ගේ ජන ජීවිතය, කෘෂි කර්මාන්තය ඇතුළු විවිධ ක්ෂේත්‍ර මේ නිසා කඩා වැටිලා තිබෙනවා. ඒ සියලු ක්ෂේත්‍ර නැවත ගොඩනඟන්න ජාතික ජන බලවේග රජය විධියට අපි මැදිහත් වෙන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, පැහැදිලි කර ගැනීමක්ද?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු අමාත්‍යතුමා කිව්වා, මම සමාජය නොමඟ යවන්න කටයුතු කරනවා කියලා. පසුගිය දවස්වල දිගින් දිගටම මාධ්‍යවල පළ වුණා, 2024-2025 වර්ෂවල මිය ගිය අලින්ගේ ගණන. මට මේ සමාජය මුළා කරන්න, නැත්නම් සමාජයට වැරදි තොරතුරක් දෙන්න අවශ්‍ය නැහැ. මම මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරපු ලියුමේ කියා තිබෙනවා, "පසුගිය රජයන්ද මේ සම්බන්ධයෙන් තීරණයක් අරගෙන නැහැ" කියලා. ඒක මේ ලියුමේ පැහැදිලිව තිබෙනවා. මම සමාජයට වැරදි පණිවුඩයක් දීලා නැහැ. ඔබතුමා කිව්වා, මම මේ සමාජයට බොරු කියනවා කියලා. මම බොරුවක් නොවෙයි කිව්වේ, මේක හැම මාධ්‍යයකම පළ වුණා.

ඊළඟ කාරණය මේකයි. ආසියානු අලියා වඳ වෙනවා කියලා ඔබතුමා කිව්වා. ඉන්දියාවේ අලියා වඳ වෙනවා ඇති. මරලා හෝ වෙන මොනවා හෝ කරලා ඉන්දියාවේ අලි වඳ වෙනවා ඇති. හැබැයි, 2011 ඉඳලා 2024 දක්වා කාලය තුළ ආසියාවේ අලින්; ලංකාවේ අලින් සැහෙන්න ප්‍රමාණයකින් වැඩිවෙලා තිබෙනවා; අලින් ප්‍රමාණය සියයට 27කින් වැඩිවෙලා තිබෙනවා කියලා ඔබතුමා පිළිගෙන තිබෙනවා. අලින් 7,500ක් සිටියා නම්, මේ 400 අයින් කළාම නැවතත් 7,000ට ආසන්න ප්‍රමාණයකට අඩුවෙලා තිබෙනවා. හැබැයි, ඔබතුමා එක කාරණයක් පිළිගන්න ඕනෑ. මට ප්‍රශ්නයක් තිබුණේ, මහව ඉඳලා එන "මීනගයා" දුම්රියේ රියැදුරෙක් ගැනයි. ඔබතුමා පිළිගන්නවාද කියලා මම දන්නේ නැහැ, ඔබතුමා ඒ ගැන සොයා බලන්න. පසුගිය කාලයේ ඔබතුමා වනජීවී ඇමති හැටියට ඉන්නකොට තමයි මඩකලපුව දක්වා යන දුම්රියේ හැප්පිලා අලි 12ක් මැරුණේ. ඒ, මේ අවුරුද්දේ. ඕනෑ නම් ඔබතුමා ගිහිල්ලා සොයා බලන්න. මම කියන එක වැරදියි නම්, ඔබතුමා සොයා බලා මට කියන්න. අපි දෙදෙනාම හරි ගිහිල්ලා බලමු, "මීනගයා" දුම්රියේ හැපිලා මේ අවුරුද්දේ කී දෙනෙක් මැරුණාද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එතුමා අවුරුදු 67ක් වයස දුම්රිය රියැදුරෙක්. හැබැයි, ඒ රියැදුරා තවමත් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මහව-මඩකලපුව දුම්රියට නැඟපු වෙලාවේ ඉඳලා තමයි අලි වැඩියෙන්ම මැරෙන්නේ. එතුමා වේගය පාලනය කරන්නේ නැහැ. වේගය පාලනය නොකරපු නිසා තමයි පසුගිය කාලයේ අලි විසිවෙලා ගිහිල්ලා ලයිට් කනුවල, ගෙවල්වල වැදිලා සිටියේ. ඒක නැහැයි කියන්න බැහැ, පත්තරවල, රූපවාහිනීවල, ඒ හැම එකේම මේවා පෙන්නුවා.

මහජනතාව නොමඟ යැවීමක් නොවෙයි මේ කරන්නේ. මේ රටේ දවසින් දවස අලි මැරෙනවා; අලින් පුච්චනවා. වැව්වලත් අලි මැරෙනවා. කැලෑවලත් අලි මැරිලා ඉන්නවා. පසුගිය කාලයේ බෙහෙත් කරලා කොපමණ අලි සංඛ්‍යාවක් ගොඩදාගන්න බැලුවාද? එක අලියෙක් ගොඩදාගන්න බැරි වුණා. ඒ වෙනුවෙන් තමයි මම මේ ප්‍රශ්නය ගෙනාවේ.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චාමර සම්පත් මන්ත්‍රීතුමා වලිගෙ පාගාගෙන. මම කිව්වේ එතුමා ජනතාව නොමඟ යැව්වා, ජනතාව නොමඟ යවන්න උත්සාහ කළා කියලා. එතුමා කිව්වා, අලි මරණ වැඩිපුරම සිදු වුණේ 2025 අවුරුද්දේ කියලා. අන්න ඒක තමයි බොරුව. ඒක මහ බොරුවක්. ඒක වැරදියි. වැඩිපුරම අලි මරණ සිද්ධ වුණේ 2023 අවුරුද්දේ. ඒ සංඛ්‍යාව 488ක්. එතුමා අන්න ඒක තමයි නොමඟ යවන්න කියපු කාරණය. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* කරුණාකරලා මට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට මේ කරුණ පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. ඒක තමයි ඔබතුමා කියපු මහ බොරුව. ඔය විධියට ජනතාව නොමඟ යවන්න එපා.

ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් අහගන්න. ආසියානු අලින් වඳවීමේ තර්ජනයකට මුහුණ පාලා ඉන්නේ. ලංකාවේ ඉන්නේත් ආසියානු අලි. ඒක තමයි මම කිව්වේ. ඒක නිසා වලිගෙ පාගාගන්න එපා. ඔබතුමා අහපු ප්‍රශ්න ටිකට මම උත්තර දීලා තිබෙනවා. ඔබතුමා කියන වැල් බයිලාවලට උත්තර දෙන්න මම සූදානම් නැහැ. මේක සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නවලට අදාළ විධියට මම උත්තර දීලා තිබෙනවා. මම හිතනවා, ඔබතුමා ඒවායෙන් සෑහීමකට පත් වෙයි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීම කළා. මම හිතන විධියට අතුරු ප්‍රශ්න නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ පැහැදිලි කිරීම කළා. අපි ඉදිරියට යමු.

සභාව කල් තබන අවස්ථාවේ දෙවැනි ප්‍රශ්නය, ගරු උපුල් කිත්සිරි මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙතයි.

පසුගිය දිනවල සිදු වූ "දිට්වා" සුළි කුණාටුව සමඟ ලංකාවේ ජලාශ පිළිබඳව යම් අවිනිශ්චිත තත්ත්වයන්ද මතුවන ලදී. ඉදිරියේදී ද එවැනි සුළි කුණාටු තත්ත්වයන් අපේ රටට නිරන්තරයෙන් ඇති විය හැකි යැයි අපට අනුමාන කළ හැකිය. අපේ ජලාශ පද්ධතිය එවැන්නක් සඳහා සුදුසුකම් සහිත වුවද, ඇතැම් විට ඒ පිළිබඳව අවිනිශ්චිත තත්ත්වයන් මතුවීම වැළැක්විය නොහැකිය. පසුගිය දිනවල ඇති වූ මෙම තත්ත්වයත් සමඟ ලංකාවේ සියලුම ජලාශ පිරී ඉතිරී යන ලදී. එසේ පිරී ඉතිරී ගිය ජලාශ අතර උඩවලව ජලාශය -එවැනි තත්ත්වයන්වලට ඔරොත්තු දෙන ලෙස නිර්මාණය කළද- ඇතැම් කරුණු මත අනාරක්ෂිත තත්ත්වයට පත්වී ඇත. ඒ අනුව පහත සඳහන් ප්‍රශ්න මම ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කරමි.

[ගරු උපුල් කිත්සිරි මහතා]

1. උඩවලව ජලාශය ඉදිකරන ලද වර්ෂය කුමක්ද?
2. එම ජලාශය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?
3. එම ජලාශයේ ධාරිතාව සහ අස්වද්දන බිම් ප්‍රමාණය කොපමණද?
4. ශ්‍රී ලංකාවේ ජලාශ මතින් A සහ B ශ්‍රේණියේ ප්‍රධාන මාර්ග පිහිටා තිබේද?
5. උඩවලව ජලාශයේ වැව් බැම්ම මතින් එවැනි ප්‍රධාන මාර්ගයක් පිහිටා තිබීමෙන් ජලාශ වේල්ලට අනතුරක් නොපවතින්නේද?
6. එසේ අනතුරුදායක තත්ත්වයක් පවතින්නේ නම් ඊට යෙදිය හැකි විකල්ප ක්‍රම සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයේ අවධානය යොමු කර තිබේද?
7. නොඑසේ නම් මන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු ලබා දීම, ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු අරවින්ද සෙනරත් මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උපුල් කිත්සිරි මහතා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන්නේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. උඩවලව ජලාශය මහවැලි ව්‍යාපාරය තුළ ඉතාම වැදගත් වාරි පද්ධතියක් ලෙස අපි හඳුනා ගන්නවා.

1. මෙය ඉදිකරලා තිබෙන්නේ 1968දී.
2. කෘෂිකාර්මික කටයුතු සඳහා දියවර නිකුත් කිරීම, පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ ජල විදුලිබලය උත්පාදනය කියන අරමුණු පෙරදැරිව තමයි 1968දී උඩවලව ජලාශය ඉදිකරලා තිබෙන්නේ.
3. ධාරිතාව මිලියන ඝනමීටර් 268.65ක් ලෙස සහ ඒ ජලය යොදාගෙන අස්වද්දන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 25,000ක් ලෙස හඳුනාගෙන තිබෙනවා.
4. අපේ රටේ මාර්ග පද්ධතිය ගත්තාම, එය සමහර වෙලාවට ජලාශවල වේලි මතින්, ඇළ මාර්ග හරහා ගමන් කරමින් තිබෙනවා. ඒ වාගේම මේ උඩවලව ජලාශයට අදාළව ගත්තොත්, වේල්ල හරහා මාර්ගය වේල්ලේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා ඇති පිවිසුම් මාර්ගය වුවත්, බී 427 මාර්ගය ලෙස මෙම මාර්ගය ගැසට් කර ඇති අතර, ගූගල් සිතියමේද පෙන්වා ඇත.

   ඇත්තටම උඩවලව ජලාශයේ තිබෙන පිහිටීමේ ස්වභාවය අනුව වේල්ල හරහා ගමන් කරන ප්‍රධාන මාර්ගයක් එයට ඇතුළත් කරලා තිබෙනවා. ඒ පිළිබඳව තමයි එතුමා අපෙන් විමසීමක් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.
5. ජලාශ සහ වේලි මාර්ග ප්‍රධාන මාර්ග ලෙස භාවිතයේදී වාහන ගමනාගමනය එම වේලිවලට අවදානමක්ව තිබෙනවා. ඇත්තටම වාරි ඉංජිනේරුවන්, මහවැලි පද්ධතිය තුළ කටයුතු කරන ඉංජිනේරුවරුන් මේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමින් තිබෙනවා. වේල්ල මතින් ප්‍රධාන ප්‍රවාහන මාර්ගය යෙදුණාම වේල්ලට යම් බලපෑමක් වෙනවා කියන එක ඔවුන් කියනවා.

   දැනට මෙම වේල්ල මත ඇති මාර්ගය හරහා උඩවලව දෙසට හා තණමල්විල දෙසට සැහැල්ලු වාහනවලට හා මගී බස් රථ සඳහා පමණක් ගමන් කිරීමට අවසර දී ඇත. මේ වන විට පිටවාන නිර්මිතයේ, ඒ කියන්නේ කොන්ක්‍රීට් යොදා සකස් කර තිබෙන කොටසේ කුලුනුවල පිපිරීම් නිර්මාණය වී ඇති බැවින්, ඒ පිළිබඳව අවධානය යොමු කර වාර්තාවක් ලබා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතිනවා. එම වාර්තාව අනුව ඉදිරි කටයුතු සූදානම් කර ඒ අනුව ක්‍රියාත්මක වන්න මහවැලි අධිකාරිය දැනට කටයුතු කරමින් තිබෙනවා.

6 සහ 7. ඔව්.

ඇත්තටම ඒ මාර්ගය කාලයක් විවෘත කරලා තිබුණේ නැහැ. නමුත් පසුකාලීනව එය නැවත විවෘත කරලා ජනතාවට තණමල්විල දෙසට සහ මොනරාගල දෙසට ගමන් කිරීමට

තිබෙන කෙටි මාර්ගයක් විධියට තමයි එය භාවිත කරන්නේ. හැබැයි, විකල්ප මාර්ගත් තිබෙනවා. නමුත් ජනතාව හැම වෙලාවකම උත්සාහ කරන්නේ කෙටි මාර්ගයක් භාවිත කරන්න.

සාමාන්‍ය ජනතාව කෙටි මාර්ගයක් ලෙස මෙම මාර්ගය භාවිත කිරීමට පුරුදුව ඇති නිසා එම මාර්ගය වසා දැමීමට අපහසු තත්ත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. වාරිමාර්ග ඉංජිනේරුවන් ඒ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරමින් සහ මැදිහත්වීම් කරමින් ඉන්නවා.

ඒ වාගේම පිටවානේ කොන්ක්‍රීට් කුලුනුවල නිර්මාණය වී ඇති පිපිරුම් පිළිබඳ අධ්‍යයන වාර්තාව අනුව වාහන ගමනාගමනය වේල්ලට තර්ජනයක් නම් ඉදිරියේදී ඒ වාහන ද වේල්ල හරහා ගමන් කිරීම නතර කිරීමට කටයුතු කරන බවට තමයි ඉංජිනේරුවන්ගේ පැත්තෙන් තොරතුරු ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මෙහි වේල්ලට පහළින් ආසන්න විකල්ප මාර්ගයක් තිබෙනවා. නමුත් ජනතාව එය පරිහරණය කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ මාර්ගය තුළ තිබෙන යම් අපහසුතා නිසා අමාත්‍යාංශය විධියට අපි මාර්ග සංවර්ධන අධිකාරියත් සමඟ සාකච්ඡා කරලා මේ වේල්ලට පහළින් තිබෙන විකල්ප මාර්ගය පිළිසකර කර පහසුකම් සහිත මාර්ගයක් බවට පත් කර තාවකාලිකව ජනතාවගේ අවශ්‍යතාව සඳහා දෙන්න සූදානමින් ඉන්නවා.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරෙන් මම සෑහීමට පත් වනවා. නමුත් මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. 1968දී තමයි මේ වේල්ල ඉදි කළේ. පසුගිය එල්ටීටීඊ ක්‍රියාකාරකම් සහිත වකවානුවේදී මේ වේල්ල හරහා යන වාහන දැඩි ලෙස සීමා කරලා තිබුණා. නමුත් අපි දන්නවා, විකල්ප පාරක් හැටියට මේකට වෙන පාරක් පාවිච්චි කරන්න පුළුවන් කියලා.

උඩවලව ජලාශය කියන්නේ හම්බන්තොට දක්වා විශාල ප්‍රදේශයක් පෝෂණය වන ජලාශයක්. මෙය අනාරක්ෂිත වුණොත්, ඒ ප්‍රදේශවලට අනතුරු ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම මේ ප්‍රදේශය දැන් බහුල වශයෙන් සංචාරක කර්මාන්තය සඳහා පාවිච්චි වනවා.

මුල් කාලයේදී ඒ ජලාශයේ වේල්ල මතින් ගියේ ඉතාම අඩු වාහන ප්‍රමාණයක්. අද වන විට වාහන විශාල සංඛ්‍යාවක් ඒ මතින් යනවා. එය අනතුරක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමැතියි. ඔබතුමා සඳහන් කළ ඒ විකල්ප මාර්ගය භාවිත කරන්න ජනතාවත් කැමැතියි. ඒ වාර්තා ලැබෙන තෙක් ඉන්න එපා. මොකද උත්තරයේම තිබෙනවා, හදිසි තත්ත්වයක් මතු වුණොත් ඒ ජලාශයේ වේල්ල හරහා තිබෙන ප්‍රධාන මාර්ගය වහන්න සිදුවන බව. ඒ නිසා කඩිනමින් මැදිහත් වෙලා මේ විකල්ප මාර්ගය -ඒ ජලාශයට යටින් තිබෙන පාර- ජනතාව වෙනුවෙන් විවෘත කරන්න පුළුවන් වන විධියට හොඳාකාරයෙන් හදන්න පුළුවන්ද? මොකද ඒක විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයටත්, ඒ ප්‍රදේශයටත් වැදගත් වන නිසා. එහෙම කළොත් සංචාරක කර්මාන්තය සඳහා සහ එම ප්‍රදේශවාසීන්ට ඒ මාර්ගය පාවිච්චි කරන්න පුළුවන් වනවා. ප්‍රධාන මාර්ගයට පහළින් එම මාර්ගය යොදා දෙන්න පුළුවන්ද කියන එක සහ කඩිනමින් ඒ සඳහා මැදිහත් වන්න පුළුවන්ද කියන එක තමයි අපට දැනගන්න අවශ්‍ය වන්නේ.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි කර ගැනීම සඳහා මම මේ කාරණය කියන්නේ. මහවැලි අධිකාරිය මේ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරමින් තිබෙනවා. ඉක්මනින් සාකච්ඡා කරලා ඔබතුමා කියන ඒ විකල්ප මාර්ගයට අදාළව අවශ්‍ය කරන මැදිහත්වීම් අපි කරනවා. මාර්ග සංවර්ධන අධිකාරියත් එක්ක කථා කරලා ඒ අවශ්‍යතාව ඉටු කර දෙන්න අමාත්‍යාංශය විධියටත්, මහවැලි අධිකාරිය විධියටත් අපි කටයුතු කරනවා කියන එක තමයි මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ.

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.39ට, 2026 ජනවාරි 08වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.39க்கு, பாராளுமன்றம் 2026 சனவரி 08, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.39 p.m.until 9.30 a.m. on Thursday, 08th January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.